# කර්මාන්ත ශාලා ආඥා පනත

**කම්කරු දෙපාර්තමේන්තුව**

# I වන කොටස

2000 අංක 33, 2

## කර්මාන්තශාලා ලියාපදිංචි කිරීම සහ කර්මාන්තශාලා ගොඩනැගිලි අනුමත කිරීම

කර්මාන්තශාලා ලියාපදිංචි කිරීම සහ කර්මාන්තශාලා ගොඩනැගිලි අනුමත කිරීම ආදිය

2. (1) යම් කර්මාන්තශාලාවක් නිවේදිත දිනයට පෙර ඒ දිනයේ හෝ ඊට පසුව පිහිටුවනු ලැබුව ද මේ ආඥාපනතේ විධිවිධානවලට සහ මේ පනත යටතේ සාදන ලද නියෝගවලට අනුකූලව එය ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ නම් මිස කිසිම තැනැත්තකු නිවේදිත දිනයේ හෝ ඉන් පසු එම කර්මාන්තශාලාවේ පදිංචිකරු නොවිය යුතුය :

1976 අංක 12, 2

2000 අංක 33,3

එසේ වුවද නිවේදිත දිනයට පෙර පිහිටුවන ලද යම් කර්මාන්තශාලාවක් නිවේදිත දිනයෙන් ආරම්භ වන තුන් මසක කාල පරිච්ඡේදය තුළ පදිංචිකරු විසින් පරිහරණය කිරීම මේ වගන්තියේ ඉහත දැක්වූ විධිවිධාන උල්ලංඝනය කිරීමක් ලෙස නොසැලකිය යුතුය.

(2) මේ ආඥාපනතින් නියම කර ඇති ලියාපදිංචි කිරීමේ කාර්යය සඳහා කර්මාන්තශාලාවක් පිහිටවනු ලැබූ දිනය , ගොඩනැගිලි ඉදිකිරීම හෝ අළුත්වැඩියා කිරීම නැතහොත් ස්ථානය පිරිසිදු කිරීම හා සකස් කිරීම නැතහොත් යන්ත්‍ර හෝ උපකරණ සවිකිරීම හෝ අළුත්වැඩියා කිරීම හැර , කර්මාන්තශාලාවේ නියම ක්‍රියාකාරිත්වයන්ගෙන් යමක් හෝ යම් වර්ගයක වැඩවල යම් ක්‍රියාවලියක් එහි ආරම්භ කරනු ලබන දිනය වන්නේ ය.

2000 අංක 33, 3

(3) නිවේදිත දින හා එදිනට පසුව කිසිම තැනැත්තකු විසින් -

(අ) යම් භූමි භාගයක කර්මාන්තශාලා ගොඩනැගිල්ලක් ඉදි කිරීම ; හෝ

(ආ) යම් කර්මාන්තශාලා ගොඩනැගිල්ලක යම් විශාල කිරීමක් කිරීම ; හෝ

(ඇ) වෙනත් යම් ගොඩනැගිල්ලක් කර්මාන්තශාලා ගොඩනැගිල්ලක් බවට පරිවර්තනය කිරීම ; හෝ

අවස්ථාවෝචිත පරිදි, ඒ ඉදි කිරීම හෝ විශාල කිරීම හෝ පරිවර්තනය කිරීම සඳහා වන සැලසුම් ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයා විසින් හෝ අනුමත කරනු ලැබ ඇත්තේ නම් මිස , ආරම්භ නොකළ යුතුය.

(4) (3) වන උප වගන්තිය යටතේ වූ අනුමතය දෙනු නොලැබූ අවස්ථාවක දී , අවස්ථාවෝචිත පරිදි, ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයා විසින් හෝ ඊට පදනම් වූ හේතු ඉල්ලුම්කරු වෙත ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තියෙහි " විශාල කිරීම " යන්නට යම් ගොඩනැගිල්ලක්, කාමරයක් හෝ වෙනත් ඉදි කිරීමක් එකතු කිරීම , කොටස් දෙකකට හෝ ඊට වැඩි ගණනකට බෙදීමේ කාර්යය සඳහා යම් ගොඩනැගිල්ලක් වෙනස් කිරීම , බිත්ති දෙකක් හෝ ඊට වැඩි ගණනක් අතර යම් ඉඩ ප්‍රමාණයක වහලක් සෑදීම , නැවත ඉදිකිරීමේ කාර්යය

සඳහා විනාශ කරන ලද හෝ කඩාදමන ලද යම් ගොඩ නැගිල්ලක් මුළුමනින් ම හෝ ඉන් යම් කොටසක් නැවත ඉදිකිරීම , යන්ත්‍ර පිහිටුවා ඇති ආකාරයේ යම් වෙනසක් කිරීම හෝ උෂ්ණත්වය , ආලෝකමත් කිරීම හෝ වාතාශ්‍රය වැනි මේ ආඥාපනතේ යම් විධිවිධානයකට බලපාන ගොඩනැගිල්ලේ අභ්‍යන්තර සැකසුම්වල වෙනත් යම් වෙනසක් කිරීම ඇතුළත් වේ.

නියෝග සෑදීමට ඇති බලය

2000 අංක 33, 4

3. (1) මේ ආඥාපනතින් නියම කර ඇති කර්මාන්තශාලා ලියාපදිංචි කිරීමට , කර්මාන්තශාලා ගොඩනැගිලි සහ භූමි භාග අනුමත කිරීමට, කර්මාන්තශාලා ගොඩනැගිලිවලට විශාල කිරීම් අනුමත කිරීමට සහ ගොඩනැගිලි, වෙනත් ගොඩනැගිලි කර්මාන්තශාලා ගොඩනැගිලි බවට පරිවර්තනය කිරීමට අදාළ සියලුම කරුණු සඳහා අදාළ අමාත්‍යවරයා විසින් නියෝග මගින් විධිවිධාන සැලැස්විය හැකිය.

(2) විශේෂයෙන් ම හා (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් සිදු නොවන පරිදි --

(අ) 2(3) වන වගන්තිය යටතේ අනුමතිය සඳහා වන ඉල්ලුම් පත්‍ර සලකා බැලීමේ කාර්යය සඳහා සැලසුම් සහ වැඩ විස්තර ඉදිරිපත් කරන ලෙස නියම කිරීම සහ එබඳු සැලසුම්වල සහ වැඩ විස්තරවල ස්වභාවය නියම කිරීම ;

2000 අංක 33 , 4

(ආ) ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයේ ආකෘතිය නියම කිරීම ;

2000 අංක 33 , 4

(ඇ) ලියාපදිංචි කිරීමේදී නිකුත් කළ යුතු සහතිකවල ආකෘති නියම කිරීම ;

2000 අංක 33 , 4

(ඈ) ලියාපදිංචි කිරීමට පෙර ඉල්ලුම්කරු විසින් ඉටු කළ යුතු කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම ; සහ

(ඉ) “ ලියාපදිංචි කළ හැක්කේ යම් කොන්දේසිවලට යටත්ව ද ඒ කොන්දේසි සහ , ඒ ලියාපදිංචි කිරීම අවලංගු කළ හැක්කේ යම් අවස්ථානුගත කරුණුවල දී ද එම අවස්ථානුගත කරුණු , නියම කිරීම ”.

අමාත්‍යවරයා විසින් නියෝග මගින් කළ හැකිය.

(3) කර්මාන්තශාලා ලියාපදිංචි කිරීමේ කාර්යය සඳහා --

(අ) නිවේදිත දිනයට පෙර පිහිටුවන ලද කර්මාන්තශාලා සම්බන්ධයෙන් ; සහ

(ආ) නිවේදිත දිනයෙහි හෝ එදිනට පසුව පිහිටුවන ලද කර්මාන්තශාලා සම්බන්ධයෙන්

මේ වගන්තියේ පෙරාතුව වූ විධිවිධාන යටතේ වෙනස් නියෝග සාදනු ලැබිය හැකිය.

යම් ස්ථානයක් කර්මාන්ත ශාලාවක් ලෙස පදිංචියට ගැනීමේ හෝ පාවිච්චි කිරීමේ අරමුණ පිළිබඳ දැන්වීම සහ 2 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් නිවේදනය කරන ලද දිනයට පෙර පිහිටුවන ලද කර්මාන්ත ශාලාවක් සම්බන්ධයෙන් ඉදිරිපත් කළ යුතු දැන්වීම

2000 අංක 33, 5

4. (1) නිවේදිත දින හෝ එදිනට පසු කිසිම තැනැත්තකු විසින්, යම් ස්ථානයක් කර්මාන්තශාලාවක් ලෙස පදිංචියට ගැනීම හෝ පාවිච්චි කිරීම, තමා ඒ පරිහරණයට ගැනීම හෝ පාවිච්චි කිරීම ආරම්භ කිරීමට අදහස් කරන දිනයට යටත් පිරිසෙයින් එක් මාසයකට පෙර, නියමිත විස්තර ඇතුළත් ලිඛිත දැන්වීමක්, ඒ තැනැත්තා විසින් ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයාට හෝ දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයාට භාර දී ඇත්නම් මිස, ආරම්භ කරනු නොලැබිය යුතුය. එසේ සපයන ලද විස්තරවල යම් වෙනසක් සිදුවුවහොත්, ඒ කර්මාන්තශාලාවේ පදිංචිකරු විසින්, විස්තරවල ඒ සෑම වෙනස්වීමක් ම ඇතුළත් අලුත් ලිඛිත දැන්වීමක් ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයා වෙත හෝ දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයා වෙත හෝ සපයනු ලැබිය යුතු ය :

එසේ වුව ද ඒ තැනැත්තා විසින් ඒ දැන්වීම භාර දීමෙන් පසු, දැන්වීමෙහි නිශ්චිතව දැක්වෙන දිනයට කලින් දිනයක දී ඒ පදිංචියට ගැනීම හෝ පාවිච්චි කිරීම සඳහා ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයාගෙන් හෝ දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයාගෙන් ලිඛිත අවසරයක් ලබා ඇත්නම්, ඒ පදිංචියට ගැනීම හෝ පාවිච්චි කිරීම එසේ ආරම්භ කළ හැකි ය.

(2) 2 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් නිවේදිත දිනයට පෙර පිහිටුවනු ලැබ, ඒ දිනයේ දී පාවිච්චියට ගනු ලබමින් තිබෙන කර්මාන්තශාලාවක පදිංචිකරු විසින්, ඒ දිනයේ සිට මාස දෙකක කාලයක් ඇතුළත, නියමිත ආකෘතියක වූ ද, නියමිත විස්තර ඇතුළත් වූ ද, ලිඛිත දැන්වීමක්, ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයා වෙත හෝ දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයා වෙත සපයනු ලැබිය යුතු ය. එසේ සපයන ලද විස්තරවල යම් වෙනසක් සිදුවුවහොත්, වෙනත් කරුණු අතර, විස්තරවල ඒ සෑම වෙනස්වීමක් ම ඇතුළත් අලුත් ලිඛිත දැන්වීමක් ඒ කර්මාන්තශාලාවේ පදිංචිකරු විසින් ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයා වෙත හෝ දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයා වෙත සපයනු ලැබිය යුතු ය.

කර්මාන්තශාලාවක වැඩ අත්හිටුවීමේ සහ නැවත ආරම්භ කිරීමේ දැන්වීම

1976 අංක 12, 2

2000 අංක 33, 6

5. යම් කර්මාන්තශාලාවක වැඩ මාස හයකට වැඩි කාලයක් සඳහා අත්හිටුවා තිබෙන විට එසේ වැඩ අත්හිටුවනු ලැබීමට පෙරාතුව ම ඒ කර්මාන්තශාලාවෙහි පදිංචිකරු ව සිටි තැනැත්තා විසින් --

(අ) එසේ වැඩ අත්හිටුවනු ලැබූ දිනය සඳහන් කරන ලිඛිත දැන්වීමක් ඒ කාලසීමාව ඉකුත්වීමෙන් දින පහළොවක් ඇතුළත ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු තැන හෝ දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු තැන වෙත භාරදිය යුතුය ; තවද,

(ආ) නැවත වැඩ ආරම්භ කිරීමේ අදහස සහ එසේ නැවත වැඩ ආරම්භ කිරීමට අදහස් කරන දිනය ප්‍රකාශ කරමින් ඔහු විසින් ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු තැන වෙත හෝ දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු තැන වෙත එසේ නැවත වැඩ ආරම්භ කිරීමට අදහස් කරන දිනට අඩුම වශයෙන් දින පහළොවකට කලින් ලිඛිත දැන්වීමක් භාර දී නොමැති නම් එහි නැවත වැඩ ආරම්භ නොකළ යුතුය.

මේ ආඥාපනත යටතේ ලියා පදිංචි කර ඇත්නම් මිස, කර්මාන්තශාලා පිළිබඳව පළාත් පාලන ආයතන විසින් බලපත්‍ර නිකුත් නොකළ යුතු බව

1976 අංක 12, 02

5 අ. 80, 81, 82, 84, 86, හෝ 126 යන වගන්තිවල සඳහන් කරන ලද යම් ක්‍රියාවලියක් හෝ ක්‍රියාවක් වන්නා වූ හෝ එවැනි ක්‍රියාවලියක් හෝ ක්‍රියාවක් ඇතුළත් වන්නා වූ යම් කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා කිසි ම පළාත් පාලන ආයතනයක් විසින් බලපත්‍රයක් නිකුත් කිරීම , එම කර්මාන්තය හෝ ව්‍යාපාරය පවත්වාගෙන යන ස්ථානය මේ ආඥාපනත යටතේ කර්මාන්තශාලාවක් වශයෙන් ලියාපදිංචි කර ඇත්නම් මිස නොකළ යුතුය.

## II වෙනි කොටස

## සනීපය ( සාමාන්‍ය විධිවිධාන )

පවිත්‍රතාව

6. සෑම කර්මාන්ත ශාලාවක් ම පිරිසිදු තත්ත්වයකින් තැබිය යුතු ය . තවද යම් කානුවකින්, කැසිකිළියකින් හෝ පීඩනයකින් වහන දුර්ගන්ධයෙන් නිදහස් ව තිබිය යුතු ය . එසේ ම ඉහත දැක්වුණු විධිවිධානවල සාමාන්‍යත්වයටහානියක් නොවන පරිදි --

(අ) වැඩ කරන කාමරවල බිමෙන් හා බංකුවලින් ද , පඩි පෙළින් ද ප්‍රවේශවලින් ද කුණු සහ රොඩු එකතු වීම් සුදුසු ක්‍රමයකට දිනපතා බවත් කළ යුතු ය.

(ආ) සෑම වැඩ කරන කාමරයක ම බිම යටත් පිරිසෙයින් සතියකට වරක්වත් සේදීමෙන් හෝ ප්‍රතිඵල සහිත නම් හා සුදුසු නම් පිසදැමීමෙන් හෝ වෙනත් ක්‍රමයකට හෝ පිරිසිදු කළ යුතු ය.

(ඇ) සියලුම ඇතුල් බිත්ති ද, වෙන් කිරීම් ද, සීලින් හෝ කාමර වල සහ බිත්තිවල මුදුන් ද , ප්‍රවේශවල හා පඩි පෙළෙහි මුදුන් ද පිරිසිදු සනීපාරක්ෂක තත්ත්වයක තබා ගැනීම සඳහා නියෝග වලින් නියමිත සියලු ම ප්‍රතිකර්ම යෙදිය යුතු ය.

එසේ ද වුවත් --

(i) මේ වගන්තියේ (ඇ) ඡේදය යටතේ පනවනු ලැබූ යම් නියෝගයක විධිවිධාන යාන්ත්‍රික බලය පාවිච්චි නො කරන, දහ දෙනකුට අඩුවෙන් සේවයෙහි යොදා ඇති යම් කර්මාන්ත ශාලාවකට, දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු තැන විසින් වෙනස් ලෙස නියම කරන අවස්ථාවක හැර , අන් කිසි ම අවස්ථාවක දී අදාළ නො විය යුතු ය.

(ii) කර්මාන්ත ශාලාව පිරිසිදු තත්ත්වයක තබා ගැනීමේ කාර්ය සඳහා මේ වගන්තියේ ඉහත දැක්වුණු විධිවිධාන , යම් කර්මාන්තශාලා වර්ගයක හෝ යම් විස්තරයකට හෝ වැටෙන කර්මාන්ත ශාලාවලට හෝ ඉන් කොටසකට නුවුවමනා බව හෝ විශේෂ කරුණු නිසා එකී විධිවිධාන නුසුදුසු බව හෝ ප්‍රමාණවත් නොවන බව කොමසාරිස්ට පෙනී ගිය විට ඔහුට සුදුසු යයි හැගෙතොත් එකී වර්ගයේ හෝ එකී විස්තරයේ කර්මාන්ත ශාලාවලට හෝ ඉන් කොටස්වලට ඉහත කී විධිවිධාන අදාළ නොවන බව හෝ

ආඥාවෙහි වෙනස් කොට තිබෙන ආකාරයට ඒවා අදාළ වන බව හෝ ආඥාවකින් ඔහුට නියම කළ හැකි ය.

7. (1) කර්මාන්ත ශාලාවේ සේවයෙහි යෙදී සිටින තැනැත්තන් ගේ සනීපයට අන්තරායක් වන ලෙස , වැඩ කරන අතර කර්මාන්ත ශාලාවේ තදබදයක් නො තිබිය යුතු ය.

(2) යම් වැඩ කරන කාමරයක එක වේලාවකට සේවයට යොදනු ලබන තැනැත්තන්ගේ ගණන කොපමණ ද කිවහොත් එම කාමරයේ ඒ එක් එක් කම්කරුවාට ඉඩහැර තිබෙන වර්ග අඩි ප්‍රමාණය හාර සියයකට අඩුවේ නම්, ඉහතකී පරිදි කර්මාන්ත ශාලාව තදබද වූවක් ලෙස, ඉහත කී විධිවිධාන වල සාමාන්‍යත්වයට හානියක් නොවන පරිදි , සැලකිය යුතු ය.

එසේ ද වුවත්, පුපුරණ ද්‍රව්‍ය නිපදවනු ලබන හෝ පාවිච්චි කරනු ලබන යම් වැඩ කරන කාමරයක විශේෂ තත්ත්වයක් යටතේ වැඩ ගෙන යන නිසා, මේ උප වගන්තියේ විධිවිධාන ඒ වැඩ කරන කාමරයට අදාළ කිරීම නුසුදුසු බව හෝ අනවශ්‍ය බව ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු තැනට ඒත්තු ගිය අවස්ථාවක දී , සහතිකයෙහි සඳහන් යම් කොන්දේසිවලට යටත් ව ඒ වැඩ කරන කාමරයට ඒ විධිවිධාන අදාළ කිරීම සහතිකයකින් ඔහුට නිදහස් කළ හැකිය.

(3) නියමිත දිනයෙහි වැඩ කරන කාමරයක් ලෙස පාවිච්චි කරනු ලැබූ යම් කාමරයක් සම්බන්ධයෙන්, ඒ දිනයෙන් පසු පසු අවුරුදු කාලයකට ද , ඒ කාලය ඉකුත් වීමට පෙර එම කාමරයට ප්‍රතිඵල සහිත සුදුසු යාන්ත්‍රික වාතාශ්‍රය සපයනු ලැබූයේ නම් තවත් අවුරුදු පහක කාලයකට ද ඉහත සඳහන් උපවගන්තියෙහි සඳහන් වර්ග අඩි හාර සියය වෙනුවට වර්ග අඩි දෙසිය පනහ සඳහන් වූ ලෙස එකී උප වගන්තිය බල පැවැත්විය යුතු ය.

තව ද පහත දැක්වෙන අවස්තාවල දී ඒ කාමරයට මේ උප වගන්තිය අදාළ වීම නතර විය යුතු ය.

එනම් --

(අ) නියමිත දිනයෙහි කාමරයෙහි පදිංචි ව සිටින්නාහට හෝ ඒ ව්‍යාපාරය ඔහුට පසුව හිමි වන්නාට හෝ නො වන වෙනත් තැනැත්තකුට එකී කාමරයෙහි පදිංචිය හිමි වීම ;

(ආ) ඉහතකී කාල සීමාවලින් පළමු කාල සීමාවෙහිදී කාමරයට ප්‍රතිඵල සහිත සුදුසු යාන්ත්‍රික වාතාශ්‍රය ලැබීමේ විධිවිධාන සැලැස්විය යුතු බව දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු තැන විසින් නියම කරනු ලැබ, ඒ නියමය ඉෂ්ට නො කිරීම; හෝ

(ඇ) එකී කාල සීමාවලින් දෙවෙනි කාල සීමාව අතරතුර හෝ එකී කාල සීමාවලින් එකකදී කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු තැනගේ නියමය ප්‍රකාර කාමරයට සපයනු ලැබූ ප්‍රතිඵල සහිත සුදුසු යාන්ත්‍රික වාතාශ්‍රය පැවැත්වීම නතර වීම හෝ ද වේ.

8. යම් කර්මාන්ත ශාලා වර්ගයකට හෝ යම් විස්තරයකට හෝ වැටෙන කර්මාන්ත ශාලාවක් හෝ ඒවායේ කොටසක් හෝ යම් නිපදවීමේ ක්‍රමයක් හෝ සම්බන්ධයෙන්, කර්මාන්ත ශාලාවක වැඩ කරන කාමරයක සේවයෙහි යොදනු ලැබූ සෑම තැනැත්තකුටම 7 වෙනි

වගන්තිය යටතේ ඉඩ හරිනු ලැබූ වර්ග අඩි ප්‍රමාණය වැඩි කිරීම සඳහා ඇමතිවරයාට නියෝග පැනවිය හැකි ය.

9. යම් කාමරයක වර්ග අඩි ඉඩ ප්‍රමාණ 7 වෙනි වගන්තියේ කාර්යය සඳහා ගණන් බැලීමේ දී, බිමෙන් අඩි දහ හතරකට වැඩි උසින් කිසි ම ඉඩ ප්‍රමාණයක් ගණනට නො ගත යුතු ය . තවද කාමරයකට ගැලරියක් ඇතුළත් වේ නම් ඒ ගැලරිය, කාමරයේ අනිත් කොටසින් වෙන් කරනු ලැබූ වෙන ම කාමරයක් ලෙස , 7 වෙනි වගන්තියේ කාර්යය සඳහා සැලකිය යුතු ය.

සේවයට යොදනු ලැබූ තැනැත්තන්ගේ ගණන, එක් එක් වැඩ කරන කාමරයක දැන්වීමක සවි කොට තැබිය යුතු බව

10. දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු තැන විසින් වෙනත් ආකාරයකට නියම කරනු නො ලැබුවහොත්, කර්මාන්ත ශාලාවේ එක් එක් වැඩ කරන කාමරයක 7 වෙනි වගන්තියේ විධිවිධාන ගැන සැලසීමක් ඇති ව, එකී කාමරයේ සේවයේ යෙදිය හැකි තැනැත්තන්ගේ ගණන් දැක්වෙන දැන්වීමක් සවි කොට තැබිය යුතුය.

උෂ්ණත්වය

11. (1) එක් එක් වැඩ කරන කාමරයක ප්‍රමාණවත් උෂ්ණත්වයක් ලබා ගැනීමට හා තබා ගැනීමට ප්‍රබල විධිවිධාන ඇති කළ යුතු ය . යම් වැඩ කරන කාමරයක සේවයෙහි යෙදී සිටින තැනැත්තන්ට හානි කරවිය හැකි වූ ද, අප්‍රිය විය හැකි වූ ද දුමක් යම් වැඩ කරන කාමරයක වාතය හා මිශ්‍රවන අන්දමේ කිසි ම ක්‍රමයක් උෂ්ණත්වය තබා ගැනීම සඳහා නො යෙදවිය යුතු ය.

(2) ( ඉහත කී උප වගන්තියෙන් වාඩි වී කරන වැඩ සඳහා නියමිත මානයට වෙනස් වූ ) , යුක්ති සහතික උෂ්ණත්වය පිළිබඳ මානයක් කර්මාන්ත ශාලාවලට හෝ යම් කිසි වර්ගයකට හෝ විස්තරයකට හෝ වැටෙන කර්මාන්ත ශාලාවලට හෝ ඒවායේ කොටස්වලට, නියෝගවලින් නියම කිරීමට ද , සේවයෙහි යෙදී සිටින්නන්ට ඇමතිවරයාගේ අදහස් පරිදි හානි කරවිය හැකි වූ යුක්ති සහගත උෂ්ණත්වයක් පවත්වා ගැනීමේ ක්‍රම තහනම් කිරීමට ද දක්වනු ලබන ස්ථාන වල සහ ආකාරයට උෂ්ණ මාපක සැපයීමට සහ පවත්වා ගැනීමට ද ඇමතිවරයාට නියම කළ හැකි ය.

වාතාශ්‍රය

12. (1) එක් එක් වැඩ කරන කාමරයක පිරිසිදු වාතය ලැබීමෙන් ප්‍රමාණවත් වාතාශ්‍රය , ඇති කර ගැනීම හා පවත්වා ගැනීම සඳහා ද කර්මාන්ත ශාලාවේ ගෙන යන යම් නිපදවීමේ ක්‍රමයක් හෝ කර්මාන්තයක් නිසා ඇති විය හැකි, සනීපයට අහිතකර වූ සියලු දුම්, දූවිලි හා වෙනත් අපිරිසිදු දේ හානි කර නොවීම සඳහා ද සුදුසු වූ ප්‍රබල විධිවිධාන පුලුවන් තරමින් සැලැස්විය යුතු ය.

(2) කර්මාන්ත ශාලා සඳහා හෝ යම් වර්ගයකට හෝ විස්තරයකට වැටෙන කර්මාන්ත ශාලා සඳහා හෝ ඒවායේ කොටස් සඳහා හෝ ප්‍රමාණවත් වාතාශ්‍රය ලැබීමේ මානයක් නියෝග මගින් ඇමතිවරයා විසින් නියම කළ හැකි ය.

ආලෝකය

13. (1) මිනිසුන් වැඩ කරන හෝ ගැවසෙන කර්මාන්ත ශාලාවක සෑම කොටසකම ප්‍රමාණවත් වූ ද , සුදුසු වූ ද ස්වභාවික හෝ කෘතීම ආලෝකයක් ලබා ගැනීම හා පවත්වා ගැනීම සඳහා ප්‍රබල විධිවිධාන සැලැස්විය යුතු ය.

(2) කර්මාන්ත ශාලා සඳහා හෝ යම් කිසි වර්ගයකට හෝ විස්තරයකට වැටෙන කර්මාන්ත ශාලා සඳහා හෝ ඒවායේ කොටස් සඳහා හෝ යම් නිපදවීමේ ක්‍රමයක් සඳහා ප්‍රමාණවත් වූද , සුදුසු වූ ද

ආලෝකය දීමේ මානයක් නියෝග මගින් ඇමතිවරයා විසින් නියම කළ හැකි ය.

(3) යම් කෘතිම ආලෝක කිරීමක් යම් කිසි විශේෂ ප්‍රදීපකයකින් නිපදවිය යුතු ය යි නියම කිරීමේ හෝ අන් ලෙසකින් දැන්වීමේ හෝ නියමයක් ලෙස මේ වගන්තියේ ඉහත දැක්වුනු විධිවිධානවල හෝ එය යටතේ පනවනු ලැබූ නියෝගවල හෝ කිසිවකින් තේරුම් නො ගත යුතු ය.

(4) වැඩ කරන කාමරවලට ආලෝකය ලැබීම සඳහා පාවිච්චි කරනු ලැබූ සියලු ම විවෘත ජනෙල් වල සහ වහල් කවුළුවල ඇතුල් පැත්ත සහ පිට පැත්ත පුලුවන් තරම් පිරිසිදුවද අවහිරයක් නොමැති ව ද තැබිය යුතු ය.

එසේ ද වුවත්, උෂ්ණය හෝ තද රශ්මිය අඩු කිරීමේ කාර්යය සඳහා ජනෙල් හා වහල් කවුලු සුදු හුනු ගෑමට හෝ ආවරණය කිරීමට මේ උප වගන්තියෙන් හානියක් නො විය යුතු ය.

14. කෘතෘ ක්‍රමයකින් ඉවත් කිරීමට හැකි වන තරමට යම් බිමක් තෙත් කරන සුලු යම් නිපදවීමේ ක්‍රමයක් පවත්වා ගෙන යන අවස්ථාවක දී, එකී තෙත අස් කිරීම සඳහා ප්‍රතිඵල ගෙන දෙන ක්‍රමයක් සලස්වා එය පවත්වා ගෙන යා යුතු ය.

15. (1) කර්මාන්ත ශාලාවේ සේවයෙහි යෙදී සිටින තැනැත්තන් සඳහා ප්‍රමාණවත් වූද, සුදුසු වූද සනීපාරක්ෂක පහසුකම් ඇති කොට ඒවා පවත්වා ගෙන යා යුතුවත් හැර, ඒවා පිරිසිදුවට ද තැබිය යුතු ය. තවද එකී පහසුකම්වලට ආලෝකය ලබා ගැනීමට ප්‍රබල විධිවිධාන සැලසිය යුතු ය. ස්ත්‍රී පුරුෂ දෙ පක්ෂය ම සේවයෙහි යෙදී සිටින නැතහොත් සේවයට ගැනීමට අදහස් කොට ඇති අවස්ථා වල දී , එක් එක් පක්ෂයට, නියමයෙන් ම වෙන් වූ ඉඩ කඩ එබඳු පහසුකම්වල ඇති විය යුතු ය.

(2) කර්මාන්ත ශාලාවල් සඳහා හෝ යම් වර්ගයකට හෝ විස්තරයකට හෝ වැටෙන කර්මාන්ත ශාලාවක් හෝ සඳහා ප්‍රමාණවත් වූද, සුදුසු වූද විධිවිධාන නිශ්චය කරන නියෝග ඇමතිවරයා විසින් පැන විය හැකි ය.

16. (1) යම් කර්මාන්ත ශාලාවක හෝ යම් පන්තියකට හෝ විස්තරයකට වැටෙන කර්මාන්ත ශාලාවක, පහත දැක්වෙන කරුණු සිදුවී ඇති බව, කොමසාරිස්ට පෙනී ගිය හොත්, ඒ කර්මාන්ත ශාලාවේ හෝ නියමවල සඳහන් කරනු ලැබූ වර්ගයකට හෝ විස්තරයකට වැටෙන කර්මාන්ත ශාලාවක හෝ සේවයෙහි යෙදී සිටින පුද්ගලයන්ගේ හෝ යම් පුද්ගල පන්තියක හෝ ප්‍රථමාධාර දීම නැතහොත් වැලැක්වීමේ ස්වභාවය ඇති යම් වෛද්‍ය ප්‍රතිකාරයක් හැර වෙනත් වෛද්‍ය ප්‍රතිකාරයක් ඇතුළත් නොවූ වෛද්‍ය පරීක්ෂණයක් පැවැත්විය යුතු ලෙසට නියමයන් ඔහු විසින් නිකුත් කළ හැකි ය.

(2) සියළුම කර්මාන්ත ශාලාවල හෝ යම් කිසි වෙන්කොට දක්වනු ලැබූ වර්ගයකට අයත් කර්මාන්තශාලා වල හෝ මේ වගන්තියේ කාර්යය සඳහා කළ යුතු පිළයෙළ කිරීම් සම්බන්ධයෙන් නියෝග ඇමතිවරයා විසින් පැනවිය හැකිය.

## III වෙනි කොටස

## ආරක්ෂාව ( සාමාන්‍ය විධිවිධාන )

ප්‍රධාන යන්ත්‍ර

17. (1) (3) වෙනි උප වගන්තියේ සඳහන් ප්‍රධාන යන්ත්‍ර හැර , වෙනත් ප්‍රධාන යන්ත්‍රයකට නියම ලෙස සම්බන්ධ වූ සෑම මහ රෝදයක් ද, යම් ප්‍රධාන යන්ත්‍රයක සෑම ක්‍රියාකාරී කොටසක් ද , එකී මහ රෝදය හෝ ප්‍රධාන යන්ත්‍රය එන්ජින් ගෘහයක පිහිටා තිබුන ද නො තිබුන ද ප්‍රවේසම් ලෙස ආරක්ෂා කොට තිබිය යුතු ය.

(2) සෑම ජල රෝදයක සහ හරස් ජල රෝදයක ම වතුර පාරෙහි ඉහළ සහ පහළ ප්‍රවේසම් ලෙස ආරක්ෂා කොට තිබිය යුතු ය.

(3) විදුලි ජනක යන්ත්‍රවල, මෝටර්වල සහ භ්‍රමණ පරිවර්තනවල සෑම කොටසක ද ඒවාට නියම ලෙස සම්බන්ධ වූ සෑම මහ රෝදයක් ද ඒ ස්ථානයේ සේවයෙහි යෙදී සිටින හෝ එහි වැඩ කරන සෑම තැනැත්තෙකු ම, ඒවා ප්‍රවේසම් ලෙස ආරක්ෂා කොට තිබුනාක් මෙන් ම, අනතුරක් නො වන පරිදි ඒවා පිහිටුවා නො තිබුනේ නම් , නැතහොත් ගොඩ නගා නොතිබුනේ නම් , ප්‍රවේසම් ලෙස ආරක්ෂා කොට තිබිය යුතුය.

18. (1) ඒ ස්ථානයේ සේවයෙහි යෙදී සිටින හෝ එහි වැඩ කරන සෑම තැනැත්තෙකු ම සංප්‍රේෂක යන්ත්‍රවල සෑම කොටසක් ම ප්‍රවේසම් ලෙස ආරක්ෂා කොට තිබෙන්නාක් මෙන් ම , ඒ යන්ත්‍ර පිහිටා තිබෙන නැතහොත් ගොඩ නගා තිබෙන ආකාරයෙහි ම ආරක්ෂා නොවේ නම්, ඒ යන්ත්‍රවල සෑම කොටසක් ම ප්‍රවේසම් ලෙස ආරක්ෂා කොට තිබිය යුතුය.

(2) වැඩ ගෙන යන සෑම කාමරයක ම හා ස්ථානයක ම, ඒවායේ ඇති සංප්‍රේෂක යන්ත්‍රවලින් අප්‍රමාදව විදුලි බලය කපා හැරීමට පුලුවන් වූ නිවැරදි ව ක්‍රියා කරන උපක්‍රම හා උපකරණ සලස්වා පවත්වා ගෙන යා යුතු ය.

(3) කිසි ම ධාවන පටියක්, පාවිච්චි නොකරන අවස්ථාවක දී, සංප්‍රේෂක යන්ත්‍රයක කොටසක් වූ භ්‍රමණ දණ්ඩකට හේත්තු වී තිබීමට හෝ එය මතු පිට යැමට හෝ ඉඩ නොහැරිය යුතු ය.

(4) සංප්‍රේෂක යන්ත්‍රවල කොටසක් වූ ස්ථිර වූද , බුරුල් වූද කප්පිවලට සහ කප්පි වලින් ධාවන පටි ගමන් කරවීම සඳහා සුදුසු ස්ට්‍රයිකින් ගියර හෝ වෙනත් නො වරදින සුලු යාන්ත්‍රික උපකරණ සපයා ඒවා පාවිච්චි කළ යුතු ය. තවද එබඳු ගියරයක් හෝ උපකරණයක්, ධාවන පටිය ස්ථිර කප්පියට නැවත යෑම වැලැක්වෙන පරිදි සෑදීම තැබීම හා පවත්වා ගෙන යාම කළ යුතු ය.

(5) ඉහත සඳහන් උප වගන්ති තුනෙන් දැක්වෙන යම් නියමයක් ඉෂ්ට කිරීම විශේෂ කරුණු නිසා අනවශ්‍ය බව හෝ ක්‍රියාත්මක නො වන බව හෝ කොමසාරිස්ට ඒත්තු ගිය විට , එබඳු අවස්ථාවලට ඒ නියම අදාළ නො විය යුතු බව ආඥාවකින් ඔහුට නියම කළ හැකි ය.

19. (1) ප්‍රධාන යන්ත්‍ර සහ සංප්‍රේෂක යන්ත්‍ර නො වන යන්ත්‍රයක සෑම අන්තරාය දායක කොටසක් ම ප්‍රවේසම් ලෙස ආරක්ෂා කොට තැබිය යුතු ය. එම ස්ථානයේ සේවයෙහි යෙදී සිටින නැතහොත් එහි වැඩ කරන සෑම තැනැත්තෙක් ම, ඒ කොටස ප්‍රවේසම් ලෙස ආරක්ෂා කොට තිබෙන පරිද්දෙන් ම , එය පිහිටීම නැතහොත් එහි සෑදීම නිසා ආරක්ෂා වෙයි නම්, කලින් කී ලෙස එය ආරක්ෂා කොට තැබීම අවශ්‍ය නො විය යුතු ය. එසේ ද වුවත්, යම් යන්ත්‍රයක අන්තරාදායක කොටසක ආරක්ෂාව සැලසීම එය ක්‍රියා කරවන පිලිවෙල නිසා ස්ථිර ආරක්ෂක උපකරණයකින් නොහැකි වේ නම්, එය ක්‍රියා කරවන්නා ඒ කොටස හා

හැප්පීම වලක්වන ඉබේ ක්‍රියා කරන උපක්‍රමයක් සැපයීම , මේ උප වගන්තියේ නියම ඉෂ්ට කළ ලෙස සැලකිය යුතු ය.

(2) ඕනෑ ම වර්ගයක යන්ත්‍ර සම්බන්ධයෙන් පාවිච්චි කිරීමට සුදුසු වූද, පහත දැක්වෙන කටයුතු කරන්නා වූද ඕනෑ ම වර්ගයක හෝ විස්තරයක ආරක්ෂක උපක්‍රම ඇති බව ඇමතිවරයාට ඒත්තු ගිය අවස්ථාවක දී, නියෝගවල දක්වා තිබෙන යන්ත්‍ර වර්ග සම්බන්ධයෙන් එම වර්ගයේ හෝ විස්තරයේ උපක්‍රම පාවිච්චි කිරීම නියම කරන නියොග ඇමතිවරයා විසින් පැනවිය හැකි ය.

එකී කටයුතු නම් --

(අ) යන්ත්‍රය ක්‍රියාකාරී ව තිබිය දී ම , යන්ත්‍රයෙන් අන්තරාය දායක කොටසක් අනාවරණය වීම වැලැක්වීම ; හෝ

(ආ) අන්තරායක් වූ අවස්ථාවක දී යන්ත්‍රය නැවැත්වීම ද වේ.

තවද මේ උප වගන්තිය කඩ කිරිම සම්බන්ධයෙන් ඇතිවුන නීති කෘත්‍යයකදී, ඒ කඩ කිරීම සිදු වී ය යි සලකනු ලබන යන්ත්‍රය සම්බන්ධයෙන් ඉහතකී උපක්‍රමයට තරමක් දුරට සමාන වූ බලයක් ඇති උපක්‍රමයක් පාවිච්චි කරනු ලැබූ බව සඳහන් කිරීම නිදහසට ප්‍රමාණවත් විය යුතු ය.

(3) ලියවන පට්ටලයක කඳ කඩෙහි යම් කොටසක් ශීර්ෂ දණ්ඩෙන් නෙරා සිටින විට ඒ ස්ථානයේ සේවයෙහි යොදා ඇති හෝ වැඩ කරන සෑම තැනැත්තෙකුට අනතුරු රහිත වන ලෙස ආරක්ෂා කොට තැබිය යුතු ය.

යන්ත්‍රයක් සම්බන්ධයෙන් හෝ යන්ත්‍රයකි පාවිච්චි කරනු ලැබූ යම් නිපදවීමේ ක්‍රමයක් සම්බන්ධයෙන් හෝ , යන්ත්‍රය ක්‍රියාකාරී ව පවතින විට අන්තරාදායක වූ ද්‍රව්‍ය හෝ උපකරණ ආරක්ෂා සහිත ව තබා ගත යුතු බව නියම කරන නියෝග ඇමතිවරයා විසින් පැනවිය හැකි ය.

ආරක්ෂා කරනු නොලැබූ යන්ත්‍ර පිළිබඳ විධිවිධාන

20. යම් යන්ත්‍රයක කොටසක් ප්‍රවේසම් ලෙස ආරක්ෂා කොට තිබෙන්නක් ලෙස ම එහි පිහිටීමේ හෝ එය සෑදීමේ හෝ අන්දම නිසා ඒ ස්ථානයේ සේවයෙහි යෙදී සිටින නැතහොත් එහි වැඩ කරන සෑම තැනැත්තෙකුට ම, මෙම කොටසෙහි ඉහත දැක්වුනු විධිවිධානවල කාර්ය සඳහා, ප්‍රවේසම් සහිත ද යන්න නිශ්චය කිරීම සඳහා පහත සඳහන් අය ගණනට නොගත යුතු ය.

එනම් ---

(අ) යන්ත්‍රයක යම් කොටසක් ක්‍රියාකාරී ව පවතින විට ම , කිරීමට අවශ්‍ය වූ යම් පරීක්ෂණයක්, තෙල් දැමීමක් හෝ හරි ගැස්සීමක් හෝ වන්නා වූ ඒ කොටස ක්‍රියාකාරී ව පවතිද්දී ම, යම් පරීක්ෂණයක් හෝ එබඳු පරීක්ෂණයකින් වහා ම අවශ්‍ය බව පෙනී යාමක් අනුව වූ තෙල් දැමීමක් හෝ හරිගැස්සීමක් හෝ කරන කිසි තැනැත්තෙක් ; හා

(ආ) ඇමතිවරයා විසින් පනවනු ලැබූ නියෝගවල දැක්වෙන යම් නිපදවීමේ ක්‍රමයක පාවිච්චි කරනු ලැබූ සංප්‍රේෂක යන්ත්‍රවල කොටසක් සම්බන්ධයෙන් නම් , ඒ නිපදවීමේ ක්‍රමයෙහි නොනවත්වා ගෙන යාමේ ස්වභාවය නිසා ඒ කොටස නැවැත්වීම ඒ ක්‍රමය ගෙන යාමට තදබල ලෙස බාධාවක් වන නිසා, නියෝගවල සඳහන් පිළිවෙළට හෝ අවස්ථාවල දී යම් තෙල් දැමීමක් හෝ සවිකිරීමක් හෝ පටි මාරු කිරීමක් ගෙන යන කිසි තැනැත්තෙක් ද වේ.

එ සේ ද වුවත්, ඇමතිවරයා විසින් පනවනු ලැබූ නියෝගවල දැක්වෙන පරිදි, අවුරුදු දහ අටක් වයස සම්පූර්ණ වූ පිරිමින් විසින් ඒ පරීක්ෂණය , තෙල් දැමීම හෝ වෙනත් කටයුතු කරනු ලැබූ විට ද එසේ සඳහන් කරනු ලැබූ වෙනත් සියලු ම කොන්දේසි ඉෂ්ට කරනු ලැබූ විට ද පමණක් මේ වගන්තිය අදාළ විය යුතු ය.

ආරක්ෂා කිරීම, ගොඩ නැංවීම හා පවත්වා ගෙන යාම

21. මේ කොටසෙහි ඉහතකී විධිවිධාන ප්‍රකාර සලස්වනු ලැබූ සියලු ම ආරක්ෂා කිරීම් හා වෙනත් රැකවල් ස්ථිර ලෙස ගොඩනංවා , එසේ ආරක්ෂා කළ යුතු නැතහොත් රැකවල් තැබිය යුතු කොටස් ක්‍රියාකාරී ව පවත්නා තාක් හා ඒවා පාවිච්චියට ගන්නා තාක් නිසි ආකාර තබා පවත්වා ගෙන යා යුතු ය. ඒ කොටස් පරීක්ෂණය සඳහා ද, එකී පරීක්ෂණයෙන් වහා ම අවශ්‍ය ලෙස පෙනී යාම නිසා කළ යුතු යම් තෙල් දැමීමක් හෝ හරි ගැස්වීමක් හෝ සඳහා ද වුවමනාවෙන් ම අනාවරණය කළ අවස්ථාවක දී ද ඇමතිවරයා විසින් පනවනු ලැබූ නියෝගවල සඳහන් සියලු ම කොන්දේසි ඉෂ්ට කරනු ලැබූ විට ද කලින් කී ලෙස එම කොටස් ආරක්ෂා කොට තැබිය යුතු නො විය යුතු ය.

22. (1) කර්මාන්ත ශාලාවක, යාන්ත්‍රික බලයකින් දුවවීමට අදහස් කරනු ලබන, යම් යාන්ත්‍රයක් සම්බන්ධයෙන් ---

(අ) යම් භ්‍රමණ දණ්ඩක, ඉද්දක, රෝදයක හෝ කුඩා දැති රෝදයක සෑම ඉස්කුරුප්පුවක් ම අගුලක් ම , යතුරක් ම අනතුරු වැලැක්වීම සඳහා යටට ගිල්විය යුතු යත වසා තැබිය යුතු ය නැතහොත් ප්‍රබල ලෙස ආරක්ෂා කළ යුතුය.

(ආ) ක්‍රියාකාරී ව තිබිය දී ම නැවත නැවත හරි ගැස්සීම වුවමනා නො වන සියලු ම දැති රෝද ද වෙනත් දත් සහිත වූ හෝ ඝර්ෂණ සහිත වූ දැති රෝද ද සම්පූර්ණයෙන් ම වසා තිබෙන ආකාරයට ආරක්ෂා සහිත වන ලෙස පිහිටා නැති අවස්ථාවල දී ඒවා සම්පූර්ණයෙන් ම වසා තැබිය යුතු ය.

(2) යාන්ත්‍රික හෝ විදුලි බලයෙන් ක්‍රියාකරවීමට අදහස් කරනු ලබන්නා වූ ද මේ වගන්තියේ නියමයනට අනුකූල නොවන්නා වූ ද යම් යන්ත්‍රයක් ශ්‍රී ලංකාවේ කර්මාන්තශාලාවක පාවිච්චිය සඳහා ආනයනය කරන්නා වූ හෝ විකුණන්නා වූ හෝ කුලියට දෙන්නා වූ හෝ ආනයනකරුගේ , විකුණන්නාගේ හෝ කුලියට දෙන්නාගේ නියෝජිත වශයෙන් ආනයනය කිරීමට, විකිණීමට හෝ කුලියට දීමට සලසන්නා වූ යම් තැනැත්තෙක් වරදකරුවකු වන අතර , රුපියල් පනස් දහසකට නොවැඩි දඩයකට ඔහු යටත් වන්නේ ය. ”

(3) මේ ආඥාපනතෙහි හෝ මේ ආඥාපනතෙහි නියෝගවල සඳහන් පරිදි, මේ පනත යටතේ පනවනු ලැබූ නියෝගයක හෝ නියමයන් අනුව නොවූ යන්ත්‍රවලට හෝ යන්ත්‍රෝපකරණ වලට හෝ ඉහත දැක්වුනු උප වගන්තියේ විධිවිධාන නියෝග මගින් ඇමතිවරයා විසින් අදාළ කළ හැකි ය. තවද මේ උප වගන්තිය යටතේ පනවනු ලැබූ යම් නියෝග සඳහන් කරනු ලැබූ නිපදවීම් ක්‍රමයක යන්ත්‍රවලට හෝ යන්ත්‍රෝපකරණවලට, සම්බන්ධය ඇති විය හැකි ය.

(4) නියමිත දිනට පෙර සාදනු ලැබූ යන්ත්‍රයකට මේ වගන්තියේ කිසිවක් අදාල නො විය යුතු ය . එසේ ම නියෝග පැනවීමට පෙර සාදනු ලැබූ යන්ත්‍රවලට හෝ යන්ත්‍රෝපකරණවලට මේ වගන්තිය යටතේ පනවනු ලැබූ කිසි ම නියෝගයක් අදාළ නො විය යුතු ය.

23. (1) යාබද බිමෙහි සිට හෝ තට්ටුව සිට හෝ අඩි තුනකට වඩා අඩු අයිනක් ඇති සෑම සවි කරනු ලැබූ යාත්‍රාවක , ගොඩනැගිල්ලක, ලෝහාශයක හෝ වලක, යම් දවන, කාවදින හෝ වසවූ දියාරු ද්‍රව්‍යයක් ඇතුළත් වේ නම් , ඒ යාත්‍රාව, ගොඩනැගිල්ල, ලෝහාශය හෝ වල ප්‍රවේසම් ලෙස නැතහොත් යටත් පිරිසෙයින් ඒවායේ උසට ප්‍රවේසම් ලෙස ආරක්ෂා කළ යුතු ය. නැතහොත් එම කටයුත්තෙහි ස්වභාවය නිසා එකී උසට වැසීම හෝ ආරක්ෂා කිරීම කළ නො හැකි නම් එකී යාත්‍රාවට, ගොඩනැගිල්ලට, ලෝහාශයට හෝ වලට යමකු වැටීම වලක්වනු පිණිස, වැසීමට, ආරක්ෂා කිරීමට හෝ වෙනත් ක්‍රමයක් අනුගමනය කිරීමට , හැකි තරම් දුරට විධිවිධාන සැලැස්විය යුතු ය.

1976 අංක 12 , 5 (2) සවි කරනු ලැබූ භාජනයක, ඉදිකිරීමක, තෙල්දෙණක හෝ වළක යම් දවන, පීඩාකාර හෝ විෂ සහිත ද්‍රවයක් තිබෙන, එහෙත් එය සුරක්ෂිත ලෙස ආවරණය කර නොමැති අවස්ථාවක එයට ඉහළින් හෝ හරහට ---

(අ) පළලින් අඩු ම වශයෙන් අඟල් දහ අටක් නොවූ, හා

(ආ) දෙපැත්තෙහි, අඩු ම වශයෙන් අඩි තුනක් උසට සුරක්ෂිත වැටක් නොමැති සහ සුරක්ෂිත ලෙස සවිකර නොමැති

කිසි ම ඉණිමගක්, තරප්පුවක් හෝ අන්තර මාර්ගයක් නොතැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තියෙහි සඳහන් පරිදි වූ යම් භාජන ,
1976 අංක 12 , 5 ඉදිකිරීම්, තෙල් දෙණ හෝ වළවල් එකිනෙකට යාව ඇති විට ඒවා අතර ගඩොල්වලින් හෝ වෙනත් නිර්මාණයකින් වටකොට නොමැති ඉඩ ප්‍රමාණය පළලින් අඟල් දහ අටකට අඩුවන හෝ දෙපැත්තෙහි ම අඩු ම වශයෙන් අඩි තුනක් උසට සුරක්ෂිතව වැටක් නොමැති වන කල් හි ඒවා අතරින් යාම වළකින පරිද්දෙන් සුරක්ෂිත බාධක පිහිටවිය යුතු ය.

(4) ඉණිමඟකට, තරප්පුවකට හෝ අන්තර් මාර්ගයකට තහඩු
1976 අංක 12 , 5 වැටක් හෝ ඉම් පුවරු සහිතව ඉහළ සහ පහළ ඇන්දක් සවිකර ඇත්නම් මිස, මේ වගන්තියේ කාර්යය සඳහා එය වැටකින් සුරක්ෂිත කර ඇති ලෙස සලකනු නොලැබේ.

(5) (අ) අමාත්‍යවරයා විසින් නියෝග මගින් මේ වගන්තියේ විධිවිධානවලින් යමක් --

(i) සවි කරනු නොලැබූ භාජනයකට හෝ
1976 අංක 12 , 5 ඉදිකිරීමකට; හෝ

(ii) ද්‍රවයක් නොවන ද්‍රව්‍යයක් අඩංගු භාජනයකට , ඉදිකිරීමකට, තෙල් දෙණකට හෝ වළකට

ව්‍යාප්ත කරනු ලැබිය හැකිය.

(ආ) " දවන " යන යෙදුම, මේ උපවගන්තියේ (අ) (ii) වන ඡේදය යටතේ සාදන ලද යම් නියෝගයක, ද්‍රවයක් නොවන යම් ද්‍රව්‍යයක් සම්බන්ධයෙන් යෙදෙන විට , දැවෙන්නට ඉඩ තිබෙන යන්න ඉන් අදහස් වේ.

(6) මේ වගන්තියේ නියමයන් අවශ්‍ය නොවන බවට හෝ
1976 අංක 12 , 5 නුසුදුසු බවට තමා සෑහීමට පත් වන යම් පන්තියක භාජනයක් , ඉදිකිරීමක්, තෙල් දෙණක් හෝ වළක් ඒ නියමයන්ගෙන් නිදහස් කිරීම, ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු තැන විසින් නියමයක් මගින් කළ හැකිය.

ස්වයංකාරී යන්ත්‍ර

24. මේ උප වගන්තිය අදාළ වන යම් කර්මාන්ත ශාලාවක හෝ ඉන් කොටසක, යම් ස්වයංකාරී යන්ත්‍රයක කිසි ම හරහට දිවෙන කොටසක් ද එහි ගෙන යන කිසි ම ද්‍රව්‍යයක් ද, එය දිවෙන මාර්ගය, තම සේවය ඉෂ්ට කිරීමේ දී හෝ වෙනත් කටයුත්තක දී යම් තැනැත්තකු එහා මෙහා යන මාර්ගයක් නම්, ඒ කොටස පිටතට හෝ ඇතුළට දිවෙන විට, යන්ත්‍රයේ කොටසක් නොවූ යම් ස්ථිර ගොඩනැගිල්ලක සිට අඟල් දහ අටක දුර ප්‍රමාණය ඇතුළත, දිවීමට ඉඩ නො දිය යුතු ය.

එසේ ද වුවත්, යම් ස්වයංකාරී නූල් කටින යන්ත්‍රයක හරහට දිවෙන කොටස වෙනත් එබඳු ම යන්ත්‍රයක ඉස්සරහ මීටෙහි යම් කොටසක සිට අඟල් දොළහක දුර තැනකට දිවීම මේ උප වගන්තියේ කිසිවකින් බාධාවක් නො විය යුතු ය.

(2) (අ) නියමිත දිනට පසුව නැවත පිහිටවනු ලැබූ යම් කර්මාන්ත ශාලාවකට හෝ ඉන් කොටසකට ද,

(ආ) නියමිත දිනට පසු කර්මාන්ත ශාලාවකට කරනු ලැබූ දීර්ඝ කිරීමකට හෝ එකතු කිරීමකට ද

(1) වෙනි උප වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

(3) සේවයෙහි යොදවනු ලැබූ කිසිම තැනැත්තකු ස්වයංකාරී නූල් කටින යන්ත්‍රයක දිවෙන කොටස් හා ඇතුළට දිවීමෙහි දී දිවෙන කොටස දිසාවට යන යන්ත්‍රයේ ස්ථිර කොටස අතර, පිටතට දිවිමෙහි දී දිවෙන කොටස සමග යන්ත්‍රය නැවැත්වූ විට හැර, අන් කිසිම වේලාවක දී නො සිටින ලෙස වග බලා ගැනීමට ඒ යන්ත්‍රය භාර ව සිටින තැනැත්තාට උපදෙස් දීමෙන් හා වෙනත් පිළිවෙළකින් කළ හැකි, සියලු ම විධිවිධාන සැලැස්විය යුතු ය.

(4) ප්‍රධාන පරීක්ෂකගේ නිර්දේශ ප්‍රකාර ආරක්ෂක විධිවිධාන සලසනු ලැබූ නැතහොත් රැකවල් කරනු ලැබූ යම් කර්මාන්ත ශාලාවක් හෝ කර්මාන්ත ශාලා වර්ගයක් ලේකම් විසින් මේ වගන්තිය ක්‍රියාවේ යෙදවීමෙන් නිදහස් කළ හැකි ය.

ස්ත්‍රීන් සහ බාල තැනැත්තන් ලවා යන්ත්‍ර පිරිසිදු කරවීම

25. ප්‍රධාන යන්ත්‍රය හෝ සංප්‍රේෂක යන්ත්‍ර ක්‍රියාකාරී ව තිබියදී ම සංප්‍රෙෂක යන්ත්‍රයෙහි ප්‍රධාන යන්ත්‍රයක යම් කොටසක් ස්ත්‍රියක විසින් හෝ බාල තැනැත්තකු විසින් හෝ පිරිසිදු නො කළ යුතු ය . තවද යම් යන්ත්‍රයක හෝ එය අසල ඇති යන්ත්‍රයක හෝ වැඩ කරන කොටසකින් අන්තරායක් වීමට , ඒවා පිරිසිදු කිරීමෙන් ඉඩක් ලැබේ නම් , ඒ යන්ත්‍රයෙහි යම් කොටසක් ඉහතකී අය විසින් පිරිසිදු නො කළ යුතු ය.

අන්තරායදායක යන්ත්‍රවල වැඩ කරන බාල තැනැත්තන් පුහුණු කිරීම හා ඔවුන් පරීක්ෂා කිරීම

26. (1) යම් බාල තැනැත්තකුට යන්ත්‍රයකින් සිදුවෙන සියලු ම අනතුරු පිළිබඳ ව ද ඒ සඳහා අනුගමනය කළ යුතු ආරක්ෂක ක්‍රම පිළිබඳ ව ද සම්පූර්ණයෙන් ම උපදෙස් නොදී මේ වගන්තිය අදාළ වන කිසි ම යන්ත්‍රයක වැඩ නො කළ යුතු ය. එමෙන් ම එහි වැඩ කිරීමට නම් ---

(අ) ඔහු එකී යන්ත්‍රයේ වැඩ පිළිබඳ ව ප්‍රමාණවත් පුහුණුවක් ලබා ගත යුතු ය. නැතහොත්

(ආ) ඔහු, යන්ත්‍රය පිළිබඳ සම්පූර්ණ දැනුමක් හා පළපුරුද්දක් ඇති තැනැත්තකුගේ ප්‍රමාණවත් පරීක්ෂණයක් යටතේ විය යුතු ය.

(2) තමාගේ අදහස අනු ව, යන්ත්‍ර කොතරම් අන්තරායදායක ස්වභාවයෙන් යුක්ත ද කිවහොත් ඉහත කී නියමයන් ඉෂ්ට නො කොට බාල තැනැත්තන් විසින් ඒවායේ වැඩ නො කළ යුතු බව කොමසාරිස්

තැන විසින් ආඥාවකින් ප්‍රකාශ කරනු ලැබූ විට ඒ යන්ත්‍රවලට මේ වගන්තිය අදාළ වන්නේ ය.

ඔසවන යන්ත්‍ර හා සෝපාන යන්ත්‍ර

27. (1) සෑම ඔසවන යන්ත්‍රයක් හෝ සෝපාන යන්ත්‍රයක් ම යහපත් යාන්ත්‍රික තැනීමෙන් ද ශක්තිමත් ද්‍රව්‍යයෙන් ද ප්‍රමාණවත් ශක්තියෙන් ද යුක්ත විය යුතු ය. තව ද ඒවා නිසි ආකාර පවත්වා ගෙන යා යුතු ය.

(2) සෑම ඔසවන යන්ත්‍රයක් හෝ සෝපාන යන්ත්‍රයක් ම යටත් පිරිසෙයින් මාස දොළහකට එක වරක් වත්සුදුසු තැනැත්තකු විසින් සම්පූර්ණයෙන්ම පරීක්ෂා කළ යුතු ය . නියමිත විස්තර ඇතුළත් කොට, නියමිත ආකෘතියක සකස් කරනු ලැබූ, එබඳු සෑම පරීක්ෂණයකම ප්‍රතිඵල පිළිබඳ වාර්තාවක්, ඒ පරීක්ෂණය කරනු ලැබූ තැනැත්තා විසින් අත්සන් කළ යුතු ය . තවද එය දහ හතර දවසක් ඇතුළත සාමාන්‍ය ලේඛන පොතෙහි ඇතුළත් කළ යුතුය. නැතහොත් එයට ඇමිණිය යුතු ය.

(3) සෑම ඔසවන යන්ත්‍ර වර්ගයක් ම සෝපාන යන්ත්‍ර මාර්ගයක් ම දොරටු සවි කරනු ලැබූ සැලකිය යුතු වූ කොටුවකින් ප්‍රබල ලෙස ආරක්ෂා කොට තිබිය යුතු ය . තවද එකී කොටුව, දොරටු වැසූ විට ඒ මාර්ගයේ යමකු වැටීම හෝ ඒ ඔසවන යන්ත්‍රයේ හෝ සෝපාන යන්ත්‍රයේ ක්‍රියාකාරී කොටසක් සමග යමෙකුගේ හැප්පීම හෝ වැළැක්විය හැකි වුවක් විය යුතු ය.

(4) මැස්ස හෝ තට්ටුව ගොඩබාන ස්ථානයට පැමිණි විට ද දොරටුව වසන තෙක් ඒ මැස්ස හෝ තට්ටුව ගොඩබාන තැනින් ගෙනයාමට නො හැකි විට ද හැර අන් අවස්ථාවලදී, ඒ දොරටුව විවෘත කිරීමට නො හැකි වෙන පරිදි ප්‍රබල පූට්ටුවක් හෝ වෙනත් උපක්‍රමයක් එයට සවි කොට තිබිය යුතු ය.

එසේ ද වුවත්, නියම දිනට පෙර තනනු ලැබූ හෝ නැවත තනනු ලැබුවා වූද, ඉහත කී උපක්‍රම සවිකිරීම කරුණු අනුව නොහැකි වන්නා වූ ද ඔසවන යන්ත්‍රයක් හෝ සෝපාන යන්ත්‍රයක් හෝ සම්බන්ධයෙන් පුළුවන් තරම් දුරට ඉහත කී පරමාර්ථ ඉෂ්ට කර ගැනීමට හැකි යම් පිළිවෙළක් යෙදීම ප්‍රමාණවත් විය යුතු ය . කෙසේ වුව ද මැස්ස හෝ තට්ටුව ගොඩබාන ස්ථානයේ තිබෙන විට දොරටුව වසා සවි කොට තැබිය යුතු ය.

(5) යම් තැනැත්තකුගේ යම් අවයවයක් හෝ ඔසවන යන්ත්‍රයෙහි හෝ සෝපාන යන්ත්‍රයෙහි ගෙන යනු ලැබූ යම් භාණ්ඩ හා ඔසවන යන්ත්‍රයෙහි හෝ සෝපාන යන්ත්‍රයෙහි හෝ කොටසක් හා යම් ස්ථිර ගොඩනැගිල්ලක් අතර හෝ බර සම කිරීමට යොදනු ලැබූ බරක් සහ ඔසවන යන්ත්‍රයේ හෝ සෝපාන යන්ත්‍රයේ කොටසක් අතර , අසු නොවන පරිදි සෑම ඔසවන යන්ත්‍රයක් හෝ සෝපාන යන්ත්‍රයක් ද ඉහත සඳහන් කොටුවක් ද තැබිය යුතු ය.

(6) සෑම ඔසවන යන්ත්‍රයක ම හෝ සෝපාන යන්ත්‍රයක ම , ප්‍රවේසම් ලෙස එයට ගෙන ගිය හැකි වැඩි ම , වැඩ කළ හැකි බර ප්‍රමාණය, ප්‍රකට ලෙස ලකුණු කොට තිබිය යුතු ය. තවද ඒ බරට වැඩි කිසි ම බරක් යම් ඔසවන යන්ත්‍රයක හෝ සෝපාන යන්ත්‍රයක ගෙන නො ගිය යුතු ය.

(7) බඩු සමග හෝ බඩු නැති ව හෝ මිනිසුන් ගෙන යාමට පාවිච්චි කරනු ලැබූ ඔසවන යන්ත්‍රවලට හා සෝපාන යන්ත්‍රවලට පහත දැක්වෙන අතිරේක නියම ද අදාළ විය යුතු ය. එනම් --

(අ) මැස්සේ හෝ තට්ටුවේ වඩා දිවීම වැලැක්වීම සඳහා ප්‍රබල ඉබේ ක්‍රියා කරන උපක්‍රම සලස්වා තිබිය යුතු ය.

(ආ) එක් එක් පාර්ශවයකින් ගොඩ බැසීමක් සලස්වන , ප්‍රවේශයකින් යුත් සෑම මැස්සක් ම දොරටුවක් සවි කොට තිබිය යුතු ය . මිනිසුන් හෝ බඩු මැස්සෙහි ඇති විට දොරටුව නො වසා මැස්ස උස් කිරීමට හෝ පහත් කිරීමට නො හැකි වන ලෙස ද , දොරටුව විවෘත කළ විට එය නවතින ලෙස ද එබඳු සෑම දොරටුවකට ම ප්‍රබල උපක්‍රම පිළියෙල කොට තිබිය යුතු ය . නියමිත දිනට පෙර තනනු ලැබූ හෝ නැවත තනනු ලැබූ ඔසවන යන්ත්‍රයක් හෝ සෝපාන යන්ත්‍රයක් හෝ සම්බන්ධයෙන් ඉහත කියන ලද පරිදි උපක්‍රම පිළියෙළ කිරීමට කරුණු අනුව නොහැකි වූ අවස්ථාවක දී, ඉහත කී පරමාර්ථ ඉෂ්ට වන අන්දමට කළ හැකි තරම් දුරට යම් පිළිවෙළක් සැලැස්වීම ප්‍රමාණවත් විය යුතු ය. එය කෙසේ වුවද, මැස්ස නවත්වා තිබෙන විට හෝ හිස් ව තිබෙන විට හැර අනික් අවස්ථාවල දී දොරටුව වසා සවි කොට තැබිය යුතු ය.

(ඇ) නියමිත දිනෙන් පසු තනනු ලැබූ හෝ නැවත තනනු ලැබූ ඔසවන යන්ත්‍රයක හෝ සෝපාන යන්ත්‍රයක තට්ටුව හෝ මැස්ස එල්වා ඇත්තේ කඹයකින් හෝ දම්වැලකින් හෝ නම්, තට්ටුව හෝ මැස්ස හෝ සමග වෙන් වෙන්ව ම සම්බන්ධ කරනු ලැබූ කඹ හෝ දම් වැල් යටත් පිරිසෙයින් දෙකක්වත් තිබිය යුතු ය. එක් එක් කඹය හෝ දම්වැල සහ එයට සම්බන්ධ කරනු ලැබූ දේවලට තට්ටුවෙහි හෝ මැස්සෙහි සම්පූර්ණ බරද පට වන වැඩි ම බර ප්‍රමාණය ද ගෙන යාමට හැකි විය යුතු ය . කඹ හෝ දම්වැල් හෝ සම්බන්ධ කරනු ලැබූ දෙයක් කඩා යාමේ දී වැඩි ම පටවන බර සමග තට්ටුව හෝ මැස්ස උසුලා සිටීමට හැකි වන පරිදි ප්‍රබල උපක්‍රම යෙදිය යුතු ය.

(8) අඛණ්ඩ ඔසවන යන්ත්‍රයක් හෝ සෝපාන යන්ත්‍රයක් සම්බන්ධයෙන් මේ වගන්තියේ (3) වෙනි උප වගන්තියේ සිට (7) වෙනි උප වගන්තිය දක්වා ( එයත් ඇතුළුව ) අදාළ නොවිය යුතු ය. යාන්ත්‍රික බලයක් සම්බන්ධ කරනු නො ලැබූ ඔසවන යන්ත්‍රයක් හෝ සෝපාන යන්ත්‍රයක් සම්බන්ධයෙන් (4) වෙනි සහ (7) වෙනි උප වගන්ති අදාළ නො විය යුතු ය.

(9) ක්‍රියා කිරීමේ සංවිධානය , මාර්ග දේශක උපකරණයකින් හෝ උපකරණවලින් සීමා කරනු ලැබූ තට්ටුවක් හෝ මැස්සක් නොමැති, කිසි ම සෝපාන යන්ත්‍රයක් හෝ උපකරණයක්, ඔසවන යන්ත්‍රයක් හෝ සෝපාන යන්ත්‍රයක් හෝ ලෙස , මේ වගන්තියේ කාර්ය සඳහා , නො සැලකිය යුතු ය.

(10) යාන්ත්‍රික බලයෙන් හෝ වෙනත් ක්‍රමයකට බඩු හෝ ද්‍රව්‍ය ඉස්සීමට හෝ පහත් කිරීමට පාවිච්චි කරනු ලැබූ සෑම ආම්පන්නයක විවරයක් හෝ ඒ සමාන දොරකඩක් ප්‍රවේශම් ලෙස ආරක්ෂා කළ යුතු ය . ඒ විවරයේ හෝ දොරකඩ සෑම පැත්තකට ම ප්‍රවේශම් සහිත වූ අල්ලා ගැනීමේ උපක්‍රමයක් සලස්වා තිබිය යුතු ය . ආරක්ෂා කිරීම නිසි ලෙස පවත්වාගෙන යා යුතු ය. විවරයේ හෝ දොරකඩ බඩු ඉස්සීම හෝ පහත්

කිරීම හෝ කරන විට හැර අන් අවස්ථාවල දී එය නියම ස්ථානයෙහි තිබිය යුතු ය.

(11) යම් වර්ගයකට හෝ විස්තරයකට හෝ වැටෙන ඔසවන යන්ත්‍ර, සෝපාන යන්ත්‍ර, ඔසවන යන්ත්‍ර මාර්ග, ආම්පන්නයක විවර හෝ ඒ සමාන දොරකඩ පිළිබඳ ව විශේෂ කරුණු නිසා මේ වගන්තියේ නියමයක් ක්‍රියාවේ යෙදවීම යුක්ති සහගත නොවන බව කොමසාරිස්ට ඒත්තු යන පරිදි පෙන්වා දුන් අවස්ථාවක දී ඒ වර්ගයට හෝ විස්තරයට හෝ වැටෙන ඉහත කී දේවල් පිළිබඳ ව ඒ නියම අදාළ නොවන බව ආඥාවකින් ලේකම් විසින් නියම කළ හැකි ය.

28. මිනිසුන් බඩු හා ද්‍රව්‍ය ඉස්සීම හෝ පහත් කිරීමේ කාර්යය සඳහා පාවිච්චි කරනු ලැබූ සෑම දම්වැලක්, කඹයක් හෝ කප්පි උපකරණයක් පිළිබඳ ව පහත දැක්වෙන විධිවිධාන ඉෂ්ට කළ යුතු ය. එනම් --

(අ) යහපත් ලෙස තනනු නොලැබුවා වූද, කල් පවත්නා ද්‍රව්‍ය නුවූ ද, ප්‍රමාණවත් ශක්තියක් නොමැත්තා වූද, පෙනෙන දෝෂවලින් නිදහස් නුවූ ද කිසි ම දම්වැලක්, කඹයක් හෝ කප්පි උපකරණයක් පාවිච්චි නො කළ යුතු ය.

(ආ) අන්තරාය විරහිත ව වැඩ කළ හැකි සෑම වර්ගයක ම බර ප්‍රමාණ ද , පාවිච්චියට ගනු ලබන දම්වැලෙහි කඹයෙහි හෝ කප්පි උපකරණවල ප්‍රමාණය ද කොටස් කීපයකින් යුත් බඩු බාන කඹයක් නම්, වෙනස් පැති වලින් අනතුරු රහිත ව වැඩ කළ හැකි බර ප්‍රමාණය ද දක්වන චක්‍රයක් ස්ථානයේ ප්‍රකට තැන්වල තබා තිබිය යුතු ය . තවද ඒ චක්‍රයෙහි දක්වනු නො ලැබූ කිසි ම දම්වැලක් , කඹයක් හෝ කප්පි උපකරණ පාවිච්චි නො කළ යුතු ය . අනතුරු රහිත ව වැඩ කළ හැකි බර ප්‍රමාණය කප්පි උපකරණවල පැහැදිලි ව ලකුණු කොට තිබේ නම් ඒ සම්බන්ධයෙන් ද වෙනස් පැතිවල අනතුරු රහිත ව වැඩ කළ හැකි බර ප්‍රමාණය කොටස් කීපයකින් යුත් බඩු බාන කඹයක පැහැදිලි ව ලකුණු කොට තිබේ නම් ඒ සම්බන්ධයෙන් ද මේ ඡේදයේ විධිවිධාන අදාළ නො විය යුතු ය.

(ඇ) ඉහත කී චක්‍රයෙහි දක්වනු ලැබූ හෝ ඉහත කී ලෙස ලකුණු කරනු ලැබූ අනතුරු රහිත වැඩ කළ හැකි බර ප්‍රමාණයට වඩා වැඩි බරක් සඳහා කිසිම දම්වැලක් , කඹයක් හෝ කප්පි උපකරණ පාවිච්චි නො කළ යුතු ය.

(ඈ) සෑම කාල සීමාවක දී ම යටත් පිරිසෙයින් හය මාසයකට එක් වරක් හෝ ලේකම් විසින් ආඥාවකින් නියම කළ හැකි පරිදි ඊට වඩා දීර්ඝ කාලයක් අතරතුර හෝ, පාවිච්චි කරනු ලබන සියලු ම දම්වැල් , කඹ හා කප්පි උපකරණ සුදුසු තැනැත්තකු ලවා සම්පූර්ණයෙන් ම පරීක්ෂා කරවා ගත යුතු ය.

(ඉ) සුදුසු තැනැත්තකු විසින් අත්හදා බැලීමක් හා පරීක්ෂණයක් කරනු ලැබූ තැනැත්තා විසින් අත්සන් කරනු ලැබ, අනතුරු රහිත ව වැඩ කළ හැකි බර ප්‍රමාණය දක්වන ඒ අත්හදා බැලීමේ හා පරීක්ෂණයේ සහතිකයක් ලබා නො ගත්තාවූද, ඒ සහතිකය පරීක්ෂා කර බැලීම සඳහා තබා නොමැත්තාවූ ද , කොහුවලින් සාදන ලද

කඹයක් හෝ බඩු බාන කඹයක් හෝ නො වන කිසි ම දම්වැලක්, කඹයක් හෝ කප්පි උපකරණයක් පළමු වතාවට කිසි ම කර්මාන්ත ශාලාවක පාවිච්චියට නො ගත යුතු ය.

(ඊ) අලාභ හානියක් නො වන පරිදි රත් කිරීමකට භාජන නො කළ හැකි ද්‍රව්‍යවලින් සාදා තිබීම හෝ තනා තිබෙන්නේ එවැනි අන්දමකට වීම හෝ ( නැතහොත් පණ පෙවීම හැර) තමා විසින් අනුමත කරනු ලැබූ වෙනත් රත් කිරීමකට භාජන කරනු ලැබීම යන කරුණු උඩ ප්‍රධාන පරීක්ෂකයා විසින් සහතික පත්‍රයකින් නිදහස් කරනු ලැබූ වර්ගයක හෝ විස්තරයක, දම්වැලක් හා කප්පි උපකරණයක් ද, බඩු බාන කඹයක් ද හැර වෙනත් සියලු ම දම්වැල් හා කප්පි උපකරණ සෑම දහහතර මාසයක කාලයක දී ම යටත් පිරිසෙයින් එක් වරක්වත් , අඟල් භාගයක් මහතැති හෝ ඊට කුඩා දම්වැල් හෝ බඩු බාන කඹ හෝ උණු කරපු ලෝහ හෝ උණු කරපු ලෝහ බොර පිළිබඳ ව පාවිච්චි කරනු ලැබූ දම්වැල් හෝ සම්බන්ධයෙන් සෑම හය මාසයක කාලයකට ම යටත් පිරිසෙයින් එක් වරක්වත් පණ පෙවිය යුතු ය. තවද නියම ලෙස පාවිච්චි නො කරන දම්වැල් හෝ කප්පි උපකරණ සම්බන්ධයෙන් අවශ්‍ය වූ විටක පණක් ඒවාට පණ පෙවිය යුතු ය.

(උ) කොහු කෙඳිවලින් සාදනු ලැබූ බඩුබාන කඹ හැර අන් සියළුම දම්වැල් කඹ හා කප්පි උපකරණ සම්බන්ධයෙන් නියම විස්තර ඇතුලත් කරනු ලැබූ ලේඛන පොතක් තැබිය යුතු ය.

(2) මේ වගන්තියෙහි " කප්පි උපකරණ " පාඨයෙන් බඩු බාන දම්වැල්, බඩු බාන කඹ, චක්‍ර, කොකු, යදම් හා කර කැවෙන වළලු අදහස් කෙරෙයි.

(3) යම් කිසි වර්ගයකට හෝ විස්තරයකට වැටෙන දම්වැල්, කඹ හා කප්පි උපකරණ සම්බන්ධයෙන් (1) මෙහි උපවගන්තියේ සියලු ම විධිවිධාන හෝ ඉන් යමක් ක්‍රියාවේ යෙදවීම විශේෂ කරුණු නිසා යුක්ති සහගත නොවේ යයි ලේකම්ට ඒත්තු යන පරිදි ඔප්පු කළ අවස්ථාවක දී , ඒ විධිවිධාන ඉහත කී වර්ගයේ හෝ විස්තරයේ දේ සම්බන්ධයෙන් ක්‍රියාවේ නො යොදන ලෙස ලේකම් විසින් ආඥාවකින් නියම කළ හැකි ය.

29. (1) නැංගුරම් දමන හා සවි කරන උපකරණ ඇතුළුව, සවි කරනු ලැබූ හෝ නො ලැබූ, සෝපාන යන්ත්‍රයක සියලු ම කොටස් හා වැඩ කරන ගියර, පලුදු නැති ද්‍රව්‍ය වලින් ප්‍රමාණවත් ශක්තියකින් යුක්ත ව පෙනෙන දෝෂවලින් නිදහස් ව යහපත් ලෙස තනා තිබිය යුතු ය . තවද ඒවා නිසි ලෙස පවත්වා ගෙන යා යුතු ය.

(2) ඉහත කී සියලුම කොටස් හා ගියර සෑම දහ හතර මාසයක කාලයක දී යටත් පිරිසෙයින් එක් වරක්වත් සුදුසු තැනැත්තකු ලවා සම්පූර්ණයෙන් ම පරීක්ෂා කරවිය යුතු ය . සෑම පරීක්ෂණයක ම නියමිත විස්තරය ඇතුළත් ලේඛන පොතක් තැබිය යුතු ය.

(3) දුවන දොඹකරයක් ගමන් කරන සියලු ම යකඩ පීලි ද , බඩු ගෙන යන වාහනයක හෝ රෝද සහිත වාහනයක හෝ රථය ගමන් කරන පාර ද සුදුසු ප්‍රමාණයක ප්‍රමාණවත් ශක්තියකින් යුක්ත විය යුතු ය . තවද පීලි සහ පාර මතුපිට සෑම තැන ම එක සේ සමතලාව තිබිය යුතු ය . ඒ යකඩ පීලි හෝ පාර නිසි ලෙස සකස් කොට ප්‍රමාණවත් ලෙස ඒවාට ශක්තිය දිය යුතු ය. නැතහොත් ඒවා සවි කොට තිබිය යුතු ය. තවද ඒවා නිසි ලෙස පවත්වා ගෙන යා යුතු ය.

(4) නෙරා සිටින කොටස උස් කිරීමෙන් හෝ පහත් කිරීමෙන් අනතුරු රහිත ව වැඩ කළ හැකි බර ප්‍රමාණය වෙනස් කළ හැකි ලෙස තනනු ලැබූ දොඹකරයක් සම්බන්ධයෙන් හැර සෑම සෝපාන යන්ත්‍රයක ම අනතුරු රහිතව වැඩ කළ හැකි බර ප්‍රමාණය ඉබේ දැක්වෙන්නක් හෝ දොඹකරයෙහි නෙරා සිටින කොටසෙහි අනුරූප නැමීම අනු ව හෝ බරෙහි අනුරූප අර අනුව හෝ අනතුරු රහිත ව වැඩ කළ හැකි බර දැක්වෙන චක්‍රයක් එයට අමුණා තිබිය යුතු ය.

(5) පරීක්ෂණයක් සඳහා හැර අන් කිසි ම අවස්ථාවක දී, ඉහත කී උප වගන්තිය යටතේ ලකුණු කරනු ලැබූ හෝ පෙන්වනු ලැබූ අනතුරු රහිත ව වැඩ කළ හැකි බර ප්‍රමාණයට වඩා බරක් කිසිම සෝපාන යන්ත්‍රයක නො පැටවිය යුතුය.

(6) සුදුසු තැනැත්තකු විසින් අත්හදා බලනු නො ලැබුවාවූ ද , මේ වගන්තියේ (1) වෙනි උපවගන්තියේ සඳහන් පරිදි යන්ත්‍රයේ සියලු ම කොටස් හා වැඩ කරන ගියර පරීක්ෂා කරනු නොලැබුවාවූ ද , එ සේ ම යන්ත්‍රයේ අනතුරු රහිතව වැඩ කළ හැකි බර ප්‍රමාණය හෝ බර ප්‍රමාණ දක්වන, ඒ අත්හදා බැලීම හා පරීක්ෂණය කරනු ලැබූ තැනැත්තා විසින් අත්සන් කරනු ලැබූ එම අත්හදා බැලීම හා පරීක්ෂණය පිළිබඳ සහතිකයක් ලබා නොගන්නා වූ ද එකී සහතිකය පරීක්ෂණය සඳහා තබා නොමැත්තා වූ ද කිසි ම සෝපාන යන්ත්‍රයක් පළමු වරට කර්මාන්ත ශාලාවක පාවිච්චියට නො ගත යුතු ය.

(7) උඩින් ගමන් කරන දොඹකරයක රෝද පාරෙහි හෝ ඊට නුදුරුව හෝ දොඹකරය වැදෙන හැකි තැනක යම් තැනැත්තකු සේවයෙහි යෙදී සිටින්නේ නම් නැතහොත් වැඩ කරන්නේ නම් , ඒ ස්ථානයේ සිට අඩි විස්සක් ඇතුළතට ඒ දොඹකරය ළගා නොවන ලෙස , දොඹකරය පදවන්නාට කලින් දැනුම් දීමෙන් හෝ වෙනත් ක්‍රමයකට ප්‍රබල විධිවිධාන සැලැස්විය යුතු ය.

(8) මේ වගන්තියේ ‘‘ සෝපාන යන්ත්‍රය ’’ යන පාඨයෙහි දොඹකරයක්, බර උස්සන යන්ත්‍රයක්, තද කරන උපකරණයක්, වෙනත් එවැනි ආම්පන්නයක්, කප්පියක් කප්පි කීපයක් එක් තොට සෑදූ උපකරණයක් බඩු ගෙන යන වාහනයක හෝ රෝද සහිත වාහනයක් අදහස් කෙරෙයි.

බිම්, ප්‍රවේශ හා පඩි පෙළවල් තැනීම හා පවත්වා ගෙන යාම

30. (1) සියලු ම බිම්, පඩි, පඩි පෙළවල්, ප්‍රවේශ හා මාර්ග යහපත් ලෙස තනා තිබිය යුතුවාක් මෙන් ම ඒවා නිසි ලෙස පවත්වාගෙන යා යුතුය.

(2) ගොඩනැගිල්ලක ඇති සෑම පඩි පෙළකට ම හෝ ගොඩනැගිල්ලකින් පිටවීමට ඇති මාර්ගයකට ම ශක්තිමත් අත්වැලක් සපයා පවත්වා ගෙන යා යුතු ය. පඩි පෙළෙහි ඇරුණු පැත්තක් වෙතොත් අත්වැල ඒ පැත්තෙහි විය යුතු ය . පඩි පෙළට ඇරුණු පැති දෙකක් වූ විටක, නැතහොත් නැගීමෙහි ස්වභාවය නිසා හෝ පඩිවල මතු පැත්තෙහි

තත්වය නිසා හෝ වෙනත් විශේෂ කරුණු නිසා හෝ පඩි පෙළ නිසා අනතුරු විය හැකි වූ විටක එබඳු අත්වැලක් දෙපැත්තෙහි ම සවි කොට පවත්වා ගෙන යා යුතු ය . පඩි පෙළක ඇරුණු පැත්තක්, පහතින් අත්වැලක් හෝ වෙනත් ප්‍රබල ක්‍රමයක් සැලසීමෙන් හා පවත්වා ගෙන යාමෙන් ආරක්ෂා කළ යුතු ය.

(3) වැඩෙහි ස්වභාවය නිසා ආරක්ෂා කිරීම ක්‍රියාවෙහි යෙදවිය නොහැකි විට හැර අන් සෑම අවස්ථාවලදී ම , බිමෙහි වූ සියලුම විවර ප්‍රවේසම් ලෙස ආරක්ෂා කළ යුතු ය.

(4) සියලු ම හිණි මං ශක්තිමත් ලෙස තනවා නිසි ලෙස පවත්වාගෙන යා යුතු ය.

ප්‍රවේසම් සහිත වූ ප්‍රවේශය හා ප්‍රවේසම් සහිත වූ වැඩ කරන ස්ථානය

31. (1) යම් තැනැත්තකු යම් වේලාවක දී වැඩ කරන සෑම ස්ථානයකට ම ප්‍රවේසම් සහිත වූ ප්‍රවේශයක් යුක්ති සහගත ව සපයා දිය හැකි නම්, එසේ සපයා දී එය පවත්වා ගෙන යා යුතු ය.

1976 අංක 12 , 6

(2) යම් තැනැත්තකු අඩි හයකට වැඩි උසක සිට වැටීමට ඉඩ ඇති ස්ථානයක වැඩ කළ යුතු අවස්ථාවක, එම ස්ථානය සුරක්ෂිත පා රඳනයක් සහ අවශ්‍ය නම් සුරක්ෂිත අත්වැලක් සපයා ඇති ස්ථානයක් වන්නේ නම් මිස, කොටු කිරීමෙන් හෝ වෙනත් ආකාරයකින් සාධාරණ ව කළ හැකිතාක් පමණින් එම තැනැත්තාගේ ආරක්ෂාව සැලසීම පිණිස එම ස්ථානයෙහි විධි විධාන සලසා තිබිය යුතු ය. ”.

32. (1) මිනිසුන්ට හුස්ම ගැනීම අපහසු වන තරම් අන්තරායදායක දුමාරය, විස ද්‍රව්‍ය හෝ හානිකර ද්‍රව තිබීම හෝ අම්ලකර ඌනතාවක් ඇතිවීමට ඉඩ ඇති යම් කාමරයක්, ටැංකියක්, ලොකු පීප්පයක්, වළක්, නළයක්, දුම් නළයක් හෝ එවැනි සීමිත ඉඩ ප්‍රමාණයක් ඇතුළත වැඩ කිරීමට ඇති අවස්ථාවක --

(අ) එයින් පිටවීමට ප්‍රමාණවත් මාර්ගයක් සලසා ඇත්තේ නම් මිස, හැඩයෙන් ඍජුකෝණාශ්‍රාකාර, අණ්ඩාකාර හෝ වෘත්තාකාර වූ ද දිගින් අගල් දහ අටකට හා පළලින් අගල් දහසයකට හෝ ( වෘත්තාකාර නම් ) විෂ්කම්භයෙන් අගල් දහ අටකට නො අඩු වූදටැංකි වැගන් රථයක හෝ වෙනත් ජංගම යන්ත්‍ර කට්ටලයක නම් දිගින් අගල් දහසයකට හා පළලින් අගල් දහහතරකට හෝ (වෘත්තාකාර නම්) විෂ්කම්භයෙන් අගල් දහසයකට නොඅඩු මිනිස් කවාටයක් ඒ සීමිත ඉඩ ප්‍රමාණයෙහි සාදා තිබිය යුතු ය ; තවද,

(ආ) පහත සඳහන් නියමයන් පිළිපදිනු ලැබ ඇත්තේ නම් මිස , කිසිම තැනැත්තකු එම සීමිත ඉඩ ප්‍රමාණය තුළට කිසිම කාර්යයක් සඳහා ඇතුළු නොවිය යුතුය :-

(i) එහි තිබිය හැකි යම් දුමාර , විෂ ද්‍රව්‍ය හෝ හානි කර ද්‍රව ඉවත් කිරීමට සහ දුමාර ඇතුළුවීම වැළැක්වීමට ගත හැකි සියලු පියවර ගත යුතු අතර, ඉඩ ප්‍රමාණය අන්තරායදායක දුමාරවලින්, විෂ ද්‍රව්‍යවලින් හෝ හානිකර ද්‍රවවලින් , තොර බව ඊට සුදුසු පරීක්ෂණයකින් නිශ්චය කර ඇත්තේ නම් මිස , ඇතුළු වන තැනැත්තා එක් කොණක් පිටතට සිටින තැනැත්තකු විසින් අල්ලාගෙන සිටින ලණුවක අනෙක් කොණෙහි

ආරක්ෂා සහිතව බඳිනු ලැබූ පටියක් හීන බැඳගත යුතුය. එසේ නැතහොත්,

(ii) ඇතුළු වන තැනැත්තා සුදුසු ශ්වසන උපකරණයක් පැළඳ ගත යුතු යි;

(ආ) සුදුසු ශ්වසන උපකරණ හා සුදුසු ප්‍රාණවත් කරන උපකරණ සහ සුදුසු පටි හා ලණු සපයනු ලැබ වහා ලබාගත හැකි අන්දමට තබාගත යුතු අතර නියම කරනු ලබන ආකාරයකට ඒවා කලින් කල පරීක්ෂා කරනු ලැබිය යුතු ය; තවද,

(ඇ) සේවයේ යොදවනු ලැබ සිටින තැනැත්තන්ගෙන් සෑහෙන ගණනකට ඒ උපකරණ පාවිච්චි කිරීම පිළිබඳව ද ශ්වසනය ගළි ලබාදීමේ ක්‍රමය පිළිබඳව ද පුහුණුවක් හා ප්‍රායෝගික දැනීමක් ලබාදිය යුතුය;

එසේ වුවද ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු තැන විසින්, සහතිකයක් මගින්, ඉහත කී නියමයන්ට අනුකූලව ක්‍රියාකිරීම හෝ අනවශ්‍ය හෝ කළ නොහැකි දෙයක් බවට ඔහු සෑහීමට පත් වී ඇති යම් අවස්ථාවක ඒ නියමයන්ගෙන් නිදහස් කිරීම, ඒ සහතිකයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි කොන්දේසිවලට යටත් ව කළ හැකිය.

(2) බොයිලේරුවක් ඇති ගිනි උදුනක හෝ බොයිලේරුවක් ඇති දුම් නලයක කිසිම වැඩක් කිරීමට, එය හුලං වැදීමෙන් හෝ වෙනත් ක්‍රමයකින් සිසිල් ව , සේවක කරනු ලැබූ තැනැත්තන්ට වැඩ කිරීම ප්‍රවේසම් සහිත වන තෙක් ඉඩ නො හැරිය යුතු ය.

1976 අංක 12 , 7

(3) (1) වන උපවගන්තියේ සඳහන් යම් ස්ථානයක වැඩ කිරීමට සිදුවී ඇති අවස්ථාවක් සම්බන්ධයෙන් වැඩි දුර ආරක්ෂා සඳහා විධිවිධාන අමාත්‍යවරයා විසින් නියෝග මගින් සැලැස්විය හැකිය.

පුපුරන හෝ දැවෙන සුලු ධූලි වායු, වාෂ්ප හෝ ද්‍රව්‍ය පිළිබඳ කළයුතු ආරක්ෂා සංවිධාන

33. (1) ධූලි පැන නඟින ඇඹරීමක් හෝ තැලීමක් හෝ වෙනත් ක්‍රමයක් නිසා , ගිනි ඇවිලීමෙන් පිපිරෙන ස්වභාවයක හෝ ප්‍රමාණයක ධූලි, වැඩ කරන කාමරයකට ඇතුළු වුවහොත්, ඒ ක්‍රමය සඳහා පාවිච්චි කරනු ලබන යන්ත්‍රය කොරටු කිරීමෙන් ද , ලී එක්කාසු වීම වැලැක්වීමෙන් හෝ ධූලි ඉවත් කිරීමෙන් ද , ගිනි ඇවිලෙන සුලු දේවල් පිට කිරීමෙන් හෝ ඒවා ප්‍රබල ලෙස කොටු කිරීමෙන් ද එබඳු පිපිරීමක් වැළැක්වීම සඳහා කළ හැකි සියළුම විධිවිධාන සැලැස්විය යුතු ය.

(2) ඉහත සඳහන් ක්‍රමයක් සඳහා පාවිච්චි කරනු ලැබූ යන්ත්‍රයක ගිනි ඇවිලීමෙන් පිපිරෙන සුලු ස්වභාවයක හා ප්‍රමාණයක ධූලි ඇති විටක , එබඳු පිපිරීමකින් ඇති විය හැකි පීඩනයට යටත් නොවන ලෙස යන්ත්‍රය සාදා නොමැති නම් , ඒ යන්ත්‍රය සම්බන්ධයෙන් හුලං අඩු කරන යන්ත්‍ර, සුලං පාලනය කරන යන්ත්‍ර හා සුලං පිටවීමේ විවර හෝ වෙනත් ඒ හා සමාන බලය ඇති වෙනත් උපකරණ සැපයීමෙන් එබඳු පිපිරීමක පැතිරීම හා ඉන් වන හානිය සීමා කිරීම සඳහා කළ හැකි සියලු ම විධිවිධාන සැලැස්විය යුතු ය.

(3) වාත පීඩනයට වඩා වැඩි වූ පීඩනය යටතේ යම් පිපිරෙන හෝ ගිනි ඇවිලෙන ගෑස් හෝ වාෂ්ප යම් යන්ත්‍රයක කොටසක ඇතුලත් වේ නම් , පහත දැක්වෙන විධිවිධාන ප්‍රකාර මිස , ඒ කොටස විවෘත නොකළ යුතු ය. ඒ විධිවිධාන නම් :-

(අ) යන්ත්‍රයෙහි කොටස සමග සම්බන්ධ වූ යම් නලයක සන්ධියක් සවි කිරීම හෝ යම් විවරයක ආවරණය

කොටසට සවි කිරීම හෝ ලිහිල් කිරීමට පෙර ඒ කොටසට හෝ එබඳු නළයකට හෝ වායු හෝ වාෂ්ප ගලා යෑම, නැවතීමේ වැල්වයකින් හෝ වෙනත් ක්‍රමයකට ප්‍රතිඵල ලැබෙන ලෙස නැවැත්විය යුතු ය.

(ආ) ඒ සවි කිරීම ඉහතකී ලෙස ඉවත් කිරීමට පෙර, නළයෙන් හෝ යන්ත්‍රයේ කොටසෙහි වායු හෝ වාෂ්පවල පීඩනය වාත පීඩනයට ගෙන ඒම සඳහා කළ හැකි සියලුම විධිවිධාන සැලැස්විය යුතු ය.

තවද ඒ සවි කිරීම ඉහත කී ලෙස ලිහිල් කළ කල්හි හෝ ඉවත් කළ කල්හි හෝ, ඒ සවි කිරීම කරන තෙක් හෝ ප්‍රවේසම් ලෙස එය නැවත තබන තෙක් හෝ කිසි ම පුපුරන හෝ ගිනි ඇවිලන වායු හෝ වාෂ්ප නළයට හෝ යන්ත්‍රයේ කොටසට ඇතුල්වීමට ඉඩ නො දිය යුතු ය.

එසේ ද වුවත්, එලිමහනෙහි සවි කරනු ලැබූ යන්ත්‍රයක් සම්බන්ධයෙන් මේ උපවගන්තිය අදාළ නොවිය යුතු ය.

(4) යම් ගිනියම් කර පෑස්සීමේ හෝ සවි කිරිමේ හෝ පෑස්සීමේ කටයුත්තකට නැතහොත් උෂ්ණ කිරීම වුවමනා යම් කැපීමේ කටයුත්තකට යම් පුපුරන, ගිනි ඇවිලෙන සුලු දෙයක් ඇතුළත් වන හෝ ඇතුළත්ව තිබූ කිසිම යන්ත්‍රයක්, ටැංකියක් හෝ භාජනයක්, ඒ ද්‍රව්‍ය හා ඉන් නගින දුම් ඉවත් කිරිම සඳහා හෝ එය පිපිරීම හෝ ගිනි ඇවිලීම නොවීම සඳහා හෝ සියලු ම විධිවිධාන සලස්වන තෙක්, යටත් නොකළ යුතු ය. තවද යන්ත්‍රයක්, ටැංකියක් හෝ භාජනයක් ඉහත කී ලෙස යම් කටයුත්තකට යටත් කොට තිබිණි නම්, ද්‍රව්‍ය ගිනි ඇවිලීමේ අන්තරාය සම්පූර්ණයෙන් ම වැළැක්වෙන ප්‍රමාණයකට ලෝහය සිසිල් වන තෙක් කිසි ම පිපිරෙන හෝ ගිනි ඇවිලෙන සුළු ද්‍රව්‍යයක් ඒ යන්ත්‍රයට, ටැංකියට හෝ භාජනයට ඇතුළුවීමට ඉඩ නොදිය යුතු ය.

(5) ඉහතින් වූ උපවගන්ති දෙකෙහි සඳහන් විධිවිධානවලින් යමක් ඉෂ්ට කිරීම අනවශ්‍ය බව හෝ නොහැකි බව ප්‍රධාන පරීක්ෂකට ඒත්තු ගිය අවස්ථාවක දී, සහතිකයෙහි සඳහන් කොන්දේසිවලට යටත්ව ඒ නියමය ඉෂ්ට කිරීම සහතිකයකින් ඔහුට නිදහස් කළ හැකි ය.

34. (1) වෙන් වූ හෝ සමූහයකින් එකක් වූ හෝ සෑම දුම් බොයිලේරුවකටම ---

(අ) එයට ඈඳනු ලැබූ පහත දැක්වෙන උපකරණ තිබිය යුතු ය. එනම් :-

(i) යම් නැවැත්වීමේ වැල්වයක් හැර, ඉඩ හැර තිබෙන වැඩි ම වැඩ කළ යුතු පීඩනයට වඩා වැඩි පීඩනයකින් බොයිලේරුව වැඩ කරනු ලැබීම නැවැත්වීමට හැකිවන පරිදි හරි ගැස්විය හැකි සුදුසු ආරක්ෂක වැල්වයක් ; තවද එය බොයිලේරුවට කෙලින් ම හෝ පුලුවන් තරම් ලංවම සවි කොට තිබිය යුතුය;

(ii) බොයිලේරුව දුම් නළයකට සම්බන්ධ කරන සුදුසු නැවැත්වීමේ වැල්වයක් ;

(iii) දුම් අවකාශයට සම්බන්ධ වූ ද, බොයිලර් සේවකයාට ලෙහෙසියෙන් ම පෙනෙන්නා වූ ද එක් ඝන අඟලකට රාත්තල් ගණන දැක්වෙන නිවැරදි දුම් පීඩන මාපකයක් ;

තවද එහි වැඩ කිරීමට ඉඩ හැර තිබෙන වැඩි ම පීඩනය පැහැදිලි ව පෙනෙන පාටකින් ලකුණු කොට තිබිය යුතු ය.

(iv) බොයිලරයේ ජල මට්ටම දැක්වීම පිණිස, විනිවිද පෙනෙන ද්‍රව්‍යයකින් කරන ලද හෝ ප්‍රධාන පරීක්ෂක විසින් අනුමත කරනු ලැබූ වෙනත් වර්ගයක හෝ යටත් පිරිසෙයින් එක් ජල මාපකයක්; තවද මාපකය නාළාකාර වීදුරු වර්ගයේ එකක් වූයේ නම් ද බොයිලේරුවේ වැඩ කරන පීඩනය ස්වභාවයෙන් ම ඝන අඟලකට රාත්තල් හතළිහකට වැඩි වේ නම් ද , මාපකය කියවීම බාධා නොවන අන්දමේ ප්‍රබල ආරක්ෂක උපකරණයක් මාපකයට සැපයිය යුතුය. දෙකක් හෝ ඊට වැඩි වූ බොයිලේරුවලින් එකක් වී නම් ලේසියෙන් ම දැකිය හැකි පැහැදිලි අංකයක් දරන තහඩුවක් ද වේ. තවද;

(ආ) අත්හදා බැලිය හැකි පීඩන මාපකයක් සම්බන්ධ කිරීමට ක්‍රමයක් සලස්වා දිය යුතු ය.

(ඇ) එසේ ම පිටතින් ගිනි තැබිය හැකි නොවේ නම් ගිනි තැබිය හැකි සුදුසු ඇබයක් හෝ වතුර අඩු බව දක්වන ප්‍රබල උපක්‍රමයක් හෝ සපයා දිය යුතු ය.

එසේ ද වුවත්, මේ උපවගන්තියේ (අ) ඡේදයේ () වෙනි අනුච්ඡේදය සමනය කිරීමේ යන්ත්‍ර සම්බන්ධයෙන් ද (අ) ඡේදයේ 3, 4 සහ 5 වෙනි අනුච්ඡේද සහ (ආ) සහ (ඇ) සහ ඡේද සමනය කිරීමේ යන්ත්‍ර හෝ උෂ්ණය අධික ලෙස වැඩි කිරීමේ යන්ත්‍ර හෝ සම්බන්ධයෙන් ද අදාළ නොවිය යුතු ය.

(2) පෙරාතුව ම වූ උපවගන්තියේ කාර්යය සඳහා, ලිවරයෙහි නිවැරදි ආකාරයට බර සලසා නොමැති නම්, ලීවර වැල්වයක් ආරක්ෂා වැල්වයක් ලෙස නො සැලකිය යුතු ය.

(3) දෙකකට හෝ ඊට වැඩි දුම් බොයිලේරු සමූහයකින් එකක් වූ යම් දුම් බොයිලේරුවකට, පහත දැක්වෙන කටයුතු කරනු නො ලැබූ අවස්ථාවක දී, කිසිවකු ඇතුලු නොවිය යුතුවත් හැර එහි සිටීම ද නො කළ යුතු ය. එකී කටයුතු නම් :-

(අ) බොයිලේරු සමූහයේ කොටසකින් බොයිලේරුවට දුම් හෝ උණුවතුර ඇතුල්විය හැකි සියලු ම ද්වාර ඒ කොටසින් ගලවා තිබීම; සහ

(ආ) ඒ ඇතුළුවීම පාලනය කරනු ලබන සියලු ම වැල්ව හෝ ඇබ වසා දමා අගුල් දා තිබීම; තවද අන් බොයිලේරුවක් හෝ ඊට වැඩි ගණනක් සමග පොදුවේ සුලං හරින නළයක් බොයිලේරුවට ඇති විටක හෝ පොදුවේ ඇති සුලං භාජනයකට හෝ වළකට සුලං පිට හරින විටක එක් එක් බොයිලේරුවේ ඇති සුලං හරින නලය හෝ ඇබය වැල්වය හෝ ඇබය වැහූ විටක හැර අන් අවස්ථාවක දී, ඉවත් නො කළ හැකි යතුරකින් විවෘත කරන්ට හැකි වන පරිදි ද, ඒ සුලං අරින වැල්ව හෝ ඇබ පංතියට පාවිච්චි කරන එකම යතුරක් ඇති ලෙසට ද, තනා තිබීම.

1976 අංක 12, 8

(3 අ) (6) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද සහතිකය දරන්නා විසින් ලියවිල්ලකින් අවසර දී ඇත්නම් මිස කිසිම තැනැත්තකු විසින් හුමාල බොයිලේරුවක කටයුතු කිරීම හෝ එය ක්‍රියා කරවීම නොකළ යුතුය . නියම කරනු ලැබිය හැකි නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමෙන් පසුව මිස , කිසිම තැනැත්තකුට මේ වගන්තිය යටතේ අවසර නොදිය යුතුය.

(3 ආ) (අ) නිවේදිත දිනයට පෙර යම් කර්මාන්තශාලාවක පාවිච්චි කරන ලද හුමාල බොයිලේරුවක් නිවේදිත දිනයෙන් තුන් මාසයක කාලයක් ඉකුත් වීමෙන් පසුව පාවිච්චියට ගැනීම සඳහා කරන ලද ඉල්ලීමක් මත ඒ හුමාල බොයිලේරුව සම්බන්ධයෙන් ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු තැන විසින් ලියාපදංචි කිරීමේ සහතිකයක් නිකුත් කර ඇත්නම් මිස , ඒ තුන්මසක කාලය ඉකුත් වීමෙන් පසු ඒ බොයිලේරුව එසේ පාවිච්චි නොකළ යුතුය.

(ආ) නිවේදිත දිනයෙහි දී හෝ ඉන් පසුව යම් කර්මාන්ත ශාලාවක් තුළ පළමු වරට අලුත් හුමාල බොයිලේරුවක් පාවිච්චියට ගැනීම හෝ යම් කර්මාන්තශාලාවක පාවිච්චි කරන ලද යම් හුමාල බොයිලේරුවක් වෙනත් කර්මාන්තශාලාවක් තුළ පළමුවරට පාවිච්චියට ගැනීම , ඒ සඳහා කරන ලද ඉල්ලීමක් මත ඒ හුමාල බොයිලේරුව සම්බන්ධයෙන් ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු තැන විසින් ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කර ඇත්නම් මිස නොකළ යුතුය.

(ඇ) අමාත්‍යවරයා විසින් නියෝග මගින් --

(i) ඉල්ලීමේ ආකෘතිය සහ සහතිකයේ ආකෘතිය නියම කරනු ලැබිය හැකිය ; තවද,

(ii) එක් එක් හුමාල බොයිලේරුව සම්බන්ධයෙන් නියම කරනු ලැබිය හැකි ආකෘතියක වාර්තා තබන ලෙස නියම කරනු ලැබිය හැකිය.

(4) දුම් බොයිලේරුවක සෑම කොටසක් ම , පලුදු නැති ද්‍රව්‍යවලින් ප්‍රමාණවත් ශක්තියක් ඇති ව , පැහැදිලි ව පෙනෙන දෝෂ වලින් නිදහස් ව, යහපත් ලෙස තනා තිබිය යුතු ය.

(5) සෑම දුම් බොයිලේරුවක් හා එහි සියලුම සවි කිරීම් සහ සම්බන්ධ කිරීම් නිසි ලෙස පවත්වා ගෙන යා යුතු ය.

1976 අංක 12, 8

(6) සෑම හුමාල බොයිලේරුවක් සහ එහි සියලු සවිකිරීම් සහ සම්බන්ධිත කොටස් සෑම මාස දොළහක කාලපරිච්ඡේදයක් තුළ ම යටත් පිරිසෙයින් එක් වරක්වත් සහ යම් විශාල අළුත්වැඩියා කිරීමකට පසුව ද සම්පූර්ණයෙන් පරීක්ෂා කිරීම, කොමසාරිස් විසින් ඒ සඳහා නිකුත් කරන ලද සහතිකයක් දරන්නකු විසින් කරනු ලැබිය යුතුය;

එසේ වුව ද අඛණ්ඩ හුමාල සැපයුමක් අවශ්‍ය ක්‍රියාවලියක කාර්යයන් සඳහා යම් බොයිලේරු පේලියක් නියමිත දිනයේ දී භාවිත වන අවස්ථාවක ඒ පේලියේ පීඩනය යටතේ පවත්නා හුමාලයෙන් වෙන්

කරනු නොලැබිය හැකි යම් නවත්වන කපාට එසේ වෙන් කිරීමක් නොමැතිව පරීක්ෂා කළ හැකි තාක් දුරට පමණක් පරීක්ෂා කළ යුතු ය . එහෙත් ඒ කපාටය එසේ වෙන් කළ හැකි වන ආකාරයේ උපකරණයක් සවි කිරීම සඳහා සාධාරණ අවස්ථාවක් ඇති වූ වහාම ද ඒ කාරණය කෙසේ වුවත් නියමිත දිනයෙන් තුන් අවුරුද්දක කාලපරිච්ඡේදයක් ගත වූ පසු මෙම අතුරු විධානයේ බලපෑම නතර වන්නේය;

(7) පෙරාතුව ම වූ උපවගන්තියේ නියම ප්‍රකාර කළ යුතු වූ පරීක්ෂණයක් පහත දැක්වෙන පරිදි වූ පරීක්ෂණ වලින් යුක්ත විය යුතු ය. පළමු ව බොයිලේරුව සිසිල් වූ විට හා ඇතුල් පැත්ත හා පිටපැත්ත නියමිත ආකාරයට පිළියෙළ කළ විට ද දෙවනුව සමනය කිරීමේ යන්ත්‍රයක් හෝ උෂ්ණය වැඩි කරන යන්ත්‍රයක් නොවන අවස්ථාවක දී , එය ස්වභාවික දුම් පීඩනය යටතේ වූ විට ද කළ යුතු ය . තවද ඒ පරීක්ෂණයේ කොටස් දෙක වෙනස් තැනැත්තන් විසින් කළ හැකිය . බොයිලේරුව සිසිල් වූ විට කරනු ලැබූ පරීක්ෂණයෙන් පසු දුම වැඩි කළ අවස්ථාවක දී හෝ ඊට පසු කිරීමට පුලුවන් වූ වහා ම දුම් පීඩනය යටතේ වූ පරීක්ෂණය පළමු වතාවට කළ යුතු ය . වැඩ කිරීමට ඉඩ හරිනු ලැබූ වැඩි ම පීඩනයට වඩා වැඩි පීඩනයකින් බොයිලේරුව වැඩ කිරීම වැලැක්වීම සඳහා ආරක්ෂක වැල්වය හරි ගැස්සීමට පරීක්ෂණය කරන තැනැත්තා විසින් වවග බලා ගත යුතු ය.

(8) වැඩ කිරිමට ඉඩ හරිනු ලැබූ වැඩි ම පීඩනය ද ඇතුලුව , නියමිත විස්තර නියමිත ආකෘතියක ඇතුළත් කොට, වාර්තාවක් පුලුවන් තරම් ඉක්මනින් ම, කෙසේ වෙතත් පරීක්ෂණය සම්පූර්ණ කිරීමෙන් පසු විසි අට දිනක් ඇතුළත දී , සාමාන්‍ය ලේඛන පොතෙහි ලිවිය යුතුය . නැතහොත් ඇමිණිය යුතු ය . වාර්තාව පරීක්ෂණය කරන තැනැත්තා විසින් අත්සන් කළ යුතු ය . තවද ඒ තැනැත්තා බොයිලේරු පරීක්ෂා කරන වෙළඳ ව්‍යාපාරයක හෝ සමාගමක පරීක්ෂකයකු නම් ඒ වෙළඳ ව්‍යාපාරයේ හෝ සමාගමේ ප්‍රධාන ඉංජිනේරු තැන විසින් හෝ ඔහු විසින් ඒ සඳහා ලියවිල්ලකින් බලය දෙනු ලැබූ ඒ වෙළඳ ව්‍යාපාරයේ හෝ සමාගමේ වගකිව යුතු නිලධාරියකු විසින් හෝ දෙවනු ව අත්සන් කළ යුතු ය . මේ උපවගන්තියේ හා පරීක්ෂණවල වාර්තා පිළිබඳ ව මේ වගන්තියේ මතු දැක්වෙන විධි විධානවල කාර්ය සඳහා බොයිලේරුවක් සිසිල් වූ විට කරන පරීක්ෂණයක් එය දුම් පීඩනය යටතේ තිබිය දී කරන පරීක්ෂණයත් වෙන් වූ පරීක්ෂණ ලෙස සැලකිය යුතු ය.

(9) (අ) පහත දැක්වෙන කටයුතු ඉෂ්ට නො කොට කිසි ම අලුත් දුම් බොයිලේරුවක් පළමු වතාවට යම් කර්මාන්ත ශාලාවක පාවිච්චියට නොගත යුතු ය.

එනම් :-

(i) බොයිලේරුවේ ඉඩ හරිනු ලැබූ වැඩ කිරීමේ වැඩිම පීඩනය හා බොයිලේරුව හා සවි කිරීම් සඳහා කරනු ලැබූ අත්හදා බැලීමේ පරීක්ෂණවල ස්වභාවය ද දක්වන සහතිකයක් බොයිලේරුව නිපදවන්නාගෙන් හෝ බොයිලේරු පරීක්ෂා කරන වෙළෙඳ ව්‍යාපාරයකින් හෝ සමාගමකින් ලබා ගැනීම ;

(ii) කර්මාන්තශාලාව පිහිටුවා ඇති ස්ථානයෙහි එම සහතිකය පරීක්ෂා කර බැලීම සඳහා තැබීම; හා

(iii) සහතිකය දෙනු ලැබූ බොයිලේරුව බව හැඳින ගැනීම සඳහා බොයිලේරුව ලකුණු කොට තැබීමද වේ.

(ආ) වෙනත් ස්ථානයක කලින් පාවිච්චි කරනු ලැබූ කිසි ම දුම් බොයිලේරුවක්, මීට ඉහතින් ම වූ උපවගන්ති තුන ප්‍රකාර පරීක්ෂා කොට වාර්තා කරන තෙක් කිසි ම කර්මාන්ත ශාලාවක පළමු වතාවට පාවිච්චියට නො ගත යුතුය . තවද ඒ පරීක්ෂණය බොයිලේරුව කර්මාන්ත ශාලාවෙහි සවිකිරීමෙන් පසුව කළ යුතු ය.

(10) දුම් බොයිලේරුවක වැඩ කිරීම ආරක්ෂා සහිත වීම සඳහා කොන්දේසි මේ වගන්තිය යටතේ කරනු ලැබූ පරීක්ෂණයක වාර්තාවෙහි දක්වා තිබේ නම්, ඒ කොන්දේසි ප්‍රකාර හැර අන් ලෙසකට බොයිලේරුව පාවිච්චි නො කළ යුතු ය.

(11) ඉඩ හරිනු ලැබූ වැඩි ම වැඩ කිරීමේ පීඩනය අඩු කළ අවස්ථාවක දී හෝ යම්කිසි අලුත්වැඩියා කිරීමක් වහා ම හෝ දක්වනු ලැබූ හෝ කාල සීමාවක දී හෝ නො කළහොත් බොයිලේරුව ප්‍රවේසම් සහිත ව පාවිච්චි කිරීමට බැරි බව පරීක්ෂණයෙන් පෙනී යන සෑම අවස්ථාවක දී හෝ මේ වගන්තිය යටතේ කරනු ලැබූ පරීක්ෂණයක වාර්තාවක් සපයන තැනැත්තා විසින් හෝ ඒ තැනැත්තා බොයිලේරු පරීක්ෂා කරන වෙළෙඳ ව්‍යාපාරයක හෝ සමාගමක පරීක්ෂකයකු නම්, එහි ප්‍රධාන ඉංජිනේරු තැන විසින් හෝ ඒ පරීක්ෂණය සම්පූර්ණ කිරීමෙන් පසු දවස් විසි අටක් ඇතුළත ඒ වාර්තාවෙහි පිටපතක් දිස්ත්‍රික්කයේ පරීක්ෂකයා වෙත යැවිය යුතු ය.

1998 අංක 18 , 3

(12) එබඳු පරීක්ෂණයක් කිරීමට යොදනු ලැබූ තැනැත්තාට වගන්තියෙන් නියම කොට තිබෙන පරිදි සම්පූර්ණ පරීක්ෂණයක් කිරීමට නො හැකි වී නම් , හෝ, අසත්‍ය වූ හෝ අවශ්‍යයෙන් ම තිබිය යුතු විස්තරයකින් ඌණ වූ හෝ වාර්තාවක් ඔහු විසින් කළේ නම් නැතහොත් යම්කිසි බොයිලේරු පරීක්ෂා කරන වෙළෙඳ ව්‍යාපාරයක හෝ සමාගමක ප්‍රධාන ඉංජිනේරු තැන විසින් එබඳු වාර්තාවක් කිරීමට ඉඩ හැරියේ නම් , ඒ තැනැත්තා හෝ ඉංජිනේරු තැන වරදකට වරදකාරයකු ව රුපියල් විසි පන්දහසකට වැඩි නොවන දඩයකට යටත් විය යුතු ය . තවද ඉහතින් වූ උපවගන්තියෙන් නියම කරන ලද පරිදි වාරඃතාවෙහි පිටපතක් දිස්ත්‍රික්කයේ පරීක්ෂකයාට යැවීම ඒ තැනැත්තා හෝ ප්‍රධාන ඉංජිනේරු තැන හෝ විසින් පැහැර හැරියේ නම් ඔහු වරදකට වරදකරුවකු විය යුතුය.

1976 අංක 12, 8

(13) පරීක්ෂණයේ පරිපූර්ණතාවය ගැන ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු තැන සෑහීමට පත් වී නොමැති නම්, ඔහු විසින් පත් කරනු ලබන තැනැත්තන් තුන් දෙනකු විසින් එම බොයිලේරුව නැවත පරීක්ෂා කරනු ලැබිය යුතු යයි නියම කළ හැකි අතර පදිංචිකරු ඒ නැවත පරීක්ෂණය සඳහා අවශ්‍ය පහසුකම් සැලසිය යුතුය. පරීක්ෂණයේ වාර්තාව ප්‍රමාණවත් නොවන බව හෝ අවශ්‍යයෙන් ම තිබිය යුතු කරුණක් සම්බන්ධයෙන් සාවද්‍ය බව ඒ නැවත

පරීක්ෂණයෙන් පසු පෙනී යතහොත් ඒ නැවත පරීක්ෂණයේ වියදම් රාජ්‍යයට අයවිය යුතු ණයක් වශයෙන් පදිංචිකරුගෙන් අය කර ගත හැකි වේ. නැවත පරීක්ෂණය පැවැත්වූ තැනැත්තන් විසින් අත්සන් කරනු ලැබ ඇති බව සැලකෙන නැවත පරීක්ෂණයේ වාර්තාව සාක්ෂ්‍ය වශයෙන් පිළිගත යුතු අතර , එහි සඳහන් කරුණු සම්බන්ධයෙන් එය , මුල් බැල්මෙන් ම පිළිගත හැකි සාක්ෂ්‍ය වන්නේය. ; තවද,

(14) මේ කොටසෙහි " අවසරය දිය හැකි උපරිම වැඩ කරන පීඩනය " යන යෙදුමෙන්, අලුත් හුමාල බොයිලේරුවක් සම්බන්ධයෙන් නම්, මේ වගන්තියේ (9) වෙනි උපවගන්තියේ සඳහන් සහතිකයේ නිශ්චිතව සඳහන් කරනු ලබන පීඩනය ද මේ වගන්තියේ විධිවිධාන ප්‍රකාර පරීක්ෂා කරනු ලැබූ හුමාල බොයිලේරුවක් සම්බන්ධයෙන් නම් අවසාන වරට කරන ලද පරීක්ෂණයේ වාර්තාවේ නිශ්චිතව සඳහන් කරන ලද පීඩනය ද අදහස් වෙයි. තවද, " හුමාල බොයිලේරුව " යන්නෙන් වායුගෝලීය පීඩනයට වඩා වැඩි පීඩනයක් යටතේ යම් කාර්යයක් සඳහා හුමාලය ජනනය කිරීමට භාවිතා කරනු ලබන යම් සංවෘත භාජනයක් අදහස් වන අතර ඊට සෙන්ටිග්‍රේඩ් අංශක 110 ට නොඅඩු උෂ්ණත්වයක ක්‍රියා කරන යම් උණු වතුර බොයිලේරුවක්, එවැනි යම් භාජනයකට යවන වතුර රත් කිරීම සඳහා භාවිතා කරනු ලබන යම් ඉකොනොමයිසරයක් සහ හුමාලය රත් කිරීම සඳහා භාවිත කරනු ලබන යම් සුපර්හීටරයක් ද ඇතුළත් වේ.

(15) රජයට අයත් වූ හෝ රජයේ සේවයෙහි තනිකොට ම යොදවනු ලැබූ හෝ යම් බොයිලේරුවක් සම්බන්ධයෙන්, මේ වගන්තිය අදාළ නො විය යුතු ය . එබඳු බොයිලේරු යහපත් තත්ත්වයක තබා ගැනීම සඳහා දක්ෂ කාර්යය මණ්ඩලයක් සේවයෙහි යොදා තිබීමේ කරුණ උඩ ඇමතිවරයා විසින් ඒවා ඉහත කී වගන්තිය අදාළ කිරීමෙන් නිදහස් කොට ඇත්තේය.

35. (1) බොයිලේරුවේ ඉඩ හරිනු ලැබූ වැඩ කිරීමේ වැඩි ම පීඩනය හෝ රිසීවරය වෙනත් සැපයීමේ මාර්ගයක් සමග සම්බන්ධ කරන නළයෙන් ලැබිය හැකි වැඩි ම පීඩනය අනතුරු රහිත ව ඔරොත්තු දීමට හැකි වන පරිදි තනනු නො ලැබූ ද , පවත්වා ගෙන නො ගියාවූද සෑම දුම් රිසීවරයක ම පහත දැක්වෙන උපකරණ සවි කොට තැබිය යුතු ය.

එනම් ---

(අ) සුදුසු අඩු කිරීමේ වැල්වයක් හෝ අනතුරු රහිත වූ වැඩ කිරීමේ පීඩනය වැඩි නොවීම වලක්වනු සඳහා වෙනත් ඉබේ ක්‍රියා කරන සුදුසු උපකරණයක්;

(ආ) අනතුරු රහිත වූ වැඩ කිරීමේ පීඩනයට වඩා වැඩි වූ වහා ම දුම් පිටවීමට හැකි වන පරිදි සුදුසු ආරක්ෂක වැල්වයක් හෝ අනතුරු රහිත වූ වැඩ කිරීමේ පීඩනයට වැඩි වූ වහා ම දුම් සැපයීම ඉබේ ම නැවැත්වීම සඳහා සුදුසු උපකරණයක් ;

(ඇ) වර්ග අඟලකට රාත්තල් කොපමණ ද යන්නෙන් රිසීවරයේ දුම් පීඩනය දැක්වෙන නිවැරදි දුම් පීඩන මාපකයක් ;

(ඈ) සුදුසු නැවැත්වීමේ වැල්වයක් ; හා

(ඉ) එක ම දුම් රිසීවරයක් පාවිච්චි කරන ස්ථානයකහැර අන් සෑම ස්ථානයක ම ලෙහෙසියෙන් ම දැකිය හැකි පැහැදිලි අංකයක් ඇති තහඩුවක් ද වේ.

දුම් රිසීවරයෙහි හෝ රිසීවරය හා අඩු කිරීමේ වැල්වය හෝ අනතුරු රහිත වැඩ කිරීමේ පීඩනය වැඩිවීම වලක්වනු පිණිස වූ වෙනත් උපකරණය හෝ අතර ඇති සැපයීමේ නළයෙහි හෝ ආරක්ෂක වැල්වය හා පීඩන මාපකය සවි කළ යුතුය.

(2) (ඉ) ඡේදය හැර ඉහතින් වූ උපවගන්තියේ විධිවිධානවල කාර්යය සඳහා එක නළයකින් දුම් සපයනු ලබන්නාවූ ද , එක ම යන්ත්‍රයක කොටසක් වන්නාවූ ද යම් රිසීවර පංක්තියක් එක රිසීවරයක් වශයෙන් සැලකිය හැකිය. තවද (ඇ) සහ (ඉ) ඡේදයන්හි හැර ඉහතකී විධිවිධානවල කාර්යය සඳහා එක ම නළයකින් දුම් සපයනු ලැබූ වෙනත් රිසීවර පංක්තියක් එක ම රිසීවරයක් වශයෙන් සැලකිය හැකිය.

එසේ ද වුවත්, අඩු කිරීමේ වැල්වයක් හෝ අනතුරු රහිත වූ වැඩ කිරීමේ පීඩනය වැඩිවීම වලක්වනු පිණිස වෙනත් උපකරණයක් ඒ එක ම නළයට සවි කොට නොමැති යම් රිසීවර පංක්තියකට මේ උපවගන්තිය අදාළ නො විය යුතු ය.

(3) සෑම දුම් රිසීවරයක සෑම කොටසක් ම පලුදු නැති ද්‍රව්‍යවලින්, ප්‍රමාණවත් ශක්තියකින් යුක්තව , පැහැදිලිව පෙනෙන දෝෂවලින් නිදහස් ව, යහපත් ලෙස තනා තිබිය යුතුය.

1976 අංක 12, 9 (4) සෑම හුමාල ග්‍රාහකයක් ම සහ එහි සෑම සවිකිරීමක් ම නිසියාකාරව පවත්වාගත යුතු අතර එහි නිර්මාණය අනුව ඉඩ ලැබෙන තාක් දුරට තරයේ පරීක්ෂා කිරීම , කොමසාරිස් විසින් ඒ සඳහා නිකුත් කරනු ලබන සහතිකයක් දරන තැනැත්තකු විසින් සෑම මාස විසිහතරක කාල පරිච්ඡේදයකට ම යටත් පිරිසෙයින් එක් වරක්වත් , කළ යුතු ය . තවද

1976 අංක 12, 9 (4 අ) එවැනි යම් පරීක්ෂණයක් කිරීමට යොදවනු ලැබූ තැනැත්තා මේ වගන්තියෙන් නියමිත පරිදි සම්පූර්ණ පරීක්ෂණයක් කිරීම පැහැර හැරියහොත් හෝ යම් අවශ්‍යයෙන් ම තිබිය යුතු කරුණක් සම්බන්ධයෙන් අසත්‍ය හෝ අසම්පූර්ණ වාර්තාවක් සැපයුවහොත් හෝ
1998 අංක 18, 4 එවැනි වාර්තාවක් සැපයීමට යම් හුමාල ග්‍රාහක පරීක්ෂක සමාගමක හෝ සංගමයක ප්‍රධාන ඉංජිනේරු තැන ඉඩ දෙතහොත්, ඔහු ඊට වරදකරු වන අතර රුපියල් විසි පන්දහසකට නොවැඩි දඩයකට ඔහු යටත් වන්නේය .

(5) අනතුරු රහිත වූ වැඩ කිරීමේ පීඩනය ඇතුලුව, නියමිත වෙනත් විස්තර ද අඩංගු , ඒ සෑම පරීක්ෂණයක ප්‍රතිඵල පිළිබඳ වාර්තාවක්, සාමාන්‍ය ලේඛන පොතෙහි ඇතුළත් කළ යුතුය නැතහොත් එයට ඇමිණිය යුතු ය.

(6) සෑම දුම් භාජනයක පිටවෙන මග සියලු ම වේලාවෙහි ම අවහිරයක් නැති ව විවෘත ව තිබෙන සේ ඒවා පවත්වාගෙන යා යුතුය.

(7) මේ වගන්තායේ පහත දැක්වෙන පාඨයන්ට මෙහි දී තිබෙන අර්ථ ඇත්තේ ය.

එනම් --

" අනතුරු රහිත වැඩ කිරිමේ පීඩනය " යන්නෙන් අලුත් දුම් රිසීවරයක් සම්බන්ධයෙන් නම් සාදන්නා විසින් සඳහන් කරනු ලැබූ ප්‍රමාණයද, මේ වගන්තියේ විධිවිධාන ප්‍රකාර පරීක්ෂා කරනු ලැබූ දූනු රිසීවරයක් සම්බන්ධයෙන් නම්

අවසාන පරීක්ෂණයේ වාර්තාවෙහි සඳහන් ප්‍රමාණය ද අදහස් කෙරෙයි.

" දුම් රිසීවරය " යන්නෙන් දුම් බොයිලේරුවක් හෝ දුම් භාජනයක් හෝ දුම් නළයක් හෝ දරණුවක් හෝ ප්‍රධාන යන්ත්‍රයක කොටසක් හෝ නො වන, වාත පීඩනය වැඩි වූ පීඩනයක් යටතේ දුම් තබා ගැනීමට පාවිච්චි කරනු ලැබූ යම් භාජනයක් හෝ උපකරණයක් අදහස් කෙරෙයි.

" දුම් භාජනය " යන්නෙන් වායු ගෝලයට හෝ පීඩනය, වාත පීඩනයට වඩා වැඩි නුවූ අවකාශයකට හෝ , ස්ථිර පිට වෙන මගක් ඇති ව , එමගින් උණු කිරීමේ, තැම්බීමේ, වෙලීමේ හෝ වාෂ්ප වීමේ හෝ කාර්යය සඳහා වාත පීඩනයෙන් හෝ ඊට නුදුරු වූ පීඩනයකින් හෝ දුම් ගමන් කරන ලෙස තනනු ලැබූ, ( දුම් නළයක් හෝ දරණුවක් නොවන ) යම් භාජනයක් අදහස් කෙරෙයි.

36. (1) සෑම වායු රිසීවරයක් ම පහත පෙනෙන පරිදි විය යුතු ය :-

(අ) අනතුරු රහිත වූ වැඩ කිරීමේ පීඩනය පැහැදිලි ලෙස පෙනෙන පරිදි එහි ලකුණු කොට තිබිය යුතු ය.

(ආ) වායු සංපීඩන යන්ත්‍රයක් හා සම්බන්ධ කොට ඇති රිසීවරයක් සම්බන්ධයෙන් නම් එය සංපීඩකයෙහි ලබා ගත හැකි අනතුරු විරහිත වැඩි ම පීඩනයට ඔරොත්තු දෙන සේ තනා තිබිය යුතුය. නැතහොත් සුදුසු අඩු කිරීමේ වැල්වයක් හෝ රිසීවරයේ පීඩනය වැඩිවීම වැලැක්වීමට වෙනත් සුදුසු උපකරණයක් එයට සවි කොට තිබිය යුතු ය.

(ඇ) අනතුරු විරහිත වැඩ කිරීමේ පීඩනය වැඩි වූ වහාම වාතය පිටවීමට ඉඩ ඇති සේ හරි ගස්සනු ලැබූ සුදුසු ආරක්ෂක වැල්වයක් එයට සවි කොට තිබිය යුතු ය.

(ඈ) රිසීවරයේ පීඩනය වර්ග අඟලකට රාත්තල් කොපමණ ද යන්න දක්වන නිවැරදි පීඩන මාපකයක් එහි සවි කොට තිබිය යුතු ය.

(ඉ) රිසීවරය හිස් කිරීම සඳහා සුදුසු උපකරණයක් සවි කොට තිබිය යුතුය.

(ඊ) මිනිසකුට ඇතුළුවිය හැකි සුදුසු විවරයක් හෝ අත දැමිය හැකි විවරයක් හෝ ඇතුළත සම්පූර්ණ ලෙස පිරිසිදු කළ හැකි වෙනත් ක්‍රමයක් හෝ සැපයිය යුතු ය.

(උ) කර්මාන්ත ශාලාවේ රිසීවර එකකට වඩා පාවිච්චි කරන්නේ නම් එහි පහසුවෙන් දැකිය හැකි සේ හැඳින්වීමේ ලකුණක් තිබිය යුතු ය.

(2) ආරක්ෂක වැල්ව හා පීඩන මාපක සම්බන්ධයෙන් ඉහතින් වූ උපවගන්තියෙහි දැක්වුණු විධිවිධානවල කාර්යය සඳහා, එකම

නළයක් මගින් වාතය සැපයුනු වායු රිසීවර පංක්තියක් ම එක ම රිසීවරයක් ලෙස සැලකිය හැකි ය.

එසේ ද වුවත්, අනතුරු විරහිත වැඩ කිරීමේ පීඩනය වැඩිවීම වළක්වනු සඳහා අඩු කිරීමේ වැල්වයක් හෝ වෙනත් සුදුසු උපකරණයක් සවි කිරීමට වුවමනා අවස්ථාවක දී, ඒ එක ම නළයට එම වැල්වය හෝ උපකරණය සවි කොට නොමැති නම් මේ උපවගන්තිය එයට අදාළ නො විය යුතු ය.

(3) සෑම වායු රිසීවරයක් හා එහි සවි කිරීම් ශක්තිමත් ලෙස තනා නිසි ලෙස පවත්වා ගෙන යා යුතු ය.

(4) සෑම වාත ග්‍රාහකයක් ම සෑම මාස විසිහතරක කාල පරිච්ඡේදයකට යටත් පිරිසෙයින් එක් වරක්වත් හොඳින් පිරිසිදු කොට පරීක්ෂා කරනු ලැබිය යුතුය:

එසේ වුව ද වාටි මූට්ටු රහිත නිර්මාණයක් වූ ග්‍රාහකයක් සම්බන්ධයෙන් වූ විට --

(අ) එවැනි යම් පරීක්ෂණයක් කරන යම් තැනැත්තකු විසින්, ඊළඟ පරීක්ෂණය පැවැත්විය යුත්තේ යම් කාල පරිච්ඡේදයක් ඇතුළත ද එම කාලපරිච්ඡේදය වශයෙන් මාස විසිහතරකට වැඩි වුව ද අවුරුදු හතරකට නොවැඩි කාලපරිච්ඡේදයක් නිශ්චිත ව සඳහන් කරනු ලැබිය හැකිය ; තවද,

(ආ) එය එහි අභ්‍යන්තර පෘෂ්ඨය සම්පූර්ණයෙන් පරීක්ෂා කළ නොහැකි වන ආකාරයට සාදා ඇත්නම්, ග්‍රාහකයේ අභ්‍යන්තර පරීක්ෂණය වෙනුවට සුදුසු ද්‍රව පීඩන පරීක්ෂණයක් කරනු ලැබිය යුතු ය.

ඒ සෑම පරීක්ෂණයක් ම හා පරීක්ෂාවක් ම කොමසාරිස් විසින් ඒ සඳහා නිකුත් කරන ලද සහතිකයක් දරන තැනැත්තකු විසින් කරනු ලැබිය යුතු අතර , (ප්‍රවේසම් සහිත වැඩ කරන පීඩනය පිළිබඳ විස්තර ඇතුළු ) නියම කරනු ලැබිය හැකි විස්තර ඇතුළත් එවැනි සෑම පරීක්ෂණයක හා පරීක්ෂාවක ප්‍රතිඵලය පොදු ලේඛනයේ ඇතුළත් කරනු ලැබිය යුතුය , නැතහොත් ඊට අමුණනු ලැබිය යුතු ය. තවද,

1976 අංක 12, 10
1998 අංක 18 , 5

(4 අ) එවැනි යම් පරීක්ෂණයක් හෝ පරීක්ෂාවක් කිරීමට යොදවනු ලැබූ තැනැත්තා මේ වගන්තියෙන් නියමිත පරිදි සම්පූර්ණ පරීක්ෂණයක් හෝ පරීක්ෂාවක් කිරීම පැහැර හැරියහොත් හෝ යම් අවශ්‍යයන් ම තිබිය යුතු කරුණක් සම්බන්ධයෙන් අසත්‍ය හෝ අසම්පූර්ණ වාර්තාවක් සැපයුවහොත් හෝ එවැනි වාර්තාවක් සැපයීමට යම් වාත ග්‍රාහක සමාගමක හෝ සංගමයක ප්‍රධාන ඉංජිනේරු තැන ඉඩ දෙතහොත් ඔහු වරදකරු වන අතර, රුපියල් විසි පන්දහසකට නොවැඩි දඩයකට ඔහු යටත් වන්නේ ය.

(5) මේ වගන්තියෙහි, “ වායු රිසීවරය ” යන පාඨයෙන් --

(අ) නළයක් හෝ දරණුවක් හෝ සංපීඩකයක උපාංගයක් හෝ සවි කිරීමක් හෝ කොටසක් හෝ නො වන වාත සංපීඩක යන්ත්‍රයක් හා සම්බන්ධ වූ , සංපීඩනය කරනු ලැබූ වාතය ඇතුළත් භාජනයක්, හෝ

(ආ) ඇතුළත දවන එන්ජිමක් ක්‍රියා කරවීමේ කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන, සංපීඩනය කරනු ලැබූ වාතය හෝ සංපීඩනය කරනු ලැබූ හිස් කරන වායු ඇතුළත් සවි කරනු ලැබූ යම් භාජනයක්, හෝ

(ඇ) සංපීඩනය කරනු ලැබූ වාතය මගින් යම් සායමක්, ඔප තෙලක් වෙනත් ඔපතෙල් වර්ගයක් හෝ එබඳු ද්‍රව්‍යයක් ඉසීමේ කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන , ඉසින උපකරණයක කොටසක් නො වන යම් සවි කරනු ලැබූ හෝ ගෙන ගිය හැකි භාජනයක්, හෝ

2000 අංක 33, 7

(ඈ) තෙල්, ද්‍රවයක් හෝ සමාන ද්‍රව්‍යයක් තැන්පත් කර ඇත්තා වූ ද , සම්පීඩිත වාතය හෝ යම් වායුවක් මගින් ඒ තෙල් , ද්‍රවය හෝ සමාන ද්‍රව්‍යය පිට කරනු ලබන්නා වූ ද යම් භාජනයක් අදහස් කෙරෙයි.

එසේ ද වුවත්, මේ වගන්තියේ (ඇ) ඡේදයෙහි හෝ (ඈ) ඡේදයෙහි සඳහන් කරනු ලැබූ යම් භාජනයකට, මේ වගන්තියේ (1) වෙනි උප වගන්තියේ (ඉ) ඡේදයේ විධිවිධාන අදාළ නො විය යුතු ය.

වායු ග්‍රාහක

1976 අංක 12, 11

36 අ. (1) සෑම වායු ග්‍රාහකයක ම ---

(අ) ප්‍රවේසම් සහිත වැඩ කිරීමේ පීඩනය පැහැදිලි ලෙස පෙනෙන පරිදි එහි ලකුණු කොට තිබිය යුතුය;

(ආ) සම්පීඩන යන්ත්‍රයක් හා සම්බන්ධ කොට ඇති ග්‍රාහකයන් සම්බන්ධයෙන් නම් එය සම්පීඩකයෙහි ලබාගත හැකි උපරිම පීඩනයට අනතුරු විරහිතව ඔරොත්තු දෙන සේ තනා තිබිය යුතු ය; නැතහොත් ග්‍රාහකයේ ප්‍රෙවිසම් සහිත වැඩ කිරීමේ පීඩන ඉක්මවීම වැළැක්වීමට සුදුසු හීන කිරීමේ කපාටයක් හෝ වෙනත් සුදුසු උපකරණයක් එයට සවි කොට තිබිය යුතුය;

(ඇ) ප්‍රවේසම් සහිත වැඩ කිරීමේ පීඩනය ඉක්ම වූ වහාම වායු පිටවීමට ඉඩ ඇති සේ සකස් කරනු ලැබූ සුදුසු ආරක්ෂක කපාටයක් එයට සවි කොට තිබිය යුතු ය.

(ඈ) ග්‍රාහකයේ පීඩනය වර්ග අඟලකට රාත්තල් කොපමණ ද යන්න දක්වන නිවැරදි පීඩන මාපකයක් එහි සවි කොට තිබිය යුතු ය;

(ඉ) ග්‍රාහකය ගලනය කිරීම සඳහා සුදුසු උපකරණයක් සවි කොට තිබිය යුතුය ;

(ඊ) ඇතුළත සම්පූර්ණ ලෙස පිරිසිදු කළ හැකි මිනිස් කවාටයක්, අත් කවාටයක් හෝ වෙනත් ක්‍රමයක් සපයා තිබිය යුතු ය.

(2)(අ) යම් වායු ග්‍රහකයක අඩංගු දේවල ක්‍රියාවලියේ හෝ ක්‍රියාවේ ස්වභාවය නිසා පීඩන මාපකයක් හෝ ආරක්ෂක කපිටයක් හෝ ඒ දෙකම විශ්වාසදායී ලෙස වැඩ කරතැයි බලාපොරොත්තු විය නොහැකි කවර හෝ අවස්ථාවක දී ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු තැනගේ අවසරය ඇතිව සහ මේ උපවගන්තියේ (ආ) ඡේදයට අනුකූල වීමට යටත් ව , අත්හදා බලන ලද්දා වූ හා විශ්වාසදායී ලෙස වැඩ කරන්නා වූ ඉහළ අංශකයක උෂ්ණත්වයක් වාර්තා කිරීමට හැකියාවක් ඇති තාප මානකයක් සවි කරනු ලැබිය හැකි අතර ග්‍රාහකයට දැරිය හැකි උපරිම උෂ්ණත්වය එහි පැහැදිලිව සටහන් කොට තිබිය යුතුය.

(ආ) ග්‍රාහකයේ කාර්මික ක්‍රියාවලියේ හේතුවකින් ආරක්ෂක කපාටය වෙනුවට තාප මානකයක් යෙදීම අවශ්‍ය වන කල්හි අවසර දෙන ලද පීඩනයට වඩා සියයට විසි පළුකට නොවැඩි ප්‍රමාණයකින් පීඩනය ඉහළ නගින විට පුපුරණ ආරක්ෂක පේනුවකව් ග්‍රාහකයට සවිකර තිබිය යුතුය. යම් කාර්මික හේතුවක් නිසා එවැනි පේනුවක් සවි කිරීමට නොහැකි වන විට පීඩනය හෝ උෂ්ණත්වය ප්‍රවේසම් සහිත මට්ටමෙන් ඉහළ යන විට ක්‍රියා කිරීම අරඹන සුදුසු සංඥා උපක්‍රමයක් , උපකරණවලින් එකක ( පීඩන මාපකයෙහි හෝ තාප මානකයෙහි ) සවි කරනු ලැබිය හැකිය. පිපිරීම් ඇති විය හැකි වාතාවරණයක ගිනි පුපුරකින් හෝ වෙනත් එවැනි හේතු නිසා කර්මාන්තශාලා භූමියෙහි පිපිරීමක් ඇති වීම වැළැක්වෙන පරිද්දෙන් එම සංඥා උපක්‍රමය තනා තිබිය යුතුය.

(3) පුපුරණ සුළු හෝ විෂ සහිත වායු ග්‍රාහකයට ඇතුළු විය හැකි හෝ එය තුළ ඇති විය හැකි යම් අවස්ථාවක, ආරක්ෂක කපාටවල සහ පේනුවල හෝ වෙනත් උපක්‍රමවල සිට කර්මාන්තශාලා භූමියෙන් පිටතට යන නල මාර්ග වැනි උපක්‍රම මගින් එම වායු වර්ග වැඩපළවලට ඇතුළුවීම විශ්වාසදායී ලෙස වැළැක්විය යුතුය . විෂ සහිත වායු කර්මාන්තශාලා භූමියෙන් පිටවීමට ඉඩ හැරීමට පෙර සුදුසු ෆිල්ටරයකින් හෝ වෙනත් උපක්‍රමයකින් ඒවා හානිකර නොවන තත්වයකට පත් කළ යුතු ය.

(4) විවෘත කළ හැකි සෑම භාජනයක ම, භාජනය විවෘත කිරීමට පෙර එම භාජනයෙහි පීඩනය වායු ගෝලීය පීඩනය දක්වා අඩු කිරීමට හැකි, විශ්වාසදායී ලෙස ක්‍රියා කරන උපක්‍රමයක් තිබිය යුතුය.

(5) යම් ස්ථානයක පිටත සවිකර ඇති භාජනයක සවිකිරීම් වායුගෝලීය බලපෑම්වලින් ආරක්ෂා කොට තිබිය යුතු ය.

(6) පීඩනය යටතේ ද්‍රව කරන ලද වායු හෝ විෂ වායු අඩංගු සෑම ග්‍රාහකයක් ම තාපය ලැබෙන බාහිර මාර්ගවලින් ආරක්ෂා කොට තිබිය යුතුය.

(7) යම් කර්මාන්තශාලාවක ග්‍රාහක එකකට වැඩි ගණනක් පාවිච්චි කරනු ලබන කල්හි සෑම ග්‍රාහකයකට ට හඳුනා ගැනීමේ සලකුණක් තිබිය යුතු අතර, එය පහසුවෙන් පෙනී යන පරිදි තිබිය යුතුය.

(8) ආරක්ෂක කපාටවලට සහ පීඩන මාපකවලට අදාළ මේ වගන්තියෙහි පෙරාතුව වූ විධිවිධානවල කාර්යය සඳහා තනි නළයක් මගින් වායු සපයනු ලබන යම් වායු ග්‍රාහක කට්ටලයක් එක් ග්‍රාහකයක් වශයෙන් සළකනු ලැබිය හැකිය.

එසේ වුව ද ආරක්ෂා සහිත ලෙස වැඩ කිරීමේ පීඩනය ඉක්මවීම වැළැක්වීම පිණිස සුදුසු හීන කිරීමේ කපාටයක් හෝ වෙනත් සුදුසු උපකරණයක් සවි කිරීම අවශ්‍ය වන අවස්ථාවක කපාටය හෝ උපකරණය ඉහත කී තනි නළයට සවි කර ඇත්නම් මිස මේ උපවගන්තියේ විධිවිධාන අදාළ නොවන්නේය.

(9) සෑම වායු ග්‍රාහකයක් ම හා එහි සවිකිරීම් මනා ලෙස තනා තිබිය යුතු අතර, ඒවා නිසියාකාරව නඩත්තු කරනු ලැබිය යුතුය.

(10) සෑම වායු ග්‍රාහකයක් ම හා එහි සවිකිරීම් සෑම දොලොස් මසක කාලපරිච්ඡේදයකට යටත් පිරිසෙයින් එක් වරක්වත් සම්පූර්ණයෙන් පිරිසිදු කිරීම සහ පරීක්ෂා කිරීම කරනු ලැබිය යුතුය.

එසේ වුව ද අභ්‍යන්තර පෘෂ්ඨය සම්පූර්ණ ලෙස පරීක්ෂා කිරීමට ඉඩ නොලැබෙන වාටි මූට්ටු රහිත නිර්මාණයක් වූ ග්‍රාහකයක්

සම්බන්ධයෙන් වූ විට , අභ්‍යන්තර පරීක්ෂණය වෙනුවට ඒ ග්‍රාහකයේ සුදුසු ද්‍රව පීඩන පරීක්ෂණයක් කරනු ලැබිය යුතුය.

එවැනි සෑම පරීක්ෂණයක් ම කිරීම කොමසාරිස් විසින් ඒ සඳහා නිකුත් කරන ලද සහතිකයක් දරන තැනැත්තකු විසින් කරනු ලැබිය යුතු අතර, ( ප්‍රවේසම් සහිත වැඩ කරන පීඩනය ඇතුළු ) නියම කරනු ලැබිය හැකි විස්තර ඇතුලත් එවැනි සෑම පරීක්ෂණයක ම ප්‍රතිඵලය පොදු ලේඛනයේ ඇතුළත් කරනු ලැබිය යුතුය ; නැතහොත් ඊට අමුණා තැබිය යුතුය.

1998 අංක 18 , 6

(11) එවැනි යම් පරීක්ෂණයක් පැවැත්වීම පිණිස යොදවන ලද තැනැත්තා මේ වගන්තියෙන් නියමිත පරිදි සම්පූර්ණ පරීක්ෂණයක් කිරීම පැහැර හැරියහොත් හෝ යම් අවශ්‍යයෙන් ම තිබිය යුතු කරුණක් සම්බන්ධයෙන් අසත්‍ය වූ හෝ අසම්පූර්ණ වූ වාර්තාවක් සැපයුවහොත් හෝ වායු ග්‍රාහක පරීක්ෂා කිරීමේ යම් සමාගමක හෝ සංගමයක ප්‍රධාන ඉංජිනේරුවෙක් එවැනි යම් වාර්තාවක් සැපයීමට ඉඩ දෙතහොත් ඔහු වරදකරුවකු වන අතර , රුපියල් විසි පන්දහසකට නොවැඩි දඩයකට යටත් වන්නේය.

(12)විවිධ වායු වර්ග සම්බන්ධයෙන් ගත යුතු අතිරේක ආරක්ෂක පියවරවල් සඳහා අමාත්‍යවරයා විසින් නියෝග මගින් විධිවිධාන සලස්වනු ලැබිය හැකිය.

(13)මේ වගන්තියෙහි “ වායු ග්‍රාහක ” යන යෙදුමෙන් --

(අ) සම්පීඩිත වායු වර්ගයක් පිරවීම සඳහා වූ ද සම්පීඩක යන්ත්‍රයකට සම්බන්ධ කොට තිබෙන්නා වූ ද ( සම්පීඩකයක නලයක් හෝ දහරයක් හෝ උපකාරකයක්, සවි කිරීමක් හෝ කොටසක් නොවන්නා වූ ) යම් භාජනයක්; හෝ

(ආ) සම්පීඩිත, ද්‍රව කරන ලද හෝ දිය කරන ලද වායු අඩංගු කිරීම සඳහා වූ යම් භාජනයක්

අදහස් වේ.

හුමාල බොයිලේරු, හුමාල ග්‍රාහක සහ භාජන, වාත සහ වායු ග්‍රාහක සම්බන්ධයෙන් අත්හැරීම

1976 අංක 12, 12

37. ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු තැන විසින් සහතිකයක් මගින් , පෙරාතුව වූ වගන්ති හතරේ යම් විධිවිධානයක් සාධාරණ ලෙස අදාළ කළ නොහැකි බවට තමා සෑහීමට පත් වන යම් හුමාල බොයිලේරු, හුමාල ග්‍රාහක, හුමාල භාජන, වාත ග්‍රාහක හෝ වායු ග්‍රාහක පංතියක් හෝ වර්ගයක් ඒ විධිවිධානය අදාළ වීමෙන් අත්හළ හැකිය. එවැනි කිසියම් අත්හැරීමක් කොන්දේසි විරහිතව හෝ සහතිකයේ සඳහන් කරන කොන්දේසිවලට යටත්ව කරනු ලැබිය හැකිය.

ජල මුද්‍රා තබනු ලැබූ වායු භාජන සම්බන්ධයෙන් ආරක්ෂක සංවිධාන

1976 අංක 12, 13

38. (1) සෑම වායු භාජනයක් ම යහපත් ලෙස තනා තිබිය යුතුවත් හැර ඒවා නිසි ලෙස පවත්වා ගෙන යා යුතු ය.

(2) සෑම වායු ධාරයක් ම සෑම අවුරුදු දෙකකක කාල පරිච්ඡේදයකට ම යටත් පිරිසෙයින් එක් වරක්වත් බාහිර ව සම්පූර්ණයෙන් පරීක්ෂා කිරීම, ඒ සඳහා කොමසාරිස් විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නකු විසින් කරනු ලැබිය යුතු අතර , නියම කරනු ලැබිය හැකි විස්තර ඇතුළත් ඒ සෑම පරීක්ෂණයක ම වාර්තාවක් ප්‍රධාන ලේඛනයේ ඇතුළත් කරනු ලැබිය යුතුය ; නැතහොත් ඊට අමුණා තැබිය යුතුය.

(3) ආරෝහනයක් අවුරුදු විස්සකට වැඩි කාලයක් පාවිච්චි කරනු ලැබූ යම් වායු භාජනයක් සම්බන්ධයෙන්, මේ වගන්තිය ක්‍රියාවේ

යෙදවීමෙන් පසු අවුරුදු දෙකක් ඇතුළත ද , ඊට පසු සෑම අවුරුදු දහයක කාලයක දී යටත් පිරිසෙයින් වරක් ද තහඩුවෙහි ඇතුල් පැත්තෙහි තත්ත්වය, භාජනයෙහි මුදුනෙන් හෝ පැතිවලින් ආදර්ශ කොටස් කැපීමෙන් හෝ වෙනත් ප්‍රමාණවත් ක්‍රමයකින් ලේකම් විසින් බලය දෙනු ලැබූ තැනැත්තකු ලවා පරීක්ෂා කර විය යුතුය . තවද එසේ කපනු ලැබූ සියලු ම ආදර්ශ කොටස් ද , පරීක්ෂා කරන තැනැත්තා විසින් අත්සන් කරනු ලැබූ , එබඳු සෑම පරීක්ෂණයක වාර්තාවක් ද , පරීක්ෂණය සඳහා තැබිය යුතු ය.

(4) කර්මාන්ත ශාලාවේ සෑම වායු භාජනයක ම ආදි ම ආරෝහනයේ තැනීමේ දිනය , දැනගන්ට හැකි තරමින් දැක්වෙන, කර්මාන්ත ශාලාවේ පදිංචිකාරයා විසින් හෝ ඒ සඳහා බලය දෙනු ලැබූ වගකිව යුතු නිලධාරියකු විසින් හෝ අත්සන් කරනු ලැබූ වාර්තාවක් පරීක්ෂණය සඳහා තැබිය යුතුය.

(5) කර්මාන්ත ශාලාවෙහි වායු භාජන එකකට වඩා ඇති විට, එම සෑම වායු භාජනයක් ම එහි ප්‍රකට ස්ථානයක හැඳින්වීමේ අංකයකින් හෝ අකුරකින් ලකුණු කොට තිබිය යුතුය.

(6) තමා ලත් පුහුණුවෙන් ද , පළපුරුද්දෙන් ද පිපිරීමේ අන්තරායට හා වායුවට මිනිසුන් යටත්වීමේ අන්තරායට විරුද්ධ ව ගත යුතු අවශ්‍ය ආරක්ෂක සංවිධාන පිළිබඳ දැන්මෙන් ද , අලුත් වැඩියා කිරීමේ හා කඩා දැමීමේ වැඩක් පාලනය කිරීමට සුදුසු තැනැත්තකුගේ නියම පාලනයක් යටතේ මිස අන් කිසි ම අවස්ථාවකදී වායු භාජනයක් අලුත්වැඩියා කිරීම හෝ කඩා දැමීම හෝ නොකළ යුතුය.

1976 අංක 12,13 (6 අ) යම් වායු ධාරකයක හෝ වායු ධාරක පන්තියක සැලැස්ම, ඉදිකිරීම සහ ධාරිතාව සහ එම වායු ධාරකය හෝ වායු ධාරක පන්තිය ප්‍රයෝජනයට ගන්නා කාර්යය සැලකිල්ලට ගැනීමෙන් පසුව ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු තැන විසින් සහතිකයක් මගින් , ඒ සහතිකයේ නිශ්චය කරනු ලැබිය හැකි කොන්දේසිවලට යටත් ව එම වායු ධාරකය හෝ වායු ධාරක පන්තිය මේ වගන්තියේ විධිවිධානවලට අනුකූල වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබිය හැකිය.

1976 අංක 12,13 (7) මේ වගන්තියේ “ වායු ධාරකය ” යන්නෙන් ජල මුද්රිත වායු ධාරකයක් අදහස් වේ.

නියෝග

1976 අංක 12, 14

38 අ. (1) 34 වන, 35 වන ,36 වන , 36 අ වන සහ 38 වන වගන්තිවල සඳහන් සහතික නිකුත් කිරීමට අදාළ සියලුම කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග මගින් විධිවිධාන සැලැස්විය හැකිය.

(2) විශේෂයෙන් ම සහ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොවන පරිදි ---

(අ) සහතික නිකුත් කිරීම සහ වාර්ෂික ව ඒවා අලුත් කිරීම;

(ආ) සහතිකය සඳහා ඉල්ලුම් පත්‍රයේ ආකෘතිය සහ එවැනි ඉල්ලුම් පත්‍ර සමග ගෙවිය යුතු ගාස්තු;

(ඇ) ඉල්ලුම්කරුවකුට තිබිය යුතු සුදුසුකම් හෝ පළපුරුද්ද;

(ඈ) සහතිකයට අදාළ විය යුතු කොන්දේසි සහ යම් සහතිකයක් කොමසාරිස් විසින් අවලංගු කරනු ලැබීමට හේතු විය හැකි කරුණු

එම නියෝග මගින් නියම කරනු ලැබිය හැකිය.

ගින්නක් ඇති වූ විට බේරීමේ මාර්ග

1998 අංක 18, 7

39. (1) කර්මාන්ත ශාලාවෙහි සේවයෙහි යෙදී සිටින තැනැත්තන්ට එක් එක් අවස්ථාවල දී ගින්නක් ඇති වූ විට යුක්ති සහගත

ව වුවමනා විය හැකි, බේරීමේ මාර්ග, මේ වගන්තිය අදාළ වන සෑම කර්මාන්ත ශාලාවකට ම සපයා ඇති බව, පරීක්ෂකයකු විසින් සහතික කළ යුතු ය. එබඳු සහතික පත්‍රයක් බල නොපවත්නා යම් ස්ථානයක් කර්මාන්ත ශාලාවක් ලෙස ප්‍රයෝජන ගතහොත් පදිංචිකාරයා වරදකට වරදකාරයකු ව , එසේ වරදකාරයා වීමේ දී රුපියල් විසිපන්දහස නොඉක්මවන දඩයකට යටත් විය යුතුය. එසේ වරදකාරයා කරනු ලැබූ වරද, වරදකාරයා වීමෙන් පසුත් නැවත ඔහු කළහොත් (108 වෙනි වගන්තියේ විධිවිධානවලට යටත් ව ) තවත් වරදකට වරදකරුවකු විය යුතු ය. ඒ සම්බන්ධයෙන් ඒ වරද කරන එක් එක් දවසට ඔහු රුපියල් පන් සියයකට වැඩි නොවන දඩයකට ද යටත් විය යුතුය. දිස්ත්‍රික්කයේ පිහිටි සෑම කර්මාන්ත ශාලාවක් ම පරීක්ෂා කිරීම ද ඉහතකී පරිදි , කර්මාන්ත ශාලාවෙහි බේරීමේ මාර්ග සලසා තිබෙන බව තමාට ඒත්තු ගිය විට , ඒ අනුව එබඳු සහතිකයක් දීම ද සෑම දිස්ත්‍රික්කයේ පරීක්ෂකයකුගේ ම යුතුකම විය යුතුය. එසේ සලස්වන ලද බේරීමේ මාර්ගය නියම ලෙස , විස්තර සහිත ව සහතිකයෙහි සඳහන් කොට තිබිය යුතු ය . තව ද කර්මාන්ත ශාලාවෙහි සම්පූර්ණයෙන් ම හෝ පරීක්ෂකයාහට සුදුසු ය යි හැගෙතොත් එහි යම් නියමිත කොටසක හෝ සේවයෙහි යෙදී සිටින හෝ යෙදවීමට බලාපොරොත්තු වන වැඩි ම කම්කරුවන් ගණන ද , එහි ගබඩා කරනු ලබන නැතහොත් පාවිච්චි කරනු ලබන පිපිරෙන සුලු හෝ වහා ගිනි ඇවිලෙන සුලු ද්‍රව්‍ය පිළිබඳ ව ද සහතිකය දීමෙහි දී සැලකිල්ල දැක්වූ වෙනත් කරුණු ද ඒ සහතිකයෙහි ඇතුළත් විය යුතු ය . සහතිකය පදිංචිකාරයා විසින් සාමාන්‍ය ලේඛන පොතට අමුණා තිබිය යුතු ය.

(2) ඉහත සඳහන් සහතිකයෙහි දක්වනු ලැබූ සියලු ම බේරීමේ මාර්ග බාධා විරහිත ව නිසි ලෙස පවත්වා ගෙන යා යුතු ය.

(3) මේ වගන්තිය ක්‍රියාවේ යෙදවීමට පෙර ඉදි කරනු ලැබූ හෝ කර්මාන්ත ශාලාවකට පරිවර්තනය කරනු ලැබූ හෝ යම් කර්මාන්ත ශාලාවක් සම්බන්ධයෙන් මේ වගන්තිය ක්‍රියාවේ යෙදීම හා මේ වගන්තිය යටතේ කර්මාන්ත ශාලාව පරීක්ෂා කිරීමෙන් පසු ව , පරීක්ෂකයා විසින් සහතිකයක් දීම හෝ දීමට බැරිය කීම යන කාලය අතරතුර කර්මාන්ත ශාලාව පාවිච්චි කිරීම යන කරුණ නිසාම , මේ වගන්තිය යටතේ කිසි වරදක් කළ ලෙස නො සැලකිය යුතු ය . තවද කර්මාන්ත ශාලාවෙහි වෙනස් කිරීම් කරන තෙක් පරීක්ෂකයා සහතිකය දීමට බැරිය කී අවස්ථාවක දී , පරීක්ෂකයාගේ නියමයන් ප්‍රකාර වෙනස් කිරීම් කරන කාල තුළ කිසි වරදක් කළ ලෙස ද නො සැලකිය යුතු ය.

(4) සහතිකයක් ලැබීමෙන් පසු , කර්මාන්ත ශාලාව විශාල කිරීමට හෝ අවශ්‍ය ආකෘතිය වෙනස්කම් කිරීමට හෝ කර්මාන්ත ශාලාවෙහි හෝ සහතිකයෙහි සඳහන් යම් කොටසක හෝ සේවයෙහි යෙදී සිටින කම්කරු සංඛ්‍යාව වැඩි කිරීමට හෝ කර්මාන්ත ශාලාවෙහි පිපිරෙන සුළු හෝ වහා ගිනි ඇවිලෙන සුළු ද්‍රව්‍ය ගබඩා කිරීම හෝ පාවිච්චි කිරීම පටන් ගැනීමට හෝ ඒ ගබඩා කිරීමේ හෝ පාවිච්චි කිරීමේ ප්‍රමාණය වැඩි කිරීමට හෝ අදහස් කරනු ලැබුවහොත් එම අදහස පරීක්ෂකයාහට පදිංචිකාරයා විසින් දැන්විය යුතු ය.

(5) කලින් කී වගන්තියේ සඳහන් දැන්වීම ලැබීමෙන් පසු , ගින්නක් ඇති වූ විටක දී බේරීම සම්බන්ධ වූ තත්ත්වය වෙනස්වන බව පරීක්ෂකයාගේ අදහස නම්, නැතහොත් වෙනස් තත්ත්වය නිසා එවකට පවත්නා බේරීමේ මාර්ගය ප්‍රමාණවත් නො වන බව ඔහුට ඒත්තු

ගියහොත්, දැන්වීමේ සඳහන් කාලයක් ඇතුළත, එහි සඳහන් වූ වෙනස් කිරීම් කරන ලෙස පදිංචිකාරයාට පරීක්ෂක විසින් නියම කළ හැකි ය.

(6) මේ වගන්තිය යටතේ පරීක්ෂකයා විසින් යවනු ලැබූ දැන්වීමෙහි සඳහන් කාලය ඇතුළත, දැන්වීමෙන් නියම කොට ඇති වෙනස් කිරීම්, පදිංචිකාරයා විසින් කළ යුතු ය. එ සේ ඒවා කිරීමෙන් පසු, පරීක්ෂකයා විසින් සහතිකය සංශෝධනය කළ යුතු ය. නැතහොත් අලුත් සහතිකයක් නිකුත් කළ යුතුය . ඒ වෙනස් කිරීම් නොකළහොත්, පරීක්ෂකයා විසින්, වෙනත් නීති කෘත්‍ය පැවරීමේ බලයට හානියක් නො වන පරිදි, සහතිකය අවලංගු කළ යුතුය.

(7) මෙම වගන්තිය 1976 අංක 12, 15 වගන්තිය මගින් ඉවත් කර ඇත.

(8) මේ වගන්තිය අදාල වන යම් කර්මාන්ත ශාලාවක, ගින්නක් ඇති වූ විට සලසා ඇති බේරීමේ මාර්ගවල තත්ත්වය ඒ කර්මාන්ත ශාලාව හෝ ඉන් කොටසක්, අන්තරාය නැති කිරීමට විධිවිධාන යොදන තෙක් පාවිච්චි නො කළ යුතු ආකාරයට හෝ විශේෂ නිපදවීම් ක්‍රමයක් හෝ වැඩක් සඳහා පාවිච්චි නො කළ යුතු ලෙස අන්තරායදායක බව පරීක්ෂකයාට පෙනී ගිය අවස්ථාවක දී, ඔහු විසින් සුලු අපරාධ අධිකරණයකට පැමිණිලි කළ හැකි ය . ඉහතකී කරුණු අධිකරණයට ඒත්තු ගිය විට , ඒ අන්තරාය නැති කිරීමට අවශ්‍ය වැඩ සම්පූර්ණ කරන තෙක් කර්මාන්ත ශාලාව හෝ ඉන් කොටසක් හෝ පාවිච්චි කිරීම නැතහොත් ඒ විශේෂ නිපදවීම් ක්‍රමය හෝ වැඩ සඳහා පාවිච්චි කිරීම ආඥාවකින් අධිකරණය විසින් තහනම් කළ හැකිය.

ඉහත සඳහන් ආඥාව ප්‍රකාර, යම් වැඩක් කළ අවස්ථාවක දී, ඒ කර්මාන්ත ශාලාව සම්බන්ධයෙන් මේ වගන්තිය යටතේ බල පැවැත්වූ සහතිකය පරීක්ෂකයා විසින් අවස්ථානුකූල ව සංශෝධනය කළ යුතු ය . නැතහොත් අලුත් සහතිකයක් නිකුත් කළ යුතු ය.

(9) මේ වගන්තිය පහත දැක්වෙන කරුණු සිදුවී ඇති සෑම කර්මාන්ත ශාලාවකට ම අදාළ විය යුතු ය :-

එනම් --

(අ) එහි විසි දෙනකුට වැඩි ගණනක් සේවයෙහි යෙදීම ; හෝ

(ආ) නියමිත දිනයේ දී එය ඉදි කරමින් තිබීම හෝ කර්මාන්ත ශාලාවක් වශයෙන් පාවිච්චි කරනු ලැබීම හෝ නියමිත දිනයෙන් පසු ඉදි කරනු ලැබීම හෝ කර්මාන්ත ශාලාවක් වශයෙන් පාවිච්චි කරනු ලැබීම හා එහි එකම ගොඩනැගිල්ලේ බිමට ඉහළින් වූ යම් මාලයක දහ දෙනකුට වඩා සේවයෙහි යෙදී සිටීම; හෝ

(ඇ) නියමිත දිනට පෙර එහි ඉදි කිරීම සම්පූර්ණ කොට තිබීම හා ගොඩනැගිල්ලේ පළමුවෙනි මාලයට ඉහලින් හෝ බිම සිට අඩි විස්සක් ඉහලින් හෝ එක ම ගොඩනැගිල්ලේ දහ දෙනෙකුට වඩා සේවයෙහි යෙදී සිටීම ; හෝ

(ඈ) එහි ඇතුළත හෝ යට පිපිරෙන සුලු හෝ වහා ගිනි ඇවිලෙන සුලු ද්‍රව්‍ය ගබඩා කොට තිබීම හෝ පාවිච්චි කරනු ලැබීම හෝ

වේ.

ගින්නක් ඇති වූ විට බේරීමේ මාර්ග පිළිබඳ නියෝග

40. (1) කර්මාන්ත ශාලාවල හෝ යම් වර්ගයකට හෝ විස්තරයකට වැටෙන කර්මාන්ත ශාලාවල හෝ ගින්නක් ඇති වූ විට සැලැස්විය යුතු බේරීමේ මාර්ග පිළිබඳ ව ඇමතිවරයා විසින් නියෝග පැනවිය හැකි ය.

(2) මේ වගන්තිය යටතේ පනවනු ලැබූ නියෝගවලට අනුකූල නො වූ යම් කර්මාන්ත ශාලාවක් සම්බන්ධයෙන්, කලින් කී වගන්තිය යටතේ සහතිකයක් නිකුත් කරනු ලැබී නම්, කර්මාන්ත ශාලාව නියෝගවලට අනුකූල වනු පිණිස අවශ්‍ය යයි පරීක්ෂකයාහට හැගෙන වෙනස් කිරීම්, දැන්වීමෙහි සඳහන් කරනු ලැබූ කාලයක් ඇතුළත, කරන ලෙස නියම කරන දැන්වීමක් කර්මාන්ත ශාලාවෙහි අයිතිකාරයා වෙත භාර කරවිය යුතු ය. තවද කලින් කී වගන්තියේ විධිවිධාන ඒ වගන්තිය යටතේ පරීක්ෂකයාගේ දැන්වීමකට අදාළ වන්නා සේ ම එබඳු දැන්වීමක් සම්බන්ධයෙන් ද ඒවා අදාළ විය යුතු ය.

ගින්නක් ඇති වූ විට ආරක්ෂක සංවිධාන

41. (1) සේවය කිරීම සඳහා හෝ ආහාර ගැනීම සඳහා හෝ යම් තැනැත්තකු කර්මාන්ත ශාලාවක් ඇතුළෙහි සිටින විට , කර්මාන්ත ශාලාවෙහි දොරවල් ද ඒ තැනැත්තා සිටින කාමරයේ දොරවල් ද කර්මාන්ත ශාලාවෙහි සේවයෙහි යෙදී සිටින තැනැත්තන්ට යම් ගොඩනැගිල්ලකින් හෝ කර්මාන්ත ශාලාව පිහිටි කොරටුවකින් හෝ පිටවීමේ මාර්ගයක් සලසන දොරවල් ද , ඇතුළෙන් වහා පහසු ලෙස විවෘත කිරීමට නො හැකි වන පරිදි යතුරු දමා හෝ අගුලු දමා හෝ නො තිබිය යුතු ය.

(2) දහ දෙනකුට වඩා වැඩි ගණනක් සේවයෙහි යෙදී සිටින කාමරයක පඩි පෙළකට හෝ බරාඳයකට හෝ විවෘත වන දොරවල් ද , මේ වගන්තිය ක්‍රියාවේ යෙදවීමෙන් පසු ඉදි කරනු ලැබූ හෝ කර්මාන්ත ශාලාවක් වශයෙන් පාවිච්චි කරනු ලැබූ හෝ කර්මාන්ත ශාලාවක් සම්බන්ධයෙන්, එහි සේවය කරන තැනැත්තන්ට පිටවීමේ මාර්ගයක් සලස්වන අනිත් සියලු ම දොරවල් ද, ඒවා ලිස්සුම් දොරවල් නුවුවහොත්, පිටතට විවෘත වන ලෙස තනා තිබිය යුතු ය.

(3) එක ම ගොඩනැගිල්ලෙන් බිමට ඉහලින් දහ දෙනකුට වඩා සේවයෙහි යෙදී සිටින්නාවූ ද, මේ වගන්තිය ක්‍රියාවේ යෙදවීමට පෙර ඉදි කරනු ලැබූ නැතහොත් කර්මාන්ත ශාලාවක් වශයෙන් පාවිච්චි කරනු ලැබූ යම් කර්මාන්ත ශාලාවක, ගොඩනැගිල්ලෙන් පිටවීමට මාර්ගයක් සලසන පඩි පෙළ මුල පිහිටි දොරක්, සැම වේලෙහි ම විවෘත කොට තබා නැත්නම් හා ලිස්සුම් දොරක් නුවුවහොත්, පිටතට විවෘත වන ලෙස ඉදි කොට තිබිය යුතු ය.

(4) මේ වගන්තිය ක්‍රියාවේ යෙදවීමෙන් පසු , ගොඩනැගිල්ලක ඇතුළෙහි ඉදි කරනු ලැබූ සැම ඔසවන යන්ත්‍ර මාර්ගයක් හෝ සැම සෝපාන යන්ත්‍ර මාර්ගයක් ම, මින් මතු සඳහන් කරුණුවලට යටත්ව, ගින්දර ඔරොත්තු දෙන ද්‍රව්‍ය වලින් සම්පූර්ණයෙන් ම කොටු කොට තිබිය යුතු ය . ඔසවන යන්ත්‍රයට හෝ සෝපාන යන්ත්‍රයට ප්‍රවේසවීමේ මාර්ගවලට ගින්දර ඔරොත්තු දෙන ද්‍රව්‍යවලින් සෑදූ දොරවල් සවි කොට තිබිය යුතු ය.

එ සේ ද වුවත්, එබඳු ඔසවන යන්ත්‍ර මාර්ගයක හෝ සෝපාන යන්ත්‍ර මාර්ගයක මුදුන පමණක් ගින්නෙන් දැවිය හැකි යම් ද්‍රව්‍යයකින් කොටු කොට තිබිය යුතුය. නැතහොත් මුදුනෙහි සිදුරක් තිබිය යුතු ය.

(5) කලින් කී උප වගන්තියේ නියම ඉෂ්ට කිරීම නුසුදුසු බව හෝ අයෝග්‍ය බව ප්‍රධාන පරීක්ෂකයාහට ඒත්තු ගිය අවස්ථාවක දී , ඒ නියමවලින් යමක් ඉෂ්ට කිරීම , සහතිකයෙහි සඳහන් යම් කොන්දේසිවලට යටත් ව, ප්‍රධාන පරීක්ෂක විසින් සහතිකයකින් නිදහස් කළ හැකි ය.

(6) සෑම ජනේලයක් ම, දොරක් ම හෝ ගින්නක් ඇති වූ විට බේරීමේ මාර්ගයක් සලස්වන හෝ සාමාන්‍යයෙන් ප්‍රයෝජනයට ගන්නා පිටවීමේ මාර්ගය හැර , ප්‍රවේශය ලබා දෙන වෙනත් පිටවන මාර්ග , සෑහෙන ප්‍රමාණයක වූ රතු අකුරුවලින් මුද්‍රිත දැන්වීමකින් පැහැදිලි ලෙසත්, ප්‍රකට ලෙසත් ලකුණු කොට තිබිය යුතු ය.

(7) යම් කර්මාන්ත ශාලාවක, එක ම ගොඩනැගිල්ලේ විසි දෙනකුට වැඩි ගණනක් යෙදී සිටින විට හෝ , කම්කරුවන් සේවයෙහි යෙදී සිටින වෙනත් ගොඩනැගිල්ලක, පුපුරන සුලු හෝ වහා ගිනි ඇවිලෙන සුලු ද්‍රව්‍ය ගබඩා කොට තිබෙන විට හෝ ඒවා පාවිච්චි කරන විට ගින්නක දී මුලු ගොඩනැගිල්ල තුළ ම පැහැදිලිව ම ඇසිය හැකි අනතුරු හගවන සංඥාවක් දීම සඳහා ද ප්‍රබල විධිවිධාන සැලැස්විය යුතු ය.

1976 අංක 12, 16

(7 අ) (7) වන උපවගන්තියේ සඳහන් ගිනි අනතුරු සංඥා නඩත්තු කිරීම සහ පරීක්ෂා කිරීම සඳහා අමාත්‍යවරයා විසින් නියෝග මගින් විධිවිධාන සැලැස්විය හැකිය.

(8) කම්කරුවන් සේවයෙහි යෙදී සිටින කාමරයක බඩු බාහිරාදිය, ගින්නක් ඇති වූ විට කාමරයෙහි සේවයෙහි යෙදී සිටින සියල්ලන්ට ම බේරීමේ මාර්ගයකට යා හැකි බාධා විරහිත මාර්ගයක් ඇතිවන පරිදි පිලියෙළ කොට තිබිය යුතු ය . නැතහොත් තබා තිබිය යුතුය.

ගින්නක් ඇති වූ විට බේරීමේ මාර්ග පාවිච්චි කිරීම ගැන උපදෙස්

42. (1) යම් කර්මාන්ත ශාලාවක, පළමුවෙනි මාලයට ඉහලින් හෝ බිමට අඩි විස්සක් ඉහලින් හෝ එක ම ගොඩනැගිල්ලේ විස්සකට වැඩි ගණනක් සේවයේ යෙදී සිටින විට හෝ කම්කරුවන් සේවයෙහි යෙදී සිටින ගොඩනැගිල්ලක පිපිරෙන සුලු හෝ වහා ගිනි ඇවිලෙන සුලු ද්‍රව්‍ය ගබඩා කොට තිබෙන විට හෝ ඒවා පාවිච්චි කරන විට , ගින්නක් ඇති වූ විට බේරීමේ මාර්ග පිළිබඳ ව ද, ඒවායින් ප්‍රයෝජන ගැනීම පිළිබඳ ව ද ගින්නක් ඇති වූ විට අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ගය පිළිබඳ ව ද සේවයෙහි යෙදී සිටින සියල්ලන්ට ම හොඳ දැනුමක් නිසැකයෙන් ම ඇති වන පරිදි ප්‍රබල විධිවිධාන සැලැස්විය යුතු ය.

(2) ඉහත කියන ලද අන්දමේ කර්මාන්ත ශාලාවල හෝ යම් වර්ගයක හෝ විස්තරයකට වැටෙන කර්මාන්ත ශාලාවල හෝ ඉහත සඳහන් කාර්යය සඳහා සැලසිය යුතු විධිවිධාන සම්බන්ධයෙන් ඇමතිවරයා විසින් නියෝග පැනවිය හැකිය.

ගිනි නිවන උපකරණ සවි කිරීම නියම කෙරෙන නියෝග

42 අ. (1) සෑම කර්මාන්ත ශාලාවක ම ගිනි නිවන උපකරණ ඒ සඳහා සාදන ලද නියෝගවලට අනුකූලව සපයා තිබිය යුතු ය.

1976 අංක 12, 17

(2) එම උපකරණ සෝදිසි කිරීම සහ පරීක්ෂා කිරීම සඳහා සහ කර්මාන්තශාලාවල ගිනි නිවන උපකරණ සැපයීමට අදාළ වන්නා වූ, සම්බන්ධ වන්නා වූ හෝ ආනුෂංගික වන්නා වූ සියලු කරුණු සඳහා අමාත්‍යවරයා විසින් නියෝග මගින් විධිවිධාන සැලැස්විය හැකිය . විවිධ

පන්තිවල හෝ වර්ගවල කර්මාන්තශාලා සම්බන්ධයෙන් විවිධ උපකරණ සහ ක්‍රම එම නියෝග මගින් නියම කරනු ලැබිය හැකිය.

හදිසි අනතුරු වැළැක්වීම සඳහා විශේෂ ආරක්ෂණ සංවිධාන නියම කිරීමට ලේකම්ට ඇති බලය

1976 අංක 12, 18

43. යම් කර්මාන්ත ශාලාවක හෝ යම් වර්ගයකට හෝ විස්තරයකට වැටෙන කර්මාන්ත ශාලාවක හෝ සිදුවන හදිසි අනතුරු සංඛ්‍යාව හා ඒවායේ ස්වභාවය නිසා ඒ කර්මාන්ත ශාලාවෙහි හෝ ඒ වර්ගයකට හෝ විස්තරයකට වැටෙන කර්මාන්ත ශාලාවක හෝ සේවය කරනු ලබන කම්කරුවන්ගේ ආරක්ෂාව සැලැස්වීම සඳහා විශේෂ විධිවිධාන පැනවිය යුතු බව ලේකම් ට හැඟී ගිය අවස්ථාවක දී, ආරක්ෂාව පිලිබඳ ව ද, හදිසි අනතුරු සිදුවූ අවස්ථා හා ඒවාට හේතු පරීක්ෂා කර බැලීම පිළිබඳ ව ද , ආඥාවෙහි සඳහන් වෙනත් කරුණු පිළිබඳ ව ද විශේෂ පරීක්ෂණය සඳහා පිළියෙළ කිරීමෙන් යුක්ති සහගත විධිවිධාන සැලැස්වීමට පදිංචිකාරයාට නියම කරන ආඥාවක් ලේකම් විසින් පැනවිය හැකි ය.

අන්තරායදායක තත්ත්වයන් සහ ක්‍රියා පිළිබඳව ආඥා පැනවීමේ බලය

1976 අංක 12 , 19

44. (1) 100 වන වගන්තිය යටතේ පත් කරන ලද යම් තැනැත්තකුගේ පැමිණිල්ලක් අනුව මහෙස්ත්‍රාත් අධිකරණයකට --

(අ) කර්මාන්තශාලාවක පාවිච්චි කෙරෙන මාර්ගයක, කර්මාන්තයක, යන්ත්‍රෝපකරණයක හෝ යන්ත්‍රාගාරයක යම් කොටසක් ශාරීරික හානියක් වීමේ අවදානමක් නොමැතිව පාවිච්චි කළ නොහැකි තත්ත්වයකින් පවතින බව හෝ එසේ ඉදිකර ඇති හෝ එසේ පිහිටුවා ඇති බව; හෝ

(ආ) ශාරීරික හානියක් වීමේ අවදානමක් ඇති වන ආකාරයට යම් කර්මාන්තශාලාවක යම් ක්‍රියාවලියක් හෝ වැඩක් කරනු ලබන හෝ කරනු ලැබ ඇති බව ඒත්තු ගිය කල්හි, එම අධිකරණය විසින් අවස්ථාවෝචිත පරිදි ආඥාවක් මගින් --

(i) මාර්ගවල, කර්මාන්තයක, යන්ත්‍රෝපකරණයක හෝ යන්ත්‍රාගාරයක ඒ කොටස පාවිච්චි කිරීම තහනම් කිරීම හෝ එය අළුත්වැඩියා කළ හැකි නම් හෝ වෙනස් කළ හැකි නම් එය විධිමත් පරිදි අළුත් වැඩියා කරන තුරු හෝ වෙනස් කරන තුරු එය පාවිච්චි කිරීම තහනම් කිරීම ; හෝ

(ii) පැමිණිලි කර ඇති අනතුරු වැළකීම පිණිස ආඥාවෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පියවරවල් ගන්නා ලෙස පදිංචිකරුට නියම කිරීම, හෝ

කළ හැකිය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පැමිණිල්ලක් කරනු ලබන හෝ කරනු ලැබ ඇති අවස්ථාවක 100 වන වගන්තිය යටතේ පත් කරන ලද යම් තැනැත්තකු විසින් කරනු ලබන ඒකපාක්ෂික ඉල්ලීමක් අනුව සහ මාර්ගවල , කර්මාන්තයක, යන්ත්‍රෝපකරණයක හෝ යන්ත්‍රාගාරයක එබඳු යම් කොටසක් පාවිච්චියට ගැනීමේ දී හෝ අවස්ථාවෝචිත පරිදි යම් ක්‍රියාවලියක් හෝ වැඩක් පෙර කී ආකාරයකට කරගෙන යෑමේ දී බරපතල ශාරීරික හානියක අවදානමක් තිබීම නොවැළැක්විය හැකි බවටසාක්ෂි ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක, එය පාවිච්චියට ගැනීම , කරගෙන යාම හෝ

කිරීම, පැමිණිල්ල පිළිබඳව විභාග කිරීමට සහ තීරණය කිරීමට හැකි මුල් ම අවස්ථාව එළඹෙන තුරු සම්පූර්ණ වශයෙන් හෝ කොන්දේසිවලට යටත් ව තහනම් කරමින් අධිකරණය විසින් අතුරු ආඥාවක් කරනු ලැබිය හැකිය.

කර්මාන්තශාලා ස්ථානයෙහි ආරක්ෂාව සඳහා ආඥා පැනවීමේ බලය

1976 අංක 12 , 20

44 අ. (1) කර්මාන්තශාලාවක් වන හෝ එහි කොටසක් වන හෝ එවැන්නක් වශයෙන් ප්‍රයෝජනයට ගැනීමට අදහස් කරනු ලබන යම් ස්ථානයක තත්ත්වය හෝ එහි පාලනය හෝ පිහිටීම අනුව , එය තුළ කරගෙන යන්නා වූ හෝ කරගෙන යෑමට අදහස් කරන්නා වූ යම් ක්‍රියාවලියක් හෝ වැඩක් සේවයෙහි යොදවා සිටින තැනැත්තන්ගේ ආරක්ෂාව, සෞඛ්‍යය සහ සුභසිද්ධිය ගැන සැලකිලිමත්ව කරගෙන යෑමට නොහැකි බවට, 100 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ යම් තැනැත්තකුගේ පැමිණිල්ලක් අනුව මහෙස්ත්‍රාත් අධිකරණයක් සෑහීමට පත් වන කල්හි ඒ ක්‍රියාවලියේ හෝ වැඩයේ කාර්යය සඳහා එය පාවිච්චියට ගැනීම එම අධිකරණය විසින් ආඥාවක් මගින් තහනම් කරනු ලැබිය හැකි අතර, කර්මාන්තශාලාවක් වශයෙන් පාවිච්චි කිරීමට අදහස් කර ඇති ස්ථානයක් සම්බන්ධයෙන් මේ ආඥාපනත හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ කරන ලද යම් ආඥාවක් උල්ලංඝනය නොකර ක්‍රියාවලිය හෝ කාර්යය එය තුළ කරගෙන යාමට නොහැකි බව 100 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ යම් තැනැත්තකුගේ පැමිණිල්ලක් අනුව අධිකරණය සෑහීමට පත් වන්නේ නම් එම අධිකරණය විසින් එවැනි ආඥාවක් පැනවීමද කළ හැකිය.

(2) යම් ක්‍රියාවලියක් හෝ කාර්යයක් කරගෙන යාම මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ආඥාවක් මගින් දින නියමයක් නොමැතිව හෝ අවස්ථාවෝචිත පරිදි සේවයේ යොදවා සිටින තැනැත්තන්ගේ ආරක්ෂාව, සෞඛ්‍යය සහ සුභ සිද්ධිය ගැන සැලකිලිමත් ව නැතහොත් පෙර කී පරිදි උල්ලංඝනය කිරීමක් සිදු නොවන ලෙස ක්‍රියාවලිය හෝ කාර්යය කර ගෙන යාමට හැකි වීමට ආඥාවෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පියවර ගන්නා තෙක් හෝ තහනම් කරනු ලැබිය හැකි නමුත් එවැනි යම් ආඥාවක් ස්ථානයේ පදිංචිකරු හෝ එහි අයිතිකරු විසින් පැමිණිල්ලක ආකාරයෙන් කරනු ලබන ඉල්ලීමක් මත ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකිය ; නැතහොත් වෙනස් කරනු ලැබිය හැකිය.

(3) මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ආඥාවක් ප්‍රත්‍යාදිෂ්ට කිරීමක් හෝ වෙනස් කිරීමක් සඳහා වූ යම් ඉල්ලීමක් කරනු ලැබූ විට කරුණු කියා සිටීමේ හිමිකම් පැමිණිලිකරුට තිබිය යුතුය.

වෙනත් යන්ත්‍ර පාවිච්චිය පාලනය කිරීම

45. මේ කොටසෙහි පැහැදිලි ලෙස සඳහන් කරනු නොලැබූ යම් වර්ගයක හෝ විස්තරයක කිසි ම යන්ත්‍රයක් ---

(අ) ශක්තිමත් ද්‍රව්‍යවලින් යුක්තවූ ද , යහපත් යාන්ත්‍රික තැනීමක් ඇතිවූ ද , ප්‍රමාණවත් ශක්තියක් ඇතිවූ ද ඒ යන්ත්‍ර වර්ගයට හෝ ඒ විස්තරයේ යන්ත්‍රවලට නියෝග වලින් නියමිත ආරක්ෂක උපක්‍රම සවි කොට ඇත්තාවූ ද, එසේ නියමිත ආකාරයට පිහිටුවා ඇත්තාවූ ද යන්ත්‍රයක් නොවේ නම් කර්මාන්ත ශාලාවක පාවිච්චි නො කළ යුතු ය. නැතහොත්

(ආ) ඒ යන්ත්‍රවලින් සිදුවිය හැකි තුවාල හෝ අලාභවලින් කම්කරුවන් හා දේපළ හොඳින් ආරක්ෂා කර ගැනීම සඳහා, නියෝග වලින් නියමිත ආරක්ෂක හා කලින් පරිස්සම් වීමේ සංවිධාන ඇතිව ද එලෙස නියමිත ආකාරයට ද හැර ක්‍රියා නො කරවිය යුතු ය.

## IV වෙනි කොටස

## ශුභ සිද්ධිය ( සාමාන්‍ය විධිවිධාන )

බොන වතුර සැපයීම

46. (1) පොදු ප්‍රධාන නළයකින් හෝ දිස්ත්‍රික්කයේ පරීක්ෂක විසින් ලියවිල්ලකින් අනුමත කරනු ලැබූ වෙනත් ස්ථානයකින් හෝ පථ්‍යවූ ද, ප්‍රමාණවත්වූ ද බොන වතුර, සේවයෙහි යෙදෙන සියල්ලන්ට ලෙහෙසියෙන් ම ලබා ගත හැකි වන පරිදි සුදුසු තැන්වල තබා ඒ ආකාරයට ම පවත්වා ගෙන යා යුතු ය. වතුරෙහි අපථ්‍යභාවය නිසා ම හැර වෙනත් කරුණක් උඩ, එබඳු අනුමතියක් දීම ප්‍රතික්ෂේප නො කළ යුතු ය.

(2) බොන වතුර සැපයීම පිහිටවනු ලැබූ නළයකින් නොවේ නම්, ඒවා සුදුසු භාජනවල වත් කොට තිබිය යුතුය. තවද යටත් පිරිසෙයින් දිනකට වරක්වත් වතුර ද, භාජන ද අපවිත්‍ර වීමෙන් වළක්වා ගැනීම සඳහා සැලැස්විය හැකි සියලු ම විධිවිධාන සැලැස්විය යුතු ය. නළයකින් හෝ එසේ නොවූ බොන වතුර සැපයීමක දී, දිස්ත්‍රික්කයේ පරීක්ෂක විසින් නියම කරනු ලබන අවස්ථාවල දී ‘‘ බොන වතුර ’’ යන්න පැහැදිලිව ලකුණු කොට තිබිය යුතු ය.

(3) සේවයෙහි යෙදී සිටින තැනැත්තන්ට පහසු ලෙස පානය කළ හැකි වන පරිදි ඉහලින් සවි කරනු ලැබූ නළයකින් වතුර නොලැබෙන අවස්ථාවක දී, බොන වතුරෙන් සෝදා ගැනීමට පහසුකම් ඇති ව, ඒ සැපයීම් තැන්වල සුදුසු කෝප්ප හෝ බොන භාජන තැබිය යුතු ය.

සේදීමේ පහසුකම් පිළිබඳ නියෝග

47. සාමාන්‍යයෙන් හෝ යම් වර්ගයකට හෝ විස්තරයකට හෝ වැටෙන කර්මාන්තශාලා සම්බන්ධයෙන් හෝ යම් නිපදවීම් ක්‍රමයක සේවයෙහි යෙදී සිටින තැනැත්තන් සම්බන්ධයෙන් හෝ ප්‍රමාණවත් වූ ද, සුදුසුවූ ද සේදීමේ පහසුකම් පිළිබඳ සම්මතයක් ඇමතිවරයා විසින් නියෝගවලින් නියම කළ හැකිය.

48. (1) සේවයෙහි යෙදී සිටින තැනැත්තන් සඳහා, ඔවුන් වැඩ කරන කාලය ඇතුළත නාඳින ඇඳුම් සම්බන්ධයෙන්, සුදුසු වූත්, ප්‍රමාණවත් වූත් ඉඩ කඩ ඇති කරලිය යුතු ය. එබඳු ඇඳුම් වේලා ගැනීම සඳහා යුක්ති සහගතව ක්‍රියා කරවිය හැකි යම් පිළිවෙළවල් හෝ සම්මතයක් නියම කළ විට, එහි සඳහන් පිළිවෙළවල් හෝ ඇති කළ යුතුය.

(2) සාමාන්‍යයෙන් හෝ යම් වර්ගයකට හෝ විස්තරයකට හෝ වැටෙන කර්මාන්තශාලා සම්බන්ධයෙන් හෝ ඒ සඳහා සුදුසු ඉඩ කඩ හා ඒ ඇඳුම් වේලා ගැනීමේ පිළිවෙළවල් පිළිබඳ ව සම්මතයක් ඇමතිවරයා විසින්, නියොගවලින් නියම කළ හැකි ය.

(3) ආඥාවෙහි සඳහන් විශේෂ කරුණු නිසා, මේ වගන්තියේ නියමයක් අදාළ කිරීම තම අදහස පරිදි යුක්ති සහගත නොවන අවස්ථාවල දී, මේ වගන්තියේ ඒ විධිවිධාන වලින් යමකින් කර්මාන්තශාලා නිදහස් කිරීම ලේකම්ට ආඥාවකින් කළ හැකිය.

49. තමන්ගේ සේවා කාලය ඇතුළත විවේකය ගැනීමට ලැබෙන ප්‍රස්ථාවලින් ප්‍රයෝජන ගැනීමට හැකි වන පරිදි සෑහෙන තරම් විවේක ගැනීම සඳහා සුදුසු පහසුකම්, තමන්ගේ වැඩ කොටස නැගිට සිටීමෙන් කරන කම්කරු ස්ත්‍රීන්ගේ ප්‍රයෝජනය පිණිස, ඇති කොට පවත්වාගෙන යා යුතුය.

50. (1) නියමිත සම්මතයක ප්‍රථමාධාර පෙට්ටියක් හෝ රාක්කයක් ලෙහෙසියෙන් ම ළඟා විය හැකි වන පරිදි තබවා, එ සේ ම පවත්වා ගෙන යා යුතුය. තවද එක සිය පනස් දෙනකුට වඩා සේවයෙහි යෙදී සිටින අවස්ථාවක දී සෑම එක සිය පනස් දෙනකුට ම අතිරේක පෙට්ටියක් හෝ රාක්කයක් තැබිය යුතු ය.

මේ විධිවිධානයේ කාර්යය සඳහා , කර්මාන්ත ශාලාවක සේවයෙහි යෙදී සිටින තැනැත්තන් ගණන එහි එක්වරක සේවයෙහි යෙදී සිටින තැනැත්තන්ගේ වැඩි ම ගණන ලෙස ද, එක සිය පනහේ යම් කොටසක් එක සිය පනහ ලෙසද සැලකිය යුතු ය. සේවයේ යෙදී සිටින තැනැත්තන් එහි යෙදී සිටින්නේ මුර පිළිවෙළට නම්, ගණන් ගැනීම එක් වරෙක සේවයෙහි යෙදී සිටින වැඩි ම ගණන අනුව විය යුතු ය.

(2) ප්‍රථමාධාර පෙට්ටියක හෝ රාක්කයක උපකරණ හෝ ප්‍රථමාධාරයට අවශ්‍ය දේ හෝ හැර අන් කිසිවක් නො තැබිය යුතු ය.

(3) එක් එක් ප්‍රථමාධාර පෙට්ටියක් හෝ රාක්කයක් වගකිව යුතු තැනැත්තකු භාරයේ තැබිය යුතුය . පනස් දෙනකුට වැඩියෙන් සේවයෙහි යෙදී සිටින කර්මාන්ත ශාලාවක් සම්බන්ධයෙන් නම් , ඔහු ප්‍රථමාධාර සේවයෙහි පුහුණුව ලද්දකු විය යුතුය . වැඩ කරන කාලය අතරතුර ඕනෑ වෙලාවක භාරයේ සිටින තැනැත්තා ලෙහෙසියෙන්ම හමුවීමට පුලුවන්කම තිබිය යුතුය. වැඩ කරන කාමරයක් සම්බන්ධයෙන් සපයනු ලැබූ ප්‍රථමාධාර පෙට්ටිය හෝ රාක්කය භාර ව සිටින තැනැත්තාගේ නම දැක්වෙන දැන්වීමක් එවැනි සෑම කාමරයක ම සවිකොට තිබිය යුතු ය.

(4) කර්මාන්ත ශාලාවක ගිලන් කාමරයක් ඇති කොට , ඒ කර්මාන්ත ශාලාවෙහි සිදුවන සියලු ම තුවාළවලට වහා ම එහි දී ප්‍රතිකාර කිරීමට පිළිවෙළක් සලසා ඇති අවස්ථාවක දී , සහතිකයෙහි සඳහන් ප්‍රමාණයට හා එහි සඳහන් කොන්දේසිවලට යටත් ව , ඒ කර්මාන්ත ශාලාව මේ වගන්තියේ නියමවලින් ප්‍රධාන පරීක්ෂක විසින් , සහතිකයකින් නිදහස් කළ හැකිය.

## V වෙනි කොටස

## සෞඛ්‍යය, ආරක්ෂාව හා ශුභ සිද්ධිය

### ( විශේෂ විධිවිධාන හා නියෝග )

ධූලි හෝ දුම් ඉවත් කිරීම

51. (1) සෑම කර්මාන්ත ශාලාවක ම , සේවයෙහි යෙදී සිටින තැනැත්තන්ට අනර්ථදායක වූ ද , අප්‍රසන්න වූ ද ප්‍රමාණයක හා ස්වභාවයක, එහි ගෙන යන්නා වූ යම් නිපදවීමේ ක්‍රමයක් සම්බන්ධයෙන් ධූලි, දුම් හෝ වෙනත් අපිරිසිදු භාවයක් පැන නගින්නේ නම් නැතහොත් යම් වර්ගයක දුවිලි සැලකිය යුතු ප්‍රමාණයක් පැන නගින්නේ නම් , ධූලි, දුම් හෝ වෙනත් අපිරිසිදු දෙය සේවයෙහි යෙදී සිටින්නන් ආශ්වාස කිරීමෙන් වැළැක්වීම සඳහා හා යම් වැඩ කරන කාමරයක ඒවා එකතු නො වීම සඳහා සැලැස්විය හැකි සෑම විදිවිධාන ම සැලැස්විය යුතු ය.විශේෂයෙන් ම නිපදවීමේ ක්‍රමයෙහි ස්වභාවය අනු ව හිස් කිරීමේ

උපකරණ යෙදිය හැකි නම් , එබඳු අවස්ථාවලදී ඒවා ධූලි , දූම් හෝ වෙනත් අපිරිසිදු භාවයක් හට ගන්නා තැනට පුලුවන් තරම් නුදුරුව ම යම් වැඩ කරන කාමරයක වාතය සමග එක් නොවන සේ, පිහිටුවා පවත්වා ගෙන යා යුතු ය.

(2) එක තැනක තබා තිබෙන, ඇතුළත දැවෙන කිසි ම ඇන්ජිමක් පහත පෙනෙන කටයුතු ඉෂ්ට නො කොට පාවිච්චි නො කළ යුතු ය. එනම් :-

(අ) ඇන්ජිමෙන් පිටවෙන වායු එලිමහනට යැම පිණිස ඉඩ සැලසීම ; හා

(ආ) ( ඇන්ජිම අත්හදා බැලීමේ කාර්යය සඳහා පාවිච්චි කරන අවස්ථාවලදී හැර ) අනික් සෑම අවස්ථාවල දී ම , එය ඇන්ජිමේ වැඩ කරන තැනැත්තන් හැර සේවයෙහි යෙදී සිටින අනිකුදු තැනැත්තන් වැඩ කරන කාමරයෙන් හෝ කාමරයේ කොටසින් වෙන් කොට, ඒ කාමරයේ හෝ කාමරයේ කොටසෙහි වාතය සමග ඇන්ජිමෙන් පිටවෙන යම් අනර්ථදායක දුම් මිශ්‍රවීම වැලැක්වෙන සේ, තැබිය යුතුය.

ශ්වාස භංගකයක් හෝ උද්දීපක වායුවක් හෝ වාෂ්පයක් පාවිච්චි කෙරෙන හෝ තිබීමට ඉඩ ඇති අවස්ථාවක ආරක්ෂාවන්

1976 අංක 12, 21

51 අ. (1) ඇමෝනියා, ක්ලෝරීන්, කාබන් ඩයොක්සයිඩ් හෝ වෙනත් ශ්වාස භංගක හෝ උද්දීපක වායුවක් හෝ වාෂ්පයක් යම් කර්මාන්තශාලාවක පාවිච්චි කෙරෙන හෝ තිබීමට ඉඩ ඇති කල්හි එම ශ්වාස භංගකය, වායුව හෝ වාෂ්පය පාවිච්චි කෙරෙන හෝ තිබිය හැකි යන්ත්‍රාගාරය හෝ උපකරණය, කර්මාන්තශාලා ස්ථානයෙහි තැනැත්තන් සාමාන්‍ය වශයෙන් යම් වැඩක නොයොදවනු ලබන කොටසක පිහිටුවා තිබිය යුතුය.

(2) එවැනි යම් ශ්වාස භාගකයක්, වායුවක් හෝ වාෂ්පයක් පාවිච්චි කෙරෙන හෝ තිබිය හැකි යම් කර්මාන්තශාලාවක ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු තැන විසින් අනුමත කරන ලද ආකාරයක ශ්වසන උපකරණ හෝ වෙනත් මෙවලම් සපයා, නිසියාකාරව නඩත්තු කොට පහසුවෙන් ලබාගත හැකි පරිදි තිබිය යුතුය.

(3) අන්තරායදායක වායු හෝ දූමාරය පිටවීමට ඉඩ ඇති යම් චිම්නියක, කවුළුවක, බෝක්කුවක, කාණුවක, කෙම්යක හෝ කසළ කාණුවක හෝ කසළ වළක හෝ වෙනත් එවැනි ස්ථානයක අභිමුඛයෙහි හෝ ඒ අසල වැඩ කිරීම සඳහා කිසිම තැනැත්තකු --

(අ) එසේ පිටවීම් වැළැක්වීමට සාර්ථක පියවර ගෙන ඇති බවට කර්මාන්තශාලාවේ වගකිව යුතු තැනැත්තකු විසින් ලියවිල්ලකින් සහතික කරනු ලැබ ඇත්නම් මිස ; හෝ

(ආ) (i) ඒ තැනැත්තා එවැනි වැඩක් කරගෙන යන අතර, ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු තැන විසින් අනුමත කරන ලද ශ්වාසක මෙවලමක් පැළඳ ගෙන සිටී නම් මිස ;

(ii) කඹයක් හෝ කඹ හෝ එසවීමේ උපකරණ සුරක්ෂිත ලෙස සවිකර තිබෙන රක්නයක් ඒ තැනැත්තා පැළඳගෙන සිටින්නේ නම් සහ යම් අන්තරායක දී එම තැනැත්තා බේරාගත හැකි වන ආකාරයකට ඒ කඹයේ හෝ කඹවල

කෙළවර තැන්පත් කරනු ලැබ තිබේ නම් මිස ; සහ

(iii) කර්මාන්තශාලාවේ වගකිව යුතු තැනැත්තකුගේ පරිපාලනය යටතේ එම වැඩය කරගෙන යන්නේ නම් මිස

නොයෙදවිය යුතුය.

සමහර අන්තරායදායක කර්මාන්තවල දී ආහාර ගැනීම.

52. (1) යම් කාමරයක දූවිල්ලක් හෝ දුමක් පැන නැගෙන පරිදි ඊයම්, පාසානම් හෝ වෙනත් විෂ ද්‍රව්‍යයක් පාවිච්චි කරන්නේ නම් , නොනවත්වා ම දීර්ඝ වේලාවක් සේවයෙහි යෙදීමෙන් පසු ඉඩ හැර තිබෙන කාල සීමාවලදී හැර, කෑම ගැනීම හෝ විවේක ගැනීම හෝ සඳහා ඉඩ හැර තිබෙන වේලාවල දී ඒ කාමරයෙහි සිට කෑම හෝ බීම ගැනීමට හෝ එහි නැවතී සිටීමට හෝ කිසිවකුට ඉඩ නො හැරිය යුතු ය.

(2) ගිනිගල් ධූලි හෝ නො දැවෙන ලෝහමය ධූලි හෝ පැන නඟින ඇමතිවරයා විසින් පනවනු ලැබූ නියෝගවලින් නියමිත , යම් නිපදවීමේ ක්‍රමයක් කාමරයක ගෙන යන්නේ නම් , නොනවත්වා ම දීර්ඝ වේලාවක් සේවයෙහි යෙදීමෙන් පසු ඉඩ හැර තිබෙන කාල සීමාවල දී හැර, කෑම ගැනීම හෝ විවේක ගැනීම හෝ සඳහා ඉඩ හැර තිබෙන වේලාවල දී, කිසිවකුට එහි නැවතී සිටීමට ඉඩ නො හැරිය යුතු ය.

(3) පසුගිය උපවගන්ති දෙකෙහි සඳහන් කාමරයක සේවයෙහි යෙදී සිටින තැනැත්තන්ට කර්මාන්ත ශාලාවෙහි අන් තැනක කෑම ගැනීම සඳහා සුදුසු විධිවිධාන සැලැස්විය යුතු ය.

(4) යම් නිපදවීමේ ක්‍රමයක ස්වභාවය නිසා , ඒ ක්‍රමය ගෙන යන කාමරවල සිට කෑම ගැනීම හෝ කෑම හෝ විවේක හෝ ගැනීම සඳහා ඉඩ හැර තිබෙන කාල සීමාව තුළ ඒවායේ නැවතී සිටීම හෝසනිපයට හානිකර බව හෝ අයෝග්‍ය බව හෝ ලේකම්ට ඒත්තු ගිය අවස්ථාවක දී , ඒ නිපදවීමේ ක්‍රමය ගෙන යන කාමරවලට සුදුසු ය යි හැඟෙතොත් , මේ වගන්තියේ (1) වෙනි සහ (3) වෙනි උප වගන්ති වල විධිවිධාන ඔහු විසින් අදාළ කළ හැකි ය.

ඇස් ආරක්ෂාව

1976 අංක 12, 22

53. (1) යම් කර්මාන්ශාලාවක් තුළ කරගෙන යනු ලබන යම් ක්‍රියාවලියක් හෝ ක්‍රියාවක් නිසා එම ක්‍රියාවලියේ හෝ ක්‍රියාවෙහි යොදවා සිටින තැනැත්තන්ගේ ඇස්වලට හෝ එම ක්‍රියාවලිය හෝ ක්‍රියාව කරගෙන යන ස්ථානයට ආසන්නව වැඩ කරන තැනැත්තන්ගේ ඇස්වලට විශේෂයෙන් ම හානියක් සිදුවීමට ඉඩ ඇති අවස්ථාවක ඒ තැනැත්තන්ගේ ඇස් ආරක්ෂා කිරීම සඳහා සුදුසු පිළිවෙත් සලස්වා තිබිය යුතුය.

(2) අමාත්‍යවරයා විසින් නියෝග මඟින් --

(අ) සාමාන්‍යයෙන් සහ යම් කර්මාන්තශාලා පන්තියකට හෝ වර්ගයකට සැපයිය යුත්තේ කවර ආකාරයක ආරක්ෂාවක් ද යන්න පිළිබඳ ව විධිවිධාන සැලැස්විය හැකිය ;

(ආ) නියම කරනු ලැබිය හැකි අවස්ථාවලදී ඇස් ආරක්ෂක උපකරණ සැපයීම, සවි කිරීම සහ වෙනස් කිරීම සඳහා සුදුසුකම්ලත් තැනැත්තන් යොදවන ලෙස විධිවිධාන සැලැස්විය හැකිය ;

(ඈ) ඇස් පෙනීම දුර්වල තැනැත්තන්ට විශේෂ ඇස් ආරක්ෂක උපකරණ සැපයීමට විධිවිධාන සැලැස්විය හැකිය; තවද,

(ඇ) ඉහත කී කරුණු වලට සම්බන්ධ හෝ ආනුෂංගික සියලුම කරුණු සඳහා පොදුවේ විධිවිධාන සැලැස්විය හැකිය.

විකිරණයෙන් සහ කම්පනයෙන් ආරක්ෂාව

1976 අංක 12, 23

53 අ. (1) යම් කර්මාන්තශාලාවක සේවයෙහි යොදවා සිටින කිසිම තැනැත්තකු ඒ තැනැත්තා සේවයෙහි යොදවා සිටින වැඩයේ කාර්යයන් සඳහා අවශ්‍ය ප්‍රමාණයට වැඩියෙන් අයනී කරණ විකිරණයට , "ලේසරයට " , පාරජම්බුල හෝ අවරක්ත රශ්මියට හෝ වෙනත් විද්‍යුත් චුම්භක විකිරණයකට කල්වීම හෝ අතිධ්වනික කම්පනයන් ඇතුළු කම්පනයකට භාජනය වීම සිදු නොවිය යුතුය.

(2) එවැනි කර්මාන්තශාලාවල සේවයෙහි යොදවා සිටින තැනැත්තන්ගේ සෞඛ්‍යයට සිදුවන අනතුර අවම කිරීම සඳහා ගත යුතු නිශ්චිත පියවරවල් අමාත්‍යවරයා විසින් නියෝග මගින් නියම කරනු ලැබිය හැකිය.

කටින් ඇදීමෙන් තරස් දණ්ඩෙහි නූල් ඇමීම

54. කපු පිළි හෝ වෙනත් රෙදි වියන කර්මාන්ත ශාලාවලට, කටින් ඇදීමෙන් නූල් දැමිය නො හැකි නොහොත් ලේසියන් ම දැමිය නො හැකි තරස් දඬු සැපයීම හා පාවිච්චිය සඳහා යුක්ති සහගත ව ක්‍රියාත්මක කළ හැකි ලෙස පෙනෙන විශේෂ නියෝග ඇමතිවරයා විසින් පැනවිය හැකිය. සේවයෙහි යෙදී සිටින තැනැත්තන් වෙත ද එහි පදිංචිකාරයන් වෙත ද එබඳු නියෝගවලින් යුතුකම් පැවරිය හැකි ය.

ගිනිකූරු සෑදීමෙහි දී සුදු ප්‍රකාශද පාවිච්චි කිරීම තහනම් කිරීම

55. (1) ගිනිකූරු සෑදීමෙහි දී කිසිවකු විසින් සුදු ප්‍රකාශද පාවිච්චි නො කළ යුතු ය.

(2) මේ ආඥා පනතෙහි මේ කොටසෙහි කාර්යය සඳහා "සුදු ප්‍රකාශද " යන්නෙන් ස්වභා වශයෙන් ම සුදු හෝ කහ ප්‍රකාශ ද යන නමින් දන්නා ද්‍රව්‍යය අදහස් කෙරෙයි.

භූමිගත කාමර

56. (1) ගබඩා කිරීමට හෝ ලේකම්ගේ නියමයෙන් ඉඩ හරිනු ලැබූ වෙනත් කාර්යයකට හෝ පමණක් පාවිච්චි කරනු ලැබූ භූමිගත කාමරයක් නොවන, තැනීම, උස ප්‍රමාණය, ආලෝකය හෝ වාතාශ්‍රය හෝ සම්බන්ධයෙන් නැතහොත් සනීපය පිළිබඳ කරුණක් හෝ ගින්නක් ඇති වූ විටක දී , බේරී යාමට ප්‍රමාණවත් මාර්ගයක් නොමැති වීම හෝ යන කරුණක් උඩ යම් කාර්යයක් සඳහා, දිස්ත්‍රික්කයේ පරීක්ෂක විසින්, නුසුදුසු යයි, සහතික කරනු ලැබූ භූමිගත කාමරයක කිසි වැඩක් ගෙන යාම නො කළ යුතු ය.

එසේ ද වුවත්, ඇත්ත වශයෙන් ම ප්‍රයෝජනයට ගනු ලබන කාමරයක් සුදුසු නැතැ යි පරීක්ෂක විසින් සහතික කරනු ලැබූ අවස්ථාවක දී, ඒ කාමරය සුදුසු තත්ත්වයට ගෙන ඒම සඳහා හෝ වෙනත් ස්ථානයක් ලබා ගැනීම සඳහා හෝ ප්‍රමාණවත් යැ යි හැගෙන කාලයකට ඒ සහතික පත්‍රය ක්‍රියාවේ යෙදවීම අත්හිට විය යුතු ය.

(2) නියමිත දිනයෙහි ද , කර්මාන්ත ශාලාවක කොටසක් නොවූ ද, කර්මාන්ත ශාලාවක වැඩ කරන කාමරයක් වශයෙන් පාවිච්චි නොකළා වූ ද, ගබඩා කිරීමේ කාර්යය හෝ ඉහත කී ලෙස ඉඩ දෙනු ලැබූ යම් කාර්යයක් හෝ සඳහා පමණක් පාවිච්චි කළාවූ ද යම් භූමිගත කාමරයක් සම්බන්ධයෙන් --

(අ) මේ වගන්තිය යටතේ නුසුදුසු ය යි සහතික කරනු ලැබූ වැඩක් සඳහා ඒ කාමරය පාවිච්චි කිරීමට පෙර ,

පදිංචිකාරයා විසින් නියමිත විස්තර ඇතුළත් කොට නියමිත ආකෘතියක දිස්ත්‍රික්කයේ පරීක්ෂකට ඒ බව දැනුම් දිය යුතු ය. තවද

(ආ) උෂ්ණවත්, තෙත් හෝ ධූලි සහිත හෝ ස්වභාවයක හෝ යම් දුමක් පැන නැඟින සුලු නිපදවන ක්‍රමයක් වූ යම් නියමිත නිපදවන ක්‍රමයක් සඳහා , දිස්ත්‍රික්කයේ පරීක්ෂකගේ කැමැත්ත ලියවිල්ලකින් ලබා නො ගෙන ඒ කාමරය පාවිච්චි නොකළ යුතුය.

(3) මෙම උපවගන්තිය 1976 අංක 12 , 24 වගන්තිය මගින් ඉවත් කර ඇත.

(4) මේ වගන්තියේ " භූමිගත කාමරයක් " යන්නෙන්, බිම සිට සීලිම දක්වා මැනීමේ දී සම්පූර්ණ උසෙන් භාගයක් හෝ ඊට වඩා , යාබද වීථියේ හෝ ඒ කාමරයට යාබද වූ හෝ එයට ඉතාමත් ම ලංවූ පොළවේ අඩි පාරේ මතු පිටට පහත් වූ කාමරයක් හෝ ඉන් කොටසක් පිහිටියේ නම්, එබඳු කාමරයක් අදහස් කෙරෙයි.

(5) කාමරය සුදුසු බවට පත් කිරිම සඳහා තමාගේ අදහස පරිදි වෙනස් කිරීම් කරන ලද නම් , මේ වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ සහතිකය ප්‍රධාන පරීක්ෂක විසින් ආපසු ගත හැකි ය.

රජක ස්ථාන

57. සෑම රජක ස්ථානයක් ම --

(අ) රෙදි මදින කාමරයක උෂ්ණත්වය විධිමත් කරනු සඳහා ද, සෑම සෝදන කාමරයක ම දුම් පිටතට යැවීම සඳහා ද පංකා මගින් හෝ වෙනත් ක්‍රමයක ප්‍රබල විධිවිධාන සැලැස්විය යුතු ය.

(ආ) කම්කරුවන් උෂ්ණයෙන් ප්‍රවේශම් කර ගනු පිණිස , රෙදි මදින කාමරයෙන් හෝ මේසයෙන්, උණු කරන ඉස්තිරික්ක සඳහා වූ සෑම ගිනි උදුන් ම වෙන් කොට තිබිය යුතු ය.

(ඇ) විනාශදායක දුම් පිටවන කිසි ම වායු ඉස්තිරික්කයක් පාවිච්චි නො කළ යුතු ය.

වැඩි බර එසවීම
1976 අංක 12, 25

58. (1) කිසිම තැනැත්තකු, ඔහුට හානියක් සිදුවීමට තරම් වූ බරක් එසවීමට, ගෙන යාමට හෝ ඉවත් කිරීමට යොදවනු නොලැබිය යුතුය.

(2) කර්මාන්ත ශාලාවල සේවයෙහි යෙදී සිටින තැනැත්තන් විසින් ඉස්සිය යුතු, ගෙන ගිය යුතු හෝ ඉවත් කළ යුතු වැඩි ම බර නියම කරන විශේෂ නියෝග ඇමතිවරයා විසින් පැනවිය හැකි ය . තවද ඒ නියෝගවලින් නා නා අවස්ථාවල දී වෙනස් බර නියම කළ හැකිවාක් මෙන් ම නියෝග සාමාන්‍යයෙන් පුද්ගලයන්ට හෝ යම් පුද්ගල පන්තියකට හෝ යම් කර්මාන්ත ශාලා වර්ගයක හෝ යම් විස්තරයකට වැටෙන කර්මාන්ත ශාලාවල හෝ යම් නිපදවීම් ක්‍රමයක හෝ සේවයෙහි යෙදෙන පුද්ගලයන්ට අදාළ කළ හැකි ය.

ශබ්දය වැළැක්වීම
1976 අංක 12, 26

. (1) යම් කර්මාන්තශාලාවක සේවයෙහි යොදවා සිටින කිසිම තැනැත්ත 58 අ කු එම තැනැත්තාට සුදුසු කර්ණාරක්ෂකයන් සපයා

ඇත්නම් මිස නියම කරන ලද ඉහළ සීමාවක් ඉක්මවා ශබ්දයට ලක් නොකළ යුතුය.

(2) යම් පන්තියක හෝ වර්ගයක කර්මාන්ත ශාලාවක අඩු කිරීම සඳහා ගත යුතු පියවරවල් සඳහා අමාත්‍යවරයා විසින් නියෝග මගින් විධිවිධාන සැලැස්විය හැකිය.

විදුලිය ජනිත කිරීම ආදිය කෙරෙන්නා වූ කර්මාන්තශාලා වල සැලැස්විය යුතු ආරක්ෂා මාර්ග

1976 අංක 12, 26

2000 අංක 33, 8

58 ආ. (1) විදුලි බලය ජනිත කරවන්නා වූ හෝ පරිවර්තනය කරවන්නා වූ හෝ බෙදා හරින්නා වූ සෑම කර්මාන්ශාලාවක ම සහ 80 වන වගන්තියේ සඳහන් සෑම ස්ථානයක ම තිබෙන සෑම විදුලි උපකරණයක් ම අංගෝලාංගයක් ම සහ සන්නායකයක් ම --

(අ) එහි සඳහන් කර ඇති කාර්යය සඳහා ප්‍රමාණවත් විය හැකි ප්‍රමාණයෙන් සහ බලයෙන් යුක්ත විය යුතුය;

(ආ) කර්මාන්තශාලාවේ වැඩ කරන තැනැත්තන්ට අනතුරු සිදුවීම හැකිතාක් දුරට වැළැක්වෙන පරිදි ඉදිකර , පිහිටුවා, ආරක්ෂාකර, ක්‍රියාවේ යොදවා සහ නඩත්තුකර තිබිය යුතුය; තවද,

(ඇ) නියම කරනු ලැබිය හැකි වෙනත් නියමයන්ට අනුකූල ව විය යුතුය.

(2) (1) වන උපවගන්තිය අදාළ වන කර්මාන්තශාලා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් විශේෂයෙන් ම පහත සඳහන් කරුණු පිළිබඳව නියෝග සාදනු ලැබිය හැකිය :-

(අ) ආරක්ෂක උපකරණ සැපයීම ;

(ආ) විදුලි උපකරණ, අංගෝපාංග සහ යන්ත්‍රෝපකරණ පරීක්ෂා කිරීම සහ අළුත්වැඩියා කිරීම කරගෙන යා යුතු ආකාරය ;

(ඇ) අන්තරායෙන් වැළකීමට අවවාද දීමේ දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට නියම කිරීම ;

(ඈ) විදුලි යන්ත්‍රෝපකරණ තෝරා ගැනීමේ දී සහ ඉදි කිරීමේ දී ගත යුතු ආරක්ෂා මාර්ග ;

(ඉ) උපකරණ, වැටකින් වෙන් කිරීම සහ කොටු කිරීම ;

(ඊ) පරිනාමක සහ ස්විච් කාමර ඉදි කිරීම, නඩත්තු කිරීම සහ ක්‍රියා කරවීම;

(උ) විද්‍යුත් පාලක ආම්පන්න සැපයීම ;

(ඌ) ස්විච් පුවරු සම්බන්ධයෙන් ගත යුතු ආරක්ෂක විධිවිධාන ;

(එ) පුපුරණ සුළු වාතාවරණයක විදුලි ඉදිකිරීම් ;

(ඒ) ගෙන යා හැකි විදුලි අත් උපකරණ සහ පහන් පාවිච්චි කිරීම;

(ඔ) උපකරණ, අංගෝපාංග සහ යන්ත්‍රෝපකරණ භූගත කිරීම;

(ඕ) ගොඩනැගිලිවල ආවරණය නොකළ සන්නායක දැමීම ; සහ

(ක) ඉස්මත්තේ පිහිටි ප්‍රධාන සේවා කම්බි සහ පාරිභෝගිකයන්ගේ සන්නායක ඉදිකිරීම සහ නඩත්තු කිරීම.

## ආරක්ෂාව හා සෞඛ්‍යය පිළිබඳ විශේෂ නියෝග

59. (1) කර්මාන්ත ශාලාවල පාවිච්චි කරනු ලබන යම් නිපදවීමක්, යන්ත්‍රෝපකරණ, යන්ත්‍ර, නිපදවීම් ක්‍රමයක් හෝ අත් වැඩ ක්‍රමයක්, ඒවායේ සේවයේ යෙදී සිටින්නන්ට හෝ යෙදී සිටින්නන් පන්තියකට ශාරීරික තුවාල කළ හැකි ස්වභාවයක බව ඇමතිවරයාට ඒත්තු ගිය අවස්ථාවක දී , අවශ්‍යතාව පිරිමසින, යුක්ති සහගත ව ක්‍රියාත්මක කළ හැකි ලෙස පෙනී, විශේෂ නියෝග මේ ආඥා පනතෙහි විධිවිධානවලට යටත් ව, ඔහු විසින් පැනවිය හැකි ය.

(2) එසේ පනවනු ලැබූ විශේෂ නියෝගවලින්, වෙනත් කටයුතු සමග, පහත දැක්වෙන ක්‍රියා කළ හැකි ය :-

(අ) යම් නිපදවීමක්, යන්ත්‍රෝපකරණ යන්ත්‍ර නිපදවීම් හෝ අත් වැඩ ක්‍රමයක් සම්බන්ධයෙන් සියලු ම කම්කරුවන් හෝ යම් පන්තියක කම්කරුවන් වැඩට ගැනීම තහනම් කිරීම හෝ සේවයෙහි යෙදවිය හැකි පැය ගණන වෙනස් කිරීම හෝ සීමා කිරීම ; හෝ

(ආ) යම් ද්‍රව්‍යයක් පාවිච්චි කිරීම හෝ නිපදවීම් ක්‍රමයක් තහනම් කිරීම, සීමා කිරීම හෝ පාලනය කිරීම ; හෝ

(ඇ) සෞඛ්‍යය හෝ ආරක්ෂාව සම්බන්ධයෙන් වූ 2 වෙනි කොටසෙහි, 3 වෙනි කොටසෙහි හෝ මේ කොටසෙහි විධිවිධාන යම් කර්මාන්ත ශාලා පන්තියක් හෝ යම් විස්තරයකට වැටෙන කර්මාන්ත ශාලා හෝ සම්බන්ධයෙන් වෙනස් කිරීම හෝ ඒවාට අදාළ කිරීම ද වේ.

තවද ඒ විශේෂ නියෝගවලින් සේවයෙහි යෙදී සිටින්නන් වෙත ද වෙනත් තැනැත්තන් වෙතද පදිංචි ව සිටින්නන් වෙත ද යුතුකම් පැවරිය හැකි ය.

(3) නිපදවීම්, යන්ත්‍රෝපකරණ, යන්ත්‍ර, නිපදවීම් ක්‍රම හෝ යම් අත්වැඩ ක්‍රමයක් පාවිච්චි කරනු ලබන සියලු ම කර්මාන්ත ශාලාවලට හෝ යම් නියමිත පන්තියකට හෝ විස්තරයකට ඇතුළත් කර්මාන්ත ශාලාවලට එසේ පනවනු ලැබූ විශේෂ ව්‍යවස්ථා අදාළ කළ හැකිය. තවද සම්පූර්ණයෙන් ම හෝ කොන්දේසිවලට යටත් ව හෝ යම් නියමිත පන්තියක හෝ විස්තරයක කර්මාන්ත ශාලාවක් ඒ නියෝග වලින් නිදහස් කළ හැකිය.

## අතිරේක විධිවිධාන

ඡායාරූප සැම්පල් යනාදිය ගැනීමට ඇති බලය

1976 අංක 12, 27

60. (1) යම් දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවකු විසින් හෝ ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු තැන විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබූ යම් තැනැත්තකු විසින් කර්මාන්තශාලාවේ පදිංචිකරු වෙත හෝ පදිංචිකරු පහසුවෙන් සොයාගත නොහැකි වුවහොත් කළමනාකරු වෙත හෝ ( වතු කර්මාන්තශාලාවක් සම්බන්ධයෙන් වන කල්හි ) අධිකාරී වෙත, පෝර්මන් කෙනකු වෙත හෝ වෙනත් වගකිව යුතු තැනැත්තකු වෙත දැනුම්දීමෙන් පසු යම් වේලාවකදී --

(අ) යම් කර්මාන්තශාලාවක යම් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීම සඳහා පාවිච්චි කරන හෝ පාවිච්චි කිරීමට මිශ්‍ර

කරන ලද යම් ද්‍රව්‍යයක ප්‍රමාණවත් සැම්පලයක් විශ්ලේෂණය සඳහා ගනු ලැබිය හැකිය ;

(ආ) යම් කර්මාන්තශාලාවක නිෂ්පාදිත භාණ්ඩ ප්‍රමාණවත් සංඛ්‍යාවක් විශ්ලේෂණය සඳහා ගනු ලැබිය හැකිය ;

(ඇ) මේ ආඥාපනතේ මේ කොටස යටතේ සාදන ලද යම් නියෝගයක් උල්ලංඝනය කිරීමකට සම්බන්ධිත යයි ඔහු විසින් සැක කරනු ලබන හෝ සේවයෙහි යොදවා සිටින තැනැත්තන්ට ශාරීරික හානි සිදුවිය හැකි යයි ඔහු අදහස් කෙරෙන ද්‍රව්‍යයක් වන්නා වූ ද යම් කර්මාන්තශාලාවක පාවිච්චි කරනු ලබන්නා වූ හෝ පාවිච්චි කිරීමට අදහස් කරන්නා වූ ද යම් ද්‍රව්‍යයක් විශ්ලේෂණය සඳහා ගනු ලැබිය හැකිය;

(ඈ) යම් කර්මාන්ත ශාලාවක හෝ එබඳු කර්මාන්තශාලාවක තිබෙන යන්ත්‍රෝපකරණවල හෝ යම් ද්‍රව්‍යයක ඡායාරූපයක් ගැනීම හෝ සටහනක් සකස් කිරීම කළ හැකිය ; නැතහොත්

(ඉ) යම් කර්මාන්ත ශාලාවක තිබෙන යම් යන්ත්‍රෝපකරණයක් හෝ ද්‍රව්‍යයක් යම් පරීක්ෂණයක දී, විභාගයක දී හෝ නඩුවක දී ඉදිරිපත් කිරීම පිණිස ගත හැකිය.

1976 අංක 12, 27

(2) මේ වගන්තිය යටතේ යම් සැම්පලයක් ලබාගන්නා විට සහ අවශ්‍ය උපකරණ සැපයීමෙන් පසු , පදිංචිකරු හෝ කළමනාකරු හෝ ( වතු කර්මාන්තශාලාවක් සම්බන්ධයෙන් වන කල්හි ) අධිකාරී හෝ පෝර්මන් හෝ එකී වෙනත් වගකිව යුතු තැනැත්තා විසින් දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු තැනගෙන් හෝ ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු තැන විසින් බලය පවරනු ලැබූ තැනැත්තාගෙන්, සැම්පලය තුන් කොටසකට බෙදා ඒ එක් එක් කොටස එහි ස්වභාවයෙන් ඉඩ ලැබෙන ප්‍රමාණයට ලකුණු කොට සහ මුද්‍රා තබා හෝ අලවා --

(අ) එක් කොටසක් පදිංචිකරුට හෝ කළමනාකරුට හෝ (වතු කර්මාන්තශාලාවක් සම්බන්ධයෙන් වන කල්හි ) අධිකාරීට හෝ පෝර්මන්ට හෝ ඉහත කී වෙනත් වගකිව යුතු තැනැත්තාට දෙන ලෙසත්;

(ආ) එක් කොටසක් අනාගත සංසන්දනය සඳහා තබා ගන්නා ලෙසත් ;

(ඇ) එක් කොටසක් විශ්ලේෂකට දෙන ලෙසත්

ඉල්ලා සිටිය හැකිය. තවද, මේ වගන්තිය යටතේ වූ කිසියම් විශ්ලේෂණයක් රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව හෝ යම් රජයේ රසායානාගාරයක් හෝ යම් රජයේ ආයතනයක් විසින් පවත්වනු ලැබිය යුතු යයි ඉල්ලා සිටිනු ලැබුවහොත් එය එසේ පවත්වනු ලැබිය යුතුය.

(3) මේ වගන්තිය යටතේ සැම්පලයක කරන ලද විශ්ලේෂණයක ප්‍රතිඵලය ගැන රජයේ රස පරීක්ෂක හෝ ඒ රජයේ රසායනාගාරයේ හෝ ආයතනයේ ප්‍රධානයා විසින් දෙන ලද බව සැලකෙන සහතිකයක්, එහි සඳහන් කරුණු සම්බන්ධයෙන් සාක්ෂ්‍ය

වශයෙන් මේ ආඥාපනත යටතේ පවත්වන යම් නීති කෘත්‍යයක දී පිළිගත හැකි අතර එම විශ්ලේෂණය කළ තැනැත්තා සාක්ෂිකරුවකු වශයෙන් කැඳවන ලෙස පාර්ශවකරුවන්ගෙන් කවර හෝ පාර්ශවකරුවකු විසින් ඉල්ලා සිටිය හැකිය.

## VI වෙනි කොටස

## හදිසි අනතුරු හා කාර්මික රෝග දැන්වීම හා විභාග කිරීම

හදිසි අනතුරු දැන්වීම

1976 අංක 12, 28

61. (1) යම් කර්මාන්තශාලාවක් තුළ --

(අ) එම කර්මාන්තශාලාවේ සේවයේ යොදවනු ලැබ සිටින තැනැත්තකු මරණයට පත් කරන; හෝ

(ආ) ඒ තැනැත්තා යොදවනු ලැබ සිටි සේවයෙන් තුන් දිනකට වැඩි කාලයක සම්පූර්ණ වේතනය ඉපයීමට ඒ තැනැත්තා අපොහොසත් කරවන ; හෝ

(ඇ) තාපයේ, අධික සේ වෙහෙස වීමේ, විදුලි කම්පනයේ හෝ ආශ්වාස කළ නොහැකි හෝ විෂ සහිත දුමාර හෝ වායු ආශ්වාස කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඒ තැනැත්තා සිහි නැති කරවන

යම් අනතුරක් සිදුවූ අවස්ථාවක, ඒ අනතුර පිළිබඳ ලිඛිත දැන්වීමක්, නියම කරනු ලැබිය හැකි ආකෘතියක හා නියම කරනු ලැබිය හැකි විස්තර සමග, දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු තැන වෙත යැවීම පදිංචිකරු හෝ කළමනාකරු හෝ (වතු කර්මාන්තශාලාවක් සම්බන්ධයෙන් වූ විට ) අධිකාරී විසින් වහාම කළ යුතු ය.

2000 අංක 33, 9

(2) අබලතාව ඇති කරවන යම් අනතුරක් ගැන මේ වගන්තිය යටතේ දැනුම් දෙනු ලැබූ විට හා ඒ දැනුම් දීමෙන් පසු, අබලතාවට පත් වූ තැනැත්තා ඒ අනතුරේ ප්‍රතිඵලයක් වශයෙන් මිය ගිය අවස්ථාවක පදිංචිකරු හෝ කළමනාකරු හෝ (වතු කර්මාන්තශාලාවක් සම්බන්ධයෙන් වූ විට ) අධිකාරීවිසින් මරණය ගැන තමා දැනගත් වහාම ඒ මරණය පිළිබඳ ලිඛිත දැන්වීමක් දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු තැන වෙත යැවිය යුතුය.

1998 අංක 18 , 9

(3) මේ වගන්තිය අදාළ වන යම් අනතුරක්, සේවයෙහි යොදවා ඇති තැනැත්තකුට සිදු වූ අවස්ථාවක සහ කර්මාන්ත ශාලාවේ පදිංචිකරු, මියගිය හෝ තුවාල සිදු වූ තැනැත්තාගේ නියම සේවා යෝජකයා නොවන අවස්ථාවක, ඒ පදිංචිකරු හෝ කළමනාකරු හෝ (වත්තක කර්මාන්තශාලාවක් සම්බන්ධයෙන් වන විට ) වතු අධිකාරීවරයා විසින් අනතුර පිළිබඳ ලිඛිත දැන්වීමක් නියමිත යම් විස්තර ද සමග නියමිත ආකෘති පත්‍රයක, මියගිය හෝ තුවාල සිදු වූ තැනැත්තාගේ නියම සේවා යෝජකගෙන් ලබා ගෙන , අනතුර පිළිබඳ ඒ දැන්වීම දිස්ත්‍රික් කර්මාන්ත ශාලා පරීක්ෂා කිරීමේ ඉංජිනේරුවරයා වෙත යැවීමට වහාම කටයුතු සැලැස්විය යුතු ය.

(4) කර්මාන්තශාලාව තුළ , එහි සේවය කරන යම් තැනැත්තකු මරණයට පත් කරවන අනතුරක් සිදු වූ අවස්ථාවක , එම අනතුරට භාජනය වූ යම් තැනැත්තකු ඉවතට ගැනීමේ හෝ ඔහුට පිළිසරණ වීමේ කාර්යය සඳහා හැර , කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයකුගේ අවසරය නොමැතිව එම අනතුරට සම්බන්ධ යම් යන්ත්‍රයකට හෝ භාණ්ඩයකට අත තැබීම හෝ ඒවා ආකූල කිරීම හෝ

ඒවාට අත තැබීම හෝ ඒවා ආකූල කිරීම වෙත යම් තැනැත්තකු ලවා කරවීම කිසිම තැනැත්තකු විසින් නොකළ යුතුය.

හදිසි අනතුරු දැන්වීමේ විධිවිධාන අන්තරාදායක සිදුවීම් සම්බන්ධයෙන් අදාල කිරීමේ බලය

62. (1) සේවයෙහි යොදවනු ලැබූ තැනැත්තන්ට බරපතළ ශාරීරික තුවාළ සිදුවිය හැකිය යන කරුණ උඩ , සෑම විශේෂ පන්තියක පිපිරීම්, ගිනි, ගොඩනැගිලි කඩා වැටීම, යන්ත්‍රෝපකරණවලට හා යන්ත්‍රවලට වන හදිසි අනතුරු හෝ කර්මාන්ත ශාලාවක වෙනත් සිදුවීම් සම්බන්ධයෙන් ඉක්බිති ව ම දැක්වෙන වගන්තිය යටතේ දැනුම්දීම යෝග්‍ය ය යි ඇමතිවරයාට හැඟී ගියහොත්, මරණය හෝ බෙලහීන වීම සිදු වුවද නුවූවද ඒ අන්දමේ සිදුවීම්වලට ඒ වගන්තියේ විධිවිධාන නියෝගයකින් ඔහු විසින් අදාළ කළ හැකි ය.

(2) නියෝගවලට සම්බන්ධ වූ යම් සිදුවීමක් පිළිබඳ ව දීමට වුවමනා දැන්වීම වහා ම යැවීම වෙනුවට, ඒ නියෝගවලින් සීමා කරනු ලැබූ කාලය ඇතුළත යවන ලෙස ඒ නියෝගවලින් ඇමතිවරයා විසින් ඉඩ දිය හැකි ය.

කාර්මික රෝග දැනුම්දීම

1976 අංක 12, 29

1998 අංක 18, 10

63. (1) යම් කර්මාන්තශාලාවක දී ඊයම් , පොස්පරස්, ආසනික් හෝ රසදිය විෂ වීමෙන් අසනීප වූ බව හෝ යම් කර්මාන්තශාලාවක දී වැළඳුණු “ ඇන්ත්‍රැක්ස් ” රෝගයෙන් පෙළෙන බව තමා විශ්වාස කරන රෝගියකුට ප්‍රතිකාර කරන හෝ එවැනි රෝගියකු බැලීමට කැඳවනු ලබන සෑම ලියාපදිංචි වෛද්‍යවරයකු ම, රෝගියාගේ නම සහ සම්පූර්ණ තැපැල් ලිපිනය ද රෝගියා පෙළෙන බව වෛද්‍යවරයා විශ්වාස කරන රෝගය ද රෝගියා සේවයේ යෙදී සිටින හෝ අන්තිමවරට සේවයේ යෙදී සිටි කර්මාන්ත ශාලාවේ නම සහ ලිපිනය ද සඳහන් දැන්වීමක්, ( එවැනි දැන්වීමක් කලින් යවා ඇතහොත් මිස ) , ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු තැන වෙත වහාම යැවිය යුතුය. තවද මේ වගන්තිය අනුව යවනු ලබන සෑම දැන්වීමක් වෙනුවෙන් ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලබන රුපියල් දෙසීයක ගාස්තුවකට ඒ වෛද්‍යවරයා හිමිකම් ලබන්නේය.

(2) මේ වගන්තියේ විධිවිධානවලට විරුද්ධවීම් වශයෙන් එහි නියමයන් ප්‍රකාර යම් දැන්වීමක් යැවීම යම් වෛද්‍යවරයකු විසින් පැහැර හැරියොත් ඔහු රුපියල් පන්සියයකට වැඩි නොවන දඩයකට යටත් විය යුතු ය.

1976 අංක 12, 29

(3) කර්මාන්තශාලාවක් තුළ සිදුවන ඊයම් , පොස්පරස්, ආසනික් හෝ රසදිය විෂ වීමක් හෝ “ ඇන්ත්‍රැක්ස් ” රෝගය වැළඳීමක් පිළිබඳ ලිඛිත දැන්වීමක් නියම කරනු ලැබිය හැකි ආකෘතියක් අනුව ද නියම කරනු ලැබිය හැකි විස්තරත් සමග ද දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු තැනට හා බලය ලත් කර්මාන්තශාලා වෛද්‍යවරයකුට පදිංචිකරු විසින් වහාම යැවිය යුතු ය . තවද අනතුරු පිළිබඳ දැනුම්දීම සම්බන්ධයෙන් වූ මේ ආඥාපනතේ විධිවිධාන , ඒ විධිවිධානවල සඳහන් යම් අනතුරකට අදාළ වන ආකාරයට ම එකී යම් කරුණකට අදාළ වන්නේය.

(4) සියලු ම කර්මාන්තශාලා සම්බන්ධයෙන් හෝ යම් වර්ගයක හෝ යම් විස්තරයකට වැටෙන හෝ කර්මාන්තශාලා සම්බන්ධයෙන් හෝ , මේ වගන්තියේ සඳහන් රෝගවලට හැර වෙනත් රෝග වලටද මේ වගන්තියේ විධිවිධාන ඇමතිවරයා විසින් නියෝගවලින් අදාළ කළ හැකි ය.

හදිසි අනතුරකින් හෝ කාර්මික රෝගයකින් සිදු වූ මරණයක් විභාග කිරීම

64. (1) යම් තැනැත්තකුගේ මරණයට හේතුව සොයා බැලීමේ විභාගයක් අපරාධ නඩු විධාන සංග්‍රහය යටතේ පවත්වන පරීක්ෂකයකුට, ඒ මරණය, මේ ආඥා පනත යටතේ දැනුම් දිය යුතු හදිසි අනතුරකින් හෝ රෝගයකින් සිදුවී තිබෙන බව පෙනී ගිය අවස්ථාවක දී, ඒ නීති කෘත්‍යය ගැන විමසිලිමත් වීම සඳහා පරීක්ෂකයකු හෝ ලේකම් වෙනුවෙන් යම් තැනැත්තකු හෝ පැමිණ නො සිටියහොත්ඒ විභාගය පරීක්ෂක විසින් කල් දැමිය යුතු ය . කල් දැමූ විභාගය පැවැත්වීමට යටත් පිරිසෙයින් දින හතරකට පෙර, ඒ විභාගය පවත්වන වේලාව සහ ස්ථානය දන්වන ලිපිගත දැන්වීමක් දිස්ත්‍රික්කයේ පරීක්ෂක වෙත ඒ පරීක්ෂක විසින් යැවිය යුතු ය. එසේ ද වුවත්,

(අ) කල් තැබීමට පෙර මෘත දේහය හඳුනා ගැනීම පිණිස සාක්ෂි විභාග කොට , පරීක්ෂක විසින් භූමදානය නියම කළ හැකි ය. තවද,

(ආ) එක් තැනැත්තකුට වඩා වැඩි ගණනකගේ මරණය පිළිබඳව පවත්වනු ලැබූ විභාගයක දී , ඒ විභාගය පැවැත්වීමට විසි හතර පැයකට පෙර ලැබෙන සේ විභාගය පවත්වන වේලාව සහ ස්ථානය පරීක්ෂකට මරණ පරීක්ෂක විසින් දැන්වීමක් යවා තිබේ නම් , විභාගය කල් තැබීම අනවශ්‍ය බව ඔහුට හැගෙතොත්, මේ වගන්තිය ප්‍රකාර ඒ විභාගය කල් තැබීම ඔහු කළ යුත්තක් ම නො විය යුතු ය.

(2) (1) වෙනි උප වගන්තියේ සඳහන් යම් විභාගයක තමාගේ අදහස පරිදි කරුණට අදාළ වූ ප්‍රශ්නයක් හෝ නිසි ප්‍රශ්නයක් හෝ නොවූ යම් ප්‍රශ්නයක් ඇසීමට ඉඩ නො දීමට මරණ පරීක්ෂකට ඇති බලයට යටත්ව, පහත සඳහන් තැනැත්තන්ට තමා ම හෝ අධි නීතිඥයකුට හෝ නීතිඥයකු හෝ නියෝජිතයකු හෝ මගින් යම් සාක්ෂිකරුවකු විභාග කිරීමට බලය ඇත්තේ ය.

ඒ තැනැත්තෝ නම් --

පරීක්ෂකයෙක්, විභාගය පවත්වනු ලබන්නේ යම් තැනැත්තකුගේ මරණය සම්බන්ධයෙන් නම් ඒ තැනැත්තාගේ ඥාතියෙක් , අනතුර සිදුවුණු හෝ රෝගය වැළඳුණු කර්මාන්ත ශාලාවේ පදිංචිකාරයා ; කර්මාන්ත ශාලාවේ සේවයෙහි යෙදී සිටින වැඩි දෙනකුගේ අණ පරිදි ලියවිල්ලකින් පත් කරනු ලැබූ යම් තැනැත්තෙක් ; නැසීගිය තැනැත්තාගේ මරණය සිදුවූ කාලයෙහි ඔහු බැඳී ඇති නැතහොත් කර්මාන්ත ශාලාවේ සේවයෙහි යෙදී සිටින තැනැත්තකු බැඳී ඇති කම්කරු සමිතියකින්, මිත්‍ර සමාජයකින් හෝ වෙනත් සමිතියකින් ලියවිල්ලකින් පත් කරනු ලැබූ තැනැත්තෙක් හෝ පදිංචිකාරයා සාමාජිකයකු වූ යම් සේව යෝජකයන්ගේ සමිතියකින් ලියවිල්ලකින් පත් කරනු ලැබූ තැනැත්තෙක් ද වෙති.

(3) පරීක්ෂකයකු නො පැමිණි එබඳු විභාගයක දී ඒ හදිසි අනතුරට හෝ රෝගයට හේතුවුණු නො සැලකිල්ල හෝ පිළියමක් වුවමනා ලෙස මරණ පරීක්ෂකට පෙනී යන කර්මාන්ත ශාලාවෙහි හෝ කර්මාන්ත ශාලාව ගැන හෝ යම් දෝෂයක් හෝ පිළිබඳ ව සාක්ෂි දෙන අවස්ථාවක දී ඒ නො සැලකිල්ල හෝ දෝෂය පිළිබඳ ව ලිපිගත

දැන්වීමක් දිස්ත්‍රික්කයේ පරීක්ෂක වෙත මරණ පරීක්ෂක විසින් යැවිය යුතු ය.

(4) මේ වගන්තියේ මරණ පරීක්ෂකයකු ගැන සඳහන් කිරීමේ දී, ඒ සඳහනටම සුලු අපරාධ විනිශ්චකාරවරයකු ඇතුළත් වූ ලෙස සැලකිය යුතු ය.

හදිසි අනතුරු හා රෝග සම්බන්ධව ක්‍රමානුකූල විභාගයක් නියම කිරීමට ඇති බලය

65. (1) යම් කර්මාන්ත ශාලාවක සිදුවුණු හදිසි අනතුරක් හෝ එහි දී වැළඳුණු හෝ වැළඳී ඇතැ යි සැක කරනු ලැබූ රෝගයක් හෝ පිළිබඳ ව ද , එහි හේතු සහ වෙනත් කරුනු පිළිබඳ ව ද ක්‍රමානුකූල විභාගයක් පැවැත්වීම යෝග්‍ය ය යි ඇමතිවරයාට හැඟී ගිය අවස්ථාවක දී එබඳු විභාගයක් පැවැත්වීමට ඇමතිවරයා විසින් නියම කළ හැකි ය. එබඳු විභාගයක් සම්බන්ධයෙන් පහත දැක්වෙන විධිවිධාන බල පැවැත්විය යුතුය :-

(අ) විභාගය පැවැත්වීම සඳහා සුදුසු තැනැත්තකු හා විභාගය පැවැත්වීමේ දී උපදේශක ලෙස ක්‍රියා කිරීමට නීතිය දැනුමක් හෝ වුවමනා කාරණය පිළිබඳ ව විශේෂ දැනුමක් ඇති තැනැත්තකු ඇමතිවරයා විසින් පත් කළ හැකි ය.

(ආ) හදිසි අනතුර සිදුවීමේ හෝ රෝගය හට ගැනීමේ හෝ හේතු ද, ඒ පිළිබඳ ව වෙනත් කරුණු ද දැන ගැනීම සඳහා ද මේ වගන්තියේ සඳහන් වාර්තාව ඉදිරිපත් කිරීම පහසුවනු සඳහා ද (මින් මතු “ අධිකරණය ” යි කියනු ලබන ) එසේ පත් කරනු ලැබූ තැනැත්තා හෝ තැනැත්තන් විසින්, තමාට ඉතාම ඵලදායී ලෙස හැගෙන ආකාරයට හා එබඳු තත්ත්ව යටතේ , ප්‍රසිද්ධියේ විභාගය පැවැත්විය යුතු ය.

(ඇ) මේ ආඥාපනත යටතේ වන වැරදි සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලැබූ පැමිණිලි විභාග කිරීමේ දී සුලු අපරාධ විනිශ්චයකාරවරයකුට ඇති සියලු ම බලතල ද , මේ ආඥා පනත යටතේ පත් කරනු ලැබූ පරීක්ෂකයකුට ඇති සියලු ම බලතල ද , එයට අතිරේක ව මෙහි පහත දැක්වෙන බල ද , විභාග කිරීමේ කාර්යය සඳහා අධිකරණයට ඇත්තේ ය.

එනම් --

(i) එකී කාර්යය සඳහා අධිකරණයට ඇතුළුව පරීක්ෂා කළ යුතු ය යි පෙනී යන යම් ස්ථානයකට හෝ ගොඩනැඟිල්ලකට ඇතුළුව එය පරීක්ෂා කිරීම;

(ii) එකී කාර්යය සඳහා තමා ඉදිරිපිට කැඳවා විභාග කිරීමට සුදුසු යයි හැගෙන සෑම තැනැත්තන්ගේ ම පැමිණ සිටීම අධිකරණය විසින් අත්සන් කරනු ලැබූ සිතාසියකින් නියම කිරීම;

(iii) එකී කාර්යය සඳහා වැදගත් යයි අධිකරණය කල්පනා කරන සියලු ම පොත් , කඩදාසි හා ලේඛන ඉදිරිපත් කිරීමට නියම කිරීම ; හා

(iv) දිවුරුමක් දිවුරවීම හා විභාග කරනු ලැබූවකුට ඔහු විසින් විභාග කිරීමේ දී කරනු ලැබූ

කරුණුවල සත්‍ය භාවය පිළිබඳ ව ප්‍රකාශයක් කොට එහි අත්සන් කිරීමට නියම කිරීම ද වේ.

(ඈ) ඇමතිවරයා විසින් පනවනු ලැබූ නියෝගවලින් නියමිත ක්‍රමයක් අනුව සාක්ෂි දීම පිණිස පැමිණෙන සාක්ෂිකාරයින්ට වියදම් ගෙවිය යුතු ය.

(ඉ) හදිසි අනතුරෙහි හේතු ද , එහි වෙනත් කරුණු ද නැතහොත් රෝගයක් සම්බන්ධයෙන් නම් ඒ පිළිබඳ කරුණු ද දක්වා, අධිකරණයට සුදුසු ය යි හැඟෙන වෙනත් අදහස් ද එකතු කොට, අධිකරණය විසින් ඇමතිවරයා වෙත වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

(ඊ) උපදේශකයන් වශයෙන් ක්‍රියා කිරීමට පත් කරනු ලැබූ තැනැත්තන්ගේ පඩිය ද ඇතුළුව , මේ වගන්තිය යටතේ විභාගයක දී හෝ විභාගයක් සම්බන්ධයෙන් හෝ දරන්ට වුන වියදම්, හදිසි අනතුර හෝ රෝගය ඇතිවීම පිළිබඳ ව තමාගේ හෝ තමාගේ සේවකයකුගේ හෝ නියෝජිතයකුගේ හෝ යම් ක්‍රියාවක් නිසා හෝ නො කර හැරීමක් නිසා හෝ යම් තරමකට වගකිව යුතු යයි අධිකරණයට පෙනී යන , අධිකරණය වෙත කැඳවනු ලැබූ තැනැත්තකු විසින් සම්පූර්ණයෙන් හෝ කොටසක් හෝ ගෙවීමට අධිකරනය විසින් නියම කළ හැකිය . එහෙත් එසේ ගෙවීමට නියම කරනු නො ලැබූ වියදම් පොදු ආදායමෙන් ගෙවිය යුතු ය.

(උ) තමාට හිමිවිය යුතු යම් වියදමක් වෙතොත් එය ඉදිරිපත් කිරීමෙන් පසු, ඔප්පු කිරීමේ භාරය තමා වෙත පැවරෙන යුක්ති සහගත හේතුවක් නොමැති ව, යම් සිතාසියක් හෝ අධිකරණයේ ආඥාවක් ඉෂ්ට කිරීම යම් තැනැත්තකු විසින් පැහැර හැරියොත් , නැතහොත් අධිකරණයට සිය යුතුකම ඉෂ්ට කිරීම වැළැක්වුවහොත් හෝ එයට බාධා කළහොත් ඔහු වරදකට වරදකාරයකු ව රුපියල් සියයකට වැඩි නො වන දඩයකට යටත් විය යුතු ය. තවද යම් වාර්තාවක් කිරීමේ හෝ ලේඛනයක් ඉදිරිපත් කිරීමේ හෝ ආඥාවක් නො කර හැරීමක් පිළිබඳව ඉහත කී ලෙස වැරදිකාරයා කරනු ලැබුවකුගේ නොකර හැරීමක් සම්බන්ධයෙන් නම්, 108 වෙනි විධිවිධානවලට යටත් ව, තවත් වරදකට ඔහු වරදකාරයා විය යුතු ය. තවද ඒ නො කර හැරීම පවත්වා ගෙන යන එක් එක් දවසකට රුපියල් පන් දහසකට වැඩි නොවන දඩයකට ද ඒ සම්බන්ධයෙන් ඔහු යටත් විය යුතු ය.

(2) තමාට සුදුසු ය යි හැඟෙන කාලයක දී හා ආකාරයට අධිකරණයේ වාර්තාව ඇමතිවරයා විසින් ප්‍රසිද්ධ කළ හැකි ය.

සමහර අවස්ථාවලදී පරීක්ෂා කිරීමට හා වාර්තා කිරීමට පරීක්ෂක වෛද්‍යවරයාගේ යුතුකම

66. (1) (අ) කර්මාන්තශාලාවක් තුළ දුමාරවලට හෝ අනෙකුත් හානිකර ද්‍රව්‍යවලට පාත්‍රවීම නිසා හෝ කොමසාරිස්ගේ උපදෙස්වල විමර්ශනය අවශ්‍ය ලෙස නිශ්චිතව සඳහන් යම් වෙනත් විශේෂ හේතුවක් නිසා සිදු වූ මරණ හෝ තුවාල ගැන ; සහ

(ආ) කොමසාරිස්ගේ සාමාන්‍ය හෝ විශේෂ උපදෙස් අනුව දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු තැන විසින් බලයලත් කර්මාන්තශාලා වෛද්‍යවරයා වෙත යොමු කරනු ලබන යම් මරණයක් හෝ තුවාලයක් ගැන ; සහ

(ඇ) මේ ආඥාපනත යටතේ තමාට දැනුම්දීමක් කරනු ලබන යම් රෝගයක් ගැන

විමර්ශනය කොට වාර්තා කිරීම බලයලත් කර්මාන්තශාලා වෛද්‍යවරයාගේ යුතුකම වන්නේය.

(2) මේ වගන්තිය යටතේ විමර්ශනයක කාර්යය සඳහා, යම් ගොඩනැගිල්ලක, මියගිය, තුවාල ලත් හෝ හානි සිදු වූ තැනැත්තා ගෙන යනු ලැබූ යම් කාමරයකට ඇතුළුවීමේ බලය ඇතුළුව, කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවකු සතු බලතලවලට සමාන බලතල බලය ලත් කර්මාන්ත ශාලා වෛද්‍යවරයාට ඇත්තේ ය.

## VII වෙනි කොටස

1965 අංක 17, 2

### ස්ත්‍රීන් සහ බාල තැනැත්තන් සේවයෙහි යෙදීම

### කාලවේලා සහ නිවාඩු

ස්ත්‍රීන් සහ බාල තැනැත්තන් සේවයෙහි යෙදවීමේ පැය ගණන් පිළිබඳ කොන්දේසි

67. කර්මාන්ත ශාලාවක සේවයෙහි යෙදී සිටින සෑම ස්ත්‍රියක හෝ බාල තැනැත්තකු සඳහා, වැඩ කරන පැය ගණන, සේවා කාලය, කෑම හා විවේකය පිළිබඳ කාලය මේ කොටසේ විධිවිධානවලට යටත්ව , පහත දැක්වෙන කොන්දේසිවලට එකඟ විය යුතු ය.

එනම් ---

(අ) කෑම හා විශ්‍රාමය සඳහා දෙනු ලබන කාලය හැර වැඩ කරන පැය ගණන යම් දවසක, නමයකට හෝ යම් සතියක, හතලිස් අටකට හෝ වැඩි නො විය යුතු ය.

1984 අංක 32, 5

(ආ) වයස දහසයට පත් නොවූ තරුණ අය සම්බන්ධයෙන් වන විට සේවා නියුක්ති කාලය යම් දිනකට පැල දොළහ නොඉක්මවිය යුතු අතර, එය උදේ හයට කලින් ආරම්භ කිරීම හෝ සවස හයට පසුව අවසාන කිරීම නොකළ යුතු ය. තව ද, වයස දහ අටට පත් නොවූ තරුණ අය සම්බන්ධයෙන් වන විට සේවා නියුක්ති කාලය සවස අට පසු වී අවසාන නොවිය යුතු අතර , සතියෙහි එක් දිනකවත් පස්වරු එකට පසුව අවසන් නොවිය යුතු ය.

2000 අංක 33, 11

(ඇ) කෑම හා විවේකය සඳහා යටත් පිරිසෙයින් පැය භාගයක අන්තර කාලයක් නොමැති ව , ස්ත්‍රියක හෝ බාල තැනැත්තකු නොනවත්වා ම පැය හතර හමාරක කාලයක් එක වාරයකට සේවයේ නො යෙදිය යුතු ය . එබඳු අන්තර කාලයක් උදය එකොළහ සහ පස්වරු එක අතර පැයවල දී විය යුතු ය. තවද යම් වාරයක දී මිනිට්ටු දහයකට නො අඩු අන්තර කාලයක් ඉඩ හැරී විට ඒ වාරය පැය පහ දක්වා වැඩි කළ හැකි ය.

ස්ත්‍රීන් රාත්‍රී කාලයේ සේවයේ යෙදවීම

1984 අංක 34,

67 අ. (1) මේ කොටසේ විධිවිධානවලට යටත්ව , කර්මාන්තශාලාවක සේවයෙහි නියුක්ත කරවන ලද සෑම ස්ත්‍රියකටම, රාත්‍රිය මුළුල්ලේම වැඩ කිරීමට අවසර දෙනු ලැබිය යුතු ය.

(2) ස්ත්‍රියක් කර්මාන්තශාලාවක රාත්‍රී කාලයේ දී සේවයෙහි නියුක්ත කරවීම, පහත දැක්වෙන කොන්දේසිවලට යටත්ව කරනු ලැබිය යුතු ය :-

(අ) සිය කැමැත්තට විරුද්ධව කිසිම ස්ත්‍රියකට රාත්‍රී කාලයෙහි වැඩ කිරීමට බල කරනු නොලැබිය යුතු ය;

(ආ) කර්මාන්තශාලාවක සෑම පදිංචිකරුවකු විසින් ම , රාත්‍රී කාලයේ දී ස්ත්‍රීන් ප . ව. 10.00 න් පසු වැඩ කිරීම සඳහා සේවයෙහි නියුක්ත කරවීමට පෙරාතුව කම්කරු කොමසාරිස්වරයාගේ ලිඛිත අනුඥාව ලබා ගත යුතු ය;

(ඇ) යම් දිනක පෙ.ව.6.00 සහ ප.ව.6.00 අතර කාලය තුළ සේවයෙහි නියුක්ත කරවනු ලැබූ කිසිම ස්ත්‍රියක් ප .ව. 10.00 න් පසු සේවයෙහි නියුක්ත කරවනු නොලැබිය යුතු ය;

(ඈ) රාත්‍රී කාලයේ දී වැඩ කරන සෑම ස්ත්‍රියකටම ඇය විසින් ලබා ගන්නා සාමාන්‍ය ගෙවීම මෙන් එක හමාරකට නොඅඩු ගෙවීමක් ලැබිය යුතු ය;

(ඉ) රාත්‍රී කාලයේ දී වැඩ කරන කම්කරු ස්ත්‍රීන් ගේ ශුභ සාධනය පිළිබඳව සොයා බැලීම සඳහා කාන්තා පාලිකාවන් පත් කරනු ලැබිය යුතු ය;

(ඊ) රාත්‍රී කාලයේ දී වැඩ කරන සෑම කම්කරු ස්ත්‍රියකටම සේවා යෝජක විසින් විවේක කාමර සහ කෑම බීම සපයනු ලැබිය යුතු ය;

(උ) යම් එක් මාසයක් තුළදී කිසිම ස්ත්‍රියක් දින දහයකට වැඩියෙන් රාත්‍රී වැඩ සඳහා සේවයෙහි නියුක්ත කරවනු නොලැබිය යුතුය;

ස්ත්‍රීන් සහ බාල තැනැත්තන් අතිකාල සේවයෙහි යෙදවීම

2002 අංක 19, 2

68. (1) යම් කර්මාන්තශාලාවක ඇති අධික වැඩ ප්‍රමාණය, වැඩ කරන පැය ගණන සහ සේවා නියුක්තිය පිළිබඳ කාලසීමාවන්ට අදාළව මේ කොටසෙහි විධිවිධානවල කුමක් සඳහන් වුව ද , කාන්තාවන් සහ වයස අවුරුදු දහසය සම්පූර්ණ වූ එහෙත් වයස අවුරුදු දහඅට සම්පූර්ණ නොවූ තරුණ අය, අතිකාල සේවයෙහි නියුක්ත කිරීම මගින් ඉටුකර ගත හැකිය ;

එසේ වුව ද කාන්තාවක් විසින් යම් ලිත් මාසයක් තුළ දී කරනු ලබන අතිකාල පැය ගණනෙහි එකතුව පැය හැටක් නොඉක්මවිය යුතු අතර වයස අවුරුදු 16 සම්පූර්ණ වූ එහෙත් වයස අවුරුදු 18 සම්පූර්ණ නොවූ තරුණ අයකු යම් ලිත් මාසයක් තුළ කරනු ලබන අතිකාල පැය ගණනෙහි එකතුව පැය පනහක් නොඉක්මවිය යුතු ය.

(2) ස්ත්‍රියකගේ හෝ බාල තැනැත්තකුගේ අතිකාල සේවය පහත දැක්වෙන කොන්දේසිවලට යටත් විය යුතු ය.

2002 අංක 19, 2

(අ) කාන්තාවක් හෝ තරුණ අයකු විසින්, අතිකාල සේවයේ යෙදුන කාලසීමාව ඇතුළුව එහෙත් ආහාර අනුභවය සහ විවේකය සඳහා අවසර දී ඇති විවේකය කාලය අත්හැර , යම් සතියක් තුළ වැඩ කරන මුළු පැය ගණන පැය හැටක් නොඉක්ම විය යුතු ය.

1984 අංක 32, 7

(ආ) ස්ත්‍රිය හෝ තරුණ අය සේවයෙහි නියුක්ත කරවීමේ කාලය යම් දිනකට පැය දොළහ නොඉක්මවිය යුතු අතර, තරුණ අය සම්බන්ධයෙන් වන විට , සේවා නියුක්ති කාලය ආරම්භය සහ අවසානය සඳහා මේ කොටසෙහි සඳහන් වේලාවන්ගෙන් බැහැරව , කාලය දීර්ඝ කරනු නොලැබිය යුතු ය.

2002 අංක 19, 2

(2 අ) සේවා යෝජකයකු විසින්, අතිකාල සේවයෙහි යෙදීම සඳහා ඇයගේ කැමැත්ත ලිඛිතව දෙනු ලබන්නේ නම් මිස --

(අ) ගර්භනී කාන්තාවක් ඇයගේ ගර්භනී කාලය තුළ; සහ

(ආ) කිරිදෙන මවක් ඇයගේ දරුවා උපත ලද දිනයේ සිට ගණන් බලනු ලබන එක් අවුරුදු කාලසීමාවක් සඳහා ; සහ

(ඇ) මළ දරුවකු බිහිකළ කාන්තාවක් ඇය මළ දරුවා බිහි කළ දින සිට ගණන් බලනු ලබන මාස තුනක කාලසීමාවක් සඳහා,

අතිකාල සේවයෙහි යෙදවීම නොකළ යුතු ය.

(3) නොනවත්වා ම සේවයෙහි යෙදීම හා ආහාර ගැනීම හෝ විවේක සඳහා ඇති අන්තර කාල සම්බන්ධයෙන් මේ කොටසේ විධිවිධාන වෙනත් සේවාවලට අදාළ වන ආකාරයට ම අතිකාල සේවයටත් අදාළ විය යුතුය.

2002 අංක 19, 2

(4) අමාත්‍යවරයා විසින් ---

(අ) යම් කාන්තාවක් හෝ තරුණ අයකු අතිකාල සේවයෙහි යෙදවීම මගින් ඒ කාන්තාවගේ හෝ තරුණ අයගේ ශරීර සෞඛ්‍යයට අහිතකර බලපෑමක් ඇතිවන බව පෙනී යන්නේ නම් , එම කාන්තාව හෝ තරුණ අය හෝ ඔවුන්ගේ යම් පන්තියක් අතිකාල අතිකාල සේවයෙහි යෙදවීම තහනම් කිරීම හෝ සීමා කිරීම ;

(ආ) කාන්තාවක් හෝ තරුණ අයකු කර්මාන්ත ශාලාවක් තුළ අතිකාල සේවයෙහි යොදවනු ලබන කාලය තුළ විවේකාගාර පහසුකම් සැලසීම ඇතුළු එම කර්මාන්තශාලාව ඇතුළත පවත්වාගෙන යා යුතු සේවා තත්ත්වයන්;

(ඇ) රාත්‍රී කාලයේ දී අතිකාල සේවයේ යොදවනු ලබන කාන්තාවන්ට ගමන් පහසුකම් සැලසීමේ ආකාරය,

නියෝග මගින් නියම කරනු ලැබිය හැකි ය.

(5) යම් පඩකතියක හෝ යම් විස්තරයකට වැටෙන හෝ කර්මාන්තශාලාවක ගෙන යන කර්මාන්තය පිළිබඳ ව වූ විශේෂ කරුණු හා තත්ත්ව ගැන සැලකීමෙන් මේ වගන්තියෙන් ඉඩ හරිනු ලැබූ එහි අතිකාල සේවය ඒ කර්මාන්තයට බරපතල පාඩුවක් නො වන පරිද්දෙන් අඩු කළ හැකි බව ඒ කර්මාන්ත ශාලා සම්බන්ධයෙන් ඇමතිවරයා වෙත කරුණු කියා සිටි අවස්ථාවක දී, පදිංචිකාරයන්ගේ හෝ සේවය කරන තැනැත්තන්ගේ හෝ සමාගමක ද, සම්බන්ධකමක් ඇතැයි තමා සලකන පඩි පාලක සභාවක හෝ එබඳු මණ්ඩලයක ද අදහස් විමසීමෙන් පසු , විභාගයක් පැවැත්වීමට ඇමතිවරයා විසින් නියම කළ හැකිය . විභාගයේ

ප්‍රතිඵලයක් වශයෙන් කර්මාන්තයට බරපතළ බාධාවක් නොවන පරිදි අතිකාල සේවය අඩු කළ හැකි බව ඇමතිවරයාට ඒත්තු ගියොත් , ස්ත්‍රීන්ගේ හෝ බාල තැනැත්තන්ගේ නැතහොත් සේවයෙහි යොදනු ලැබූ බාල තැනැත්තන්ගේ අතිකාල සේවයෙහි ප්‍රමාණය අඩුවන ලෙස ඉහත සඳහන් පඩකතියේ හෝ විස්තරයේ කර්මාන්ත ශාලාවලට මේ වගන්තියේ විධිවිධාන අදාළ වීමෙහි දී ඒවා නියෝග වලින් ඇමතිවරයා විසින් වෙනස් කළ හැකි ය.

(6) යම් පඩකතියක හෝ විස්තරයක කර්මාන්ත ශාලාවක වැඩ, යම් කාල සීමාවක දී හෝ වෙනත් විශේෂ හේතුවක් නිසා හෝ වැඩි වේ නම්, ඒ පඩකතියක හෝ විස්තරයක කර්මාන්ත ශාලා සම්බන්ධයෙන් ස්ත්‍රීන් සඳහා හෝ යම් නියමිත නිපදවීම් ක්‍රමයක සේවය කරන ස්ත්‍රීන් සඳහා හෝ ඒ වැඩිවීමේ යම් කාලසීමාවක් අතරතුර මේ වගන්තිය යටතේ දවසකට ඉඩ හරිනු ලැබූ වැඩ කිරීමේ පැය ගණන ද , සේවය කිරීමේ කාලය ද නියෝගවලින් ඇමතිවරයා විසින් වැඩි කළ හැකිය . එහෙත් නියෝගවල දැක්වෙන පරිදි අවුරුද්දකට අටකට වැඩි නො වන සති ගණනකින් ඒ වැඩි කිරීම කළ යුතු ය.

අතිකාල සේවය විස්තර කිරීම

69. මේ කොටසෙහි කාර්යය සඳහා,

(අ) යම් ස්ත්‍රියක හෝ බාල තැනැත්තකු සම්බන්ධයෙන් "අතිකාල සේවය " යන පාඨයෙන් 67 වෙනි වගන්තියේ (අ) ඡේදය යටතේ ඒ ස්ත්‍රිය හෝ බාල තැනැත්තා වැඩ කළ යුතු මුළු පැය ගණනට අතිරේකව, ඒ ස්ත්‍රිය හෝ බාල තැනැත්තා කර්මාන්ත ශාලාවෙහි වැඩ කරන යම් කාල සීමාවක් අදහස් කෙරෙයි.

(ආ) අතිකාල සේවයෙහි පැය ගණන් බැලීමෙහි දී පැය භාගයකට අඩු පැයක කොටසක් පැය භාගයක් වශයෙන් ද, පැය බාගයකට වැඩි පැයක කොටසක් පැයක් වශයෙන් ද සැලකිය යුතු ය.

අතිකාල ලේඛන පොත

70. කර්මාන්ත ශාලාවෙහි සේවයේ යෙදී සිටින එක් එක් ස්ත්‍රිය හෝ එක් එක් බාල තැනැත්තා විසින් කරනු ලැබූ අතිකාල සේවයෙහි විස්තර දැක්වෙන, නියෝග වලින් නියමිත ආකාරයකට, ලේඛන පොතක් සෑම කර්මාන්ත ශාලාවක ම පදිංචිකාරයා විසින් තබා පවත්වා ගෙන යා යුතු ය.

එකම දිනක කර්මාන්තශාලාවේ ඇතුලත හා පිටත සේවය සීමා කිරීම

71. (1) යම් ස්ත්‍රියකට හෝ බාල තැනැත්තකුට ආහාර ගැනීම හෝ විවේකය හෝ සඳහා ඉඩ හරිනු ලැබූ අන්තර කාලයක දී හෝ ඒ ස්ත්‍රියගේ හෝ බාල තැනැත්තාගේ හෝ සේවා කාලයට ඇතුළත් නොවූ යම් කාල වේලාවක දී හෝ කර්මාන්ත ශාලාවේ ව්‍යාපාරයක හෝ පදිංචිකාරයා විසින් ගෙන යනු ලබන වෙනත් ව්‍යාපාරයක හෝ, ඒ ස්ත්‍රිය හෝ බාල තැනැත්තා කර්මාන්ත ශාලාවෙහි සේවයෙහි යෙදී සිටින කාල සීමාව ඇතුළත යම් දවසක, කර්මාන්ත ශාලාවෙන් පිට , ඒ ස්ත්‍රිය හෝ බාල තැනැත්තා සේවයෙහි නො යෙදවිය යුතු ය.

එසේ ද වුවත්, ස්ත්‍රියක හෝ වයස දහසයක් වූ බාල තැනැත්තකු හෝ සේවා කාලයෙන් පිට, සාප්පුවක බහත කියන ලද පරිදි සේවයෙහි යෙදවිය හැකිය. එහෙත් එබඳු සේවයේ යෙදීමක්, අතිකාල සේවය පිළිබඳ විධිවිධාන ඇතුළුව , මේ කොටසෙහි කාර්යය සඳහා, කර්මාන්ත ශාලාවෙහි සේවයේ යෙදීමක් ලෙස සැලකිය යුතු ය.

(2) මේ වගන්තියේ කාර්යය සඳහා, යම් ස්ත්‍රියකට හෝ ඈ සඳහා හෝ යම් බාල තැනැත්තකුට හෝ ඔහු සඳහා හෝ යම් වැඩක් දෙනු ලැබේ නම්, නැතහොත් ඔහු හෝ ඇය විසින් කර්මාන්ත ශාලාවේ පිටත සිට වැඩ කිරීම සඳහා යම් වැඩක් පිටත ගෙන යේ නම් , එබඳු ස්ත්‍රිය හෝ බාල තැනැත්තා එසේ වැඩ දුන් හෝ ගෙන ගිය දිනයේ කර්මාන්ත ශාලාවෙන් පිට සේවයෙහි යෙදුන ලෙසට සැලකිය යුතු ය.

අන්තර කාල ඇතුලත කාමර පාවිච්චිය තහනම් කිරීම

72. 76 වෙනි වගන්තිය යටතේ පනවනු ලබන නියෝගවලට යටත් ව, ආහාර ගැනීම සඳහා හෝ විවේකය සඳහා හෝ යම් ස්ත්‍රියකට හෝ බාල තැනැත්තකුට ඉඩ හරිනු ලැබූ අන්තර කාල ඇතුළත යම් වේලාවක දී ඒ ස්ත්‍රියට හෝ බාල තැනැත්තාට නිපදවීමේ ක්‍රමයක් ගෙන යන කාමරයක නැවතී සිටීමට ඉඩ නො දිය යුතු ය.

සතිපතා සහ වාර්ෂික නිවාඩු දවස්

73. (1) (2) වෙනි උප වගන්තිය යටතේ හෝ 76 වෙනි වගන්තිය යටතේ හෝ පැනවිය හැකි නියෝගවලට යටත් ව ---

(අ) ඉරුදිනක හෝ ඉරුදින වෙනුවෙන් නියම කරනු ලැබිය හැකි වෙනත් සතියේ දිනක හෝ තරුණ කර්මාන්ත ශාලාවක සේවයේ නියුක්ත කරනු ලැබීම නැතහොත් සතියේ වෙනත් නම් දිනක යම් කර්මාන්ත ශාලාවක් තුළ සේවයෙහි නියුක්ත තරුණ අයකු කර්මාන්තශාලාවේ ව්‍යාපාරික කටයුතු සම්බන්ධයෙන් හෝ පදිංචිකරු විසින් කරගෙන යනු ලබන වෙනත් යම් ව්‍යාපාරයක, ඉරුදින හෝ ඒ නියමිත සතියේ දිනක සේවයේ නියුක්ත කරනු ලැබීම කරනු නොලැබිය යුතුය; තව ද

(ආ) එක් අවුරුද්දකට, සතියේ පිළිවෙළින් එක දවස් හයක සම්පූර්ණ නිවාඩුවක් කර්මාන්ත ශාලාවක සේවයෙහි යෙදී සිටින සෑම ස්ත්‍රියකට හෝ සෑම බාල තැනැත්තකුට හෝ දිය යුතු ය . ඒ දින හය පදිංචිකාරයා විසින් නියම කරනු ලැබ , ඒ සති දිනයන්හි පළමු දිනට පෙර සති තුනකට අඩු නො වන කාලයක් තුළ , කර්මාන්ත ශාලාවෙහි සවි කරනු ලැබූ දැන්වීමක මාර්ගයෙන් ම ඒ බව දැනුම් දිය යුතු ය.

(2) යම් පඩකතියක හෝ විස්තරයක කර්මාන්ත ශාලාවක පාවිච්චි කරනු ලබන ද්‍රව්‍යවල වටිනාකම ශීඝ්‍ර ලෙස අඩුවීමකට යටක් වන නිසා හෝ යම් පඩකතියක හෝ විස්තරයක කර්මාන්ත ශාලාවක වෙනත් කරුණු හෝ තත්ත්ව නිසා හෝ ඒ පඩකතියේ හෝ විස්තරයේ කර්මාන්ත ශාලාවට (1) වෙනි උප වගන්තියේ (අ) ඡේදයේ විධිවිධාන අදාළ කළහොත් ඒ කර්මාන්ත ශාලාවල වැඩ නිසි ආකාර ඉෂ්ට කිරීමට බරපතල බාධා ඇති වන බව ඇමතිවරයාට ඒත්තු ගිය අවස්ථාවක දී , නියම කළ හැකි කොන්දේසිවලට යටත් ව ඒ පඩකතියේ හෝ විස්තරයේ කර්මාන්ත ශාලා එම ඡේදයේ විධිවිධානවලින් නියෝග මාර්ගයෙන් ඇමතිවරයා විසින් නිදහස් කළ හැකි ය . එහෙත් යම් ස්ත්‍රියක් හෝ බාල තැනැත්තකු කර්මාන්ත ශාලාවෙහි සේවයෙහි යෙදුනු හය දවසකට වැඩි නොවන එක් එක් කාල සීමාවකට යටත් පිරිසෙයින් සම්පූර්ණ නිවාඩු එක් දවසක්වත් ඒ ස්ත්‍රියට හෝ බාල තැනැත්තාට ලබා දීම ඒ නියෝගවලින් සහතික කළ යුතු ය.

පාලන පදවි දරන ස්ත්‍රීන් පිළිබඳ ව්‍යාතිරේකය

74. සාමාන්‍යයෙන් අතින් කරන වැඩක නියුක්ත නොවූ, පාලනයේ වගකිව යුතු පදවි දරන ස්ත්‍රීන්ට මේ කොටසෙහි ඉහත සඳහන් විධිවිධාන අදාළ නො විය යුතු ය.

හදිසි අවස්ථාවකදී VII වෙනි කොටසෙහි සමහර විධිවිධාන අත්හිටවීමට ඇති බලය

75. හදිසි අනතුරක් හෝ යන්ත්‍රෝපකරණ හෝ යන්ත්‍ර කඩා හැලීමක් හෝ වෙනත් බලාපොරොත්තු නොවූ හදිසියක් සිදුවුන අවස්ථාවක දී , යම් කර්මාන්ත ශාලාවක් සම්බන්ධයෙන්, පැය ගණන් හා නිවාඩු දවස් පිළිබඳ ව මේ කොටසෙහි යම් විධිවිධාන , ආඥාවෙහි සඳහන් කාල සීමාවකට ලේකම් විසින් අත්හිට විය හැකි ය . එහෙත් එසේ අත්හිට විය යුත්තේ, කර්මාන්ත ශාලාවේ සාමාන්‍ය වැඩ කිරීමේ දී බරපතළ බාධා කිරීම් වැළැක්වීම පිණිස මිස , කර්මාන්ත ශාලාවල ස්ත්‍රීන් සහ බාල තැනැත්තන් සේවය සීමා කිරීම සඳහා වූ ජාත්‍යන්තර ගිවිසුමක් ක්‍රියාවේ යොදවන යම් නීතියක් සමග, සට්ටනය වීමට නො වන බව සැලකිය යුතු ය.

ව්‍යාතිරේක යටතේ සේවයට ගනු ලැබූ ස්ත්‍රීන් හා බාල තැනැත්තන් සඳහා ආරක්ෂාව

76. මේ කොටස යටතේ අතිකාල සේවයෙහි යොදනු ලැබූ ස්ත්‍රීන් ගේ හෝ බාල තැනැත්තන්ගේ සෞඛ්‍යය හෝ ශුභ සිද්ධිය ආරක්ෂා කිරීම සඳහා යම් විශේෂ විධිවිධාන ඇති කිරීම වුවමනා යයි ඇමතිවරයාට පෙනී ගිය අවස්ථාවකදී, මේ කොටසෙහි දැක්වෙන වෙනත් කොන්දේසිවලට අතිරේක ව, ඒ සේවයට ගැනීමේ දී ඉහත කී විධිවිධාන කොන්දේසියක් ලෙස පිළිගැනීමට ඇමතිවරයා විසින්, නියෝග මාර්ගයෙන් නියම කළ හැකි ය.

බාල තැනැත්තන් සේවයට ගැනීම සඳහා සුදුසුකම් පිළිබඳ සහතිකය

77. (1) මේ වගන්තියේ විධිවිධානවලට යටත්ව , දහසය වන විය සම්පූර්ණ නොකළා වූ ද කර්මාන්ත ශාලාවක සේවය සඳහා ගනු ලැබුවා වූ ද යෞවනයකු, ඔහු බලයලත් කර්මාන්තශාලා වෛද්‍යවරයා විසින් පරීක්ෂා කරනු ලැබ හා ඒ සේවය සඳහා යෝග්‍ය බව සහතික කරනු ලැබ ඇත්නම් මිස, නියම කරනු ලැබිය හැකි වූ ද සත් දිනකට නොඅඩු වූ ද කාල පරිච්ඡේදයක් ඉකුත්වීමෙන් පසු ඒ සේවයේ රැඳී නොසිටිය යුතු ය.

(2) යෞවනයකු පරීක්ෂා කිරීමෙන් පසු ඔහු සේවයට යෝග්‍ය ලෙස සහතික කළ යුතු ද නැද්ද යන්න හෝ සහතිකය නිකුත් කළ යුත්තේ කවර කොන්දේසිවලට යටත්ව ද යන්න තීරණය කිරීමට පෙර තවදුරටත් තොරතුරු හෝ සලකා බැලීම සඳහා තවදුරටත් කාලය බලයලත් කර්මාන්තශාලා වෛද්‍යවරයාට අවශ්‍ය නම් , සහතික කරනු ලබන්නා වූ ද සහතිකය නිකුත් කරනු ලබන දිනයෙන් විසි එක් දිනකට නොවැඩි වූ ද කාලපරිච්ඡේදයක් සඳහා එම යෞවනයා සේවයේ යෙදවීමට බලය දෙමින් තාවකාලික සහතිකයක් ඔහු විසින් නිකුත් කළ හැකි ය.

(3) බලයලත් කර්මාන්තශාලා වෛද්‍යවරයා විසින් නිකුත් කරනු ලබන යම් සහතිකයක් --

(අ) එකම පරිහරණය කරන සියලුම කර්මාන්තශාලාවල හෝ ඒ කර්මාන්තශාලා අතුරින් සහතිකයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි කර්මාන්තශාලාවල සේවයේ යෙදවීම සම්බන්ධයෙන් ;

(ආ) අදාළ තැනැත්තා සේවයේ යොදවනු ලබන වැඩවල ස්වභාවය සම්බන්ධයෙන් වූ කොන්දේසිවලට යටත්ව ;

(ඇ) සහතිකයේ නිශ්චිතව සඳහන් කාලපරිච්ඡේදයකට පසු ඔහු නැවත පරීක්ෂණයකට භාජන කළ යුතුය යන කොන්දේසියකට යටත්ව

නිකුත් කරනු ලැබිය හැකිය.

(4) බලයලත් වෛද්‍යවරයා විසින් , යම් යෞවනයකු සම්බන්ධයෙන් මේ වගන්තිය යටතේ සහතිකයක් ඉහත සඳහන් යම් කොන්දේසියකට යටත්ව නිකුත් කරනු ලැබූ අවස්ථාවක , ඒ කොන්දේසියට අනුකූලව මිස ඒ යෞවනයා සේවයේ යොදවනු නොලැබිය යුතු ය.

(5) ඉහත සඳහන් යම් කොන්දේසියක්, සහතිකය නිකුත් කරනු ලැබූ සේවයට හෝ එකම පදිංචිකරු පරිහරණය කරන කර්මාන්තශාලාවක වෙනත් සේවයකට අදාළ වන තාක් දුරට , යෞවනයාට දහසය වන විය සම්පූර්ණ වූ පසුත් බලපැවැත්විය යුතු බවට බලයලත් කර්මාන්තශාලා වෛද්‍යවරයා සහතිකයේ විධාන කළහොත් එය එසේ බලපැවැත්විය යුතුය; එහෙත් එම විධානය කරනු ලැබ නැත්නම් යෞවනයාට දහසය වන විය සම්පූර්ණ වූ විට ඒ කොන්දේසියේ බලපැවැත්ම නතර වන අතර, කෙසේ වුවත් යෞවනයාට දහ අට වන විය සම්පූර්ණ වූ විට ඒ කොන්දේසියේ බලපෑම නතර වන්නේය.

(6) මේ වගන්තිය යටතේ වූ සහතිකයක් සහතිකයෙහි සඳහන් කාල සීමාවෙන් පසු නැවත පරීක්ෂා කිරීම නියම කෙරෙන කොන්දේසියකට යටත් වන අවස්ථාවක, ඒ නැවත පරීක්ෂා කිරීමේ දී බලයලත් කර්මාන්තශාලා වෛද්‍යවරයා විසින් සහතිකය වෙනස් කිරීම හෝ තමා විසින් විධාන කරනු ලබන දිනයක සිට එය ප්‍රත්‍යාදිෂ්ට කිරීම කළ හැකිය; තවද යෞවනයකුගේ සහතිකය ඔහුට දහසය වන විය සම්පූර්ණ වීමට පෙර ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබුවහොත් ඒ සහතිකය අදාළ සේවයෙහි ඔහු නිරත වී නොසිටිය යුතු අතර ඉන් පසු, සහතිකයක් නිකුත් කරනු නොලැබ ඇත්තාක් සේ මේ වගන්තියේ (1) වන උපවගන්තිය බලපැවැත්විය යුතුය.

(7) යම් යෞවනයකු වෙනුවෙන් මේ වගන්තිය යටතේ වූ සහතිකයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබුවහොත් යෞවනයාගේ මව / පියා ඉල්ලා සිටියහොත් ඒ ප්‍රතික්ෂේප කිරීමට හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීමට හේතු ලියවිල්ලක මාර්ගයෙන් ඒ මවට /පියාට බලයලත් කර්මාන්තශාලා වෛද්‍යවරයා විසින් දිය යුතුය.

(8) (අ) මේ වගන්තිය යටතේ පරීක්ෂණ පැවැත්විය යුතු ආකාරය හා ස්ථානය නියම කරමින් ;

(ආ) මේ වගන්තිය යටතේ නිකුත් කරනු ලබන සහතිකයේ ආකෘතිය නියම කරමින් ;

(ඇ) යෞවනයකු සේවයේ යොදවනු ලබන යම් ක්‍රියාවලියක් පරීක්ෂා කිරීමට බලයලත් කර්මාන්තශාලා වෛද්‍යවරයකුට පහසුකම් සැපයීම ඇතුළුව , මේ වගන්තිය යටතේ පවත්වනු ලබන පරීක්ෂණවල කාර්යයන් සඳහා කර්මාන්තශාලා පදිංචිකරුවන් විසින් සැලසිය යුතු පහසුකම් නියම කරමින් ;

(ඈ) මේ වගන්තිය බලගැන්වීමේ කාර්යය සඳහා සුදුසු යයි අමාත්‍යවරයා විසින් අදහස් කරනු ලබන වෙනත් යම් කරුණක් නියම කරමින්

අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකිය.

(9) යාන්ත්‍රික බලය භාවිතා නොකෙරෙන යම් කර්මාන්තශාලා පංතියක් හෝ වර්ගයක් මේ වගන්තිය ක්‍රියාත්මක වීමෙන් අමාත්‍යවරයා විසින් නියෝග මගින් නිදහස් කළ හැකිය.

වැඩ සඳහා සුදුසුකම් පිළිබඳ සහතික ඉල්ලීමට පරීක්ෂකට ඇති බලය

78. යම් යෞවනයකු කර්මාන්තශාලාවක හෝ කර්මාන්තශාලාවක කිසියම් විශේෂ ක්‍රියාවලියක හෝ වැඩ වර්ගයක හෝ යෙදවීම ඔහුගේ සෞඛ්‍යයට හෝ අනික් අයගේ සෞඛ්‍යයට හානිකර බව කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවකුගේ මතය වූ අවස්ථාවක , ඒ ගැන ලිඛිත දැන්වීමක් ඔහු විසින් පදිංචිකරු වෙත භාරදිය හැකිය . දැන්වීම භාරදෙනු ලැබීමෙන් පසු දිනකට නොඅඩු වූ ද දින හතකට නොවැඩි වූ ද කාලපරිච්ඡේදයක් වන එම දැන්වීමේ සඳහන් කරනු ලබන්නා වූ කාලපරිච්ඡේදය ඉකුත් වීමෙන් පසු ඒ යෞවනයා අවස්ථාවෝචිත පරිදි ඒ කර්මාන්තශාලාවේ හෝ ඒ ක්‍රියාවලියෙහි හෝ වැඩ වර්ගයෙහි හෝ යෙදවීම නවත්වන ලෙස ඒ දැන්වීමෙන් නියම කරනු ලැබිය හැකිය . දැන්වීම භාරදුන් පසු බලයලත් කර්මාන්තශාලා වෛද්‍යවරයා විසින් ඒ යෞවනයා පෞද්ගලිකව ම පරීක්ෂා කර බලා , අවස්ථාවෝචිත පරිදි, කර්මාන්තශාලාවේ හෝ ක්‍රියාවලියේ හෝ වැඩ වර්ගයෙහි හෝ සේවයේ යොදවනු ලැබීමට ඔහු සුදුසු බව සහතික කර ඇතොත් මිස, ඒ පදිංචිකරු ඒ දැන්වීමේ සඳහන් කාල පරිච්ඡේදයෙන් පසු ඒ යෞවනයා සේවයේ යෙදවීම නොකළ යුතුය.

## VIII වෙනි කොටස

### විශේෂ අදාළ කිරීම් හා ව්‍යාප්ත කිරීම්

### අයිතිකාරයා යටත් කරනු ලබන ස්ථාන

ගොඩනැගිල්ලක කොටසක් වෙනත් කර්මාන්තශාලාවකට දීම.

1976 අංක 12, 33

79. (1) ගොඩනැගිල්ලක කොටසක් වෙනම කර්මාන්ත ශාලාවක් වශයෙන් කුලියට දී ඇති නමුදු, එකම වහල යටතේ කර්මාන්තශාලාවක කොටසක් නොවන්නා වූ අවස්ථාවක --

(අ) කර්මාන්තශාලාවේ කාර්යයන් සඳහා පාවිච්චි කරන එහෙත් කර්මාන්තශාලාවලට සංයුක්ත නොවන ගොඩනැගිලි වල කොටසක් සම්බන්දයෙන් මේ වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේදවල නිශ්චිතව සඳහන් මේ ආඥාපනතේ විධිවිධාන අදාළ වන්නේ ය;

(ආ) එසේ අදාළ වන ලෙස එකී (අ) ඡේදයෙහි නිශ්චිතව සඳහන් විධිවිධානවල යම් කඩ කිරීමක් සම්බන්ධයෙන් මේ වගන්තියේ (4) වන සහ (5) වන උපවගන්තිවලට යටත් ව ගොඩනැගිල්ලෙහි අයිතිකරු වග කිව යුතු වන්නේය ; තවද

(ඇ) කර්මාන්තශාලාව සම්බන්ධයෙන් මේ වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයෙහි නිශ්චිතව සඳහන් විධිවිධානවල යම් කඩ කිරීමක් සම්බන්ධයෙන් ගොඩනැගිල්ලෙහි පදිංචිකරු වෙනුවට එහි අයිතිකරු මේ වගන්තියේ (5) වන උපවගන්තියට යටත්ව වගකිව යුතු වන්නේය.

(2) එකී විධිවිධාන නම් --

(අ) පිරිසිදුකම සහ ආලෝකය සම්බන්ධයෙන් II වන කොටසෙහි විධිවිධාන සහ ප්‍රධාන යන්ත්‍ර , සංප්‍රේෂක යන්ත්‍ර, ඔසවනයන් හා සෝපානයන්, දම්වැල්, කඹ සහ ඔසවීමේ උපකරණ, දොඹකර සහ වෙනත් ඔසවීමේ යන්ත්‍ර, බිම්, අන්තර් මාර්ග සහ තරප්පු තැනීම සහ නඩත්තු කිරීම සම්බන්ධයෙන් සහ හුමාල බොයිලේරු , හුමාල ග්‍රාහක සහ හුමාල භාජන , වාත ග්‍රාහක සහ වායු ග්‍රාහක සම්බන්ධයෙන් III වන කොටසේ විධිවිධාන ;

(ආ) කර්මාන්තශාලා භූමියේ අන්තරායදායක තත්ත්වයන් සහ ක්‍රියා මාර්ග හෝ ආරක්ෂාව ගැන ආඥා පැනවීමට මහෙස්ත්‍රාත් අධිකරණයකට ඇති බලය සම්බන්ධයෙන් III වන කොටසේ විධිවිධාන ; සහ

(ඇ) වැසිකිළි, කැසිකිළි පහසුකම් සම්බන්ධයෙන් II වන කොටසේ විධිවිධාන සහ ඔසවන යන්ත්‍ර සහ සෝපාන යන්ත්‍ර සම්බන්ධයෙන් III වන කොටසේ විධිවිධාන

වන්නේ ය.

(3) මේ වගන්තියේ පෙරාතුව වූ විධිවිධානවලින් අදාළ කරවනු ලැබූ විධිවිධානවල කාර්යයන් සඳහා ගොඩනැගිල්ලෙහි පිටතින් සවි කර ඇති ඔසවීමේ යන්ත්‍ර සහ ඒ යන්ත්‍ර සම්බන්ධයෙන් පාවිච්චියට ගනු ලබන දම්වැල්, කඹ සහ ඔසවීමේ උපකරණ ගොඩනැගිල්ලෙහි තිබෙන ඒවා ලෙස සලකනු ලැබිය යුතු නමුත් කර්මාන්තශාලාවේ කාර්යයන් සඳහා පාවිච්චියට ගනු නොලබන යම් ඔසවීමේ යන්ත්‍රයක් සහ එසේ පාවිච්චියට ගනු ලබන ඔසවීමේ යන්ත්‍රයක් සම්බන්ධයෙන් පාවිච්චි නොකෙරෙන යම් දම්වැලක්, කඹයක් හෝ ඔසවීමේ උපකරණයක් ගණන් ගනු නොලැබිය යුතුය.

(4) දම්වැල්, කඹ, ඔසවීමේ උපකරණ, දොඹකර සහ වෙනත් ඔසවීමේ යන්ත්‍ර , හුමාල බොයිලේරු, හුමාල ග්‍රාහක සහ හුමාල භාජන , වාත ග්‍රාහක සහ වායු ග්‍රාහක සම්බන්ධයෙන් III වන කොටසේ විධිවිධාන කිසිවක් (කර්මාන්තශාලාව සම්බන්ධයෙන් හෝ වෙනත් ආකාරයකින්) කඩකිරීම් සඳහා,

(අ) එය කර්මාන්තශාලාවේ පදිංචිකරුවකුට අයත් වූ හෝ ඔහු විසින් සපයන ලද හෝ යම් යන්ත්‍රයකට හෝ යන්ත්‍රාගාරයකට සම්බන්ධ කඩකිරීමක් වන්නේ නම් ඔහු වගකිව යුතු ය; තවද

(ආ) වෙනත් යම් අවස්ථාවක දී ගොඩනැගිල්ලෙහි අයිතිකරු වගකිව යුතු ය.

එතෙකුදු වුවත් ඒ විධිවිධාන කඩකිරීම් තම පාලනයෙන් බැහැර වූ කරුණුවලට අදාළ වනතාක් පමණට අයිතිකරු වග නොකිව යුතු අතර , කර්මාන්තශාලාවක් සම්බන්ධයෙන් එවැනි යම් කඩකිරීමක් ස ඳහා පදිංචිකරු වගකිව යුතුය.

(5) මේ වගන්තිය ප්‍රකාර, අයිතිකරු --

(අ) කුලී නිවැසියන් කීප දෙනකු විසින් සනීපාරක්ෂක පහසුකම් පොදුවේ පාවිච්චි කරනු ලබන විට පමණක් ඒවායේ පිරිසිදුකම සම්බන්ධයෙන් ; සහ

(ආ) තම පාලනය යටතේ ඇති කරුණුවලට අදාළ වන තාක් පමණට ඔසවනයන් සහ සෝපානයන්ට අදාළ වූ විධිවිධාන කඩකිරීමක් සම්බන්ධයෙන්

වගකිව යුතුය.

(6) මේ ආඥාපනතේ 44 වන වගන්තියෙහි පදිංචිකරු පිළිබඳ වූ (කර්මාන්තශාලාව සම්බන්ධයෙන් එය අදාළ වන පරිදි සහ මේ වගන්තියේ පෙරාතුව වූ විධිවිධාන ප්‍රකාරඑය අදාළ වන පරිදි ) සඳහන් කර්මාන්තශාලාවේ පදිංචිකරු හෝ ගොඩනැගිල්ලේ අයිතිකරු යන දෙදෙනාගෙන් පැමිණිලි කරනු ලබන කරුණු සම්බන්ධයෙන් වගකිව යුතු තැනැත්තා සම්බන්ධයෙන් කෙරෙන සඳහනක් ලෙස තේරුම් ගත යුතුය.

(7) මේ වගන්තියේ පෙරාතුව වූ විධිවිධාන මගින් අදාළ කරවනු ලැබූ විධිවිධානවල පොදු ලේඛනය පිළිබඳ සඳහනක් ගොඩනැගිල්ලේ අයිතිකරු වගකිව යුතු වන කරුණු සම්බන්ධයෙන් වූ විට ඔහු විසින් තබා ගනු ලබන ලේඛනයක් සම්බන්ධයෙන් කෙරෙන සඳහනක් ලෙස සැලකිය යුතු අතර, ඒ ලේඛනය සම්බන්ධයෙන් මේ පනතේ 119 වන වගන්තියේ (3) වන උපවගන්තිය, අයිතිකරු කර්මාන්තශාලාවේ පදිංචිකරුව සිටියාක් මෙන් අදාළ වන්නේ ය.

1976 අංක 12, 34

79 අ. (1) එකම වහල යටතේ කර්මාන්ත ශාලාවක අයිතිකරු ( ඔහු පදිංචිකරුවන්ගෙන් කෙනකු වුව ද නොවූව ද ) මේ පනතේ පහත සඳහන් විධිවිධානවල යම් කඩකිරීමක් සම්බන්ධයෙන් පදිංචිකරු වෙනුවට වගකිව යුතුය. එනම් ---

(අ) පිරිසිදුකම, තදබදය, වාතාශ්‍රය, උෂ්ණත්වය, ආලෝකය, බිමෙහි ජලාපවහනය, වැසිකිළි, කැසිකිළි පහසුකම් පිළිබඳ II වන කොටසේ විධිවිධාන ;

(ආ) කොටු කිරීම සහ ආරක්ෂක උපකරණ සැපයීම සහ නඩත්තු කිරීම, අත්හදා බැලීම සහ පරීක්ෂා කිරීම, බිම් අන්තර මාර්ග සහ තරප්පු පෙළවල් ඉදිකිරීම සහ නඩත්තු කිරීම, සහ කර්මාන්තශාලාවල අන්තරායදායක තත්ත්වයන් පිළිබඳව ආඥා පැනවීමට මහෙස්ත්‍රාත් අධිකරණයකට ඇති බලය පිළිබඳ III වන කොටසේ විධිවිධාන ;

(ඇ) IV වන කොටසේ විධිවිධාන ;

(ඈ) දූවිලි හෝ දූමාරය ඉවත් කිරීම සහ ශ්වාස හංගක හෝ උද්දීපක වායු හෝ වාෂ්ප පාවිච්චි කරනු ලබන හෝ ඒවා තිබීමට ඉඩ ඇති අවස්ථාවක ගත යුතු ආරක්ෂක විධිවිධාන පිළිබඳ V වන කොටසේ විධිවිධාන;

(ඉ) VI වන කොටසේ විධිවිධාන; සහ

(ඊ) X වන කොටසේ විධිවිධාන.

(2) (1) වන උපවගන්තියේ සඳහන් විධිවිධානනග කාර්යය සඳහා එකම වහල යටතේ වූ මුළු කර්මාන්තශාලාවක්, එහි අයිතිකරු පදිංචිකරු වූවාක් මෙන් ගැණෙන එක් කර්මාන්තශාලාවක් සේ සැලකිය යුතුය.

(3) යම් කොටු කිරීමක්, උපකරණ, යන්ත්‍ර හෝ යන්ත්‍රාගාර එකම වහලක් යට දී පාවිච්චි කිරීමෙන් උද්ගත වන යම් කඩ කිරීමක් සම්බන්ධයෙන්, එම පාවිච්චි කිරීම අයිතිකරුගේ පාලනයෙන් බාහිර වූ කරුණක් වන්නේ නම් මේ වගන්තියේ (1) වන උපවගන්තිය අදාළ නොවිය යුතුය.

(4) එක් කුලී නිවැසියකු පමණක් පදිංචි කාමරවල දී ---

(අ) පිරිසිදුකම, තදබදය, උෂ්ණත්වය, වාතාශ්‍රය සහ ආලෝකය පිළිබඳව වන II වන කොටසේ විධිවිධානවල ; හෝ

(ආ) දුවිලි සහ දුමාරය ඉවත් කිරීම පිළිබඳව V වන කොටසේ විධිවිධානවල

යම් කඩකිරීමක් සම්බන්ධයෙන්, එම කඩකිරීම අවශ්‍ය යම් ගොඩනැගීම් වැඩක් කරගෙන යාමට අපොහොසත් වීමේ හෝ අයිතිකරුවන්ට අයිති යම් යන්ත්‍රයක , යන්ත්‍රාගාරයක හෝ සවිකිරීමක යම් දෝෂයක හේතුවෙන් උද්ගත වන්නේ නම් මිස , මේ වගන්තියේ (1) වන උපවගන්තිය අදාළ නොවන්නේය; තවද, එවැනි යම් කාමරයක දී VI වන කොටසේ විධිවිධානවල කඩකිරීමක් සම්බන්ධයෙන් ද මේ වගන්තියේ (1) වන උපවගන්තිය අදාළ නොවන්නේය.

(5) මේ වගන්තියේ (4) වන උපවගන්තියෙහි සඳහන් යම් අපොහොසත් වීමකින් හෝ දෝෂයකින් එය උද්ගත වන්නේ නම් මිස , IV වන කොටසේ විධිවිධාන කඩකිරීමක් සම්බන්ධයෙන් මේ වගන්තියේ (1) වන උපවගන්තිය අදාළ නොවන්නේය.

(6) වෙන් වශයෙන් වූ කර්මාන්තශාලා තුළ වූ කොටසවලින් ඇතුළත් නොවූ ද එකම වහල යටතේ වූ ද කර්මාන්තශාලාවක යම් කොටසක් සම්බන්ධයෙන් මේ ආඥාපනතේ විධිවිධාන , මේ වගන්තියේ පෙරාතුව වූ විධිවිධාන මගින් ඒවා අදාළ කර නොමැති නම් , අදාළ වන තාක් පමණට ඒ කොටස කර්මාන්තශාලාවක් වූවාක් මෙන් සහ අයිතිකරු එහි පදිංචිකරු වූවාක් මෙන් අදාළ වන්නේය.

(7) එකම වහල යටතේ වූ යම් පන්තියක හෝ වර්ගයක කර්මාන්තශාලාවකට මේ වගන්තියේ විධිවිධාන අදාළ කිරීමේ දී අමාත්‍යවරයා විසින් නියෝග මගින් එම විධිවිධාන වෙනස් කළ හැකිය.

## විදුලි ස්ථාන

විදුලි ස්ථාන වලට ආඥා පනත අදාල කිරීම

80. (1) වෙළඳාම වශයෙන් හෝ යම් කිසි ගමනාගමන ව්‍යාපාරයක හෝ වෙනත් කාර්මික හෝ වෙළඳ ව්‍යාපාරයක හෝ පොදු ගොඩනැගිල්ලක හෝ පොදු සංස්ථාවක හෝ කාර්යය පිළිබඳ ව හෝ වීථිවලට හෝ වෙනත් පොදු ස්ථානවලට හෝ සැපයීම සඳහා විදුලි බලය නිපදවන, හෝ වෙනත් ද්‍රව්‍යයකට හරවන හෝ ක්‍රියා කරවන හෝ පාලනය කරන යම් ලෙසකින් විධිමත් කරන හෝ නිපදවීමක හෝ වැඩ පළක හෝ ඒ සම්බන්ධයෙන් නිත්‍ය ලෙස, පුද්ගලයන් සේවයෙහි යොදනු ලැබූ යම් ස්ථානයකට, ඒ ස්ථානය කර්මාන්ත ශාලාවක් මෙන් ද , ඒ නිපදවීම් ක්‍රමයෙහි හෝ වැඩ පළෙහි හෝ ඒ සම්බන්ධයෙන් සේවයෙහි යොදනු ලැබූ තැනැත්තකුගේ සේවා යෝජකයා පදිංචිකාරයා මෙන් ද මෙහි පහත දැක්වෙන කරුණුවලට යටත් ව , මේ ආඥාපනතෙහි, විධිවිධාන අදාළ විය යුතු ය . එසේ ද වුවත් ලේකම්ට හෝ දිස්ත්‍රික්කයේ පරීක්ෂකට හෝ ආඥාවකින් පහත දැක්වෙන කටයුතු කළ හැකිය.

එනම් ---

(අ) ආණ්ඩුවට අයත් විදුලි ස්ථානයක් හෝ විදුලි ආඥාපනත යටතේ දෙනු ලැබූ බල පත්‍රයක් යටතේ වැඩ කරනු ලැබූ යම් විදුලි ස්ථානයක් හෝ, යම් බාල තැනැත්තකුගේ හෝ ඒ විදුලි ස්තානයේ සේවයෙහි සිටින සියලුම බාල

තැනැත්තන්ගේ හෝ සේවා කාලය හා නිවාඩු දවස් පිළිබඳව VII වෙනි කොටසෙහි සඳහන් විධිවිධාන වලින් නිදහස් කිරීම ; හෝ

(ආ) ආඥාවෙහි වෙනස් කරනු ලැබූ ලෙස ඒ විධිවිධාන යම් බාල තැනැත්තකු වෙත හෝ සියලුම බාල තැනැත්තන් වෙත හෝ අදාළ විය යුතු ලෙස නියම කිරීම ද වේ.

(2) ඉහත කියන ලද පරිදි සැපයීම සඳහා ඒ නිපදවීම් ක්‍රම හෝ වැඩ පළ ගෙන යනු ලබන හෝ පවත්වනු ලබන, යන්ත්‍රෝපකරණ හා යන්ත්‍ර නිසි ලෙස සවි කිරීමෙන් පසු, යම් කෙනෙකුට ඇතුළුවීමට ඉඩ ඇති තරමට විශාල වූ වෙනත් ස්ථානයක් සම්බන්ධයෙන්, ඒ ස්ථානය කර්මාන්ත ශාලාවක් මෙන් ද, ඒ නිපදවීම් ක්‍රමයෙහි හෝ වැඩ පළෙහි හෝ ඒවා සම්බන්ධයෙන් සේවයෙහි යෙදුන තැනැත්තකුගේ සේව යෝජකයා කර්මාන්ත ශාලාවෙහි පදිංචිකාරයා මෙන් ද මේ උප වගන්තියේ මින්මතු දැක්වෙන මේ ආඥාපනතෙහි විධිවිධාන අදාළ විය යුතු ය. ඒ විධිවිධාන නම් :-

(අ) I වෙනි කොටස ද ;

1961 අංක 54, 3

1976 අංක 12, 35

2000 අංක 33, 12

(අඅ) III වෙනි කොටස ද ;

(අඅඅ) විදුලිය ජනනය කරනු ලබන කර්මාන්තශාලාවල ගතයුතු ආරක්ෂා විදිවිධාන සහ ආරක්ෂාව සහ සෞඛ්‍යය සඳහා වූ විශේෂ නියෝග පිළිබඳ V වන කොටසේ විධිවිධාන.

(ආ) VI වෙනි කොටස ද;

(ඇ) පරීක්ෂකවරුන්ගේ බලතල හා යුතුකම් සම්බන්ධයෙන් XI වෙනි කොටසෙහි විධිවිධාන සහ ඇමතිවරයාගේ නියෝග ද;

(ඈ) XIII වෙනි කොටස ද;

(ඉ) XIV වෙනි කොටස ද;

(ඊ) XV වෙනි කොටස ද වේ.

(3) අන්තිමට දැක්වුණු උප වගන්තියේ සඳහන් මේ ආඥාපනතේ යම් විධිවිධාන, ඒ උපවගන්තියේ හෝ මෙහි (1) වෙනි උප වගන්තියේ හෝ සඳහන් ස්ථානයක් නොවන අන් තැනක, ඉහත දැක්වුණු සැපයීම සඳහා ඒ නිපදවීම් ක්‍රමවල හෝ වැඩ පිළිවල පාවිච්චි කරනු ලැබූ යන්ත්‍රෝපකරණ හෝ යන්ත්‍ර වන්නා වූ යම් යන්ත්‍රෝපකරණවලට හෝ යන්ත්‍රවලට ඒ යන්ත්‍රෝපකරණ හෝ යන්ත්‍ර කර්මාන්ත ශාලාවක යන්ත්‍රෝපකරණ හෝ යන්ත්‍ර මෙන් ද ඒ යන්ත්‍රෝපකරණ පාවිච්චි කිරීම සම්බන්ධයෙන් සේවයෙහි යොදනු ලැබූ තැනැත්තකුගේ සේව යෝජකයා කර්මාන්ත ශාලාවෙහි පදිංචිකාරයා මෙන් ද සැලකීමෙන් ඇමතිවරයා විසින් විශේෂ නියෝග මාර්ගයෙන් අදාළ කළ හැකිය.

(4) ඒ නිපදවීම් ක්‍රම හෝ වැඩ පළවල්, එළිය දීම, උණුසුම් කිරීම, පණිවුඩ යැවීම හෝ ලබා ගැනීම හෝ වෙනත් කාර්යය සඳහා විදුලි

මෝටරයක් හෝ විදුලි බලයෙන් ක්‍රියා කරවිය යුතු වෙනත් උපකරණයක් ක්‍රියා කරවීමේ මුල් කාර්යය සඳහා පමණක් ගෙන යන නැතහොත් පවත්වාගෙන යන යම් ස්ථානයකට, ඇමතිවරයා විසින් විශේෂ නියෝග වලින් නියම කළ ප්‍රමාණයට විනා , මේ වගන්තියේ (1) වෙනි සහ (2) වෙනි උප වගන්ති අදාළ නොවිය යුතුය.

(5) 124 වෙනි වගන්තියෙහි " කර්මාන්ත ශාලාව " යන පාඨය විස්තර කිරීමේ කාර්යය සඳහා, විදුලි බලය ද්‍රව්‍යයක් ලෙස නොසැලකිය යුතු ය. ඉහත කියන ලද ලෙස හැර මේ වගන්තියේ කිසිවකින්, ඒ විස්තර කිරීමේ අර්ථය ඇතුළත මේ ආඥාපනත කර්මාන්ත ශාලාවලට අදාළ කිරීම සඳහා, බාධාවක් නොවිය යුතු ය.

**සංස්ථා**

සංස්ථා

1976 අංක 12, 36

81. (1) පුණ්‍ය හෝ චරිත ශෝධන කාර්යයන් සඳහා හෝ කාර්මික හෝ වෘත්තීය පුහුණුව සඳහා පවත්වාගෙන යන ආයතනයක කොටසක් වන යම් ස්ථානයක, එම ආයතනයේ භාවිතය සඳහා නොවන යම් භාණ්ඩ සෑදීම, වෙනස් කිරීම, අළුත් වැඩියා කිරීම, අලංකාර කිරීම, නිමැවුම, සේදීම, පිරිසිදු කිරීම හෝ වෙළඳාම සඳහා සකස් කිරීම සඳහා හෝ ඒවාට ආනුෂංගිකව යම් ශාරීරික ශ්‍රමයක් යොදවනු ලබන නමුත් ඒ ස්ථානය කර්මාන්තශාලාවක් නොවන අවස්ථාවක, ඒ ස්ථානයට මේ ආඥාපනතේ විධිවිධාන, මේ වගන්තියෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයට යටත්ව අදාළ වන්නේය.

1976 අංක 12, 36

(2) මේ ආඥාපනත අදාළ වන්නා වූ ද පුණ්‍ය හෝ චරිත ශෝධන කාර්යයන් සඳහා පවත්වාගෙන යනු ලබන්නා වූ ද යම් ආයතනයක වැඩ කරන තැනැත්තන් වන්නේ එම ආයතනයේ නේවාසිකයන් වන සහ එම ආයතනය විසින් නඩත්තු කරනු ලබන තැනැත්තන් හෝ යන්ත්‍ර සූත්‍රවල වැඩ අධීක්ෂණයෙහි හෝ යන්ත්‍ර සූත්‍ර පාලනය කිරීමෙහි යෙදී සිටින තැනැත්තන් පමණක් බව ද එකී වැඩ ඒවායේ යෙදී සිටින තැනැත්තන්ගේ නඩත්තුව, අධ්‍යාපනය, පුහුණුව හෝ චරිත ශෝධනය සඳහා සද්භාවයෙන් කරගෙන යනු ලබන බව ද එම ආයතනයේ පාලනය භාරව සිටින ( මෙහි මින් මතු කළමනාකරුවන් යනුවෙන් සඳහන් කරනු ලබන) තැනැත්තන් කොමසාරිස් සෑහීමට පත් වන පරිදි ඔප්පු කළහොත් කොමසාරිස් විසින්, නියමයක් මගින්, පහත සඳහන් වෙනස් කිරීම්වලට යටත්ව මේ ආඥාපනතේ විධිවිධාන එම ආයතනයට ඒ නියමය වලංගුව පවතින තාක් අදාළ විය යුතු බවට විධාන කළ හැකිය :-

(අ) නේවාසිකයන්ගේ සේවා කාලවේලාවන්, කෑම විවේක හා නිවාඩු දින විධිමත්කිරීම සඳහා වූ යෝජනා ක්‍රමයක් කළමනාකරුවන් විසින් කොමසාරිස්ගේ අනුමතිය සඳහා ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර යෝජනා ක්‍රමයේ විධිවිධාන ආඥාපනතේ අනුරූප විධිවිධානවලට වඩා නේවාසිකයන්ට අඩු වාසි සහගත නොවන බවට කොමසාරිස් සෑහීමට පත් වුවහොත් කොමසාරිස් විසින් යෝජනා ක්‍රමය අනුමත කළ හැකිය ; තවද යෝජනා ක්‍රමය එසේ අනුමත වූ පසු, ඒ අනුමතය ප්‍රත්‍යාදිෂ්ට කරනු ලබන තෙක් මේ ආඥාපනත, මේ ආඥාපනතේ විධිවිධාන වෙනුවට යෝජනා ක්‍රමයේ විධිවිධාන ආදේශ කරනු ලැබුවාක් මෙන් අදාළ වන්නේ ය.

(ආ) කළමනාකරුවන්ගේ ඉල්ලීමක් මත ආයතනයේ වෛද්‍ය නිලධරයා (එවැන්නකුසිටී නම් ) ආයතනය සඳහා බලයලත් කර්මාන්ශාලා වෛද්‍යවරයා වශයෙන් පත්කරනු ලැබිය හැකිය.

(ඇ) උද්ධෘතයන් සහ දැන්වීම් ඇලවීම සම්බන්ධයෙන් X වන කොටසේ විධිවිධාන අදාළ නොවන නමුත්, සේවා කාල වේලාවන්, කෑම සහ විවේක ගැනීම සඳහා විවේක වේලාවන්, නිවාඩු දිනයන් සහ මේ ආඥාපනතේ විධිවිධාන සලස්වා ඇති වෙනත් කරුණු සම්බන්ධයෙන් යෝජනා ක්‍රමයේ විස්තර හෝ යෝජනා ක්‍රමයක් බලපවත්වමින් නොතිබෙන අවස්ථාවක නම් නියම කරනු ලැබිය හැකි විස්තර පොදු ලේඛනයේ පෙන්වීමට නියමිත විස්තරවලට ඇතුළත් විය යුතුය.

(ඈ) චරිත ශෝධන කාර්යයන් සඳහා පවත්වාගෙන යනු ලබන ආයතනයක කොටසක් වන ස්ථානයක් සම්බන්ධයෙන් වූ විට , කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවකු හෝ පරීක්ෂක වෛද්‍ය නිලධරයකු විසින් ආයතනයේ නේවාසිකයකු පරීක්ෂා කිරීම කළමනාකරුවන්ගේ හෝ කළමනාකරුවන් යටතේ ආයතනය භාරව සිටින තැනැත්තාගේ හෝ කැමැත්ත නොමැතිව කළමනාකරුවන්ගෙන් එක් කෙනකු හෝ ඉහත කී තැනැත්තකු ඉදිරියේ මිස කරනු නොලැබිය යුතු බවට දැන්වීමක් ආයතනයේ කළමනාකරුවන් ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු තැනට දුනහොත් , කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවකු හෝ පරීක්ෂක වෛද්‍ය නිලධරයකු විසින් එසේ පරීක්ෂා කිරීම නොකළ යුතුය.

එසේ වුවද මේ ආඥාපනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ කරන ලද යම් නියමයක් එවැනි යම් ආයතනයක උල්ලංඝනය කරනු ලබන බවට කොමසාරිස් සෑහීමට පත් වූ විටඒ ආයතනය සම්බන්ධයෙන් මේ ඡේදය ක්‍රියාත්මක වීම ඔහු විසින් අවශ්‍ය යයි සලකනු ලබන තාක් දුරට අත්හිටුවිය හැකිය.

(ඉ) කළමනාකරුවන්ගේ නම් ද කළමනාකරුවන් යටතේ ආයතනය භාරව සිටින තැනැත්තෙක් සිටී නම් ඔහුගේ නම ද ආයතනයේ කරගෙන යනු ලබන වැඩ සඳහා සේවයේ යොදවනු ලැබ සිටින නේවාසිකයන් සහ අනෙක් තැනැත්තන්ගේ ගණන, වයස, ස්ත්‍රී පුරුෂ භාවය සහ රක්ෂාව පිළිබඳව නියම කරනු ලබන විස්තර නිශ්චිතව සඳහන් කරන නිවැරදි වාර වාර්තාවක්, නියම කරනු ලැබිය හැකි ආකෘතියක, කොමසාරිස් වෙත කළමනාකරුවන් විසින් සෑම අවුරුද්දක ම ජනවාරි මාසයේ පහලොස් වන දින පසුවීඹට පෙර යැවිය යුතු අතර, ඔවුහු එසේ කිරීම පැහැර හැරියහොත් වරදකරුවන් වන අතර රුපියල් දෙදහස් පන්සියයකට නොවැඩි දඩයකට යටත් වන්නෝය.

1998 අංක 18, 12

(3) කර්මාන්ත ශාලාවක් නොවන නමුත් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක බලය අනුව හෝ බලය යටතේ පරීක්ෂණයකට යටත් වූ , යම් ස්ථානයකට, ලේකම් විසින් නියම කරනු ලබන ප්‍රමාණයකට විනා මේ ආඥාපනත අදාළ නො විය යුතු ය.

## නෞකා තටාක, රේගු, වරාය වේදිකා, බඩු ගබඩා හා නැව්

නෞකා තටාක ආදිය

82. (1) නෞකා තටාකයක, රේගුවක හෝ වරාය වේදිකාවක හෝ අයිතිකරුවන්ට, භාර කරුවන්ට හෝ පාලකයන්ට හෝ අයිති බඩු ගබඩාවක් ඇතුලුව සෑම නෞකා තටාක වලට හෝ රේගුවලට හෝ වරාය වේදිකාවලට ද දුම්රිය මාර්ගයක හෝ විදුලි රිය මාර්ගයක හෝ කොටසක් නොවන නෞකා තටාකයක් හෝ රේගුවක් හෝ වරාය වේදිකාවක් සම්බන්ධයෙන් නැතහොත් ඒවායේ කාර්යය සඳහා හෝ පාවිච්චි කරනු ලබන යම් මාර්ගයකට හෝ කුඩා දුම්රිය මාර්ගයකට ද සෑම නෞකා තටාකයට ද, රේගුවකට ද , වරාය වේදිකාවකට ද කර්මාන්ත ශාලාවක කොටසක් නොවන, බඩු ගබඩාවල හෝ ඒවායේ කාර්යය සඳහා යාන්ත්‍රික බලය පාවිච්චි කරනු ලබන සෑම වෙනත් බඩු ගබඩාවලට ද , ඒවා කර්මාන්ත ශාලා ලෙස ද , ඒවායේ හෝ ඒවායේ ඇතුළත හෝ ඒවායින් කොටසක් වූ හෝ ස්ථානයක් නියම ලෙස ප්‍රයෝජනය ගනු ලබන හෝ ඒවායේ පදිංචි ව සිටින හෝ තැනැත්තා කර්මාන්ත ශාලාවක පදිංචිකාරයා ලෙස දලෙස ද සැලකීමෙන්, මින්මතු මේ උප වගන්තියේ සඳහන් කරනු ලබන මේ ආඥාපනතෙහි විධිවිධාන අදාළ විය යුතු ය.

එනම් :-

(අ) I වෙනි කොටස

1961 අංක 54, 4

(අඅ) දුම් බොයිලේරු ගැන ව්‍යතිරේක පිළිබඳ ව වූ විධිවිධාන ඇතුලුව, දුම් බොයිලේරු සම්බන්ධයෙන්, පදිංචිකාරයා යයි සලකනු ලබන තැනැත්තා වෙනුවට, බොයිලේරුවේ අයිතිකරු ඒ විධිවිධාන කඩ කිරීමත් සඳහා වගකිව යුතු පරිදි 3 වෙනි කොටසෙහි විධිවිධාන ද;

(ආ) හදිසි අනතුරු වැළැක්වීම සඳහා විශේෂ ආරක්ෂක පිළිවෙළවල් නියම කිරීමට ලේකම්ට ඇති බලය ද , අන්තරාදායක තත්ත්ව හා වැඩ පිළිවෙළවල් ගැන ආඥා පැනවීමට ලේකම්ට හා ආයාචනා මණ්ඩලයට ඇති බලය ද සම්බන්ධයෙන් III වෙනි කොටසෙහි විධිවිධාන ද ;

(ඇ) ශුභ සාධක නියෝග සම්බන්ධයෙන් IV වෙනි කොටසෙහි විධිවිධාන ද ;

(ඈ) ආරක්ෂාව හා සෞඛ්‍යය සම්බන්ධයෙන් V වෙනි කොටසෙහි විධිවිධාන ද;

(ඉ) VI වෙනි කොටස ද;

(ඊ) ගොඩනැගිල්ලෙහි කොටසක් වෙන් වූ කර්මාන්ත ශාලාවක් වූ විට, ඒ ස්ථානය සම්බන්ධයෙන් ඇමතිවරයා විසින් පැන විය හැකි නියෝග වලින් කරනු ලැබූ වෙනස් කිරීම් වලට යටත්ව, VIII වෙනි කොටසෙහි විධිවිධාන ද ;

(උ) මේ ආඥා පනතෙහි සාරාංශ හා දැන්වීම් ද , විශේෂ නියෝග ද සාමාන්‍ය ලේඛන පොත් ද (අදාළ කළ හැකි ප්‍රමාණයට) ලේඛන පොත් හා වාර්තා ප්‍රවේසම් ලෙස

තබා ගැනීම ද සම්බන්ධයෙන් ඇමතිවරයා විසින් පනවනු ලැබූ නියෝග වලින් කරනු ලැබූ වෙනස් කිරීම්වලට යටත් ව X වෙනි කොටසෙහි විධිවිධාන ද, සේවයෙහි යොදවනු ලැබූ තැනැත්තන්ගේ යුතුකම් සම්බන්ධයෙන් හා පඩිය දැන ගැනීම සඳහා පාවිච්චි කරනු ලබන, කිරුම් පඩි, මිනුම් කිරීමේ හා මැනීමේ උපකරණ සම්බන්ධයෙන් ඒ X වෙනි කොටසෙහි විධිවිධාන ද;

(ඌ) පරීක්ෂකයන්ගේ බලතල හා යුතුකම් සම්බන්ධයෙන් ද, ඇමතිවරයාගේ නියෝග සම්බන්ධයෙන් XI වෙනි කොටසෙහි විධිවිධාන ද;

(එ) XIII වෙනි කොටස ද;

(ඒ) XV වෙනි කොටස ද වේ.

1961 අංක 54, 4 (2) ( (අ) ඡේදයෙහි සඳහන් වෙනස් කිරීමට යටත් ව ) ඉහත කී උප වගන්තියෙහි (අඅ) ඡේදයෙහි ද (ආ), (ඇ), (ඉ), (උ), (ඌ) සහ (එ) යන ඡේදවල ද සඳහන් මේ ආඥාපනතෙහි විධිවිධාන, යම් නෞකා තටාකයක, වරායක හෝ ඇළක යම් නැවකට බඩු පැටවීමේ, බඩු බෑමේ හෝ රට අඟුරු දැමීමේ කාර්යයකට ද, ඒ කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන සියලු ම යන්ත්‍රවලට හා යන්ත්‍රෝපකරණ වලට ද , ඒ කාර්යය කර්මාන්ත ශාලාවක දී කළ ලෙස හා ඒ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ කර්මාන්ත ශාලාවක යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ලෙස හා ඒ කාර්යය කර ගෙන යනු ලබන තැනැත්තා කර්මාන්ත ශාලාවක, පදිංචි කාරයා ලෙස සැලකීමෙන්, මේ උප වගන්තියේ මින්මතු සඳහන් කරුණුවලට යටත් ව, අදාළ විය යුතු ය.

1961 අංක 54, 4 එ සේ ද වුවත්, ඒ (අඅ), (ආ) යන ඡේදවල සඳහන් මේ ආඥාපනතේ විධිවිධාන, නැවක තිබෙන්නාවූ ද, නැව් හිමියාට අයත් වූ ද යම් යන්ත්‍ර හෝ යන්ත්‍රෝපකරණ සම්බන්ධයෙන් අදාළ නො විය යුතු ය.

මේ උප වගන්තියේ කාර්යය සඳහා, " යන්ත්‍රෝපකරණ " යන පාඨයට, නැවත බඩු පැටවීමට හෝ බඩු බෑමට හෝ රට අඟුරු දැමීමට හෝ සේවයෙහි යොදනු ලැබූ තැනැත්තකු ප්‍රයෝජනයට ගනු ලබන , නැවක නගින, බහින මගක් හෝ හිණි මගක් ඇතුළත් වෙයි.

(3) ප්‍රධාන යන්ත්‍ර, සංප්‍රේෂක යන්ත්‍ර, වෙනත් යන්ත්‍ර, ආරක්ෂා කරනු නො ලැබූ යන්ත්‍ර, ආරක්ෂාවල් තැබීම හා පවත්වාගෙන යාම, අලුත් යන්ත්‍ර තැනීම හා විකිණීම , ස්ත්‍රීන් සහ බාල තැනැත්තන් විසින් යන්ත්‍ර ශුද්ධ කිරීම, අන්තරාදායක යන්ත්‍රවල ද, උස්සන යන්ත්‍රවල ද, සෝපාන යන්ත්‍රවල ද, දම්වැල් කඹ හා ඉස්සීමේ උපකරණවල ද, දොඹකර සහ වෙනත් සෝපාන යන්ත්‍රවල ද, බිම් ප්‍රවේශ හා පඩි පේළි තැනීමෙහි හා පවත්වා ගෙන යෑමෙහි ද බාල තැනැත්තන්ට වැඩ පුහුණු කරවීම සහ පරීක්ෂණය, සහ අන්තරාදායක කර්මාන්තශාලා ගැන ආඥා පැනවීමට ලේකම්ට ඇති බලය ද සම්බන්ධයෙන් III වන කොටසේ විධිවිධාන, මේ වගන්තියේ (1) වෙනි උප වගන්තියේ සඳහන් සෑම බඩු ගබඩාවකට ම ඒවා කර්මාන්ත ශාලා ලෙස හා ඒවායේ නියම ප්‍රයෝජනය ලබා ගන්නන් හා එහි පදිංචි ව සිටින්නන් කර්මාන්ත ශාලාවේ පදිංචිකාරයන් ලෙස සැලකීමෙන්, අදාළ විය යුතු ය.

නෞකා 83. (1) වරායක හෝ තෙත් වූ නෞකා තටාකයක ගෙන යන, නැවක් තැනීමේ, නැවත තැනීමේ, අලුත්වැඩියා කිරීමේ, නැවත සවි කිරීමේ, පින්තාරු කිරීමේ, සම්පූර්ණ කිරීමේ හෝ කඩා දැමීමේ හෝ නැවක ( ගිනි

අවුලුවන කාමර සහ දුම් පෙට්ටි ඇතුලුව ) බොයිලේරුවල මැලියම් ගැලවීමේ හෝ මල කැඩීමේ හෝ පිරිසිදු කිරීමේ හෝ නැතහොත් නැවක තෙල් ටැන්කි ශුද්ධ කිරීමේ හෝ එහි පත්ලෙහි රුඳෙන පල් වතුර ඉවත් කිරීමේ හෝ යම් කාර්යයකට, මේ වගන්තියේ මින්මතු සඳහන් මේ ආඥාපනතෙහි විධිවිධාන, මේ වගන්තියේ මින්මතු දැක්වෙන කරුණුවලට යටත්ව, අදාළ විය යුතු ය.

එනම් :-

(අ) සෞඛ්‍ය පහසුකම් සම්බන්ධයෙන් II වෙනි කොටසෙහි විධිවිධාන ද ;

(ආ) දුම් බොයිලේරු හා වායු රිසීවර ගැන ව්‍යතිරේක පිළිබඳ විධිවිධාන ඇතුළුව , දුම් බොයිලේරු හා වායු රිසීවර සම්බන්ධයෙන් හා අන්තරාදායක තත්ත්ව හා භාවිතා ගැන ආඥා පැනවීමට ලේකම්ට සහ ආයාචන මණ්ඩලයට ඇති බලය සම්බන්දයෙන් III වෙනි කොටසෙහි විධිවිධාන ද ;

(ඇ) ශුභ සාධක නියෝග සම්බන්ධයෙන් IV වෙනි කොටසෙහි විධිවිධාන ද;

(ඈ) ආරක්ෂාව හා සෞඛ්‍ය සඳහා විශේෂ නියෝග සම්බන්ධයෙන් V වෙනි කොටසෙහි විධිවිධාන ද ;

(ඉ) VI වෙනි කොටස ද;

(ඊ) ( සතිපතා හා වාර්ෂික නිවාඩු සම්බන්ධයෙන් නොව ) සේවා කාලය සම්බන්ධයෙන්, විශේෂ අවස්ථා පිළිබඳව, ඇමතිවරයා යිසින් නියෝගවලින් කළ හැකි වෙනස් කිරීම්වලට යටත් ව, VII වෙනි කොටසෙහි විධිවිධාන ද;

(උ) සාමාන්‍ය ලේඛන පොත් ( අදාළ කළ හැකි ප්‍රමාණයට ) ලේඛන පොත් හා වාර්තා ප්‍රවේසම් ලෙස තබා ගැනීම හා සේවයෙහි යෙදුනු තැනැත්තන්ගේ යුතුකම් , සම්බන්ධයෙන් X වෙනි කොටසෙහි විධිවිධාන ද ;

(ඌ) පරීක්ෂකයන්ගේ බලතල හා යුතුකම් හා ඇමතිවරයාගේ නියෝග සම්බන්ධයෙන් XI වෙනි කොටසෙහි විධිවිධාන ද;

(එ) XIII වෙනි කොටස ද;

(ඒ) XV වෙනි කොටස ද වේ.

තවද ඒ විධිවිධානවල කාර්යය සඳහා නැව කර්මාන්ත ශාලාවක් ලෙස ද, එබඳු කාර්යයක් පවරා ගනු ලබන්නා කර්මාන්ත ශාලාවේ පදිංචිකාරයා ලෙස ද සැලකිය යුතු ය.

1961 අංක 54, 5

1(අ) (1) උපවගන්තියට අදාළ වන යම් වැඩක් කරනු ලබන තැනැත්තෙකු එය පටන්ගෙන දවස් හතක් ඉකුත් වීමට පෙර , එසේ වැඩ කරනු ලබන තැනැත්තාගේ නම ද, ලිපිනය ද, වැඩ කරනු ලබන ස්ථානය ද, වැඩෙහි ස්වභාවය ද, යම් යාන්ත්‍රික බලයක් පාවිච්චි කරන්නේ නම් එහි ස්වභාවය ද , වෙනත් නියමිත විස්තර ද දැක්වෙන ලිපිගත දැන්වීමක් , දිස්ත්‍රික්කයේ පරීක්ෂක වෙත භාර කර විය යුතු ය.

(2) නැවෙහි කපිතන් විසින් හෝ නාවික පිරිස විසින් හෝ නැව පරීක්ෂා කරනු ලැබීම සඳහා ගිය ගමනක දී නැවෙහි දී හෝ කරනු ලැබූ ඉහත සඳහන් කාර්යයකට, මේ ආඥාපනතේ කිසිවක් අදාළ නොවිය යුතු ය.

## ගොඩනැගිලි සහ වෙනත් ඉදිකිරීම් වැඩ

ගොඩනැගිලි සහ වෙනත් ඉදිකිරීම් වැඩ

1976 අංක 12, 37

84. (1) වෙළඳාමක් හෝ ව්‍යාපාරයක් වශයෙන් හෝ යම් කර්මාන්ත හෝ වාණිජ ව්‍යාපාරයක කාර්යයන් සඳහා හෝ ආරම්භ කරන ලද ගොඩනැගිලි සහ වෙනත් ඉදිකිරීම් වැඩ සම්බන්ධයෙන් ඒවාට සම්බන්ධව හෝ ඒවායේ කාර්යයන් සඳහා පාවිච්චි කරනු ලබන්නා වූ ද , දුම්රිය මාර්ගයක හෝ ට්‍රෑම් රථ මාර්ගයක කොටසක් නොවන්නා වූ ද යම් මාර්ගයක් හෝ සයිඩිමක් සම්බන්ධයෙන් ද මේ වගන්තියේ (2) වන උපවගන්තියෙහි නිශ්චිතව සඳහන් මේ ආඥාපනතේ විධිවිධාන , මේ වගන්තියේ පහත සඳහන් විධිවිධානවලට යටත්ව අදාල වන්නේ ය :-

(2) එකී විධිවිධාන නම් -

2000 අංක 33, 13

(අ) ලියාපදිංචි කිරීමට අදාළ I වන කොටසේ විධිවිධාන ;

(ආ) සනීපාරක්ෂක පහසුකම්වලට සම්බන්ධ II වන කොටසේ විධිවිධාන ;

(ඇ) ආරක්ෂාවට අදාළ III වන කොටසේ විධිවිධාන ;

2000 අංක 33, 13

(ඈ) වගන්තිය 2000 අංක 33 , 13 මගින් ඉවත් කර ඇත.

(ඉ) සුභ සාධක නියෝග පිළිබඳව IV වන කොටසේ විධිවිධාන ;

(ඊ) ආරක්ෂාව සහ සෞඛ්‍යය සඳහා විශේෂ විධිවිධානවලට සම්බන්ද V වන කොටසේ විධිවිධාන ;

(උ) VI වන කොටස ;

(ඌ) අමාත්‍යවරයා විසින් නියෝග මගින් කරනු ලැබිය හැකි අනුවර්තනය කිරීම් සහ වෙනස් කිරීම් සමග මේ ආඥාපනතේ 77 වන සහ 104 වන වගන්තිවල විධිවිධාන ;

(එ) මේ ආඥාපනතේ උද්ධෘත සහ දැන්වීම්, විශේෂ නියෝග, පොදු ලේඛන ( අදාළ වන තාක් පමණට ) හා වාර්තා ප්‍රවේසම් ලෙස තබාගැනීම සහ සේවය කරන තැනැත්තන්ගේ යුතුකම් පිළිබඳ වන X වන කොටසේ විධිවිධාන ;

(ඒ) XI වන කොටස ;

(ඔ) XIII වන කොටස ;

(ඕ) XIV වන කොටස ;

(ක) XV වන කොටස ;

(3) අන්තරායදායක තත්ත්වයන් හා ක්‍රියා මාර්ග පිළිබඳව ආඥා පැනවීමට මහෙස්ත්‍රාත් අධිකරණයකට ඇති බලතල සම්බන්ධයෙන් මේ ආඥාපනතේ විධිවිධාන යටතේ කරන ලද කිසිදු නියමයක් සහ මේ ආඥාපනතේ V වන කොටස යටතේ සාදන ලද කිසිදු විශේෂ නියෝගයක් යම් ඉංජිනේරු ඉදිකිරීම් වැඩවල සැලසුම කෙරෙහි බලපාන පරිද්දෙන් හෝ විශේෂ විස්තරයෙහි නැතහොත් උපදේශක ඉංජිනේරු තැන හෝ භාරව සිටින ඉංජිනේරු තැන විසින් නිකුත් කරන ලද අත්සන් තැබූ සැලැස්මෙහි හෝ දෙන ලද ලිඛිත විධානයෙහි නියම කරනු ලැබුවා වූ ද වැඩවල හෝ සේවයෙහි යොදවා සිටින තැනැත්තන්ගේ ආරක්ෂාවට හානියක් නොවන්නා වූ ද යම් ක්‍රමයක් ඒ වැඩ කිරීමේ දී අනුගමනය කිරීම කෙරෙහි බලපාන පරිදි ක්‍රියාත්මක නොවිය යුතුය.

(4) මේ ආඥාපනතේ විධිවිධාන ගොඩනැගිලි තැනීමේ කාර්යයන්ට හෝ ඉංජිනේරු ඉදිකිරීම් වැඩවලට අදාළ කිරීමේ දී ඒ කාර්යයන් හෝ වැඩ කරගෙන යන යම් ස්ථානයක් කර්මාන්තශාලාවක් වූවාක් මෙන් ද මේ ආඥාපනත අදාළ වන එවැනි යම් කාර්යයන් හෝ වැඩ භාරව කරගෙන යන යම් තැනැත්තකු කර්මාන්තශාලාවක පදිංචිකරු වූවාක් මෙන් ද , අමාත්‍යවරයා විසින් නියෝග මගින් කරනු ලැබිය හැකි වෙනත් අනුවර්තනය කිරීම් සහ වෙනස් කිරීම් ද ඇතිව එම විධිවිධාන බලපැවැත්විය යුතු ය.

(5) පොදු ලේඛන තැබීමට ද ස්ථානයෙහි ප්‍රදර්ශනය කර තැබිය යුතු මේ ආඥාපනතේ නියමිත උධෘතයේ සහ විශේෂ නියෝගවල හෝ එකී නියෝගවල යම් නියමිත උධෘතවල හෝ පිටපත් ස්ථානයෙහි ප්‍රදර්ශනය කර තැබීමට ද නියම කෙරෙන මේ ආඥාපනතේ විධිවිධාන ගොඩනැගිලි ඉදිකිරීම් හෝ ඉංජිනේරු ඉදිකිරීම් හෝ සම්බන්ධයෙන් අනුගමනය කරනු ලැබ ඇතැයි සලකනු ලැබිය යුත්තේ, ඒ ගොඩනැගිලි ඉදිකිරීම් හෝ ඉංජිනේරු ඉදිකිරීම් හෝ කිරීමට භාර ගන්නා තැනැත්තාගේ කාර්යාලයක ඒ ලේඛන තබා තිබුණහොත් සහ , මේ ආඥාපනතේ උධෘතයේ ද නියෝග වල උධෘතයන් හෝ ඒවායේ උධෘතවල ද පිටපතක් ගොඩනැගිලි ඉදිකිරීම් හෝ ඉංජිනේරු ඉදිකිරීම් කිරීමට භාරගන්නා තැනැත්තා විසින් ඒ ගොඩනැගිලි ඉදිකිරීම් හෝ ඉංජිනේරු ඉදිකිරීම් විෂයෙහි සේවයේ යොදවන ලද තැනැත්තන් පැමිණෙන එකී තැනැත්තන්ගේ එක් එක් කාර්යාලයෙහි , අංගනයෙහි හෝ වැඩපොළෙහි ඔවුන් විසින් පහසුවෙන් කියවිය හැකි ස්ථානයක ප්‍රදර්ශනය කර තිබුණහොත් වේ.

(6) මේ ආඥාපනත අදාළ වන යම් ගොඩනැගිලි තැනීමේ කාර්යයන් හෝ ඉංජිනේරු ඉදිකිරීම් වැඩ හෝ භාරගන්නා යම් තැනැත්තකු විසින් එය ආරම්භ කිරීමෙන් පසු දින හතක් ඉකුත්වීමට පෙර, ඒ තැනැත්තාගේ නම සහ තැපැල් ලිපිනය, එම කාර්යයන් හෝ වැඩ කෙරෙන ස්ථානය සහ ඒවායේ ස්වභාවය, යම් යාන්ත්‍රික බලයක් පාවිච්චි කරන්නේ ද යන වග සහ එසේ නම් එහි ස්වභාවය , එම කාර්යයන් හෝ වැඩ පිහිටියේ යම් පළාත් පාලන ආයතනයක පරිපාලන සීමාවන් තුළ ද එම පළාත් පාලන ආයතනයේ නම සහ නියම කරනු ලැබිය හැකි වෙනත් විස්තර සඳහන් ලියවිල්ලකින් වූ දැන්වීමක් මේ වගන්තියේ (7) වන උප වගන්තියට යටත්ව දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු තැන වෙත භාරදිය යුතුය.

(7) සති හයකට නොඅඩු කාල සීමාවක් තුළ නිම කළ හැකි යයි එය භාරගත් තැනැත්තාට විශ්වාස කිරීමට සෑහෙන හේතු තිබෙන්නා වූ ඒ යම් කාර්යයන් හෝ වැඩ සම්බන්ධයෙන් ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු තැන විසින් විධාන කරනු ලැබිය හැකි අවස්ථාවල දී හැර, මේ වගන්තියේ (6) වන උපවගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතුය; එවැනි කාර්යයන් හෝ වැඩ, කරගෙන යමින් තිබෙන ස්ථානයක අවස්ථාවෝචිත පරිදි ගොඩනැගිලි තැනීමේ කාර්යයන් හෝ ඉංජිනේරු ඉදිකිරීම් වැඩ හෝ යම් තැනැත්තකු විසින් භාගනු ලබන අවස්ථාවක , කරගෙන යමින් තිබුණ කාර්යයන් හෝ වැඩ හෝ සම්බන්ධයෙන් එවැනි දැන්වීමක් දී තිබුණා නම් ඔහු විසින් ඒ වගන්තිය යටතේ දැන්වීමක් දීම අවශ්‍ය නොවිය යුතු ය.

(8) මේ වගන්තියේ පෙරාතුව වූ විධිවිධාන ප්‍රකාර යම් ගොඩනැගිලි තැනීමේ කාර්යයන්ට හෝ ඉංජිනේරු ඉදිකිරීම් වැඩවලට

මේ ආඥාපනත අදාළ කිරීම, ඒ විධිවිධාන හැරුණු විට මේ ආඥාපනත අදාළ වන්නා වූ ස්ථානයක එම කාර්යයන් හෝ වැඩ කරගෙන යාමේ හේතුවෙන් අත් නොහළ යුතු ය ; තවද, මේ වගන්තියේ කිසිවක් මේ වගන්තිය හැරුණු විට මේ ආඥාපනත ඒ ස්ථාන සම්බන්දයෙන් අදාළ වීම කෙරෙහි හානිකර අන්දමින් බලපාන ලෙස නොසැලකිය යුතුය.

## කර්මාන්ත ශාලා නො වන වෙනත් ස්ථානවල ගෙන යනු ලබන ඊයම් වැඩ

85. මෙම වගන්තිය 1976 අංක 12, 38 මගින් ඉවත් කර ඇත.

ඊයම් නිපදවීම හෝ ඊයම් සංයෝග පාවිච්චිය හෝ සම්බන්ධ වැඩවල, කර්මාන්තශාලා නොවන ස්ථානවල ස්ත්‍රීන් සහ බාල තැනැත්තන් සේවයේ යෙදවීම

86. මෙහි පහත දැක්වෙන මේ ආඥා පනතෙහි විධිවිධාන, එනම් :-

(අ) ඊයම් නිපදවීම හා සම්බන්ධ වූ සමහර වැඩ පළවල හා ඊයම් සංයෝග පාවිච්චිය ඇති වැඩවල ස්ත්‍රීන් හා බාල තැනැත්තන් යෙදවීම සම්බන්ධයෙන් වූ විධිවිධාන ;

(ආ) කර්මාන්ත ශාලාවල දී වැළඳුණු හෝ සිදුවුණු ඊයම් විෂ වීමේ දැන්වීමක් ප්‍රධාන පරීක්ෂක වෙත හෝ දිස්ත්‍රික්කයේ පරීක්ෂක වෙත යැවීමට නියම කරන විධිවිධාන ; හා

(ඇ) පරීක්ෂකයන්ගේ බලතල හා යුතුකම් සම්බන්ධයෙන් ද වැරදි, දඬුවම් හා නීති කෘත්‍ය සම්බන්ධයෙන් ද වූ විධිවිධාන ;

කර්මාන්ත ශාලාවක් නොවන යම් තැනක , ඉහතකී වැඩවල සේවයෙහි යෙදීම පිළිබඳ ව , ඒ ස්ථානය කර්මාන්ත ශාලාවක් ලෙස ද , සේව යෝජකයා කර්මාන්ත ශාලාවේ පදිංචිකාරයා ලෙස ද බාල තැනැත්තන් ගැන සඳහනක් වෙතොත්, එය අවුරුදු දහ අටක් වයසැති සියල්ලන් ම ඇතුළත් සඳහනක් ලෙස ද සැලකීමෙන් අදාළ විය යුතු ය.

## IX වෙනි කොටස

## ගෙදර වැඩ

සමහර ව්‍යාපාරවල බාහිර කම්කරුවන්ගේ ලැයිස්තුවක් තිබිය යුතු බව

87. (1) ඇමතිවරයාගේ නියෝගවලකලින් කළ දැක්වෙන කර්මාන්ත වර්ගවල සේවය කරනු ලබන තැනැත්තන් පිළිබඳව , සෑම කර්මාන්ත ශාලාවක පදිංචිකාරයකු විසින් ම හා ඒ කර්මාන්ත ශාලාවේ කටයුතු පිළිබඳව ඒ පදිංචිකාරයා විසින් සේවයට ගනු ලබන සෑම කොන්ත්‍රාත්කරුවකු විසින් ම, පහත දැක්වෙන කරුණු කළ යුතු ය.

එනම් --

(අ) කර්මාන්ත ශාලාවේ කාර්ය සඳහා, කර්මාන්ත ශාලාවෙන් පිටත ද, සේවයෙහි යොදවනු ලැබූ වෙනත් ස්ථානවල ද, කම්කරුවන් ලෙස හෝ කොන්ත්‍රාත්කරුවන් ලෙස හෝ තමා විසින් නියම සේවයට ගන්නා ලැබූ (මින් මතු බාහිර කම්කරුවන් යයි සඳහන් කරනු ලබන ) සියලුම තැනැත්තන්ගේ නම් සහ ලිපින දැක්වෙන ලැයිස්තු නියමිත ආකෘතියක, නියමිත ආකාරයට හා නියමිත විස්තරත් සමඟ තැබීම ; හා

(ආ) පරීක්ෂකට කලින් කළ වුවමනා වන ඒ ලැයිස්තුවල පිටපත් හෝ ඉන් උධෘත කොටස් යැවීම හා සෑම

අවුරුද්දක ම පෙබරවාරි මාසය ඇතුළත හා අගෝස්තු මාසය ඇතුළත ගතවුණු හය මාසය තුළ සේවයට ගනු ලැබූ සියලු ම බාහිර කම්කරු සංඛ්‍යාව දැක්වෙන ඒ ලැයිස්තුවල පිටපත් යැවීම ද වේ.

(2) පදිංචිකාරයා විසින් හෝ කොන්ත්‍රාත්කරු විසින් හෝ තබනඅ ලැබූ ලැයිස්තු පරීක්ෂක විසින් හෝ ඇමතිවරයා විසින් යථා පරිදි බලය දෙනු ලැබූ නිලධාරියකු විසින් හෝ පරීක්ෂා කරනු ලැබීමට ඉඩ ඇති විය යුතු ය. තව ද පරීක්ෂකට යවනු ලැබූ පිටපත් පරීක්ෂකයකු විසින් හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක නිලධාරියකු විසින් හෝ පරීක්ෂා කරනු ලැබීමට හැකි විය යුතු ය.

(3) (පදිංචිකාරයා විසින් වැඩට වුවමනා ද්‍රව්‍ය සපයා දුන් විටක වුවද හෝ එ සේ නොමැති විටක වුවද හෝ ) කර්මාන්ත ශාලාවක කාර්යය සඳහා යම් වැඩක් දෙනු ලැබූ යම් ස්ථානයකට ද, ඒ ස්ථානයේ පදිංචිකාරයාට ද ඒ කාර්ය පිළිබඳ ව පදිංචිකාරයා විසින් සේවයට ගනු ලැබූ සැම කොන්ත්‍රාත්කරුවකුට ද , ඒ ස්ථානය කර්මාන්ත ශාලාවක් වූ ලෙස ම, මේ වගන්තිය අදාළ විය යුතු ය.

1998 අංක 18, 13

(4) කර්මාන්ත ශාලාවක හෝ ස්ථානයක පදිංචිකාරයා විසින් හෝ කොන්ත්‍රාත්කරුවකු විසින් හෝ මේ වගන්තිය කඩ කරනු ලැබූ අවස්ථාවක දී, පදිංචිකාරයා හෝ කොන්ත්‍රාත්කරු වරදකට වරදකාරයකු ව රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට යටත් විය යුතුය.

අසනීපදායක ස්ථානයක සේවයට යෙදවීම

88. (1) යම් කර්මාන්ත ශාලාවක කාර්ය සම්බන්ධයෙන් හෝ කාර්ය සඳහා, මේ වගන්තිය අදාළ වන යම් වැඩක්, පරීක්ෂකගේ අදහස පරිදි, සේවයෙහි යෙදී සිටින් තැනැත්තන්ගේ සනීපයට හානිකර වූ , අන්තරායදායක වූ හෝ ස්ථානයකට ගෙන යේ නම්, කර්මාන්ත ශාලාවේ පදිංචිකාරයාට හෝ ඔහු විසින් සේවයට ගනු ලැබූ කොන්ත්‍රාත්කරුට හෝ තමාගේ අදහස පරිදි ඒ ස්ථානය හානි කර වන්නේ නැතහොත් අන්තරායදායක වන්නේ කුමන කරුණුවලින් ද , යන්න ද එසේ තමා අදහස් කරන්නේ කුමන හේතුන් උඩ ද යන්න ද විස්තර සහිතව දැක්වෙන ලිපිගත දැන්වීමක් දීම ද ඒ ස්ථානයේ දී කිරීම සඳහා වැඩ දීම ලිපිගත ආඥාවකින් තහනම් කිරීම ද පරීක්ෂකට කළ හැකිය.

(2) (1) වෙනි උපවගන්තිය යටතේ කරනු ලැබූ යම් ආඥාවක් ගැන අතෘප්තිමත් වූ කර්මාන්ත ශාලාවක පදිංචිකාරයකුට හෝ කොන්ත්‍රාත්කරුවකුට, ඒ ආඥාවේ දින සිට විසි එක් දවසක් ඇතුළත , ආයාචන මණ්ඩලය වෙත ආයාචනයක් ඉදිරිපත් කළ හැකිය . ආයාචනයෙහි අවසාන විනිශ්වය තෙක් ආඥාව ක්‍රියාවේ යෙදවීම අත්හිට වූ ලෙස සැලකිය යුතු ය.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා වැඩ දෙනු ලබන ස්තානයක් කර්මාන්ත ශාලාවක් ලෙස සැලකිය යුතු ය

(4) ඇමතිවරයා විසින් පනවනු ලැබූ නියෝගවල සඳහන් කර්මාන්ත වර්ග සම්බන්ධයෙන් මේ වගන්තිය අදාළ විය යුතු ය.

## X වෙනි කොටස

## විවිධ කරුණු

යාන්ත්‍රික බලය පාවිච්චිය දැන්වීම

1989 අංක 54, 6

89. කර්මාන්තශාලාවක පදිංචිකාරයා විසින් යම් කර්මාන්තශාලාවක යාන්ත්‍රික බලය පාවිච්චි කිරීමට බලාපොරොත්තු වන දිනට අවම වශයෙන් මාසයකට පෙර, එම බලයේ ස්වභාවය සහ එම දිනය නිශ්චිතව සඳහන් කරමින් ලිපිගත දැන්වීමක් ප්‍රධාන පරීක්ෂක වෙත හෝ දිස්ත්‍රික්කයේ පරීක්ෂක වෙත භාරදී නොමැති නම් , ඔහු එම යාන්ත්‍රික බලය කර්මාන්තශාලාවේ පාවිච්චි කිරීඹ ආරම්භ නොකළ යුතු ය.

එසේද වුවත්, එබඳු දැන්වීමක් භාරදීමෙන් පසුව , එම දැන්වීමේ නිශ්චිතව සඳහන් කර ඇති දිනට කලින් දිනයකදී එබඳු යාන්ත්‍රික බලයක් යම් කර්මාන්තශාලාවක පාවිච්චි කිරම ආරම්භ කිරීම සඳහා , කර්මාන්තශාලාවේ පදිංචිකාරයා විසින් ප්‍රධාන පරීක්ෂකගේ හෝ දිස්ත්‍රික්කයේ පරීක්ෂකගේ ලිඛිත අවසරය ලබා ගෙන ඇත්නම් , එසේ කිරීමට ඔහුට පුළුවන .

ආඥා පනතේ සාරාංශය හා දැන්වීම් සවිකිරීම

90. (1) සේවයෙහි යොදනු ලැබූ තැනැත්තන් ඇතුළුවන කර්මාන්ත ශාලාවෙහි, දොරටුවල පහත දැක්වෙන ලේඛන සවි කොට තැබිය යුතු ය.

එනම්:-

(අ) මේ ආඥාපනතෙහි නියමිත සාරාංශය ද;

(ආ) දිස්ත්‍රික්කයේ පරීක්ෂකගේ සහ කර්මාන්ත ශාලා පිළිබඳ ප්‍රධාන පරීක්ෂකගේ ලිපිනය සඳහන් දැන්වීමක් ද;

1976 අංක 12, 39

(ඇ) කර්මාන්තශාලාව සඳහා බලයලත් කර්මාන්තශාලා වෛද්‍යවරයාගේ නම සහ ලිපිනය පිළිබඳ දැන්වීඹක්;

(ඈ) සේවා කාලය ද කර්මාන්ත ශාලාවේ ආහාර ගැනීම සහ විශ්‍රාම ගැනීමේ අන්තර කාල පාලනය කරනු ලබන ඔර්ලෝසුවක් වෙතොත් එය පෙන්නුම් කරන දැන්වීමක් ද;

(ඉ) කර්මාන්ත ශාලාවෙහි සවි කොට තිබිය යුතු ලෙස මේ ආඥාපනතින් නියම කරන සෑම දැන්වීමක් හා ලේඛනයක් ද වේ.

එසේ ද වුවත්, ඉහතකී ලේඛන සියල්ල ම හෝ ඉන් යමක් ඒ ප්‍රධාන දොරටුවලට අතිරේකව හෝ ඒවා වෙනුවට තමා විසින් නියම කරනු ලබන , කර්මාන්ත ශාලාවේ ස්ථානවල සවිකොට තබන ලෙස පරීක්ෂකයකු විසින් නියල කළ හැකිය.

(2) කර්මාන්ත ශාලාවෙහි සේවයේ යෙදී සිටින තැනැත්තන්ට පහසුවෙන් කියවිය හැකි වූ අකුරුවලින්, එසේ ම පහසුවෙන් කියවිය හැකි තැන්වල, ඒ සියලු ම ලේඛන සවි කොට තැබිය යුතු ය . තව ද යම් ලේඛනයක් සඳහා ආකෘතියක් නියම කොට තිබේ නම් එය ඒ ආකෘතියෙහි සවි කොට තැබිය යුතු ය.

1998 අංක 18, 14

(3) මේ ආඥාපනත ප්‍රකාර, සවි කොට තිබෙන යම් සාරාංශයක්, දැන්වීමක්, නියෝග හෝ වෙනත් ලේඛනයක් යමකු කඩා ඇමුවහොත්, ඔහු වරදකට වරදකාරයකු ව රුපියල් පනහකට වැඩි නොවන දඩයකට යටත් විය යුතු ය.

විශේෂ නියෝග පිළිබඳ විධිවිධාන

91. (1) යම් කර්මාන්ත ශාලාවක එවකට බලපවත්නා සියලු ම විශේෂ නියෝග වල මුද්‍රිත පිටපත් හෝ ඒ ව්‍යවස්ථාවල නියමිත සාරාංශය හෝ, කර්මාන්ත ශාලාවේ සේවයෙහි යෙදී සිටින්නන්ට පහසුවෙන් ම කියවීමට හැකි වන අකුරුවලින් , එසේම පහසුවෙන් කියවිය හැකි ස්ථානවල සවි කොට තැබිය යුතු ය . ඒ නියෝගවලට සම්බන්ධ

වූ තැනැත්තකුට, ඔහු විසින් ඉල්ලා සිටි විටක දී, ඒ සියලු ම නියොගවල මුද්‍රිත පිටපතක් පදිංචිකාරයා විසින් දිය යුතු ය.

සාමාන්‍ය ලේඛනය

92. සෑම කර්මාන්ත ශාලාවක ම හෝ දිස්ත්‍රික්කයේ පරීක්ෂක විසින් අනුමත කරනු ලබන, කර්මාන්තශාලාවෙන් පිට ස්ථානයක හෝ නියමිත ආකෘතියකට සාරානුකූල ව සාමාන්‍ය ලේඛන පොත යයි කියනු ලබන ලේඛන පොතක් තැබිය යුතු ය . පහත දැක්වෙන විස්තර වාර්තා හා වෙනත් කරුණු එම ලේඛන පොතෙහි සටහන් කොට හෝ එයට අමුණා තැබිය යුතු ය.

එනම් --

(අ) කර්මාන්ත ශාලාවේ සේවයෙහි යෙදී සිටින බාල තැනැත්තන් පිළිබඳ ව නියමිත විස්තර ද ;

(ආ) කර්මාන්ත ශාලාව සේදීම, සුදු හුනු ගෑම, පාට ගෑම හෝ පින්තාරු කිරීම , වාර්නිෂ් ගෑම සම්බන්ධයෙන් නියමිත විස්තර ද ;

(ඇ) පරීක්ෂක වෙත දැන්වීමක් යැවීමට නියමව ඇති කර්මාන්ත ශාලාවෙහි සිදුවන සෑම හදිසි අනතුරක් හා කාර්මික රෝගයක් සම්බන්ධයෙන් නියමිත විස්තර ද ;

(ඈ) කර්මාන්ත ශාලාවේ පදිංචිකාරයා විසින් ප්‍රයෝජනයට ගනු ලබන සෑම විශේෂ ව්‍යතිරේකයක් ම දැක්වෙන විස්තර ද ;

(ඉ) මේ ආඥාපනතෙහි වෙනත් විධිවිධානයකින් සාමාන්‍ය ලේඛන පොතෙහි ඇතුළත් කළ යුතු ලෙස හෝ එයට ඇමිණිය යුතු ලෙස හෝ නියම වූ සියලු ම වාර්තා හා විස්තර ද ;

(ඊ) නියමිත වෙනත් කරුණු ද වේ.

ලේඛන පොත් සහ වාර්තා ප්‍රවේසම් ලෙස තබා ගැනීම

93. මේ ආඥාපනත අනුව පවත්වාගෙන යනු ලබන පොදු ලේඛනය හෝ වාර්තාව ඒ ලේඛනයේ හෝ වාර්තාවේ අවසාන සටහන කළ දිනයෙන් යටත් පිරිසෙයින් අවුරුදු දෙකක් හෝ යම් පංතියක හෝ වර්ගයක ලේඛන හෝ වාර්තා සඳහා නියම කරනු ලැබිය හැකි වෙනත් කාලපරිච්ඡේදයක් තුළ ආරක්ෂා කොට හා යම් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවකු හෝ බලයලත් කර්මාන්තශාලා වෛද්‍යවරයා විසින් පරීක්ෂා කරනු ලැබීම සඳහා තබනු ලැබිය යුතුය.

සේවයට යෙදී සිටින තැනැත්තන් පිළිබඳ සාමයික වාර්තා

94. (1) අවුරුද්දකට අඩු නොවන අන්තර කාල ඇතුළත ලේකම් විසින් නියම කරනු ලබන දිනවල දී හෝ දිනවලට පෙර, එසේ ම ඔහු විසින් නියම කරනු ලබන දිනයක්, දින හෝ කාලයක් සම්බන්ධයෙන් කර්මාන්ත ශාලාවෙහි සේවයෙහි යෙදී සිටින තැනැත්තන්ගේ සංඛ්‍යාව සඳහන් නිවැරදි වාර්තාවක් සෑම කර්මාන්ත ශාලාවක ම පදිංචිකාරයා විසින්, ප්‍රධාන පරීක්ෂක වෙත යැවිය යුතු ය . එහි සේවය කරන සියලු ම තැනැත්තන්ගේ වයස , ස්ත්‍රී පුරුෂ භාවය හා රක්ෂාව ද සම්බන්ධයෙන් නියමිත විස්තර ද, ලේකම් විසින් නියම කරනු ලැබූ වෙනත් කරුණුවල විස්තර ද සඳහන් විය යුතු ය.

(1 අ) (1) වන උපවගන්තිය යටතේ කොමසාරිස් විසින් කරනු ලබන සෑම විධානයක් ම, ගැසට් පත්‍රයෙහි ද එක් සිංහල එක් දෙමළ සහ එක් ඉංග්‍රීසි ප්‍රවෘත්ති පත්‍රයක ද පළ කිරීමෙන් කළ යුතු ය.

(2) මේ ආඥාපනතෙහි යම් විධිවිධානයක් අදාළ වන ස්ථානයක පදිංචිකාරයා විසින්, ලේකම් විසින් නියම කරනු ලැබූ විටක , එබඳු ම වාර්තාවක් ප්‍රධාන පරීක්ෂක වෙත සැපයිය යුතු ය.

(3) පදිංචිකාරයන් විසින් මේ වගන්තිය යටතේ වාර්තා යැවීම පහසු කරවීම පිණිස , පදිංචිකාරයන්ගෙන් යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවකට ඉල්ලා සිටීමට බලය ඇති වෙනත් වාර්තා සමග මෙකී වාර්තා ඒකාබද්ධ කිරීමේ පිළිවෙළක් ලේකම් විසින් සැලැස්විය හැකිය.

95. (1) මේ ආඥාපනතෙහි යම් විධිවිධානයක් අදාළ වන කර්මාන්ත ශාලාවක හෝ වෙනත් ස්ථානයක සේවය කරනු ලබන කිසිවකු විසින්, ඒ කර්මාන්ත ශාලාවෙහි හෝ ස්ථානයෙහි සෞඛ්‍යය, ආරක්ෂාව හෝ ශුභ සිද්ධිය ලබා ගැනීම සඳහා මේ ආඥාපනත ප්‍රකාර සපයනු ලැබූ යම් උපක්‍රමයකට, උපකරණයකට හෝ පහසුකමකට ඕනෑකමින් ම බාධා නො කළ යුතුය. නැතහොත් ඒවා වැරදි ලෙස පාවිච්චි නොකළ යුතු ය . තවද එබඳු තැනැත්තකුගේ ප්‍රයෝජනය පිණිස, සෞඛ්‍යය හෝ ආරක්ෂාව ලබා ගැනීම සඳහා, යම් උපක්‍රමයක් හෝ උපකරණයක් මේ ආඥාපනත යටතේ සැපයූ විට, ඒ උපක්‍රමය හෝ උපකරණය ඔහු විසින් ම පාවිච්චි කළ යුතු ය.

(2) මේ ආඥාපනතෙහි යම් විධිවිධානයක් අදාළ වන කර්මාන්ත ශාලාවක හෝ වෙනත් ස්ථානයක සේවය කරනු ලබන කිසිවකු විසින් තමාට හෝ අනුන්ට අන්තරායක් වන පරිදි ඕනෑකමින් හා යුක්ත සහගත හේතුවක් නොමැති ව, කිසිවක් නොකළ යුතු ය.

96. (අ) මේ ආඥාපනත යටතේ වෙනත් ලෙසකට පැහැදිලි ව සඳහන් කොට නොමැති අවස්ථාවක දී,මේ ආඥාපනත ප්‍රකාර පදිංචිකාරයා විසින් කළ යුතු හෝ සැපයිය යුතු යමක් සම්බන්ධයෙන්, සේවයෙහි යොදවනු ලැබූ තැනැත්තකුට ගෙවිය යුතු ලෙස ගිවිසගනු ලැබූ මුදලකින් යම් අඩු කිරීමක් කිරීම හෝ ලබා ගැනීම හෝ එබඳු තැනැත්තෙකුගෙන් ඔහුගේ සේවයෙහි යෙදී සිටින අන් තැනැත්තකුට එබඳු ගෙවීමක් ලබා ගැනීමට ඉඩ හැරීම හෝ ඒ පදිංචිකාරයා විසින් නො කළ යුතු ය.

97. (1) කිරුම් හා මිනුම් පිළිබඳ ව හෝ කිරුම් හෝ මැනුම් උපකරණ පිළිබඳ ව හෝ එවකට ලංකාවේ බල පවත්නා සියලු ම නීත්‍යානුකූල විධිවිධාන, කර්මාන්ත ශාලාවක සේවයෙහි යෙදී සිටින තැනැත්තකු ගේ වැටුප් වල හරි වැරදි බැලීමේ හෝ ඒවා දැන ගැනීමේ හෝ කාර්යය සඳහා ඒ කර්මාන්ත ශාලාවෙහි පාවිච්චි කරනු ලබන කිරුම් මැනුම් හා කිරීමේ උපකරණවලට, ඒවා වෙළඳාම සඳහා පාවිච්චි කරනු ලැබූ සේ ම , අදාල විය යුතු ය. තවද කිරුම් හා මැනුම් ආඥාපනත යටතේ නියෝග පැනවීමට ඇමතිවරයාට ඇති බලයට, ඒ කාර්ය සඳහා නියෝගවල සඳහන් ආකාරයට කර්මාන්ත ශාලාවල පාවිච්චි කරනු ලබන එබඳු මැනීමේ උපකරණවලට ඒ විධිවිධාන අදාළ කිරීමේ බලය ද ඇතුළත් විය යුතු ය.

(2) කිරුම හා මැනුම් හෝ කිරීමේ හෝ මැනීමේ උපකරණ සම්බන්ධයෙන් එවකට පවත්නා නීතිය යටතේ, කිරුම් හා මැනුම් පරීක්ෂා කිරීමට බලය ලැබූ සෑම පරීක්ෂකයකු විසින් ම , මේ වගන්තියෙන් හෝ වගන්තිය යටතේ ඒ නීතිය අදාළ කරනු ලැබූ කිරුම් , මැනුම් හා කිරීමේ හා මැනීමේ උපකරණ පරීක්ෂා කිරීම ද, මුද්‍රා තැබීම ද, ලකුණු කිරීම ද, සෝදිසි කිරීම ද කළ යුතු ය . තවද ඒ කාර්යය සඳහා ද වෙළඳාම සඳහා

පාවිච්චි කරනු ලබන කිරුම් , මැනුම් සහ උපකරණ සඳහා ද ඔහුට ඒකාකාර බල ද, යුතුකම් ද ඇත්තේ ය.

## XI වෙනි කොටස

### පාලනය

98. (1) කම්කරු කොමසාරිස්වරයා මෙම ආඥාපනත පාලනය කිරීම භාර නිලධාරියා විය යුතු ය.

(2) මේ ආඥාපනත යටතේ හෝ මේ ආඥාපනත යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ කොමසාරිස්ගේ යම් බලයක් , යුතුකමක් හෝ කාර්යයක් යම් නියෝජ්‍ය හෝ සහකාර කම්කරු කොමසාරිස්වරයකු, ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු තැන , නියෝජ්‍ය ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු තැන , විශේෂඥ කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවකු, විශේෂඥ පරීක්ෂක වෛද්‍ය නිලධරයකු, දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවකු , කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවකු හෝ පරීක්ෂක වෛද්‍ය නිලධරයකු විසින් ක්‍රියාවෙහි යෙදවීම , ඉටුකිරීම හෝ කිරීම කොමසාරිස්ගේ පොදු හෝ විශේෂ විධානවලට යටත්ව කළ හැකිය.

කාර්මික ආරක්ෂාව සහ සෞඛ්‍ය උපදේශක කමිටුව

99. (1) පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත කාර්මික ආරක්ෂාව සහ සෞඛ්‍යය උපදේශක කමිටුවක් තිබිය යුතු ය :-

(අ) එහි සභාපති විය යුතු ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු තැන ; සහ

(ආ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන වෙනත් සාමාජිකයන් හතර දෙනෙක්. මේ හතර දෙනා අතුරින් යටත් පිරිසෙයින් -

(i) කර්මාන්තශාලාවල පදිංචිකරුවන්ගේ අයිතිවාසිකම් නියෝජනය කරන,

(ii) කර්මාන්තශාලාවල සේවයේ යෙදී සිටින තැනැත්තන්ගේ අයිතිවාසිකම් නියෝජනය කරන, සහ

(iii) කාර්මික ආරක්ෂාව සහ සෞඛ්‍යය පිළිබඳ විෂයයෙහි විශේෂඥයකු වන

එක් කෙනකු බැගින්වත් සිටිය යුතු ය.

(2) පහත සඳහන් කටයුතු කිරීම කාර්මික ආරක්ෂා සහ සෞඛ්‍යය කමිටුවේ යුතුකම වන්නේය :-

(අ) කර්මාන්තශාලාවල සේවකයන්ගේ ආරක්ෂාවට, සෞඛ්‍යයට හා ශුභසාධනයට ආනුෂංගික හෝ සම්බන්ධ සියලුම කරුණු සහ කොමසාරිස් විසින් කමිටුවට යොමු කරන අනෙක් සියලු කරුණු ගැනකොමසාරිස්ට උපදෙස් දීම ;

(ආ) අමාත්‍යවරයා කමිටුවට යොමු කරන සියලු කරුණු ගැන අමාත්‍යවරයාට උපදෙස් දීම;

(ඇ) මේ ආඥාපනතින් හෝ එය යටතේ නියම කරනු ලැබිය හැකි යුතුකම් හා බලතල ඉටුකිරීම සහ ක්‍රියාත්මක කිරීම.

(2 අ) අ කර්මාන්තශාලාවක් ලෙස භාවිතා කිරීමට අදහස් කෙරෙන, දැන්වීමෙහි සඳහන් ස්ථානයකට ඇතුලුවීම, පරීක්ෂා කිරීම

හෝ විභාග කිරීම සඳහා (1) උපවගන්තියෙහි සඳහන් ඕනෑම නිලධාරියෙකුට වුවමනා උපක්‍රම, 2 උපවගන්තිය යටතේ දැන්වීමක් භාර කර ඇති පුද්ගලයා විසින් ද ඔහුගේ නියෝජිතයන් සහ සේවකයන් විසින් ද සපයා දිය යුතු ය.

(3) පහත සඳහන් කරුණු සඳහා හෝ සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකිය :-

(අ) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ පත් කරනු ලබන කමිටුවේ සාමාජිකයන්ගේ ධූර කාලය සහ සාමාජිකයන් අතර ඇතිවන අනියම් හෝ වෙනත් පුරප්පාඩු පුරවනු ලැබිය යුතු ආකාරය ;

(ආ) කමිටුවේ රැස්වීම් කැඳවිය යුතු ආකාරය , කමිටුව විසින් කමිටුවේ කටයුතු කරගෙන යාම සහ කමිටුවේ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය ;

(ඇ) (1) වන උප වගන්තියේ (ආ) ඡේදය යටතේ පත් කරනු ලබන සාමාජිකයන්ට ගෙවිය යුතු ගාස්තු.

(4) සාදනු ලැබිය හැකි යම් නියෝගවලට යටත්ව, කමිටුව විසින් කමිටුවේ කාර්ය පරිපාටිය විධිමත් කර ගත හැකිය.

(5) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් , එම නියමයේ නිශ්චිතව සඳහන් කරුණු ගැන තමාට වාර්තා කිරීම සඳහා නියමයේ නිශ්චිතව සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත කමිටුවක් පත් කිරීම, එසේ කිරීම අවශ්‍ය යයි තමාට හැගෙන කවර අවස්ථාවක වුවද අමාත්‍යවරයා විසින් කළ හැකිය.

100. මේ ආඥාපනතේ කාර්යයන් සඳහා ---

(අ) ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු තැන ලෙස හෝ ඒ වෙනුවට වැඩ බැලීමට තැනැත්තකු නමින් හෝ නිලයෙන් ;

(ආ) නියෝජ්‍ය ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු තැන ලෙස හෝ ඒ වෙනුවට වැඩ බැලීමට තැනැත්තකු නමින් හෝ නිලයෙන් ;

(ඇ) විශේෂඥ කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවන් ලෙස හෝ ඒ වෙනුවට වැඩ බැලීමට අවශ්‍ය විය හැකි යයි සලකනු ලැබිය හැකි තැනැත්තන් සංඛ්‍යාවක් නමින් හෝ නිලයෙන් ;

(ඈ) විශේෂඥ පරීක්ෂක වෛද්‍ය නිලධරයන් ලෙස හෝ ඒ වෙනුවට වැඩ බැලීමට අවශ්‍ය විය හැකි යයි සලකනු ලැබිය හැකි තැනැත්තන් සංඛ්‍යාවක් නමින් හෝ නිලයෙන් ;

(ඉ) දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවන් ලෙස හෝ ඒ වෙනුවට වැඩ බැලීමට අවශ්‍ය විය හැකි යයි සලකනු ලැබිය හැකි තැනැත්තන් සංඛ්‍යාවක් නමින් හෝ නිලයෙන් ;

(ඊ) කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවන් ලෙස හෝ ඒ වෙනුවට වැඩ බැලීමට අවශ්‍ය විය හැකි යයි සලකනු ලැබිය හැකි තැනැත්තන් සංඛ්‍යාවක් නමින් හෝ නිලයෙන් ; සහ

(උ) පරීක්ෂක වෛද්‍ය නිලධරයන් ලෙස හෝ ඒ වෙනුවට වැඩ බැලීමට අවශ්‍ය විය හැකි යයි සලකනු ලැබිය හැකි තැනැත්තන් සංඛ්‍යාවක් නමින් හෝ නිලයෙන් ;

පත් කරනු ලැබිය හැකිය.

101. (1) මේ ආඥාපනත ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා පහත සඳහන් දේ සියල්ලම හෝ ඉන් කිසිවක් කිරීමේ බලය කොමසාරිස්ට , ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු තැනට , නියෝජ්‍ය ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු තැනට , විශේෂඥ කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවකුට, විශේෂඥ පරීක්ෂක වෛද්‍යවරයකුට, දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවකුට , කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවකුට,පරීක්ෂක වෛද්‍ය නිලධරයකුට සහ රජයේ සේවයේ සිටින්නා වූ දකොමසාරිස් විසින් ඒ සඳහා බලය දෙනු ලැබුවා වූ ද යම් සුදුසුකම් ලත් යම් ඉංජිනේරුවකුට හෝ වෛද්‍යවරයකුට ඇත. එනම් :-

(අ) (i) මේ ආඥාපනත අදාළ වෙතැයි විශ්වාස කිරීමට ඔහුට සැහෙන හේතු තිබෙන්නා වූ ;

(ii) කර්මාන්තශාලාවක් වශයෙන් පාවිච්චි කරනු ලැබීමට අදහස් කර ඇති බව 4 වන වගන්තිය යටතේ වූ දැන්වීමක සඳහන් ව ඇති;

(iii) (i) වන සහ (ii) වන අනුඡේදවල සඳහන් යම් ස්ථානයකට යාබදව තිබෙන්නා වූ සහ එම (i) වන හෝ (ii) වන අනුඡේදයෙහි සඳහන් ස්ථානවල සේවයෙහි යොදවනු ලැබ සිටින තැනැත්තන් හානි සිදුවීමේ අවදානමට ලක් කරන පුපුරණ හෝ ඇවිලෙන සුළු ද්‍රව්‍ය හෝ වෙනත් ද්‍රව්‍ය ගබඩා කර ඇතැයි විශ්වාස කිරීමට ඔහුට සැහෙන හේතු තිබෙන්නා වූ ;

(iv) මේ ආඥාපනත අදාළ නොවන නමුත් (i) වන හෝ (ii) වන අනුඡේදයෙහි සඳහන් යම් ස්ථානයක පදිංචිකරු විසින් සපයන ලද සෞඛ්‍ය සහ සුභසාධක පහසුකම් තිබෙන්නා වූ

යම් ස්ථානයකට දිවා කාලයෙහි හෝ රාත්‍රී කාලයෙහි ඇතුළුවීම, එය පරීක්ෂා කිරීම සහ සෝදිසි කිරීම;

(ආ) යම් ස්ථානයක හෝ ගොඩනැගිල්ලක (අ) ඡේදයේ (i) වන හෝ (ii) වන අනුඡේදයෙහි සඳහන් යම් ස්ථානයකට ප්‍රවේශ මාර්ගයක් හෝ ප්‍රවේශ මාර්ගයක කොටසක් වන්නා වූ යම් ප්‍රදේශයකට ඇතුළුවීම;

(ඇ) තමාගේ යුතුකම ඉටු කිරීමේ ලා තදබල බාධා කිරීමක් ඇතිවීමේ බියක් ඇති වීමට සාධාරණ හේතු ඇතහොත් පොලිස් නිලධරයන් එක් කෙනකු හෝ වැඩි ගණනක් කැඳවාගෙන යාම ;

(ඈ) 44 වන හෝ 44 අ වන වගන්තිය යටතේ යම් මහෙස්ත්‍රාත් අධිකරණයක් වෙත පැමිණිල්ලක් හෝ ඉල්ලීමක් කිරීම සහ එම පැමිණිලි සහ ඉල්ලීම් තහවුරු කිරීම පිණිස පෙනී සිටීම;

(ඉ) මේ ආඥාපනත හෝ වෙනත් යම් ප්‍රඥප්තියක් අනුව තබා ඇති ලේඛන, සහතික, දැන්වීම් සහ ලියකියවිලි ඉදිරිපත්

කරන ලෙස නියම කිරීම සහ ඒවායින් යමක් සෝදිසි කිරීම, පරීක්ෂා කිරීම හෝ පිටපත් කිරීම ;

(ඊ) කර්මාන්තශාලා පිඹුරු සහ සැලසුම් සහ යන්ත්‍රෝපකරණවලට අදාළ පරිපථ හෝ කම්බි ඇඳුම් සටහන් ඉදිරිපත් කරන ලෙස නියම කිරීම ;

(උ) මහජන සෞඛ්‍ය පිළිබඳව මේ ආඥාපනතේ හෝ තත් කාලයේ බලපවත්වමින් තිබෙන ප්‍රඥප්තිවල විධිවිධාන, කර්මාන්තශාලාවක් සහ කර්මාන්තශාලාවක සේවයේ යෙදී සිටින තැනැත්තන්ට අදාළ වන තාක් දුරට පිළිපදිනු ලැබ ඇත්ද යන්න දැනගැනීම සඳහා අවශ්‍ය විය හැකි විභාග සහ පරීක්ෂණ පැවැත්වීම;

(ඌ) කර්මාන්තශාලාවක දී හමුවන තැනැත්තකු විසින් ඒ කර්මාන්තශාලාවේ පදිංචිකරු කවරෙක් ද යන්න පිළිබඳව දිය හැකි තොරතුරු දෙන ලෙස ඒ තැනැත්තාට නියම කිරීම ;

(එ) කර්මාන්තශාලාවක දී තමාට හමුවන සෑම තැනැත්තකුම හෝ කර්මාන්තශාලාවක හෝ මුළුමනින් ම හෝ කොටස් වශයෙන් කර්මාන්තශාලාවෙන් පිටත කර්මාන්තශාලාවක ව්‍යාපාරයක යෙදී සිටින හෝ පෙරාතුව වූ දෙමාසය තුළ යෙදී සිටි බව තමාට විශ්වාස කිරීමට හේතු ඇති සෑම තැනැත්තකු ම මේ ආඥාපනත යටතේ වූ කරුණු සම්බන්ධයෙන් තනිව හෝ තමා විසින් සුදුසු යයි සලකනු ලබන තවත් තැනැත්තකු සිටින විට පරීක්ෂා කිරීම සහ ඒ සෑම තැනැත්තකු ම එසේ පරීක්ෂා කරනු ලැබිය යුතු බවට සහ ඒ තැනැත්තා පරීක්ෂා කරනු ලැබුවේ යම් කරුණු සම්බන්ධයෙන් ද ඒ කරුණුවල සත්‍යතාවය ගැන ප්‍රකාශයක් අත්සන් කළයුතු බවට නියම කිරීම ; එහෙත්, මේ විධිවිධාන යටතේ, කිසිම තැනැත්තකුට ඔහු අපරාධයකට හසු කරන අන්දමේ යම් ප්‍රශ්නයකට පිළිතුරු දීමට හෝ යම් සාක්ෂියක් දීමට නියම කරනු නොලැබිය යුතු ය ;

(ඒ) මේ වගන්තියේ සඳහන් සුදුසුකම්ලත් වෛද්‍යවරයකු සම්බන්ධයෙන් වූ විට මේ ආඥාපනත යටතේ තම යුතුකම් ඉටුකිරීමේ කාර්යයන් සඳහා අවශ්‍ය විය හැකි වෛද්‍ය පරීක්ෂණ පැවැත්වීම ;

(ඔ) මේ ආඥාපනත ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් බලතල පාවිච්චි කිරීම.

(2) ඇතුළුවීමට, පරීක්ෂා කිරිමට, විභාග කිරීමට, ආදර්ශ කොටස් ලබා ගැනීමට හෝ කර්මාන්තශාලාව සම්බන්ධයෙන් මේ ආඥාපනත යටතේ තමාගේ බලතල පාවිච්චි කිරීම සඳහා වෙනත් යමක් කිරීමට අවශ්‍ය ලෙස, (1) වෙනි උප වගන්තියේ සඳහන් නිලධාරියාට වුවමනා උපක්‍රම, සෑම කර්මාන්ත ශාලාවකම පදිංචිකාරයා විසින් ද, ඔහුගේ නියෝජිතයන් විසින් ද සේවකයන් විසින් ද සපයා දිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ ලැබී ඇති බලයක් පාවිච්චි කිරීමේදී (1) වෙනි උපවගන්තියේ සඳහන් නිලධාරියෙකු යමකු විසින් ඕනෑකමකින් ප්‍රමාද කළහොත් හෝ මේ වගන්තිය ප්‍රකාර ඒ නිලධාරියාගේ යම්

ආඥාවක් ඉෂ්ට කිරීම හෝ මේ ආඥාපනතින් හෝ මේ ආඥාපනත ප්‍රකාර ඉදිරිපත් කළ යුතු යම් ලේඛන පොතක් , සහතිකයක්, දැන්වීමක් හෝ ලේඛනයක් හෝ ඉදිරිපත් කිරීම හෝ පැහැර හැරියහොත් හෝ යම් කර්මාන්තශාලාවක පදිංචිකාරයා කවරකු ද යන්න පිළිබඳ තොරතුරක් ඕනෑකමින් ම වසන් කළහොත් හෝ ඒ නිලධාරියා ඉදිරිපිට යමකු පැමිණ සිටීම හෝ ඔහු ඔහු විසින් ඒ තැනැත්තා විභාග කරනු ලැබීම නොහැකි වන සේ ඒ තැනැත්තා සැඟවුවහොත් හෝ එසේ කිරීම වැලැක් වුවහොත් නැතහොත් ඉන් යමක් කිරීමට උත්සාහ කළහොත්, ඔහු මේ ආඥාපනත යටතේ ඒ නිලධාරියාට තම යුතුකම ඉෂ්ට කිරීමට බාධා කළ ලෙස සැලකිය යුතු ය.

(4) (1) වෙනි වගන්තියේ සඳහන් යම් නිලධාරියකුගේ බලතල පාවිච්චි කිරීමේ දී හෝ යුතුකම් ඉෂ්ට කිරීමේදී හෝ ඔහුට බාධා කළ අවස්ථාවක දී, එසේ බාධා කළ තැනැත්තා වරදකට වරදකාරයකුව රුපියල් දෙදහස් පන්සියයකට වැඩි නොවන දඩයකට යටත් විය යුතු ය . ඒ නිලධාරියාට කර්මාන්ත ශාලාවක දී එලෙස බාධා කළහොත් ඒ කර්මාන්තශාලාවේ පදිංචිකාරයා ද වරදකට වරදකාරයකු විය යුතුය.

(5) ප්‍රධාන පරීක්ෂකයකු විසින් හෝ දිස්ත්‍රික්කයේ පරීක්ෂකයකු විසින් හෝ නිකුත් කරනු ලැබූ සහතිකයක් සීමා සහිත කාලයකට හෝ කාලය සීමා නොකට හෝ විය හැකිය. තවද එය ඔහු විසින් හෝ ඔහුගේ නිලයට පසුව පත් වන්නා විසින් වෙනස් කිරීම හෝ අවලංගු කිරීම හෝ කළ හැකි ය.

සමහර අවස්ථාවල දී පරීක්ෂකගේ බලතල ආදිය වෙනත් නිලධාරියකුට පාවිච්චි කිරීමට හැකි බව.

102. මේ ආඥාපනතෙහි සඳහන් විධිවිධානයකින්, පරීක්ෂකයකු වෙත පවරනු ලැබූ හෝ නියම කරනු ලැබූ හෝ පැවරුන යම් බලයක් , යුතුකමක් හෝ කාර්යයක්,යම්කිසි සඳහන් කරනු ලැබූ දිස්ත්‍රික්කයක් සම්බන්ධයෙන්, පරීක්ෂකයකු නොවන, ඒ කාර්යය සඳහා ආඥාවෙහි නම් කරනු ලබන වෙනත් නිලධාරියෙකු විසින් පාවිච්චි කළ යුතු යයි , හෝ ඉෂ්ට කළ යුතු යයි හෝ ගැසට් පත්‍රයේ ආඥාවක් පළ කිරීමෙන් ඇමතිවරයාට ප්‍රකාශ කළ හැකිය . එබඳු ආඥාවක් පළ කිරීමෙන් පසු , ආඥාවෙහි සඳහන් මේ ආඥාපනතෙහි යම් විධිවිධානයක් ඒ විධිවිධානයෙහි පරීක්ෂකයකු පිළිබඳ ව සඳහනක් වී නම්, ආඥාවෙහි නම් කරනු ලැබූ පරීක්ෂකයකු නොවන නිලධාරියා ඒ වෙනුවට සඳහන් කරනු ලැබූ ආකාරයට බල පැවැත්විය යුතු ය.

100 වන වගන්තිය යටතේ පත්කරනු ලබන තැනැත්තාගේ සහතිකය

1976 අංක 12 , 46

103. 100 වන වගන්තිය යටතේ පත් කරනු ලබන සෑම තැනැත්තකුට ම ඔහුගේ පත්වීම පිළිබඳව නියම කරනු ලැබිය හැකි සහතිකයක් දෙනු ලැබිය යුතු අතර මේ ආඥාපනත යටතේ ඇතුළු වීමට බලය ඇති යම් කර්මාන්තශාලාවක් හෝ ස්ථානයක් බැලීමට යන විට ඉල්ලා සිටිනු ලැබුවහොත් ඒ සහතිකය ඒ ඒ කර්මාන්තශාලාව හෝ ස්ථානයේ පදිංචිකරුට හෝ එහි කළමනාකාරිත්වය පිළිබඳ වගකිව යුතු තැනක් දරන තැනැත්තකුට ඉදිරිපත් කළ යුතුය.

පරීක්ෂණ ශලා වෛද්‍යවරයන් පත් කිරීම හා ඔවුන්ගේ යුතුකම්.

1976 අංක 12 , 47

104. (1) මේ ආඥාපනතේ කාර්යයන්ගෙන් යමක් සඳහා බලයලත් කර්මාන්තශාලා වෛද්‍යවරයන් වශයෙන් ලියාපදිංචි වෛද්‍යවරයන් සෑහෙන ගණනක් පත්කිරීම ද ඒ යම් පත් ක්‍රීමක් ප්‍රත්‍යාදිෂ්ට කිරීම ද ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු තැන විසින් කොමසාරිස්ගේ සාමාන්‍ය විධානවලට යටත්ව කළ හැකිය.

(2) බලයලත් කර්මාන්තශාලා වෛද්‍යවරයකුගේ සෑම පත්කිරීමක් ම සහ පත්කිරීමක් ප්‍රත්‍යාදිෂ්ට කිරීමක් ම අවලංගු කිරීම

කොමසාරිස් විසින් , ඒ කාර්යය සඳහා තමා වෙත කරනු ලැබූ ආයාචනයක් මත කළ හැකිය.

(3) කර්මාන්තශාලාවක පදිංචිකරු වන හෝ එම කර්මාන්තශාලාවේ හෝ එහි කරගෙන යන යම් ක්‍රියාවලියක හෝ ව්‍යාපාරයක හෝ ඊට සම්බන්ධ පේටන්ට් බලපත්‍රයක කෙළින්ම හෝ අන්ලෙසකින් සම්බන්ධතාවක් ඇති ලියාපදිංචි වෛද්‍යවරයකු එම කර්මාන්තශාලාවේ බලයලත් කර්මාන්තශාලා වෛද්‍යවරයා වශයෙන් කටයුතු නොකළ යුතුය.

එසේ වුවද කර්මාන්තශාලාවේ සේවයේ යෙදී සිටින තැනැත්තන්ගේ වෛද්‍ය අධීක්ෂණය සම්බන්ධයෙන් කර්මාන්තශාලාවේ පදිංචිකරු විසින් සේවයේ යොදවනු ලැබ සිටින , එහෙත් වෙනත් ආකාරයකින් කර්මාන්තශාලාවෙහි සම්බන්ධතාවයක් නැති ලියාපදිංචි වෛද්‍යවරයකුට යෞවනයන් පරීක්ෂාකොට ඔවුන්ගේ යෝග්‍යතාව සහතික කිරීමේ කාර්යය සඳහා, එම කර්මාන්තශාලාව සඳහා බලයලත් කර්මාන්තශාලා වෛද්‍යවරයා වශයෙන් කටයුතු කිරීමට කොමසාරිස් විසින් බලය දිය හැකිය.

(4) යම් කර්මාන්තශාලාවක බලයලත් කර්මාන්තශාලා වෛද්‍යවරයාට, කර්මාන්තශාලාවේ පොද් ලේඛන සියලු සාධාරණ වේලාවල්වල දී පරීක්ෂා කිරීමේ බලය ඇත.

(5) අමාත්‍යවරයා විසින්, බලයත් කර්මාන්තශාලා වෛද්‍යවරුන්ගේ යුතුකම් සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකිය.

(6) සේවයේ යොදවනු ලැබ සිටින තැනැත්තන් පිළිබඳව විධාන කරනු ලබන අන්දමේ පරීක්ෂණයක් හෝ විභාගයක්, එවැන්නක් කරන ලෙස කොමසාරිස් විසින් විධාන කරනු ලැබූ විට බලයලත් කර්මාන්තශාලා වෛද්‍යවරයකු විසින් කළ යුතුය.

(7) සෑම බලයලත් කර්මාන්තශාලා වෛද්‍යවරයකු ම , මේ ආඥාපනත අනුව තමා විසින් පවත්වනු ලැබූ පරීක්ෂණ හා ඉටුකරනු ලැබූ යුතුකම් පිළිබඳ වාර්තාවක් සෑම අවුරුද්දක ම , නියම කරනු ලැබිය හැකි කාලවල දී හා නියම කරනු ලැබිය හැකි ආකාරයට කොමසාරිස් වෙත යැවිය යුතු ය.

(8) යම් කර්මාන්තශාලාවක් සඳහා බලයලත් කර්මාන්තශාලා වෛද්‍යවරයකු නොමැති නම් හා නොමැති තාක් කල් , එම කර්මාන්තශාලාව පිහිටා ඇති දිස්ත්‍රික්කය සඳහා පත් කරන ලද දිස්ත්‍රික් වෛද්‍ය නිලධරයා එම කර්මාන්තශාලාව සඳහා බලයලත් කර්මාන්තශාලා වෛද්‍යවරයා වශයෙන් කටයුතු කළ යුතුය.

(9) මේ ආඥාපනත යටතේ තම යුතුකම් ඉටුකිරීම වෙනුවෙන් බලයලත් කර්මාන්තශාලා වෛද්‍යවරුන්ට ගෙවිය යුතු ගාස්තු, එම ගාස්තු යෞවනයකු කර්මාන්තශාලාවක සේවයේ යෙදවීම සඳහා වූ යෝග්‍යතාවය පිළිබඳව වූ පරීක්ෂණයකට හෝ සහතිකයකට හෝ කර්මාන්තශාලාවක සේවයේ යෙදී සිටින තැනැත්තන්ගේ මේ ආඥාපනත යටතේ වූ නියෝග හෝ ආඥාවක් අනුව කරනු ලබන යම් පරීක්ෂණයකට හෝ වෛද්‍ය අධීක්ෂණයකට අදාළ වන තාක් දුරට එම කර්මාන්තශාලාවේ පදිංචිකරු විසින් ගෙවනු ලැබිය යුතු අතර වෙනත් කවර හෝ අවස්ථාවක දී නම් ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය. තවද කර්මාන්තශාලාවක පදිංචිකරු විසින් ගෙවිය යුතු ගාස්තු සම්බන්ධයෙන් පදිංචිකරු හා බලයලත් කර්මාන්තශාලා වෛද්‍යවරයා හා

අතර ඇති කරගත් යම් එකඟවීමකට යටත්ව, එම ගාස්තු අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග මගින් නියම කරනු ලැබිය හැකි ප්‍රමාණයක් විය යුතුය.

105. මේ ආඥාපනතින් නියම කිරීමට ප්‍රකාශ කරනු ලැබූ හෝ වුවමනා වූ හෝ සියලු කරුණු සම්බන්ධයෙන් හා මේ ආඥාපනතින් නියෝග හෝ විශේෂ නියෝග පැනවීමට වුවමනා වූ හෝ බලය දෙනු ලැබූ සියලුම කරුණු සම්බන්ධයෙන් නියෝග ද , මේ ආඥාපනතෙහි විධිවිධාන හෝ එහි ප්‍රතිපත්ති ක්‍රියාවේ යෙදවීම සඳහා ඇමතිවරයාට අවශ්‍ය ය යි හැඟෙන වෙනත් නියෝග ඇමතිවරයා විසින් පැනවිය හැකිය. නියෝග

(2) ඇමතිවරයා විසින් පනවනු ලැබූ කිසිම නියෝගයක් නියෝජිත මන්ත්‍රී මණ්ඩලය හා උත්තර මන්ත්‍රී මණ්ඩලය විසින් අනුමත කරන තෙක් ද , ඒ අනුමත කිරීමේ නිවේදනය ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරන තෙක් ද වලංගු නොවිය යුතු ය.

(3) ඇමතිවරයා විසින් පනවනු ලැබ, නියෝජිත මන්ත්‍රී මණ්ඩලය හා උත්තර මන්ත්‍රී මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ සෑම නියෝගයක් ම ඒ අනුමතියේ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළවීමෙන් පසු , මෙහි පනවන ලද්දක් සේ ම වලංගු ව බල පැවැත්විය යුතු ය.

## XII වෙනි කොටස

106 සහ 107 වගන්ති 1976 අංක 12 දරන පනතේ 48 වන වගන්තිය මගින් ඉවත් කර ඇත.

## XIII වෙනි කොටස

## අතිරේක

### වැරදි, දඬුවම් හා නීති කෘත්‍ය

108. (1) කර්මාන්ත ශාලාවක හෝ එය සම්බන්ධයෙන්, හෝ මේ ආඥාපනතෙහි විධිවිධාන හෝ යම් නියෝගයක, පනවනු ලැබූ ආඥාවක හෝ එය යටතේ නිකුත් කරනු ලැබූ නියමයක හෝ විධිවිධාන කඩ කිරීමක් වුවහොත් එය සම්බන්ධයෙන් පදිංචිකාරයා හෝ ( මේ ආඥාපනතින් හෝ මේ ආඥාපනත යටතේ හෝ අයිතිකාරයා වගකිවයුතු කඩ කිරීමක් නම්) කර්මාන්ත ශාලාවෙහි අයිතිකාරයා හෝ මින් මතු මේ ආඥාපනතෙහි සඳහන් කරුණුවලට යටත් ව , වරදකට වරදකාරයකු විය යුතු ය.

(2) සේවයෙහි යෙදී සිටින තැනැත්තන්ගේ යුතුකම් සම්බන්ධයෙන් වූ X වෙනි කොටසෙහි විධිවිධාන, සේවයෙහි යෙදී සිටින තැනැත්තකු කඩ කරනු ලැබූ අවස්ථාවක දී හෝ තමා වෙත පැහැදිලි ව ම යුතුකමක් පැවරෙන මේ ආඥාපනත යටතේ පනවනු ලැබූ නියෝගයක් හෝ ආඥාවක් යමකු විසින් කඩ කරනු ලැබූ අවස්ථාවක දී හෝ , ඒ තැනැත්තා වරදකට වරදකාරයකු විය යුතු ය.

(3) මේ ආඥාපනතින් හෝ මේ ආඥාපනත යටතේ ඉඩ හරිනු ලැබූ විශේෂ ව්‍යතිරේකයකින් හෝ කර්මාන්ත ශාලාවේ පදිංචිකාරයා ප්‍රයෝජන ගත් අවස්ථාවක දී , ඒ ව්‍යතිරේකයට සම්බන්ධ වූ යම් කොන්දේසියක් ඉෂ්ට කිරීම පැහැර හැරියේ නම් , මේ ආඥාපනතෙහි විධිවිධාන ඔහු කඩ කළ ලෙස සැලකිය යුතු ය.

(4) මේ ආඥාපනතෙහි හෝ මේ ආඥාපනත යටතේ පනවනු ලැබූ යම් නියෝගයක හෝ ආඥාවක හෝ විධිවිධාන ප්‍රකාර හැර අන් ලෙසකට යම් තැනැත්තන් කර්මාන්ත ශාලාවෙහි සේවයට ගතහොත් ,

එසේ සේවයට ගනු ලැබූ එක් එක් තැනැත්තා පිළිබඳ ව කඩ කිරීමක් සිදු වූ ලෙස සැලකිය යුතු ය.

(5) මේ ආඥාපනත යටතේ වෙළෙඳ සමාගමක් විසින් සිදු කරනු ලැබූ වරදක් ඒ වෙළඳ සමාගමෙහි අධ්‍යක්ෂකගේ, කළමනාකාරයාගේ, ලේකම්ගේ හෝ වෙනත් නිලධාරියකුගේ කැමැත්ත හෝ අනුදැන්ම ඇති ව සිදු වූ බව නැතහොත් ඒ වරද කිරීම පහසු වූයේ ඒ නිලධාරියකුගේ නො සැලකිල්ල නිසා බව හෝ ඔප්පු කළ අවස්ථාවක දී, ඒ නිලධාරියා ද, වෙළෙඳ සමාගම ද වරදකට වරදකාරයන් ව නඩු පවරනු ලැබීමේ දී දඬුවම් කරනු ලැබීමට යටත් විය යුතු ය.

109. (1) මෙහි මින් මතු විධිවිධාන සලසා ඇති ආකාරයට යටත් ව කිසිම ප්‍රකාශිත දණ්ඩනයක් නියම කර නොමැති මේ ආඥාපනත යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් වරදකරු වන යම් තැනැත්තකු --

1998 අංක 18 පනත 16 වගන්තිය

ප්‍රකාශිත දණ්ඩනයක් සඳහා විධිවිධාන සලසා නොමැති වැරදි සම්බන්ධයෙන් දඩ මුදල්.

(අ) පළමුවරට සිදුකරන ලද වරදක් සම්බන්ධයෙන් වන විට, රුපියල් පන්දහසකට අඩු නොවන දඩයකට ;

(ආ) ( (2) වන උප වගන්තියේ සඳහන් දිගට ම සිදු කරගෙන යනු ලබන වරදක් සම්බන්ධයෙන් වන වරදක් නොවන ) දෙවන වරට සිදු කරන ලද වරදක් සම්බන්ධයෙන් වන විට, රුපියල් පන්දහසකට අඩු නොවන, එහෙත් රුපියල් දොළොස් දහස් පන්සියයක් නොඉක්මවන දඩයකට ;

(ඇ) ( (2) වන උප වගන්තියේ සඳහන් දිගට ම සිදු කරගෙන යනු ලබන වරදක් සම්බන්ධයෙන් වන වරදක් නොවන ) තුන්වන වරට හෝ තදනන්තරව සිදු කරන ලද වරදක් සම්බන්ධයෙන් වන විට , රුපියල් දොළොස් දහස් පන්සියයක් ඉක්මවන එහෙත් රුපියල් විසිපන් දහසක් නොඉක්මවන දඩයකට ;

යටත් විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් වරදකට වරදකරු කරනු ලැබ, දඬුවම් කරනු ලැබූ යම් තැනැත්තකු, ඔහු එසේ වරදකරු කරනු ලැබ දඬුවම් කරනු ලැබුවේ යම් කඩ කිරීමක් සම්බන්ධයෙන් ද ඒ කඩ කිරීම දිගට ම කරගෙන යනු ලබන අවස්ථාවක, ඔහු (110 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව ) තවදුරටත් වූ වරදකට වරදකරු වන අතර, ඒ සම්බන්ධයෙන් ඒ ඩ කිරීම දිගට ම සිදු කරගෙන යනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතුය.

110. මේ ආඥාපනත යටතේ වරදකට, කර්මාන්තශාලාවක පදිංචිකාරයා හෝ අයිතිකාරයා වරදකාරයකු වූ විට දඩයක් ගැසීමට අතිරේක ව හෝ ඒ වෙනුවට ආඥාවෙහි සඳහන් කාලය ඇතුළත ඒ කඩ කිරීමට හේතුවුණු කරුණු පිළිබඳ ව සඳහන් කරනු ලැබූ ආකාරයට ප්‍රතිකර්ම යෙදීමට ඔහුට අධිකරණය විසින් නියම කළ හැකි ය . තවද, ඉල්ලුම් කළ විටක දී කාලය දීර්ඝ කළ හැකිය . එබඳු ආඥාවක් කළ කල්හි, අධිකරණය විසින් ඉඩ හරිනු ලැබූ කාලය තුළ ඒ කඩ කිරීම දිගට ම ගෙන යාම සම්බන්ධයෙන් පදිංචිකාරයා හෝ අයිතිකාරයා හෝ යටත් නොවිය යුතු ය . එහෙත් මුලින් සඳහන් කාලය හෝ පසුව ආඥාවෙන් දීර්ඝ කරනු ලැබූ කාලය හෝ ඉකුත් වීමෙන් පසු , ඒ ආඥාව පරිදි ක්‍රියා නො කළහොත්, එසේ ක්‍රියා නොකරන එක් එක් දවස සම්බන්ධයෙන්

1998 අංක 18 පනත 17 වගන්තිය

කඩ කිරීමේ හේතුව සඳහා ප්‍රතිකර්ම යෙදීමට නියම කිරීමට අධිකරණයට ඇති බලය.

රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට , පදිංචිකාරයා හෝ අයිතිකාරයා අවස්ථානුකූල ව යටත් විය යුතු ය.

111. කර්මාන්ත ශාලාවක පදිංචිකාරයා හෝ අයිතිකාරයා හෝ විසින්, මේ ආඥාපනතින් හෝ මේ ආඥාපනත යටතේ පනවනු ලැබූ නියෝගයක් හෝ ආඥාවක හෝ විධිවිධානයක් කඩ කරනු ලැබූ නිසා යම් තැනැත්තකු මරණයට පත් වූයේ නම් හෝ මිය ගියේ නම් හෝ කායික තුවාළයකින් පීඩාවට පත් වූයේ නම් හෝ වෙනත් දඬුවමකට හානියක් නොවන පරිදි ඒ තැනැත්තා රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය. අපරාධ නඩු විධාන සංග්‍රහයෙහි 253 ඇ හා 253 ඉ වගන්තිවල විධිවිධානවලට යටත් ව , තුවාළ ලැබූ තැනැත්තාගේ ප්‍රයෝජනයට හෝ ඔහුගේ පවුලෙහි ප්‍රයෝජනයට , ඇමතිවරයා විසින් පනවනු ලැබූ නියෝගවල නියමිත ආකාරයට ඒ මුළු දඩය ම හෝ ඉන් කොටසක් යෙදවිය හැකි ය.

1998 අංක 18 පනත 18 වගන්තිය

මරණය හෝ තුවාල සම්බන්ධයෙන් දඩ

එසේ ද වුවත් ---

(අ) සෞඛ්‍යයට හානියක් වූ අවස්ථාවක දී , ඒ හානිය, කඩ කිරීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් සිදු වූවක් නොවේ නම් , පදිංචිකාරයා හෝ අයිතිකාරයා මේ වගන්තිය යටතේ දඩයකට යටත් නොවිය යුතු ය.

(ආ) මරණය හො හානිය සිදුවූ ක්‍රියාව හෝ පැහැර හැරීම සම්බන්ධයෙන් පදිංචිකාරයාට හෝ අයිතිකාරයාට හෝ විරුද්ධ ව මේ ආඥාපනත යටතේ ඉදිරිපත් කරනු ලැබූ චෝදනාව ඒ මරණය හෝ හානිය සිදුවීමට පෙර, විභාග කොට නිශ්ප්‍රභ කරනු ලැබුවේ නම් , ඒ තැනැත්තා මේ වගන්තිය යටතේ දඩයකට යටත් නො විය යුතු ය.

112. මේ ආඥාපනතෙහි විධිවිධාන කඩ කිරීමෙන්, යම් කර්මාන්ත ශාලාවක බාල තැනැත්තකු සේවයට ගන්නා ලද්දේ නම් , ඒ තැනැත්තාගේ පියා හෝ මව වරදකට වරදකාරයකු ව රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය . ඒ කඩ කිරීම සිදුවූයේ පියාගේ හෝ මවගේ කැමැත්ත, අනුදැන්ම හෝ ඕනෑකමින් ම වූ පැහැර හැරිමක් හෝ නොමැති ව , බව අධිකරණයට පෙනී ගියහොත් කලින් කී පරිදි දඩයකට යටත් නොවිය යුතු ය.

1998 අංක 18 පනත 19 වගන්තිය

පියකුට හෝ මවකට වරදක් සඳහා දඩ.

113. යම් තැනැත්තකු විසින් පහත දැක්වෙන යමක් කරනු ලැබුව හොත්, මේ ආඥාපනත යටතේ ඔහු වරදකට වරදකාරයකු ව ,වෙනත් දඬුවමකට හානියක් නොමැති ව , රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ යටත් විය යුතු ය.

1998 අංක 18 පනත 20 වගන්තිය

අසත්‍ය සහතික, අසත්‍ය සටහන් හා අසත්‍ය ප්‍රකාශ.

එනම් ---

(අ) මේ ආඥාපනතින් හෝ මේ ආඥාපනත යටතේ පනවනු ලැබූ ආඥාවකින් හෝ නියෝගයකින් හෝ ඉන් යමක් යටතේ හෝ ඉන් යමක කාර්යය සඳහා හෝ වුවමනා වූ සහතිකයක්, වංක ලෙස හෝ කූට ලෙස හෝ සෑදීම ;

(ආ) යම් අවශ්‍ය කරුණක් අසත්‍ය බව දැන දැන ම ඒ සහතිකය දීම හෝ අත්සන් කිරීම ;

(ඇ) වංක ලෙස, කූට ලෙස හෝ අසත්‍ය ලෙස සාදනු ලැබූ සහතිකයක් දැනුවත් ව ම ප්‍රචාරය කිරීම හෝ ප්‍රයෝජනයට ගැනීම ;

(ඈ) කෙනකුට අදාළ නො වන නමුත් ඔහුට අදාළ වන සේ එබඳු සහතිකයක් ප්‍රචාරය කිරීම හෝ ප්‍රයෝජනයට ගැනීම ;

(ඉ) ඒ සහතිකයෙහි නම් කරනු ලැබූ තැනැත්තා වෙනුවට පෙනී සිටීම ;

(ඊ) පරීක්ෂකයකු ය යි අසත්‍ය ලෙස දක්වා සිටීම ;

(උ) එබඳු වංක ලෙස ක්‍රියා කිරීමට , කූට ලෙස ක්‍රියා කිරීමකට, දීමකට, අත්සන් කිරීමකට, ප්‍රචාරය කිරීමකට, ප්‍රයෝජන ගැනීමකට, පෙනී සිටීමකට, අසත්‍ය දැන්වීමකට, අනුබල දීම ;

(ඌ) මේ ආඥාපනතින් හෝ මේ ආඥාපනත යටතේ පනවනු ලැබූ ආඥාවකින් හෝ නියෝගයකින් හෝ ඉන් යමක් යටතේ හෝ ඉන් යමක කාර්යය සඳහා හෝ, තැබිය යුතු ලෙස, භාර කළ යුතු ලෙස හෝ ගෙවිය යුතු ලෙස නියම වූ යම් ලේඛන පොතක, දැන්වීමක, සහතිකයක හෝ ලේඛනයක ඕනෑකමින් අසත්‍ය සටහන් කිරීම ;

(එ) මේ ආඥාපනතින් හෝ මේ ආඥාපනත යටතේ පනවනු ලැබූ ආඥාවකින් හෝ නියෝගයකින් හෝ ඉන් යමක් යටතේ හෝ ඉන් යමක කාර්යය සඳහා හෝ වුවමනා වූ විට, ඕනෑකමින් ම අසත්‍ය ප්‍රකාශයන් සෑදීම හෝ එබඳු අසත්‍ය ප්‍රකාශයක අත්සන් තැබීම ; හා

(ඒ) එබඳු අසත්‍ය සටහනකින් හෝ ප්‍රකාශයකින් දැනුවත් ව ම ප්‍රයෝජන ගැනීම ද වේ.

පදිංචිකාරයා යටත් වන වැරදි නියම වශයෙන් ම කරනු ලබන තැනැත්තන් දඬුවම් කිරීම.

114. පදිංචිකාරයකු හෝ අයිතිකාරයකු මේ ආඥාපනත යටතේ යටත් විය යුතු යම් ක්‍රියාවක් හෝ පැහැර හැරීමක් ඇත්ත වශයෙන් ම නියෝජිතයකුගේ, කම්කරුවකුගේ හෝ වෙනත් තැනැත්තකුගේ ක්‍රියාවක් හෝ පැහැර හැරීමක් හෝ වෙයි නම් , ඒ නියෝජිතයා, සේවකයා, කම්කරුවා, හෝ වෙනත් තැනැත්තා වරදකට වරදකාරයකු ව, ඔහු පදිංචිකාරයා හෝ අයිතිකාරයා මෙන් ම , එක හා සමාන දඩයකට යටත් විය යුතු ය.

නියම වරදකරු වරදකාරයා කිරීමෙන් පසු, යටත්වීමෙන් නිදහස් වීමට පදිංචිකාරයාට හෝ අයිතිකාරයාට ඇති බලය.

115. (1) කර්මාන්ත ශාලාවක පදිංචිකාරයකු හෝ අයිතිකාරයකු මේ ආඥාපනත යටතේ වරදකින් චෝදනා කරනු ලැබූ විට , ඔහු විසින් යථා පරිදි කරනු ලැබූ චෝදනාවක් උඩ , තම අදහස තුන් දවසකට නො අඩු කාලයකට කලින් ලියවිල්ලකින් දැනුම් දීමෙන් පසු , ඔහු විසින් නියම වරදකරු යයි චෝදනා කරනු ලබන තැනැත්තා, චෝදනාව විභාග කිරීමට නියමිත දිනයෙහි, අධිකරණය ඉදිරියට ගෙන ඒමට, ඒ පදිංචිකාරයාට හෝ අයිතිකාරයාට බලය ඇති විය යුතු ය. තවද ඔහු වරද කළ බැව් ඔප්පු කිරීමෙන් පසු , අධිකරණයට ඒත්තු යන පරිදි පහත දැක්වෙන කරුණු පදිංචිකාරයා හෝ අයිතිකාරයා විසින් ඔප්පු කළහොත් , දෙවනු කී තැනැත්තා ලසු නඩු විභාගයකින් පසු ඒ වරදට වරදකාරයා විය යුතු ය . තවද පදිංචිකාරයා හෝ අයිතිකාරයා ඒ වරදට වරදකාරයා නො විය යුතුය.

ඒ කරුණු නම් --

(අ) පදිංචිකාරයා හෝ අයිතිකාරයා මේ ආඥාපනත හා එය යටතේ පනවනු ලැබූ, අදාළවන ආඥාවක් හෝ

නියෝගයක් ක්‍රියාවෙහි යෙදවීම සඳහා නිසි සම්පූර්ණ උද්‍යොගය යෙද වූ බව ද ;

(ආ) ඔහුගේ කැමැත්ත, අනුදැන්ම හෝ ඕනෑකමින් ම වූ පැහැර හැරීමක් හෝ නොමැති ව ඒ දෙවනු කී තැනැත්තා ඒ වරද කළ බව ද වේ.

පදිංචිකාරයා හෝ අයිතිකාරයා සාක්ෂි දෙන්නේ නම් ඔහුගෙන් ද, ඔහුගේ චෝදනාව සනාථ කිරීම සඳහා කැඳවනු ලැබූ සාක්ෂිකරුවන්ගෙන් ද හරස් උත්තර ඇසීමට පැමිණිලි පක්ෂයට බලය ඇති විය යුතු ය. එසේ ම ප්‍රත්‍යුත්තර දීම සඳහා වෙනත් සාක්ෂි කැඳවීමට ද බලය ඇති විය යුතු ය.

(2) වරදක් සොයා ගන්නා වේලෙහි, පරීක්ෂකයකුට ඒත්තු යන පරිදි පහත දැක්වෙන කරුණු අවබෝධ කළහොත් , පළමු කොට කර්මාන්ත ශාලාවේ පදිංචිකාරයාට හෝ අයිතිකාරයාට හෝ විරුද්ධ ව නඩු නොපවරා නියම වරදකරු ය යි තමා විශ්වාස කරන හෝ තමාට සඳහන් කර දෙනු ලබන තැනැත්තාට විරුද්ධ ව , පරීක්ෂක විසින් නඩු පැවරිය යුතු ය. ඒ කරුණු නම් :-

(අ) කර්මාන්ත ශාලාවේ පදිංචිකාරයා හෝ අයිතිකාරයා, ඒ ඒ අවස්ථාව පරිදි, මේ ආඥාපනත ක්‍රියාවේ යෙදීමට සම්පූර්ණ නිසි උද්‍යොගය යෙදවූ බව ද ;

(ආ) වෙනත් සඳහන් කරනු ලැබූ තැනැත්තකු විසින් වරද කළ බව ද ;

(ඇ) පදිංචිකාරයාගේ හෝ අයිතිකාරයාගේ කැමැත්ත , අනු දැන්ම හෝ ඕනෑකමින් ම වූ පැහැර හැරීමක් හෝ නොමැතිව ද , තමාගේ නියමවලට විරුද්ධ ව ද ඒ වරද කරනු ලැබූ බව ද වේ.

116. මේ ආඥාපනතෙහි යම් විධිවිධාන සම්බන්දයෙන් පදිංචිකාරයා හෝ අයිතිකාරයා හෝ වෙනුවට මේ ආඥාපනත යටතේ වෙනත් තැනැත්තකු පත් කර ගනු ලැබූ අවස්ථාවක දී, ඒ විධිවිධානවල කාර්යය සඳහා, මේ ආඥාපනතින් හෝ මේ ආඥාපනත යටතේ භාර කිරීමට හෝ ඒ සම්බන්ධයෙන් ගැනීමට නියම කරනු ලැබූ නැතහොත් බලය දෙනු ලැබූ යම් ආඥාවක්, සිතාසියක්, දැන්වීමක් හෝ නීති කෘත්‍යයක් ඒ තැනැත්තා වෙත භාර කරවීමට හෝ ඔහු සම්බන්ධයෙන් ගැනීමට හෝ අවස්ථාවේ අන්දමට මෙයින් නියම කරනු ලැබේ නැතහොත් මෙයින් බලය දෙනු ලැබේ.

*පදිංචිකාරයන් හෝ අයිතිකාරයන් නොවූ වෙනත් තැනැත්තන්ට විරුද්ධ ව පවරනු ලබන නීති කෘත්‍ය.*

117. කර්මාන්ත ශාලාවක යන්ත්‍රයක් හෝ යාන්ත්‍රික බලයෙන් ක්‍රියා කරවනු ලබන උපකරණයක අයිතිකාරයා නැතහොත් කුලියට ගන්නා , කර්මාන්ත ශාලාවේ පදිංචිකාරයා නොව වෙනත් තැනැත්තකු වූ අවස්ථාවක දී , ඒ යන්ත්‍රය හෝ උපකරණය ගැන හෝ සම්බන්ධයෙන් හෝ සේවයෙහි යෙදී සිටින තැනැත්තකු වූ ද, ඒ අයිතිකාරයාගේ හෝ කුලියට ගන්නාගේ සේවයෙහි යෙදී සිටින්නා වූ ද නැතහොත් එබන්දකු විසින් පඩි ගෙවන්නා වූ ද තැනැත්තකු පිළිබඳ ව මේ ආඥාපනත යටතේ වරදක් සිදු වූ විට , ඒ අයිතිකාරයා හෝ කුලියට ගන්නා එම කර්මාන්ත ශාලාවේ පදිංචිකාරයා ලෙස සැලකිය යුතු ය.

*පදිංචිකාරයා වෙනුවට, සමහර අවස්ථාවලදී යන්ත්‍රය අයිතිකාරයා යටත් විය යුතු බව.*

118. (1) මේ ආඥපනත යටතේ සියලු ම වැරදි සුළු අපරාධ විනිශ්චයකාරවරයකු විසින් සංක්ෂේප ක්‍රමයට විභාග කළ යුතු ය.

*වැරදිවලට නඩු පැවරීම, දඩ අය කරගැනීම හා ඒවා යෙදීම.*

(2) මේ ආඥාපනත යටතේ පවත්වනු ලබන නීති කෘත්‍යයක දී, පැමිණිලි පත්‍රයෙහි හෝ චෝදනා පත්‍රයෙහි මේ ආඥාපනතෙහි දී තිබෙන අර්ථය ඇතුළත, කර්මාන්ත ශාලාව කර්මාන්ත ශාලාවක්බව කියා සිටීම ද, දැනගන්නට හැකි, කර්මාන්ත ශාලාවේ පදිංචිකාරයාගේ නම නැතහොත් පදිංචිකාරයා වෙළෙඳ සමාගමක් නම් , ඒ වෙළඳ සමාගමේ නම සඳහන් කිරීම ද ප්‍රමාණවත් විය යුතු ය.

(3) කර්මාන්ත ශාලාවක හදිසි අනතුරක් සම්බන්ධයෙන් හෝ නිසා හෝ මේ ආඥාපනත යටතේ ක්‍රමානුකූල පරීක්ෂණයක් පැවැත්වීම සඳහා පත් කරනු ලැබූ තැනැත්තකු හෝ තැනැත්තන් විසින් වාර්තාවක් ඉදිරිපත් කළ විට හෝ අපරාධ නඩු විධාන සංග්‍රහයෙහි XII වෙනි පරිච්ඡේදය යටතේ පරීක්ෂණයක් පවත්වනු ලැබූ විට හෝ ඒ වාර්තාවෙහි හෝ පරීක්ෂණයේ කෘත්‍යවලින් හෝ මේ ආඥා යම් විධිවිධාන හෝ එය යටතේ පනවනු ලැබූ ආඥා හෝ නියෝග හදිසි අනතුර සිදුවීමේ දී හෝ ඊට පෙර ඉෂ්ට කරනු නො ලැබූ බව පෙනී ගිය අවස්ථාවක දී , ඒ ඉෂ්ට නො කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු තැනැත්තකුට විරුද්ධ ව , ඒ වාර්තාව ඉදිරිපත් කිරීම හෝ ඒ පරීක්ෂණය අවසන් කිරීමට හෝ පසු ව තුන් මාසයක් ඇතුළත දී, නීති කෘත්‍ය ආරම්භ කිරීම හෝ කළ හැකි ය.

(4) මේ ආඥාපනතෙහි හෝ මේ ආඥාපනත යටතේ පනවනු ලැබූ නියෝගයක හෝ ආඥාවක හෝ සඳහන් කාලයක දී හෝ කාලයක් ඇතුළත පරීක්ෂණයක් කිරීම, වාර්තාවක් සැපයීම හෝ වෙනත් ක්‍රියාවක් කිරීම හෝ පැහැර හැරීමෙන් මේ ආඥාපනත යටතේ වරදක් කරනු ලැබූ විට, ඒ පරීක්ෂණය කරන තෙක් හෝ ඒ වාර්තාව සපයන තෙක් හෝ ඒ ක්‍රියාව කරන තෙක් හෝ වරද කරමින් පවත්නා ලෙස සැලකිය යුතු ය.

(5) මේ ආඥාපනතෙහි වෙනත් ආකාරයකට පැහැදිලි ලෙස සඳහන් කොට නොමැති අවස්ථාවල දී , මේ ආඥාපනත යටතේ නියම කරනු ලැබූ ද, අය කර ගනු ලැබූ ද සියලු දඩ මුදල් පොදු අරමුදලට ගෙවිය යුතු ය.

සාක්ෂි පිළිබඳ ව විශේෂ විධිවිධාන.

119. (1) ආහාර ගැනීම හෝ විශ්‍රාමය සඳහා හෝ ඉඩ හරිනු ලැබූ අන්තර කාලයක් ඇතුළත නො වන, වැඩ කරගන යන නැතහොත් යන්ත්‍ර ක්‍රියාකාරී ව පවත්නා ඕනෑ ම වේලාවක දී , යම් තැනැත්තකු කර්මාන්ත ශාලාවෙහි දී දකිනන්ට ලැබුවහොත්, මේ ආඥාපනතෙහි කාර්යය සඳහා, ඊට විරුද්ධ ව කරුණු ඔප්පු කරන තෙක්, ඔහු එම කර්මාන්ත ශාලාවෙහි එවේලෙහි සේවයෙහි යෙදී සිටියකු ලෙස සැලකිය යුතු ය.

(2) මේ ආඥාපනත යටතේ වූ නීති කෘත්‍යයක දී , යම් බාල තැනැත්තකු සම්බන්ධයෙන් දැනුම් දෙන්නා කියන පරිදි ඔහුගේ වයස , සම්පූර්ණ බව හෝ වයස අඩු බව හෝ අධිකරණයට පෙනී ගියහොත්, ඒ බාල තැනැත්තාගේ වයස සම්පූර්ණ බව හෝ වයස අඩු බව හෝ ඔප්පු කිරීම විත්තිකරු වෙත භාර විය යුතු ය.

(3) සාමාන්‍ය ලේඛන පොතෙහි හෝ වෙනත් ලේඛන පොතක හෝ වාර්තාවක හෝ යම් සටහනක් කිරීමට මේ ආඥාපනතින් හෝ මේ ආඥාපනත යටතේ පනවනු ලැබූ යම් ආඥාවකින් හෝ නියෝගයකින් හෝ නියම කරනු ලැබූ අවස්ථාවක දී, කර්මාන්ත ශාලාවක පදිංචිකාරයා විසින් හෝ ඔහු වෙනුවට හෝ කරනු ලැබූ සටහන , එහි සඳහන් කරුණු පිළිබඳ ව , ඔහුට විරුද්ධ වූ සාක්ෂියක් වශයෙන් පිළිගත යුතු ය . මේ ආඥාපනතෙහි හෝ මේ ආඥාපනත යටතේ පනවනු ලැබූ ආඥාවක හෝ

නියෝගයක විධිවිධාන පිළිපැදීම් සම්බන්ධයෙන් වුවමනා වූ යම් සටහනක් කරනු නො ලරබීමේ කරුණ ඒ විධිවිධාන පිළී නො පැදීමේ සාක්ෂියක් වශයෙන් පිළිගත යුතු ය.

(4) 27 වන, 28 වන, 29 වන, 34 වන, 35 වන, 36 වන, 36 අ වන, 38 වන හෝ 42 අ වන වගන්තියෙන් නියමිත යම් පරීක්ෂණයක් ඒ වගන්තියේ විධිවිධානවලට අනුකූලව පවත්වා ඇති බව ඔප්පු කිරීමේ භාරය කර්මාන්තශාලාවේ පදිංචිකරු වෙත පැවරෙන්නේය. 1976 අංක 12, 50

120. (1) මේ ආඥාපනත යටතේ භාර කරවීමට වුවමනා වූ නැතහොත් බලය දෙනු ලැබූ යම් සිතාසියක් හෝ ආඥාවක් හෝ ඇතුලුව යම් ලේඛනයක් පහත දැක්වෙන පරිදි භාර කළ හැකි ය. ලේඛන ආදිය භාර කරවීම හා යැවීම.

එනම් ---

(අ) යම් තැනැත්තකුට නම් ඔහුට භාර දීමෙන් ද, එය ඔහුගේ වාසස්ථානයෙහි තැබීමෙන් හෝ එතැනට තැපැලෙන් යැවීමෙන් ද ;

(ආ) යම් වෙළඳ සමාගමකට නම්, වෙළඳ සමාගමේ හවුල් කාරයකුට භාර දීමෙන් හෝ සමාගමේ කාර්යාලයේ එය තැබීමෙන් හෝ එතැනට එය තැපැලෙන් යැවීමෙන් ද;

(ඇ) (1938 අංක 51 දරන වෙළෙඳ සමාගම් ආඥාපනත අදාළ වන වෙළඳ සමාගමක් වූ , යම් අයිතිකාරයකුට හෝ පදිංචිකාරයකුට ඇතුලුව ) කර්මාන්ත ශාලාවක අයිතිකාරයාට හෝ පදිංචිකාරයාට හෝ නම් ඉහත කියන ලද පරිදි හෝ පෙනෙන ආකාරයට වයස අවුරුදු දහසයකට අඩු නො වන තැනැත්තකුට එය හෝ එහි සැබෑ පිටපතක් කර්මාන්ත ශාලාවෙහි දී භාර දීමෙන් ද වේ.

(2) කර්මාන්ත ශාලාවක පදිංචිකාරයකු වෙත භාර කරවීමේ කාර්යය සඳහා එබඳු ලේඛනයක වෙනත් වැඩිපුර නමක් හෝ විස්තරයක් නොමැති ව , කර්මාන්ත ශාලාවේ නියම තැපැල් ලිපිනය සහිත ව , ‘‘පදිංචිකාරයා’’ වෙතය යන්න ලියා, යැවිය හැකි ය.

(3) යම් තැනැත්තකුට වෙළෙඳ සමාගමකට, අයිතිකාරයකුට හෝ පදිංචිකාරයකුට මේ ආඥාපනත යටතේ යැවීමට වුවමනා වූ හෝ බලය දෙනු ලැබූ ලේඛනවලට ද, ඒ ලේඛන යැවීම්, ලිපිනය ලිවීම හා භාර කරවීම සඳහා ද මේ වගන්තියේ ඉහත සඳහන් විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

121. 1976 අංක 12 දරන පනතේ 51 වන වගන්තිය මගින් ඉවත් කර ඇත.

122. අයිතිකාරයා අතර ද ඒ ස්ථානය සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසක් කර්මාන්ත ශාලාවක් සඳහා බදු ගනු ලැබූ පදිංචිකාරයා අතර ද ඇති කර ගත් ගිවිසුමක් නිසා , මේ ආඥාපනතින් හෝ මේ ආඥාපනත යටතේ පනවනු ලැබූ යම් නියෝගයක හෝ ආඥාවක හෝ විධිවිධාන ඉෂ්ට කිරීම සඳහා හෝ මේ ආඥාපනතින් හෝ මේ ආඥාපනත යටතේ හෝ නියම කරනු ලැබූ සම්මතයකට හෝ නියමයකට අනුකූල කිරීම සඳහා හෝ අවශ්‍ය ඒ ස්ථානයේ ආකෘතිජ හෝ වෙනත් වෙනස්කම් කිරීම ඒ අයිතිකාරයාට හෝ පදිංචිකාරයාට වැළැක්වුණු අවස්ථාවක දී , ඒ තැනැත්තා විසින්, ඒ ස්ථානය පිහිටි ප්‍රදේශයේ අධිකරණ බලය ඇති ප්‍රදේශ අධිකරණයෙන් පෙත්සමක මාර්ගයෙන් ඉල්ලීමක් කළ හැකි ය . ගිවිසුම වෙනස් කිරීමට ප්‍රදේශ අධිකරණයට ඇති බලය.

පාර්ශ්වකාරයන් ද, ඔවුන් විසින් කැඳවනු ලබන සාක්ෂිකරුවන් ද විභාග කිරීමෙන් පසු, කරුණු අනුව අධිකරණයට සාධාරණ ය යි හැගෙන පරිදි, ගිවිසුමෙහි නියමයක් අවලංගු කරමින් හෝ වෙනස් කරමින් අධිකරණය විසින් ආඥාවක් කළ හැකි ය.

123. යම් ස්ථානයක් සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසක් හෝ කර්මාන්ත ශාලාවක් සඳහා බදු දී ඇති අවස්ථාවක දී, මේ ආඥාපනතින් හෝ මේ ආඥාපනත යටතේ හෝ නියම කරනු ලැබූ සම්මතයකට හෝ නියමයකට අනුකූල කිරීම සඳහා හෝ ආකෘතිජ හෝ වෙනත් වෙනස් කිරීම් හෝ වුවමනා වූ විට ඒ වෙනස් කිරීම්වල සම්පූර්ණ වියදම හෝ ඉන් කොටසක් අයිතිකාරයා හෝ පදිංචිකාරයා හෝ විසින්, ඒ ඒ අවස්ථාවල පරිදි, දැරිය යුතු ය යි කියා සිටියහොත්, ඒ ස්ථානය පිහිටි ප්‍රදේශයේ අධිකරණ බලය හිමි , ප්‍රදේශ අධිකරණය වෙතින් , ඒ තැනැත්තකුට පෙත්සමක මාර්ගයෙන් ඉල්ලීමක් කළ හැකි ය. පාර්ශවකාරයන් ද, ඔවුන් විසින් කැඳවනු ලබන සාක්ෂිකරුවන් ද විභාග කිරීමෙන් පසු කරුණු අනුව, අධිකරණයට සාධාරණ ය යි හැගෙන පරිදි, වියදම් පිළිබඳ ව හෝ ඒවා බෙදීම පිළිබඳ ව හෝ පාර්ශවකාරයන් අතර ඇති කර ගත් ගිවිසුමක නියම ගැන ද සලකා බැලීමෙන් පසු , අධිකරණය විසින් යම් ආඥාවක් කළ හැකි ය. එසේත් නැතහොත් අයිතිකාරයාගේ හෝ පදිංචිකාරයාගේ ඉල්ලීම අනුව, බද්ද අධිකරණය විසින් අවසන් කළ හැකි ය.

වියදම් බෙදීමට ප්‍රදේශ අධිකරණයට ඇති බලය

## XIV වෙනි කොටස

### ආඥාපනත අදාළ කිරීම

124. මේ ආඥාපනතෙහි පැහැදිලිව ම වෙනත් ආකාරයකට සඳහන් කරනු නො ලැබූ විටක, මේ ආඥාපනතෙහි විධිවිධාන, මේ ආඥාපනතින් විස්තර කරනු ලැබූ කර්මාන්ත ශාලාවලට පමණක් අදාළ විය යුතු ය . එහෙත් විරුද්ධ අදහසක් නො හැගෙන අවස්ථාවල දී හැර ඒ විධිවිධාන එබඳු සියලු ම කර්මාන්ත ශාලාවලට අදාළ විය යුතු ය.

ආඥාපනත සාමාන්‍යයෙන් අදාළ කිරීම.

125. (1) මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයට යටත්ව, මේ ආඥාපනතේ විධිවිධාන, රජයට අයත් හෝ රජයේ පරිහරණය යටතේ පවත්නා කර්මාන්තශාලාවලට සහ රජය විසින් හෝ වෙනුවෙන් භාරගන්නා ලද ගොඩනැගිලි සහ වෙනත් ඉදිකිරීම් වැඩවලට අදාළ වන්නේය;

1976 අංක 12 පනත 52 වගන්තිය

රජයට අයත් කර්මාන්ත ශාලාවලට අදාළ කිරීම

එසේ වුවද රජය සම්බන්ධ වී ඇති යම් යුද්ධයක දී , රජයේ හමුදාවල පරිහරණය යටතේ ඇති යම් කර්මාන්තශාලාවකට හෝ රජයේ හමුදා විසින් භාරගෙන ඇති ගොඩනැගිලි හෝ වෙනත් ඉදිකිරීම් වැඩවලට ඒ විධිවිධාන අදාළ නොවන්නේය ;

එසේම තවදුරටත් අමාත්‍යවරයා විසින් , නියමයක් මගින්, සම්පූර්ණයෙන් ම හෝ නියමයේ නිශ්චය කරනු ලැබිය හැකි තාක් දුරට හෝ එසේ නිශ්චය කරනු ලැබිය හැකි කාල පරිච්ඡේදයක් සඳහා, රජයට අයත් යම් කර්මාන්තශාලාවක් හෝ රජය විසින් හෝ වෙනුවෙන් භාරගෙන ඇති යම් ගොඩනැගිලි හෝ ඉදිකිරීම් වැඩ හෝ රජය වෙනුවෙන් කරගෙන යනු ලබන වැඩ සම්බන්ධයෙන් යම් කර්මාන්තශාලාවක් මේ ආඥාපනතින් නිදහස් කරනු ලැබිය හැකිය.

(2) මේ වගන්තියෙහි, “ රජයේ හමුදා ” යන්නට ශ්‍රී ලංකා යුද හමුදාව සහ ශ්‍රී ලංකා නාවික හමුදාව සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාව ඇතුළත් වේ.

## XV වෙනි කොටස

## තේරුම් කර දීම හා සාමාන්‍යය තේරුම් කර දීම

126. (1) " කර්මාන්ත ශාලාව" යන පාඨයෙන් යම් ස්ථානයක හෝ එහි කොටු කරනු ලැබූ ස්ථානයක ඇතුළත හෝ ඊට සම්බන්ධ වූ ප්‍රදේශයක් ඇතුළත හෝ එහි මායිම් ඇතුළත හෝ හෝ පහත දැක්වෙන කාර්ය වලින් යමක් සඳහා හෝ ඊට අදාළ වූ හෝ යම් නිපදවීම් ක්‍රමයක අතින් කෙරෙන වැඩ පිණිස කම්කරුවන් සේවයෙහි යෙදී සිටින්නේ නම්, එබඳු ස්ථානයක් අදහස් කෙරෙයි.

" කර්මාන්ත ශාලාව" යන පාඨය තේරුම් කර දීම.

ඒ කාර්යය නම් ---

(අ) යම් භාණ්ඩයක් හෝ ඉන් කොටසක් සෑදීම ; හෝ

(ආ) යම් භාණ්ඩයක් වෙනස් කිරිම , අලුත්වැඩියා කිරිම , අලංකාර කිරීම, සම්පූර්ණ කිරීම , පිරිසිදු කිරිම හෝ සේදීම කැඩීම හෝ විනාශ කිරීම ; හෝ

(ඇ) විකිණීම සඳහා යම් භාණ්ඩයක් පිළියෙළ කිරීම ; හෝ

1976 අංක 12 පනත 53 වගන්තිය

(ඈ) ගවයන්, බැටළුවන්, ඌරන්, එළුවන්, අශ්වයන්, බූරුවන් හෝ කොටළුවන් ඝාතනය කිරිම ; හෝ

(ඉ) ඝාතනය සඳහා වෙනත් ස්ථානයකට ගෙන යනතුරු ඉහත කී සතුන් රඳවා තැබීම ;

එකී වෙනත් ස්ථානය, එය තුළ හෝ එහි කොටු කරනු ලැබූ හෝ ඊට සම්බන්ධ හෝ එහි මායිම් ඇතුළත ප්‍රදේශයක වෙළඳාම් පිණිස හෝ ලාභ ලැබීමේ කාර්යය සඳහා එම වැඩ කරගෙන යනු ලබන්නා වූ ද එහි සේවයේ යොදවනු ලබන තැනැත්තාගේ සේවායෝජකයාට එහි ඇතුළුවීමේ අයිතිය හෝ පාලනය ඇත්තා වූ ද ස්තානයක් විය යුතුය.

තවද ඉහත දැක්වුණු විස්තර කිරීම අනු ව, කර්මාන්ත ශාලා වූව ද, නුවූවද, " කර්මාන්ත ශාලාව " යන පාඨයට, අතින් වැඩ කිරීම සඳහා කම්කරුවන් යොදනු ලබන පහත සඳහන් ස්ථාන ද ඇතුළත් වෙයි.

එනම් ---

(i) නැව් හෝ යාත්‍රා තනන , නැවත තනන, අලුත්වැඩියා කරන, නැවත සවි කරන, සම්පූර්ණ කරන හෝ කඩන, (සීමාද ඇතුළත් වන ) අංගනයක් හෝ වියලි නෞකාශයක් ;

(ii) යම් කර්මාන්ත ශාලාවක ගෙන යන වැඩට මුල් පිරීමක් වශයෙන් හෝ එහි කාර්යාලවලට අදාළ වන හෝ යම් භාණ්ඩ තේරීමේ ව්‍යාපාරයක් ගෙන යන ස්ථානයක් ;

(iii) යම් කර්මාන්ත ශාලාවක කාර්යාලවලට අදාල වන ලෙස බෝතල හෝ භාජන සේදීමේ හෝ පිරවීමේ හෝ භාණ්ඩ ඇහිරීමේ ව්‍යාපාරයක් ගෙන යන ස්ථානයක් ;

(iv) නූල් හෝ රෙදි විවීම , ගෙතීම, නැමීම, සෑදීම හෝ ඇහිරීම හෝ ගෙන යන ස්ථානයක් ;

(v) වෙනත් ව්‍යාපාරයකට උපකාර වශයෙන් හෝ වෙනත් පොදු සංස්ථාවකට කාර්යාලවලට අදාළ වන සේ පවත්වා ගෙන යනු ලැබූ යම් රජක ස්ථානයක් ;

(vi) පීලිරිය හෝ වාහන නවත්වා තැබීමේ කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන්නා වූ ද පිරිසිදු කිරීම හෝ සේදීම පමණක් කරනු ලබන්නා වූ ස්ථානයක් නොවන්නා වූ ද පීලිරිය, වාහන හෝ ප්‍රවාහන කාර්යයන් සඳහා වූ වෙනත් යන්ත්‍ර තැනීම, නැවත සවි කිරීම, ස්නේහනය කිරීම හෝ අළුත් වැඩියා කිරීම කරගෙන යන්නා වූ යම් ස්ථානයක් ; 1976 අංක 12 පනත 53(ඇ) වගන්තිය

(vii) මුද්‍රිත අකුරු වලින් හෝ ශිලා මුද්‍රණයෙන් හෝ ඡායාරූප ක්‍රමයෙන් හෝ වෙනත් ක්‍රමයකින් හෝ මුද්‍රණ කර්මාන්තය ගෙන යන හෝ වෙළඳාමක් වශයෙන් හෝ ලාබ ලැබීමේ පරමාර්ථ සඳහා හෝ වෙනත් ව්‍යාපාරයකට උපකාර වශයෙන් හෝ පොත් බැඳීම පවත්වා ගෙන යන යම් ස්ථානයක් ;

(viii) පිළියෙළ කිරීම් හෝ අලුත්වැඩියා කිරීම් පමණක් සමහර විට කරනු ලබන නෘත්‍ය ශාලාවක වේදිකාවක් හෝ අඳින කාමරයක් හෝ නො වන , වෙළෙඳ ව්‍යාපාරයක් වශයෙන් හෝ ලාභ ලැබීමේ පරමාර්ථ පිට හෝ ගෙන යන චිත්‍රපට හෝ නෘත්‍යමය සංදර්ශන නිපදවීමට , ප්‍රදර්ශනයට හෝ ඉදිරිපත් කිරීමට අදාළ වූවක් ලෙස පැවැත්වෙන ඇඳුම්, දර්ශන හෝ භාණ්ඩ සෑදීම, පිළියෙළ කිරීම හෝ අලුත්වැඩියා කිරීම කරනු ලබන යම් ස්ථානයක් ;

(ix) වෙළෙඳ සමාගමක් විසින් හෝ වෙනත් වෙළෙඳ ව්‍යාපාරයක් විසින් හෝ පාලනය කරනු ලබන ධීවර කර්මාන්තයට අදාළ වන ලෙස, දැල් සෑදීමේ හෝ දැල් අලුත්වාඩියා කිරීමේ ව්‍යාපාරයක් ගෙන යනු ලබන යම් ස්ථානයක් ;

(x) වෙළෙඳාමක් වශයෙන් හෝ ලාභ ලැබීමේ පරමාර්ථ සඳහා හෝ ගෙන යනු ලබන යම් ව්‍යාපාරයකට අදාළ වන ලෙස, ලෝහමය හෝ ලී භාණ්ඩ සෑදීම හෝ අලුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් යාන්ත්‍රික බලය පාවිච්චි කරනු ලබන යම් ස්ථානයක් ;

(xi) චිත්‍රපටි නිපදවීම වෙළෙඳාමක් වශයෙන් හෝ ලාභ ලැබීමේ පරමාර්ථ සඳහා හෝ ගෙන යනු ලබන ස්ථානයක් එහෙත් නලුවන් හා ඔවුන්ගේ සේවකයන් කර්මාන්ත ශාලාවේ සේවයෙහි යෙදී සිටිනවුන් ලෙස නො සැලකිය යුතු ය ;

(xii) ගොඩනැගිලි වැඩ හෝ ඉංජිනේරු වැඩ ගෙන යාමට අදාළ වූ, භාණ්ඩ සාදනු ලබන නැතහොත් පිළියෙළ කරනු ලබන, ඒ ගොඩනැගිලි වැඩ ඉංජිනේරු වැඩ ගෙන යනු ලබන ස්ථානයක් නො වූ ස්ථානයක් ;

(xiii) ඝන අඩි පන් දාහකට අඩු නො වන ගබඩා කිරීමේ ප්‍රමාණයක් ඇති වායු භාජනයක , වායු ගබඩා කිරීම් සඳහා පාවිච්චි කරනු ලැබූ යම් ස්ථානයක් ද වේ.

(2) කර්මාන්ත ශාලාවක් සම්බන්ධයෙන් හෝ එහි කාර්ය සඳහා හෝ පාවිච්චි කරනු ලැබූ , දුම්රිය පාරක හෝ විදුලි රිය පාරක හෝ කොටසක් නො වන යම් මාර්ගයක් හෝ පටු මාර්ගයක් කර්මාන්ත ශාලාවේ කොටසක් ලෙස සැලකිය යුතු ය. වෙනත් පදිංචිකාරයන්ට අයිති වූ, එකකට වැඩි කර්මාන්ත ශාලාවල් සම්බන්ධයෙන් මෙකී මාර්ගය හෝ පටු මාර්ගය පාවිච්චි කරනු ලබන අවස්ථාවක දී , ඒ මාර්ගය හෝ පටු මාර්ගය වෙන් වූ කර්මාන්ත ශාලාවක් ලෙස සැලකිය යුතු ය.

(3) ප්‍රධාන පරීක්ෂකගේ ලිපිගත අනුමතිය සහිත ව , කර්මාන්ත ශාලාවක කොටසක් වෙන් වූ කර්මාන්ත ශාලාවක් ලෙස ගණන් ගත හැකි ය. තව ද කර්මාන්ත ශාලාවල් දෙකක් හෝ ඊට වැඩි ගණනක් එබඳු අනුමතියක් සහිත ව, එක ම කර්මාන්ත ශාලාවක් ලෙස ගණන් ගත හැකි ය.

(4) අයිතිකාරයාගේ හෝ පදිංචිකාරයාගේ හෝ අවසරය ඇති ව , නැතහොත් ඔවුන් දෙදෙනාගේ යමකු සමග ඇති කර ගනු ලැබූ ගිවිසුමක් යටතේ, වැඩ කරන තැනැත්තන් අයිතිකාරයාගේ හෝ පදිංචිකාරයාගේ හෝ සේවයෙහි වී නම්, යම් වැඩ පළක් කර්මාන්ත ශාලාවක් වන අන්දමේ යම් වැඩක්, දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් ඒ වැඩ පළෙහි ගෙන යන්නේ නම් , ඒ වැඩ පළ මේ ආඥාපනතෙහි කාර්ය සඳහා කර්මාන්ත ශාලාවක් ලෙස සැලකිය යුතු ය . තව ද, එබඳු වැඩ පළක් සම්බන්ධයෙන්, ඒ වැඩ පළෙහි අයිතිකාරයා හෝ පදිංචිකාරයා කර්මාන්ත ශාලාවේ පදිංචිකාරයා මෙන් ද , එහි වැඩ කරන තැනැත්තන් කර්මාන්ත ශාලාවෙහි සේවය කරන්නන් මෙන් ද සැලකීමෙන් , මේ ආඥාපනතෙහි විධිවිධාන අදාළ විය යුතු ය.

(5) පතහක හෝ පතලයක හෝ ඉන් යමක් අසල වූ ද ඉන් යමකට අයත් වූ ද ඛණිජ වර්ග විකිණීම සඳහා , ඒවා ලබා ගැනීමට කැපීමට හෝ පිළියෙළ කිරීමට උපකාර වූ යම් නිපදවීම් ක්‍රමයක් පමණක් ගෙන යන ස්ථානයක් වූ ද, කිසි ම ස්ථානයක් කර්මාන්ත ශාලාවක් ලෙස නො සැලකිය යුතු ය.

(6) කර්මාන්ත ශාලාවකට අයත් වන , වට කරනු ලැබූ ප්‍රදේශය හෝ සම්බන්ධ කරනු ලැබූ ප්‍රදේශය හෝ මායිම් වන ප්‍රදේශය හෝ ඇතුළත පිහිටි ස්ථානයක් කර්මාන්ත ශාලාවෙහි ගෙන යනු ලබනනිපදවීම් ක්‍රම නොවන වෙනත් කාර්යයක් සඳහා හුදෙක් ම පාවිච්චි කරනු ලැබූ විට , මේ ආඥාපනතෙහි කාර්ය සඳහා කර්මාන්ත ශාලාවෙහි කොටසක් ලෙස නො සැලකිය යුතු ය . එහෙත් ඒ කරුණු නිසා නොවේ නම්, එය කර්මාන්ත ශාලාවක් වන්නේ නම් , එය වෙන් වූ කර්මාන්ත ශාලාවක් ලෙස සැලකිය යුතු ය.

(7) එළිමහන් ප්‍රදේශ වූ පමණින් ම කිසි ම ස්ථානයක් කර්මාන්ත ශාලාවක විස්තරයෙන් අත්හැර දැමූ ලෙස නො සැලකිය යුතු ය.

(8) මේ ආඥාපනතෙහි කාර්ය සියල්ල ම හෝ ඉන් යමක් හෝ සම්බන්ධයෙන්, එක ම කර්මාන්ත ශාලාවේ ගෙන යන විවිධ අංශ හෝ දෙපාර්තමේන්තු වෙන් වූ කර්මාන්ත ශාලා ලෙස සැලකිය යුතු ය යි ඇමතිවරයා නියෝගවලින් නියම කළහොත් ඒවා එ සේ සැලකිය යුතු ය.

(9) රජයට හෝ යම් මහා නගර සභාවකට හෝ වෙනත් ප්‍රාදේශික හෝ පොදු බල මණ්ඩලයකට හෝ අයත් නැතහොත් ඉන් යමක් විසින් අත්පත් කොට ගෙන ඇති යම් ස්ථානයක් කර්මාන්ත ශාලාවක් නො වූ ලෙස නො සැලකිය යුතු ය . රජය හෝ එබඳු බල

මණ්ඩලයක් හෝ විසින් නැතහොත් ඉන් යමක් වෙනුවෙන්, ගෙන යනු ලැබූ ගොඩනැගිලි වැඩ , හෝ ඉංජිනේරු ඉදි කිරීමේ වැඩ , වෙළෙඳ ව්‍යාපාරයක් ලෙස හෝ ලාභ ලැබීමේ පරමාර්ථ පිට හෝ පවත්වනු නො ලබන නිසා ම , ඒවා මේ ආඥාපනත අදාළ වීමෙන් නිදහස් නො කළ යුතුය.

(10) යම් ස්ථානයක පදිංචිකාරයාගේ පවුලෙහි සාමාජිකයන් පමණක් සේවයෙහි යොදවා ඇති නම් , ඒ ස්ථානය, මේ වගන්තියේ ඉහතින් දැක්වුණු විධිවිධානවල කුමක් සඳහන් වුවද , මේ ආඥාපනතෙහි කාර්ය සඳහා කර්මාන්ත ශාලාවක් ලෙස නො සැලකිය යුතු ය.

(11) යම් සාප්පුවකට අයත් ස්ථානයක් ඇතුළත, මේ වගන්තියේ ඉහත සඳහන් විධිවිධාන යටතේ , ඒ ස්ථානය කර්මාන්ත ශාලාවකට හරවන යම් වැඩක හෝ නිපදවීම් ක්‍රමයක් ගෙන යනු ලබන අවස්ථාවක දී, ඒ විධිවිධාන කුමක් සඳහන් වුවද ---

(අ) මේ ආඥාපනතෙහි කාර්ය සඳහා කර්මාන් ශාලාවක් ලෙස හෝ ගණන් ගනු ලබන ස්ථානවල කොටස හෝ කොටස්, ලිපිගත ආඥාවකින් ලේකම් විසින් විස්තර කළ හැකිය. තවද එබඳු ආඥාවක් කළ විට, එසේ විස්තර කරනු ලැබූ කොටසක් නො වන ඒ ස්ථානයේ කිසි ම කොටසක් මේ ආඥාපනතේ කාර්යය සඳහා කර්මාන්ත ශාලාවක් ලෙස නොසැලකිය යුතු ය.

(ආ) කරුණු සියල්ල ම සලකා බැලීමෙන් පසු , එසේ කිරීම යෝග්‍ය ය යි ලේකම්ට වැටහී ගියහොත්, මේ ආඥාපනතෙහි කාර්ය සඳහා ඒ ස්ථානය කර්මාන්ත ශාලාවක් ලෙස ගණන් නො ගත යුතු ය යි ලිපිගත ආඥාවකින් ඔහුට ප්‍රකාශ කළ හැකි ය . තවද එබඳු ආඥාවක් කළ විට , ඒ ස්ථානය මේ ආඥාපනතෙහි කාර්ය සඳහා කර්මාන්ත ශාලාවක් ලෙස නො සැලකිය යුතු ය.

සාමාන්‍ය පදාර්ථ

127. (1) මේ ආඥාපනතෙහි, පද සංසන්දනයෙන් වෙනත් අර්ථයක් නුදුන් අවස්ථාවල දී , පහත පෙනෙන පාඨවල අර්ථ එහි පිළිවෙළින් දැක්වෙන පරිදි විය යුතු ය.

එනම් ---

" නියමිත දිනය " – " නියමිත දිනය" යන්නෙන් 1950 ජනවාරි 01

" ආපාක ගෘහය " – " ආපාක ගෘහය " යන්නෙන් වෙළෙඳ ව්‍යාපාරයක් වශයෙන් හෝ ලාභ ලැබීමේ පරමාර්ථ පිට හෝ පාන් , විස්කෝතු පුළුස්සන හෝ රස කැවිලි වර්ග සාදන ස්ථානයක් අදහස් කෙරෙයි.

" ශාරිරික තුවාළ " – " ශාරීරික තුවාළ" යන්නට සෞඛ්‍යයට වන හානියක් ද ඇතුළත් ය.

" ගොඩනැගිලි සහ වෙනත් ඉදිකිරීම් වැඩ " යන්නෙන් ගොඩනැගිල්ලක් හෝ වෙනත් ඉදිකිරීමක් තැනීම, ගොඩනැගීම, ව්‍යුහය වෙනස් කිරීම, අළුත්වැඩියා කිරීම හෝ නඩත්තු කිරීම , (කැණීම, පින්තාරු කිරීම , සැරසීම, ඔප දැමීම, කූස්තුර දැමීම, සහ පිටතින් පිරිසිදු කිරීම ඇතුළුව ) කඩා දැමීම හෝ ඒවායේ කොටස් ගැලවීම ද අදහස් කර ඇති ගොඩනැගිල්ලක් හෝ වෙනත් ඉදිකිරීමක් තැනීමට සූදානම් වීම සහ ඒ සඳහා 1976 අංක 12, 54

අත්තිවාරම් දැමීම සහ ඒවාට සම්බන්ධ සියලු කටයුතු ද ; යම් දුම්රිය මාර්ගයක්, හෝ සයිඩිමක් ඉදිකිරීම සහ යම් අන්තර් මාර්ගයක්, උමඟක්, අගලක්, කේසන්, කොන්ඩියුට් මාර්ගයක්, නළ මාර්ගයක්, පාරක්, වාප්පුවක්, නැව් තටාකයක්, වරායක්, දේශීය ජලතරණයක්, පාලමක්, බෝක්කුවක්, බෝක්කු පාලමක්, ජල කර්මාන්තයක්, ජලාසයක්, ජල පාරක්, කසළ කාණුවක්, කැලි කසළ කර්මාන්තයක්, වායු ධාරකයක්, බුරු පලංචියක්, ගොඩ බසින පාලමක්, ආධාර බැම්මක් තැනීම, ඒවායේ ව්‍යුහය වෙනස් කිරීම හෝ (කැණීම, පීලි මාරු කිරීම් සහ පින්තාරු කිරීම ඇතුළුව ) ඒවා අළුත් වැඩියා කිරීම හෝ කඩා දැමීම හෝ ඒවාට සම්බන්ධ සියලු කටයුතු හෝ ජලයෙහි, ජලය මතුපිට හෝ අවට කරගෙන යනු ලබන වෙනත් යම් ඉදිකිරීමේ, වෙනස් කිරීමේ, අලුත්වැඩියා කිරීමේ, ඉවත් කිරීමේ වැඩ ද අදහස් වන අතර අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග මගින් නිශ්චය කරනු ලැබිය හැකි වෙනත් වැඩ ද ඊට ඇතුළත් වේ.

" ලිත් වර්ෂය " – " ලිත් වර්ෂය " යන්නෙන් යම් වර්ෂයක ජනවාරි මස පළමුවෙනි දිනයෙන් පටන් ගනු ලබන මාස දොළහක කාලය අදහස් කෙරෙයි.

" ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු තැන " යන්නෙන් 100 වන වගන්තිය යටතේ පත් කරන ලද ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු තැන අදහස් වේ. 1976 අංක 12, 54

" වර්ගය හෝ විස්තරය " - කර්මාන්ත ශාලා සම්බන්ධයෙන් " වර්ගය හෝ විස්තරය " යන්නට ප්‍රදේශය අනුව විස්තර කරනු ලබන කර්මාන්ත ශාලා සමූහයක් ඇතුළත් වෙයි.

" කොමසාරිස්වරයා " යන්නෙන් කම්කරු කොමසාරිස්වරයා ; සහ 1961 අංක 54 , 9

" කර්මාන්තශාලාවක පදිංචිකාරයා යන්නෙන් කර්මාන්තශාලාවේ කටයුතු සම්බන්ධයෙන් පරම පාලනය හිමි පුද්ගලයා ද එම කටයුතු සම්බන්ධ පාලනය කළමනාකරණ නියෝජිතයෙකුට පවරා ඇති විට එම කළමනාකරණ නියෝජිතයා ද ඇතුළත් වේ.

" කඩ කිරීම " - යම් විධිවිධානයක් සම්බන්ධයෙන් " කඩ කිරීම " යනන්ට ඒ විධිවිධානය ඉෂ්ට කිරීම පැහැර හැරීම ඇතුළත් වෙයි. තවද " කඩ කරනවා " යන පාඨය ඒ අනුව තේරුම් ගත යුතුය.

" කපු පිළි කර්මාන්ත ශාලාව " - " කපු පිළි කර්මාන්ත ශාලාව " යන්නෙන් කපු පිළි විවීම ගෙන යනු ලබන යම් කාමරයක්, මඩුවක් හෝ වැඩ පළක් හෝ ඒවායින් කොටසක් අදහස් කෙරෙයි.

" අංශක " – " අංශක " යන්නෙන් පැරන්හයිට් අංශක අදහස් කෙරෙයි.

" නියෝජ්‍ය ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු තැන " යන්නෙන් 100 වන වගන්තිය යටතේ පත් කරන ලද නියෝජ්‍ය ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු තැන අදහස් වේ. 1976 අංක 12, 54

" දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු තැන " යන්නෙන් 100 වන වගන්තිය යටතේ පත් කරන ලද දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු තැන අදහස් වේ. 1976 අංක 12, 54

" ධාවන පටිය " - " ධාවන පටිය " යන්නෙන් යම් ධාවන වර පටක් හෝ කඹයක් ඇතුළත් වෙයි.

" කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු තැන " යන්නෙන් 100 වන වගන්තිය යටතේ පත් කරන ලද කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවෙක් අදහස් වේ.

" දුම " – " දුම" යන්නෙන් වායු හෝ වාෂ්ප අදහස් කෙරෙයි.

" සාමාන්‍ය ලේඛන පොත " – " සාමාන්‍ය ලේඛන පොත" යන්නෙන් 92 වෙනි වගන්තියේ නියමයන් ප්‍රකාර තබනු ලැබූ ලේඛන පොතක් අදහස් කෙරෙයි.

" පරීක්ෂක වෛද්‍ය නිලධරයා " යන්නෙන් 100 වන වගන්තිය යටතේ පත් කරන ලද පරීක්ෂක වෛද්‍ය නිලධරයෙක් අදහස් වේ. 1976 අංක 12, 54

" පළාත් පාලන ආයතනය " යන්නෙන් යම් මහ නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වේ. 1976 අංක 12, 54

" යන්ත්‍ර " – " යන්ත්‍ර" යන්නට ධාවන පටියක් ද ඇතුළත් වෙයි. 1976 අංක 12, 54

" පවත්වා ගෙන යනු ලැබූ " – " පවත්වා ගෙන යනු ලැබූ" යන්නෙන් සාර්ථක තත්ත්වයකින් ද , සාර්ථක ක්‍රියාකාරිත්වයකින් ද , යහපත් අලුත්වැඩියා කිරීමකින් ද පවත්වාගෙන යනු ලැබූ බව අදහස් කෙරෙයි. 1976 අංක 12, 54

" නිවේදිත දිනය " යන්නෙන් මේ ආඥාපනතේ කාර්යයන් සඳහා අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කිරීමෙන් නියම කරනු ලබන දිනය අදහස් වේ.

"අයිතිකාරයා" – " අයිතිකාරයා" යන්නෙන් තමා ගණනේ හෝ වෙනත් තැනැත්තකුගේ නියෝජිතයා හෝ භාරකාරයා වශයෙන් හෝ ඒ පාඨය යම් ස්ථානයක්, සම්බන්ධයෙන් යොදන ලද, නම්, ඒ ස්ථානය සම්බන්ධයෙන් එවකට කුලිය ලබාගන්නා තැනැත්තා හෝ ඒ ස්ථානය කුලියට ගන්නකුට කුලියට දී තිබේ නම් ඒ කුලිය භාරගන්නා හෝ අදහස් කෙරෙයි.

" පියා හෝ මව " - " පියා හෝ මව " යන්නෙන් දරුවකුගේ හෝ බාල තැනැත්තකුගේ හෝ මවක හෝ පියකු හෝ ආරක්ෂකයකු නැතහොත් එබඳු තැනැත්තකුගේ නීත්‍යානුකූල ආරක්ෂාව හෝ පාලනය හෝ භාරව ඇති තැනැත්තකු අදහස් කෙරෙයි. තවද යම් දරුවකු හෝ බාල තැනැත්තකු සම්බන්ධයෙන්, ඔහුගේ පඩියෙන් නියම ලෙස ප්‍රයෝජනයක් ගනු ලබන තැනැත්තකු ද එයට ඇතුළත් වෙයි.

" සේවා කාලය " - " සේවා කාලය " යන්නෙන් ආහාර ගැනීම හා විවේකය සඳහා ඉඩ හරිනු ලැබූ කාලය ඇතුලුව , යම් දවසක කම්කරුවන් සේවයෙහි යෙදවිය හැකි කාලය අදහස් කෙරෙයි.

" නියමිත " - " නියමිත " යන්නෙන් ඇමතිවරයාගේ නියෝග වලින් නියම කරනු ලැබූ බව අදහස් කෙරෙයි.

" ප්‍රධාන යන්ත්‍ර " - " ප්‍රධාන යන්ත්‍ර " යන්නෙන් දුම්වලින් හෝ ජලයෙන් හෝ වාතයෙන් හෝ විදුලියෙන් හෝ ද්‍රව්‍ය දැවීමෙන් හෝ වෙනත් මාර්ගයකින් හෝ ලබාගත් යාන්ත්‍රික බලය සපයන

සෑම ඇන්ජිමක්, මෝටරයක් හෝ වෙනත් උපකරණයක් අදහස් කෙරෙයි.

" නිපදවීම් ක්‍රමය " - " නිපදවීම් ක්‍රමය " යන්නට යම් ගමන් යන්ත්‍රයක පාවිච්චිය ද ඇතුළත් වෙයි.

" දුම්රිය මාර්ගය " මගීන් ගෙන යාම, බඩු ගෙන යාම හෝ වෙනත් ගමනාගමනය සඳහා වූ පොදු ගමනාගමනය සඳහා වූ පොදු ගමනාගමන කාර්යය සඳහා පාවිච්චි කරනු ලැබූ යම් දුම්රිය මාර්ගයක් අදහස් කෙරෙයි. දුම්රිය මාර්ගයට සම්බන්ධ වූ දුම්රිය මාර්ග බල මණ්ඩලයේ වෙනත් වැඩ ද මෙයට ඇතුළත් වෙයි.

" සෞඛ්‍ය පහසුකම් " - " සෞඛ්‍ය පහසුකම් " යන්නට කැසිකිළි, ජලකුටි, වැසිකිළි, අලුවලවල් හෝ වෙනත් එබඳු පහසුකම් ඇතුළත් ය.

" නැව " "යාත්‍රාව" – " නැව", "යාත්‍රාව" හා " වරාය " යන්නට වෙළෙඳ නාවුක පනතෙහි දී තිබෙන අර්ථම ඇත්තේ ය.

" සාප්පුව " – " සාප්පුව" යන්නට 1954 අංක 19 දරන සාප්පු සහ කාර්යාලීය සේවකයන් පිළිබඳ ( සේවය හා වේතන විධිමත් කිරීමේ ) ආඥාපනතෙහි දී තිබෙන අර්ථ ම ඇත්තේ ය.

" විශේෂඥ කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු තැන " යන්නෙන් 100 වන වගන්තිය යටතේ පත් කරන ලද විශේෂඥ කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවෙක් අදහස් වේ. 1976 අංක 12, 54

" විශේෂඥ පරීක්ෂක වෛද්‍ය නිලධරයා " යන්නෙන් 100 වන වගන්තිය යටතේ පත් කරන ලද විශේෂඥ පරීක්ෂක වෛද්‍ය නිලධරයෙක් අදහස් වේ. 1976 අංක 12, 54

" එකම වහල යටතේ කර්මාන්තශාලාව " යන්නෙන් ස්ථානයේ සීමාව හෝ ගෙමිදුල ඇතුළත යම් ප්‍රධාන බලයන්ත්‍රයකින් විවිධ තැනැත්තන් විසින් පරිහරණය කරනු ලබන එම ස්ථානයේ විවිධ කොටස්වලට, ඒ කොටස් නීතියට අනුව වෙනම කර්මාන්තශාලා වන පරිද්දෙන් යාන්ත්‍රික බලය නිෂ්පාදන ක්‍රියාවලියන් සඳහා බෙදා හරිනු ලැබ ඇති යම් ස්ථානයක් අදහස් වේ. 1976 අංක 12, 54

" විදුලි රථ මාර්ගය " – "විදුලි රථ මාර්ගය" යන්නෙන් යම් නීතියකින් හෝ නීතියක් යටතේ බලය දෙනු ලැබ , මහාජන ගමනාගමනයේ කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන විදුලි රථ මාර්ගයක් අදහස් කෙරෙයි.

" සංප්‍රේෂක යන්ත්‍ර " - " සංප්‍රේෂක යන්ත්‍ර " යන්නෙන් සෑම දණ්ඩක් ම, රෝදයක් ම , සිලින්ඩරයක් ම , කප්පියක් ම , තද සහ ලිහිල් කප්පි ක්‍රමයක් ම සම්බන්ධ කිරීමේ උපකරණයක් ම සම්බන්ධ කිරීමේ හා පාලනය කිරීමේ උපකරණයක් ම, ධාවන පටියක් ම හෝ ප්‍රධාන යන්ත්‍රයක ක්‍රියාකාරීත්වය යම් යන්ත්‍රයකට හෝ උපකරණයකට යවන හෝ පිළිගනු ලබන වෙනත් උපක්‍රමයක් හෝ අදහස් කෙරෙයි.

" සතිය " – " සතිය" යන්නෙන් යම් ශනි දිනයක මධ්‍යම රාත්‍රියෙහි සිට ඊට පසුව එන ශනි දිනයක මධ්‍යම රාත්‍රිය දක්වා ඇති කාලය අදහස් කෙරෙයි.

" ස්ත්‍රිය " – " ස්ත්‍රිය" යන්නෙන් අවුරුදු දහ අටක් වයසැති ස්ත්‍රියක අදහස් කෙරෙයි.

" ඉංජිනේරු ඉදිකිරීමේ වැඩ " - මෙම අර්ථකථනය 1976 අංක 12 දරන පනතෙහි 54(එ) වගන්තිය මගින් ඉවත් කර ඇත.

" බාල තැනැත්තා " – " බාල තැනැත්තා" යන්නෙන් වයස දහහතරක් වුවද, වයස දහ අටට නො පැමිණි තැනැත්තකු අදහස් කෙරෙයි.

(2) යන්ත්‍ර හෝ යන්ත්‍රෝපකරණ, නියමිත දිනට හෝ මේ ආඥාපනත යටතේ වූ නියෝග පැනවීමට හෝ පෙර සවි කළ ලෙස හෝ නැවත සවි කළ ලෙස, මේ ආඥාපනතේ කාර්යය සඳහා සැලකිය යුතු ය. තවද කර්මාන්ත ශාලාවක හෝ ගොඩනැගිල්ලක හෝ ඉදිකිරීම, නැවත ඉදිකිරීම, විශාල කිරීම, එකතු කිරීම, හෝ එබඳු කර්මාන්ත ශාලාවකට පරිවර්තනය කිරීම හෝ නියමිත දිනට හෝ මේ ආඥාපනත යටතේ වූ නියෝග පැනවීමට හෝ මේ ආඥාපනතෙහි විධිවිධානයක් ක්‍රියාවේ යෙදවීමට හෝ පෙර පටන් ගන්නා ලැබූ අවස්ථාවක දී , ඒ කර්මාන්ත ශාලාව හෝ ගොඩනැගිල්ල නියමිත දිනට හෝ මේ ආඥාපනතෙහි යම් විධිවිධානයක් ක්‍රියාවෙහි යෙදවීමට හෝ පෙර ඉදිකළ ලෙස , නැවත ඉදි කළ ලෙස, විශාල කළ ලෙස, එකතු කළ ලෙස, හෝ එබඳු කර්මාන්ත ශාලාවකට පරිවර්තනය කළ ලෙස සැලකිය යුතු ය.

(3) වැඩ කරන කාමර හෝ කර්මාන්ත ශාලාවේ වෙනත් කොටස් උෂ්ණවත් කිරීමේ හෝ ඒවාට වාතාශ්‍රය හෝ එළිය දීමේ කාර්යය සඳහා යාන්ත්‍රික බලය පාවිච්චි කිරීමේ කරුණ නිසා ම , කර්මාන්ත ශාලාවක් යාන්ත්‍රික බලය පාවිච්චි කරන කර්මාන්ත ශාලාවක් ලෙස, මේ ආඥාපනතෙහි කාර්ය සඳහා නො සැලකිය යුතු ය.

(4) යම් නිපදවීම් ක්‍රමයක හෝ නිපදවීම් ක්‍රමයක් සඳහා පාවිච්චි කරනු ලැබූ කර්මාන්ත ශාලාවේ කොටසක් පිරිසිදු කිරීමෙහි හෝ යන්ත්‍රවල හෝ යන්ත්‍රෝපකරණවල කොටසක් පිරිසිදු කිරීමෙහි හෝ එහි තෙල් දැමීමෙහි හෝ ඒ නිපදවීම් ක්‍රමයට අදාළ වූ හෝ එයට සම්බන්ධ වූ හෝ සාදනු ලැබූ භාණ්ඩයට හෝ නිපදවනු ලබන ද්‍රව්‍යයට හෝ සම්බන්ධ වූ හෝ වෙනත් වැඩක හෝ කර්මාන්ත ශාලාවකපඩි ඇති ව හෝ නැති ව යෙදී සිටින ස්ත්‍රියක හෝ බාල තැනැත්තකු හෝ ළමයකු හෝ , මේ ආඥාපනතින් ඊට විරුද්ධව සඳහන් කොට නොමැති විටක මේ ආඥාපනතෙහි හෝ එය යටතේ පවත්වන්ට යෙදෙන යම් නීති කෘත්‍යයක හෝ කාර්යය සඳහා, ඒ කර්මාන්ත ශාලාවෙහි සේවයෙහි යෙදී සිටින ලෙස සැලකිය යුතු ය.

එසේ ද වුවත්, යම් නිපදවීම් ක්‍රමයකට අදාළ වූ හෝ සම්බන්ධ වූ පිරිසිදු කිරීමක් නො වන , කර්මාන්ත ශාලාවක් හෝ ඉන් කොටසක් පිරිසිදු කිරීම සඳහා පමණක් සේවයෙහි යෙදී සිටින ස්ත්‍රියක 7 වෙනි කොටසෙහි කාර්ය සඳහා කර්මාන්ත ශාලාවෙහි සේවයෙහි යෙදී සිටින ලෙස නොසැලකිය යුතු ය.

(5) යටත් පිරිසෙයින් පැය බාගයක, අන්තර කාලයකින් නො කැඩුනු විට, මේ ආඥාපනතෙහි කාර්ය සඳහා සේවය අඛණ්ඩ වූවක් ලෙස සැලකිය යුතු ය.

(6) මේ ආඥාපනතෙහි කාර්ය සඳහා පුහුණු වන්නකු සේවයෙහි යෙදී සිටින්නකු ලෙස සැලකිය යුතු ය.

(7) මේ ආඥාපනතෙහි යම් නීතියක් පිළිබඳ ව සඳහන් කිරීම් වෙතොත් එය පසුව වෙනත් නීතියකින් සංශෝධනය කරනු ලැබූ ඒ නීතිය ගැන සඳහන් කිරීම් ලෙස සැලකිය යුතු ය.

128. බඩු එකතු කිරිමේ, බඩු ගෙන යාමේ හෝ බඩු භාර දීමේ හෝ පණිවුඩ ගෙන යාමේ, හෝ පණිවුඩ කීමේ වැඩක, පඩි ඇති ව හෝ නැති ව, කර්මාන්ත ශාලාවක සේවය කරන බාල තැනැත්තකු මේ ආඥාපනතෙහි හෝ මේ ආඥාපනත යටතේ පවත්වනු ලබන නීති කෘත්‍යයක හෝ කාර්යය සඳහා, කර්මාන්ත ශාලාවෙහි සේවයෙහි යෙදී සිටි ලෙස සැලකිය යුතු ය.

කර්මාන්ත ශාලාවල සමහර රක්ෂාවල යෙදී සිටින බාල තැනැත්තන්ට මේ ආඥාපනත අදාළ කිරීම.

එසේ ද වුවත්, ප්‍රධාන කොට ම කර්මාන්තශාලාවෙන් පිට සේවයෙහි යෙදෙන බාල තැනැත්තකු සඳහා , පැහැදිලි ව සඳහන් කරනු ලැබූ අවස්ථාවලදී හැර 7 වෙනි කාණ්ඩයේ විධිවිධාන අදාල නො විය යුතුය.

## සාමාන්‍ය

129. යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක බලය ප්‍රකාර හෝ බලය යටතේ පරීක්ෂා කරනු ලැබීමට යටත් වූ, යම් ස්ථානයක, යම් භාණ්ඩයක් තැනීමට, වෙනස් කිරීමට, අලුත්වැඩියා කිරීමට, අලංකාර කිරීමට, නිම කිරීමට, සේදීමට, පිරිසිදු කිරීමට හෝ විකිණීම පිණිස පිළියෙළ කිරීමට හෝ අදාළ වූ ඉගැන්වීමේ කාර්යය සඳහා හැර, අන් අවස්ථාවල දී, අතින් යම් වැඩක් කරනු ලැබුවේ නම්, ඒ ස්ථානය කර්මාන්ත ශාලාවක් නොවන විට, මේ ආඥාපනතෙහි සඳහන් කරුණු සම්බන්ධයෙන් ඒ ස්ථානය මේ ආඥාපනත යටතේ පත් කරනු ලැබූ පරීක්ෂකයකු ලවා පරීක්ෂා කර වීමට, ඒ දෙපාර්තමේන්තුව සමග පිළිවෙළක් කොමසාරිස් විසින් ඇති කළ හැකිය. තවද එබඳු පිළිවෙළක් ඇති කළ විට, ඒ දෙපාර්තමේන්තුවේ කර්මාන්තශාලා පරීක්ෂන ඉංජිනේරුවන්ට හෝ වෙනත් නිලධාරීන්ට පවරා දී ඇති ඇතුළුවීමේ සහ පරීක්ෂා කිරීමේ බලතල ඉහත සඳහන් කරුණු පිළිබඳ ව ඒ කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවන් ට ඇති විය යුතු ය.

සමහර ස්ථාන පරීක්ෂා කිරීම

130. මෙම ආඥාපනත ක්‍රියාවෙහි යෙදවීම සඳහා කොමසාරිස් විසින් දරන්ට වන වියදම්, පොදු ආදායමෙන් දරිය යුතු ය.

කොමසාරිස්ගේ වියදම්

131. මේ ආඥාපනතෙහි දී තිබෙන අර්ථය ඇතුළත වූ කිසිම කර්මාන්ත ශාලාවකට, නියමිත දිනය සිට, පතල් හා යන්ත්‍ර ආඥාපනතෙහි විධිවිධාන අදාළ නොවිය යුතු ය.

පතල් හා යන්ත්‍ර ආඥාපනත කර්මාන්ත ශාලාවලට අදාළවීම අත්හිට විය යුතු

එසේ ද වුවත්, කර්මාන්ත ශාලා සම්බන්ධයෙන් වූ ද , නියමිත දිනට පෙරතුවම වූ දිනයේ වලංගුව පවත්නා වූ ද , ඒ ආඥාපනත යටතේ පනවනු ලැබූ සියලු ම ව්‍යවස්ථා මේ ආඥපෙනතෙහි විධිවිධාන වලට විරුද්ධ නොවන ප්‍රමාණයට ද, ඒ විධිවිධාන ඉෂ්ට කිරීම සඳහා අවශ්‍ය වන ප්‍රමාණයට ද ඒවා මේ ආඥාපනත යටතේ පනවනු ලැබූ නියෝග මෙන්ම, ඒවා අවලංගු කරන තෙක් නැතහොත් මේ ආඥාපනත යටතේ ඒ ව්‍යවස්ථා වෙනුවට වෙනත් නියෝග පනවන තෙක් වලංගුව බල පැවැත්විය යුතු ය.